# HARRY POTTER
## AND THE CURSED CHILD

PARTS ONE AND TWO



BASED ON AN ORIGINAL NEW STORY BY

**J.K. ROWLING**

**JOHN TIFFANY & JACK THORNE**

A NEW PLAY BY **JACK THORNE**

පළවැනි ජවනිකාව,පළමු වෙනි දර්ශනය

*kings cross දුම්රිය ස්ථානය*

මිනිසුන්ගෙන් පිරුණු කාර්ය බහුල දුම්රිය ස්ථානයක්.සියලු දෙනාම කොහේ හෝ යාමට සැරසෙමින් සිටිති.මේ කලබලය අස්සේ,කූඩු දෙකක් සහිත බර පැටවූ ට්‍රොලි දෙකක් ඔවුන් අතරින් ගමන් කෙරෙමින් තිබුණි.ඒවා තල්ලු කරගෙන යමින් සිටියේ කුඩා පිරිමි ළමුන් දෙදෙනෙකි.ඔවුන් Albus Potter සහ James potter නම් විය.ඔවුන්ගේ මව වන Ginny ඔවුන් පසුපසින් පැමිණියාය.එමෙන්ම තිස්හත් වැනි වියේ පසු වූ Harry ද ඔහුගේ කුඩා දියණිය වන Lilly ද උරහිසේ හිඳුවා ගෙන පැමිනියේය.

Albus:- තාත්තේ, ඔහු ඒක දිගටම කියනවා..😒

Harry:- ජේම්ස් කරුණාකරලා නවත්තන්න ඕක..🙍‍♀️🙍‍♀️

James:- මම කිව්වේ ස්ලිදරින් නිවාසයට තේරුනොත්,සහ ඒ වගේම..(තාත්තා ගේ රවන බැල්මෙන්..)😠😠 හොඳයි...

Albus:-(ඔහුගේ මව දෙස බලමින්)ඔයා මට ලියනවා නේද..එහෙම නේ...

Ginny:-සෑම දවසකම,ඔයාට අපිව ඕන වෙන..

Albus:-නෑ, හැම දවසටම නෙමෙයි..ගොඩක් අයට ලියුමක් ලැබෙන්නේ මාසෙකට වතාවක් කියලා ජේම්ස් කිව්වා..මට එහෙම වෙන්න ඕනේ නෑ..

Harry:- ඔයා දන්නවද අපි ඔයාගේ සහෝදරයට ගිය අවුරුද්දේ සතියකට තුන් වතාවක් ලිව්වා

Albus:- මොකක්!! ජේම්ස් ට...

ඇල්බස් චෝදනා මුඛයෙන් ජේම්ස් දෙස හැරී බැලුවා 😒😒

Ginny:- ඔයා ඇත්තටම හොග්වෝර්ට්ස් ගැන එයා කියන හැමදේම විශ්වාස කරන්න ඕනේ නෑ..එයා විහිළුකාරයෙක්, ඔයාගේ සහෝදරයා...

James(විරිත්තන ගමන්):- කරුණාකරලා දැන් අපිට යන්න පුලුවන්ද??😂😂

ඔහුගේ මව සහ පියා දෙස බලමින් ඇසුවේය.

Ginny:- ඔයාට කරන්න තියෙන එකම දේ හය නැතුව වේදිකා අංක 9ත් 10ත් අතර තියෙන බිත්තිය දෙසට කෙලින්ම ඇවිදගෙන යන එක...

Lilly:- මම ගොඩක් ආසාවෙන් ඉන්නේ 😍😇

Harry:- නවතින්නෙ නැතුව බය වෙන්නේ නැතුව කෙලින්ම යන්න. බිත්තිය තුළින් ඔයාලව ඇතුලට යාවි. එක ගොඩක් වැදගත් දෙයක්.. කලබලෙන් වගේ ඉන්නව නං කරන්න තියෙන හොඳම දේ බිත්තිය දෙසට දුවගෙන යන එක තමයි..

Albus:-මම ලෑස්තියි😊😊

හැරී සහ ලිලී ඔවුන්ගේ අත් ඇල්බස් ගේ ට්‍රොලිය මත තැබූහ.ජිනී ජේම්ස් සමග එකතු වූවාය. ඔක්කොම එකට, පවුලම බාධකය දෙසට වේගයෙන් දිව ගියහ.

🟤පළමුවෙනි දර්ශනය, දෙවැනි ජවනිකාව

*වේදිකා අංක 9 3/4*

හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් හි සුදු සන දුමාරයෙන් වැසුණු පරිසරයකි....

එමෙන්ම එය කලබලකාරී පරිසරය කි.නමුත් එහි තවත් පිරිසකි.ඔවුන් ඉතාමත් කදිම ඇඳුම් වලින් සැරසී සිටියහ.ඒ වෙන කවුරුත් නොවෙයි....නිල ඇඳුම් වලින් සැරසී සිටි මායාකරුවන් සහ මායාකාරියන් වේ..ඔහු තම ආදරණීයයන් ට සුබ පැතුම් එකතු කරන්නේ කෙසේ දැ යි කල් යල් බලමින් සිටියහ ..

Albus:- මේ ඒක තමයි .!!!

Lilly:- වාව්....

Albus:- වේදිකා අංක 9 3/4

Lilly:- ඔවුන් කොහෙද? එයාලා මෙහේ ද ?මට හිතෙන්නේ එයාලා තවම ඇවිත් නැතුව ඇති..

හැරී අත දිගුකර රොන් සහ හර්මයිනි පෙන්වීය.ඔවුන් දෙදෙනාගෙන් දුව වන රෝස් සහ ලිලී එකිනෙකා වෙත දිව ආහ.

රොන් මාමේ...රොන් මාමේ...🤭

Ron:- කවුද මේ ඉන්නේ... මම කැමතිම පොටර් පවුලේ සාමාජිකයා නේද?🤓 🤓

Lilly:- මගේ උපක්‍රමය සොයාගෙන ආවද??

Ron:- ඔබ වීස්ලිලා ගැන සුපරික්ෂාකාරී ද??ඔබට මායාකාරී ඇදුමද(ඇදුම වැනි ලෙඩක්) සහතික කල නාසයක් - ඔබගේ හුස්ම සොරාගනී...🤭 🤭 🤭

Rose:- අම්මේ!!..තාත්තා අර නෝණ්ඩි වැඩේ ආයිමත් කරනවා..😶 😶 😶

Hermione:- ඔයා කියන්නේ නෝණ්ඩි කියලද!!තාත්තා නම් කියන්නේ ඒක ශ්‍රේෂ්ඨයි කියලා..මමනම් හිතන්නේ ඒ දෙක අතරමැද දෙයක් කියලා..😐 😐

Ron:- අල්ලගෙන ඉන්න..මට මේක ටිකක් විඳගන්න...සිසිල් වාතය ටිකක්...හරි දැන් ඒක පුංචි ප්‍රශ්නයක් නේ..ඔහොම පොඩ්ඩක් ඉන්න..මට සමාවෙන්න.. මට මේ දැනෙන්නේ සුදු ලූණු සුවඳක්ද?😫 😫

ඔහු ඇගේ මුහුණට හුස්ම පිඹුවා..ලිලී මෝඩ ලෙස සිනාසුණාය.

Lilly:- (ඇයට පොරිවල සුවඳ දැනුනි)ඒක පොරි සුවඳයි ...😇 😇

Ron:- බින්ග්..බැන්ග්..බොයින්ග්...තරුණ නෝනා, හැම දෙයක්ම හොඳට ඉඹල බලන්න පුරුදු වෙන්න එපා...

රොන් ඇයගේ නාසයෙන් එසවූයේය..

Lilly:- අනේ කොහෙද මගේ මගෙ නහය??😕😕

Ron:- ට...ඩා.....😂😂😂

ඔහුගේ දැත් හිස් විය.ඒක මෝඩ විහිළුවක් විහිලුවක්. සැමදෙනාම එහි විහිලු ස්වභාවය දැක සතුටු විය..

Lilly:- ඔයා නම් හරිම මෝඩයෙක් රොන් මාමේ...😠😠😠

Albus:- ඔක්කොම ආයිම අපි දිහා බලනවා..☹

Ron:- ඒ මම නිසා මම ඉතින් ගොඩක් ප්‍රසිද්ධ කෙනෙක් නේ මගේ නාස් උප්පරවැට්ටිය ගොඩක් ශ්‍රේෂ්ඨයි වගේම ප්‍රසිද්දයි.

Hermione:- ඒක නම් අනිවාර්යෙන්ම වෙන දෙයක්.

Harry:- වාහනේ හරියට පාර්ක් කළා නේද? එහෙනම් මොකද්ද? 🤔🤔

Ron:- ඔව් හරියට පාර්ක් කළා.ඒ උනාට හර්මයිනී විශ්වාස කරන්නේ නෑනේ.මට පුලුවන් මගල් driving test එක පාස් වෙන්න. එහෙම නේද ?ඒ උනාට හර්මයිනී හිතන්නේ මට විභාග පරීක්ෂක මෝහනය කරන්න වෙයි කියලා. 😒😒

Hermione:- මම ඇත්තටමඑහෙම හිතුවේ නැහැ. මම ඔයා ගැන සම්පූර්ණ විශ්වාසය තියෙනවා.

Rose:- ඒ වගේම මම සම්පූර්ණ විශ්වාසය තියෙනවා ඔහු විභාග පරීක්ෂක මෝහනය කරයි කියලා.

RON:- මොකක් 🤓🤓

Albus:- තාත්තේ..

ඇල්බස් හැරිගේ කෝට් එකෙන් ඇද්දේය. හැරී ඇල්බස් දෙස බැලුවේය .

ඔයා හිතන්නෙ.. මොකද වෙන්නේ.. මම...... මම ස්ලිදරින් වලට වැටුනොත්?

Harry:- ඉතින් මොකද්ද එකෙන් වෙන වැරැද්ද? ස්ලිදරින් කියන්නේ අඳුරු මායාවන්ගේ නිවාසය. ඒ වගේම සර්පයාගේ නිවාසය. අනික ඒක නිර්භය මායාකාරයන්ගේ නිවාසයක් නෙමේ. 😍Albus Severus😍 ඔයාගේ නමට යොද තියෙන්නේ හොග්වෝර්ට්ස් වල ශ්‍රේෂ්ඨ මායා විදුහල්පති වරු දෙදෙනෙකුගේ නම් .එයින් එක් අයෙක් ස්ලිදරින් නිවාසයේ. මම හිතන්නේ එයා තමයි මම දැනගෙන හිටපු නිර්භීතම පුද්ගලයා මගේ ජීවිතයේ. 😍

Albus:- ඒ වුනාට නිකමට කියන්නේ ...

Harry:- ඔයාට ඒක ගැටලුවක් නම්,තේරීම් තොප්පිය ඔයාගේ සිතිවිලි හැඟීම් වලට ඉඩදේවි.

Albus:- ඇත්තටම 🤗🤗

Harry:-මට නම් මේක වැඩ කළා

මෙය ඔහු කාටවත් නොකී කතාවක් විය එය ඔහුගේ හිත තුල රැව් පිළිරැව් දෙන්නට විය.

Harry:- හොග්වෝර්ට්ස් ඔයාව හදලා ගනීවි. ඇල්බස් මම පොරොන්දු වෙනවා ඒ ගැන. ඒ ගැන කිසිදේකට බය වෙන්න ඕනේ නෑ.

James:- තෙස්ට්‍රියල් කෙනෙක්ද? (හැරී සහ ලූනාට පමණක් පෙනෙන මායා සත්වයෙක්) ඔන්න බලාගෙන තෙස්ට්‍රියල්.. කෙනෙ..ක්..

Albus:- මම හිතුවෙ උන් පේන්නේ නෑ කියලා..

Harry:-ඔයාගේ මහාචාර්යවරුන් කියන දේවල් විතරක් කියන ඒවා අහන්න.ජේම්ස් කියන ඒවා අහන්න යන්න එපා. ඒ වගේම මතක තියා ගන්න. ගියාම විනෝද වෙන්න අමතක කරන්න එපා .දැන් ඔයා නැතිව මේ දුම්රිය හොග්වෝර්ට්ස් වලට යන්න ඕනෙ නැත්නම්.. ඉක්මන් කරලා කෝච්චියට පැන ගන්න.

Lilly:- මම කෝච්චිය පස්සෙන් දුවන්න හදන්නේ. 🤗🤗

Ginny:- ලිලී, කරුණාකරලා.. මෙහෙ එන්න...

Hermione :- රෝස් මතක් කරලා නෙවිල්ට අපේ සුබපැතුම් දෙන්න. අපි එයාව ආදරෙන් මතක් කරා කියලා..

Rose:- අම්මේ මට මහාචාර්ය වරයෙක් ට ආදරයෙන් මතක් කිරීම ගැන කියන්න බෑ..

රෝස් දුම්රියට ඇතුළුවිය.ඇල්බස් නැවත හැරී තම මව වන ජිනී සහ හැරී වැළඳ ගත්තේය. ඉන් පසුව ඔහුද දුම්රියට නැංගේය.

Albus:- හොඳයි, එහෙනම් බායි.. ✋✋

ඔහු දුම්රිය තුළ වූ වේදිකාවට නැග ගත්තේය.හර්මයිනී,ජිනී,රොන්,සහ හැරී කෝච්චියට බලා සිටියහ. දුම්රියෙන් නලාහඬ ශබ්ද විය. දුම්රිය ගමන් කිරීමට පටන් ගැනිණි. 🚂🚂🚂

Ginny:- ඔවුන් හොඳින් ඉදීවි. එහෙම නේද?

Hermione:- හොග්වෝර්ට්ස් කියන්නේ විශාල තැනක්.

Ron:- පුදුමාකාර, කෑම වලින් පිරුණු තැනක්. මම ඕන දෙයක් කැප කරන්න කැමතියි ආයිම එහෙට යන්න පුළුවන් නම්... .😋😋

Harry:-පුදුමයි, ඇල්(ඇල්බස් ගේ නම කෙටි කර හැරී පවසන නම) ස්ලිදරින් නිවාසයට තේරේවි කියල බියෙන් ඉන්නෙ..

Hermione:- ඒක නම් කමක් නෑ කියමුකො. රෝස්, කණස්සල්ලෙන් ඉන්නේ මොකක් වුණත් ඇගේ පළවන හා දෙවන අවුරුදු වල ක්විඩිච් වාර්ථා බිඳ දමාවි කියල. ඒ වගේම එයාට කොච්චර ඉක්මනට O.W.L s විභාගය පාස් කරගන්න පුළුවන් වේවිද කියලා.

Ron:-මටනම් කිසිම අදහසක් නෑ මේ ළමයා කොහෙන් මේ අභිලාෂයන් ඔළුවට අරගෙන ද කියලා..

Ginny:- ඔයාට කොහොමද දැනෙන්නෙ හැරී?? සමහරවිට.. සමහර විට ඔහු..?

Ron:- ඔයා දන්නවාද ජීන්, අපි හැමතිස්සෙම හිතුවේ ඔයාව ස්ලිදරින් නිවාසයට තේරෙන්න මොකක් හරි ම අවස්ථාවක් තියෙයි කියලා.😏😏

Ginny:- මොකක්?? 😠😠

Ron:-ඇත්තටම ෆ්‍රෙඩ් සහ ජෝර්ජුත් ඒ විදියටම හිතුවා..

Hermione:- අපිට යන්න පුලුවන්ද? මිනිස්සු බලන් ඉන්නවා. ඔයා දන්නවනේ ඉතින්..

Ginny:- ඔයාලා තුන්දෙනා එකට ඉන්නකොට මිනිස්සු හැමවෙලේම ඔයාලා දිහා බලනවා. ඒ වගේම ඔයා දිහා විශේෂයෙන් මිනිස්සු හැමවෙලේම බලන් ඉන්නවා.

හතර දෙනාම නික්ම යාමට පිටත් වුණි.ජිනී හැරීව නවතා ගත්තාය.

Ginny:- හැරී..ඇත්තෙන්ම ඔහු හොඳින් ඉඳීවි නේද..

Harry:- ඇත්තටම..එයා හොඳින් ඉඳීවි..☺

---

◍ පළමුවෙනි ජවනිකාව, තුන්වන දර්ශනය

🚂*හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස්*🚂

ඇල්බස් සහ රෝස් දුම්රිය මැදිරි දිගේ ඇවිදන් ගියහ.ට්‍රොලි විච් ඇයගේ රසකැවිලි පිරුණු ට්‍රොලිය තල්ලු කරගෙන ඔවුන් අසලට පැමිණියාය.

Trolly witch:- ඔයාලට මොනවා හරි ඕනෙද ළමයිනේ? වට්ටක්ක පේස්ට්‍රි?චොකලට් ගෙම්බෝ? එහෙම නැත්නම් කොල්ඩ්‍රොන් කේක්?🍪🍭🍫

(චොකලට් ගෙම්බන් දෙස කෑදර කමින් බලා සිටි ඇල්බස්ගේ මුහුණ දැක)ඇල්බස් අපි හිත එකඟ කරගන්න ඕනේ..

Albus:- හිත එකඟකරගන්න ඒ මොකටද??

Rose:- අපි යාළුවෝ විදියට ආශ්‍රය කරන්න තෝර ගන්න ඕන අය ගැන.. මගේ අම්මටයි තාත්තටයි ඔයාගේ තාත්තා මුණගැහුනා.. එයාලගේ පලවෙනි දුම්රිය ගමනේදී ඔයා දන්නවනේ ඒක...

Albus:- ඉතින් ඔයා කියන්නෙ අපි තෝරාගන්න ඕනේ.. අපේ ජීවිතයේ යාළුවො වෙන්න ඕන කවුද කියලා. ඒක ටිකක් බය හිතෙන වැඩක්, අනේ!!😫😫

Rose:- බයක් නෙමෙයි අනේ, ඒක හරිම උද්වේගකරයි. මම ග්‍රේන්ජර් වීස්ලි කෙනෙක් එතකොට ඔයා පොටර් කෙනෙක් හැම කෙනාටම ඕනවෙයි අපිත් එක්ක යාලුවෙන්න ඒ නිසා අපිට ඕන අයව තමයි යාළුවො කරගන්න ඕන

Albus:- ඉතින් කොහොමද අපි තීරණය කරන්නේ අපි දුම්රිය මැදිරියේ මොන කුටියේදී ඉන්නේ කියලා..

Rose:- අපි එයාලා හැමෝගෙම තරාතිරම බලලා තීරණයක් ගමු...

ඇල්බස් එකක දොරක් විවෘත කළේය. ඔහු එහි සිටි තඹ පැහැයට හුරු සුදු පැහැයක්(blonde) ගත් හිසකෙස් සහිත කොලුවා දෙස බලා සිටියේය. ඔහු ස්කෝපියස් නම්විය.ඇල්බස් සිනාසුනේය.ස්කෝපියස් නැවත පෙරලා සිනාසුනේය.

Albus:- හායි!! මේ කුටිය....😊😊😊

Scorpius:- මේකේ වෙන කවුරුත් නෑ මම විතරයි ඉන්නේ...

Albus:- අපි හිතුවේ මේ... (පොඩ්ඩක් ඇතුලට විත්) ඒකට කමක් නැද්ද මංදා??

Scorpius:- අනේ ඒකට කමක් නෑ..හායි..

Albus:- ඇල්බස්.. මම.. මගේ නම.. ඇල්බස්..

Scorpius:- හායි ස්කෝපියස්.. මම කිව්වේ මගේ නම ස්කෝපියස්... ඔයා ඇල්බස් මම ස්කෝපියස්.. එතකොට ඔයා වෙන්න ඕන...

රෝස් ගේ මුහුණ සුදුමැලි වෙමින් තිබිණි😐😐

Rose:- රෝස් 😗😗

Scorpius:- හායි රෝස් ඔයා ආසද මගේ Fizzing Vizbees වලින් එකක් රහ බලන්න..

Rose:- ස්තුතියි, මම උදේ ආහාරය ගත්තා විතරයි. 😏😏

Scorpius:- මම ළඟ තව shock-o-choc,pepper imps සහ jelly slugs එහෙමත් තියෙනවා.අම්මගේ අදහසක්. ඇය කිව්වා (ගයමින්) පැටියෝ යාලුවො ඇති කරගන්න මේවා උදව්වේවි. (ඔහු තේරුම් ගත්තා ගායනාව මෙතනට නොගැලපෙන බව) සමහර විට මෝඩ අදහසක් වෙන්නැති.

Albus:- මටත් ටිකක් දෙනවද?? අම්මා මට පැණි රස වැඩිය කන්න දෙන්නේ නෑ. ඔයා කැමති මොකකින් කන්න පටන් ගන්නද?

ස්කෝර්පියස් ට නොපෙනෙන පරිදි රෝස් ඇල්බස්ට තට්ටුවක් දැමුවාය.

Scorpius:- ලේසියි නේ.. ඒ හැම වෙලේම මගේ රසකැවිලි බෑගයේ සැලකිල්ලට මුලින්ම භාජනය වෙන්නේ රසකැවිලි වන රජු වගේ ඉන්න pepper imps තමයි. ඒවා පෙපර්මින්ට් රසයි වගේම කන් වලින් දුම් පිටකරන්නත් පුළුවන්.

Albus:- අනර්ඝයි!! එහෙනම් ඒකෙන් තමයි මම..

නැවත වරක් තට්ටුවක් දැමුවාය.

Albus:- rose කරුණාකරලා මට තට්ටු දාන එක නවත්තනවද?? 😠😠😠

Rose:- මම ඔයාට තට්ටු දැම්මේ නැහැ..😒

Albus:- ඔයා හිමින් මට ගහනවනෙ ඒව රිදෙනවා.. 😠😠😠😠

ස්කෝර්පියස් ගේ මුහුණ අඳුරු විය😟

Scorpius:- ඇය එහෙම තට්ටු දාන්නෙ මම නිසා

Albus:- මොකක්

Scorpius:- අහන්න මම දන්නවා ඔයා කවුද කියලා ඉතින් මම හිතන්නේ එයත් මම කවුද කියලා දැනගන්න එක සාධාරණයි

Albus:- මොකක්ද ඔයා කියන්නේ මම කවුද කියල දන්නව කියල???

Scorpius:- ඔයා ඇල්බස් පොටර්.ඇය රෝස් ග්‍රේන්ජර් වීස්ලි මම ස්කෝපියස් මැල්ෆෝයි. මගේ දෙමව්පියෝ ඇස්ටොරියා සහ ඩ්‍රැකො මැල්ෆෝයි. අපේ අම්මල තාත්තල යාළුවො නෙමෙයි.

Rose:- එහෙම කියන එකනම් සරල වැඩී. ඔයාගෙ අම්මයි තාත්තයි මිනීකන්නෝ. 😡

Scorpius:- (අවමානයෙන්) තාත්තා එහෙම හිටියා. නමුත් අම්මා නම් නැහැ.😑😑

රෝස් අහක බලා ගත්තාය. ඒ මන්ද කියා ස්කෝපියස් ට වැටහිණි.

Scorpius:- මම දන්නවා කටකතාව මොකක්ද කියලා. ඒ වගේම ඒක බොරුවක්.

Albus අපහසුවෙන් සිටින රෝස් දෙස මෙන්ම බලාපොරොත්තු සුන්වූ ස්වරයෙන් සිටි ස්කෝපියස් දෙස බැලුවේය. 😟😟

Albus:- මොකක්ද එතකොට කතාව කට කතාව ?🤔🤔

Scorpius:- කටකතාව තමයි, මගේ දෙමව්පියන්ට දරුවෙක් හදන්න තරම් වාසනාවක් තිබිලා නෑ. ඉතින් මගේ තාත්තයි සීයයි පරම්පරාව ගෙනියන්න බලවත් උරුමක්කාරයෙක් නැති එක ගැන බලාපොරොත්තු සුන් වෙලා ඉඳලා තියෙන්නේ.මැල්ෆෝයි පරම්පරාව අවසාන වෙන එකෙන් වැළකෙන්න.. එයාලා ඉතිං... එයාලා ඉතින් කාල යන්ත්‍රය මගින් මගේ අම්මාව අතීතයට යවලා.

Albus:- එයාව කොහෙටද හදල තියෙන්නෙ??

Rose:- කතාව තමයි එයා වොල්ඩමෝර්ට් ගේ පුතාලු ඇල්බස්....

භයානක වේදනාසහගත නිහැඬියාවක් පැතිර ගියේය..🤐🤐🤐🤐

Albus:- ඒක සමහර විට බොරු කතාවක් වෙන්නැති.. මම කිව්වේ බලන්නකෝ ඔයාට නාහයක් තියෙනවා නේ..😂😂

අවධානය තරමක් බිඳී ගොස් ස්කෝපියස් සිනාසෙන්නට විය.. සානුකම්පිතව සතුටු විය.. 😊😊

Scorpius:- ඒ වගේම ඒක මගේ තාත්තාගේ වගේ.. මට එයාගේ නහය ලැබිලා තියෙන්නේ. එයාගේ කොන්ඩේ.. එයාගේ නම. ඒකම නෙමේ.. ඒවා මාර නියමයිනෙ.. මම කියන්නෙ තාත්තගෙ පුතාගේ එකිනෙක සබඳතා.. මට ඒවා තියෙනවා. ඒ උනාට සමස්තයක් විදිහට ගත්තහම මම මැල්ෆෝයි කෙනෙක්ට වඩා යමක්. ඔයා දන්නවනේ.. අඳුරු මායාකරු ගේ පුතා විදිහට..

ස්කෝපියස් සහ ඇල්බස් එකිනෙකා දෙස බලමින් මුහුණෙන් යමක් ඔවුන් දෙදෙනා අතර පමණක් බෙදා ගත්ත..😉😉

Rose:- හොඳයි.. හරි,අපි සමහර විට වෙන තැනකට ගියොත් හොඳයි වගේ.. එන්න ඇල්බස් ...

ඇල්බස් කල්පනාවකට වැටී සිටියේය.🤔🤔

Albus:- නෑ...(රෝස් දෙස නොබලමින්) මම හොඳින් ඔයා යන්න...

Rose:- ඇල්බස් මට මෙතන ඉන්න ඕන නෑ..

Albus:- ඉතින් මටත් ඔයා මෙතන තියාගන්න ඕනේ නෑ.නමුත් මම මෙතන ඉන්නවා.😒

රෝස් දෙපාරක් ඔහු දෙස හැරී බලා කුටියෙන් නික්ම ගියාය.

Rose:- හොඳයි

ස්කෝපියස් සහ ඇල්බස්ව දමා ඇය ගියාය.

එකිනෙකා දෙස බලමින්...

Scorpius:- ස්තූතියි 😊

Albus:- නෑ..නෑ.. මම ඔයා වෙනුවෙන් නෙමේ නැවතුනේ ඔයාගේ රසකැවිලි නිසා..

Scorpius:- එයා ටිකක් සැර පරුෂ නේද?

Albus:- ඔව්, සමාවෙන්න ..

Scorpius:- නෑ මම කැමතියි ඒකට. ඔයා ගොඩක්ම කැමති ඇල්බස් කියනවටද?ඇල් කියනවටද?

ස්කෝපියස් පොප් ලෙස ශබ්ද නගමින් රසකැවිලි කිහිපය මුඛය තුළ රුවා ගත්තේය..

(සිතමින්)ඇල්බස්....

(ඔහුගේ කන් දෙකෙන් දුමක් නගිමින් තිබුණි) මගේ රස කැවිලි වෙනුවෙන් රැඳී සිටියාට ස්තුතියි ඇල්බස් ..

Albus:- (සිනාසෙමින්)වාව්....😂😂

---

🟤පළමුවෙනි ජවනිකාව,හතරවන දර්ශනය

🎩නිවාස වලට බෙදීමේ දර්ශනය🎩

දැන් අපි කාලයත් සමඟ වෙනස් නොවූ ලෝකය වෙත පැමිණියෙමු. මේ දර්ශනය තනිකරම මැජික් වලින් පිරුණු දර්ශනයක් විය. අපි සිටි ලෝකයෙන් ක්ෂණිකව මෙම ලෝකයට අප පැන ඇත. නමුත් මෙහි ස්ථිර ප්‍රගමනයක් දක්නට ලැබුණි.

ආරම්භයේ අපි හොග්වෝර්ට්ස් තුළ එහි ශ්‍රේෂ්ඨ ශාලාවේ විය. ඒ වගේම සියළු දෙනාම ඇල්බස්ව වටකරගෙන සිටියහ.

Polly chapman:- ඇල්බස් පොටර්.....

Karl jenkins:- අපේ අවුරුද්දේ.. පොටර් වරයෙක්

Yann fredericks:- ඔහුට ඔහුගේ හිස කෙස් ලැබිලා. ඒවා නිකන් එයාගේ හිස කෙස් වගේමයි.

Rose:- ඒ වගේම මෙයා මගේ මස්සිනා.රෝස් ග්‍රේන්ජර් වීස්ලි... හමුවීම සතුටක්..

තේරීම් තොප්පිය සිසුන් අතරින් ගෙනගියේය. කව්ද එයාලගේ නිවාස වලට තේරෙන්නේ කියා බලමින්....

ඒය ක්ෂණිකව දෘශයමානවී රෝස් අසලට ලඟාවිය.ඇය ඇගේ ඉරණමට මුහුණ දීමට බලාගෙන සිටියාය.

Sorting hat:-

මම මේ රාජකාරිය අවුරුදු ගාණක් පුරා කරනවා

හැම සිසුවෙකුගේම හිස මත රැදී සිටියා

මම හිතන විදිහට මගේ මතකය අනුව

මම තමා ඉතා ජනප්‍රිය තේරීම් තොප්පිය

මම ඉහලින් තෝරනවා මම පහලින් තෝරනවා

මොන බාධක මැද වුණත් මම හරියට තෝරනවා

ඉතින් මාව පැළඳලා බලන්න ඔබ දැනගනීවි ඔබ මොන නිවාසෙට තේරිය යුතු ද කියා

රෝස් ග්‍රේන්ජර් වීස්ලි

ග්‍රිෆින්ඩෝර්

ග්‍රිෆින්ඩෝර්වරු සිටි පෙදෙසින් ප්‍රීති ඝෝෂා හඬක් ඇති විය.ඒ සමඟින් ඇය ඔවුන් හා එකතු විය.

Rose:- ස්තූතියි ඩම්බ්ල්ඩෝර්...

රෝස් ට පසුව ස්කෝපියස් ඊළඟ තැනට රවන බැල්මෙන් යුතු තේරීම් තොප්පිය දෙසට පිය මැන්නේය.

Sorting hat:- ස්කෝපියස් මැල්ෆෝයි...

ඔහුගේ හිස මත තේරීම තොප්පිය පැලඳුනේය..

ස්ලිදරින්

ඔහු මෙය බලාපොරොත්තු විය. ඔහු කට කොනින් සිනාසීය. ඔහු ස්ලිදරින් නිවාසයට තේරීමත් සමග ඒ දෙසින් ප්‍රීති ඝෝෂාවක් නැගුණි.

Polly chapman:- හොඳයි, ඒක නම් සාධාරණ පාටයි..

ඇල්බස් හිමින් සීරුවේ වේදිකාවේ ඉදිරියට පැමිණියේය.

Sorting hat:- ඇල්බස් පොටර්

ඇල්බස්ගේ හිසේ තොප්පිය පැලඳුණි.. මෙවර තරමක් වේලා ගත විය.. ඒ තේරීම් තොප්පිය මදක් කනස්සලු ස්වභාවයක් දිස් විය.

ස්ලිදරින්

ශාලාව පුරා දැඩි නිශ්ශබ්දතාවක් මතුවිණි.

ඒක දැඩි ගැඹුරු නිශ්ශබ්දතාවයක් විය.

කවුරුන් හෝ ඉඳගන්නා හඬ ඇසුණි. මොහොතකින් කිහිපදෙනෙක් මගින් නිහඬ බව බිඳුණි.

Polly chapman:- ස්ලිදරින්???

Craig bowker jr:- ස්ලිදරින් නිවාසයේ පොටර් වරයෙක් ,අනර්ඝයි !!!!

ඇල්බස් අහක බලාගත්තේය. ඔහුගේ සිත තුළ තරමක විශ්වාසය නැති ගතියකි.ස්කෝපියස් ඉතා සතුටින් සිනා සෙමින් කෑගසා ඇල්බස් ඇමතීය.

Scorpius:- ඔයාට මා ළඟින් ඉඳ ගන්න පුළුවන්.

Albus:- ඔව් ඇත්තෙන්ම ...

Yann fredericks:- මම හිතන්නේ එයාගේ කොණ්ඩේ හැරීගේ වගේම නෑ....

Rose:- ඇල්බස්? නමුත් මේක වැරදියි.ඇල්බස් . ද මේක මෙහෙම වෙන්නෙ නෙමේනෙ තිබුණේ..

එක්වරම මැඩම් හූච් පියැඹීමේ පාඩමක් සමඟ පැමිණියේය. (stage play එකක් නිසා දර්ශනය ක්ෂණිකව මාරුවෙනවා. novels වගේ නෙමෙයි)

Madam Hooch:- හොඳයි, ඇයදයි ඇයි හැමෝම බලන් ඉන්න හැමෝම කොසු අරගෙන හිටගන්න පෝළිමට හමුවන ඉක්මන් කරන්න

ළමුන් සියලු දෙනාම තමන්ගේ ස්ථානවලට ගොස් පසුපස සිටගත්හ.

Madam Hooch:- ඔයාලගේ අත ඉදිරියට දිගු කරලා "උඩට" කියලා කියන්න.

Rose:- උඩට

රෝස් සහ ගැහැනුන්ගේ කොසු එක්වරම ඔවුන්ගේ අත් වලට ආහ

Rose:- නියමයිනේ...

Madam Hooch:- හොඳයි, හරි, ඉක්මන් කරන්න. මට ඔය පොඩි උන් එක්ක නාස්ති කරන්න කාලයක් නෑ. කියන්න. කියන්න උඩට කියල

Everyone:- (රෝස් සහ යෑන් හැර) උඩට...

කොසු උඩට එමින් තිබුණි.ස්කෝපියස්ගේ පවා කොස්ස අතට පැමිණියේය. නමුත් ඇල්බස්ගේ කොස්ස තවම පොළොව මතය.

albus:- උඩට උඩට උඩට

ඔහුගේ කොස් අගලක් හෝ උඩට නාවේය. ඔහු අදහාගත නොහැකි බලාපොරොත්තු සුන්වූ ස්වරයෙන් බලාගෙන සිටියේය...

Polly chapman:- මර්ලින්ගේ රැවුල කිව්වලු.. (හරියට, හපොයි දෙයියනේ වගේ වචනයක්.ස්ලිදරින් නිවාසයේ ලිපියෙත් මේ ගැන ඇති) කොච්චර නින්දා පමුණුවන්නක් ද?ඔහු ඇත්තටම ඔහුගේ පියා වගේ නම් නෙවෙයි.. එහෙම නේද???

Karl Jenkins:- ඇල්බස්.. ස්ලිදරින් පඹයා....

Madam Hooch:- හොඳයි ළමයි දැන් ඉගිලෙන්න වෙලාව...

එක්වරම හැරි සමග ඇල්බස් දුම්රිය ස්ථානයේ සිටියහ. (කලින් කිව්වා වගේ stage play නිසා දර්ශනය මාරුවීමක් හොඳේ)

අපි නැවතත් නමයයි 3/4 වේදිකාවේ. කාලය හරිම ඉක්මනට ගෙවී යනවා. ඇල්බස් දැන් අවුරුද්දක් වැඩිමල් සිසුවෙකි.

albus:- මම මේ නිකන් කියන්නේ තාත්තේ.. ඔයා.... ඔයා... ටිකක් මගේ ඈතින් ඉන්නකෝ

Harry:- (විනෝද සිනාවක් පාමින්) දෙවෙනි අවුරුද්දේ ළමයි කොහොමත් එයාලගෙ තාත්තල ලගින් ඉන්න වැඩ කැමති නෑනේ... ඒකනේ කාරණාව

Albus:- නෑ ඒක නිකං මම කියන්නේ ඔයයි.. මමයි.. මම... මගේ...

Harry:- මිනිස්සු නිකන් බලන්නේ හරිද.. මිනිස්සු බලනවා මම දිහා ඔයා දිහා නෙමෙයි..

හැරී ගැන සැලකිල්ලෙන් එහි සිටි මායා කරුවෙක් පැමිණ හැරීට යමක් අත්සන් කිරීමට යමක් දුනි.ඔහු එය අත්සන් කළේය.

Albus:- හැරී පොටර් සහ ඔහුගේ කලකිරුණු පුත්‍රයා

Harry:- මොකද්ද ඒකෙ තේරුම

Albus:- හැරී පොටර් සහ ඔහුගේ ස්ලිදරින් පුත්‍රයා

ජේම්ස් ඔවුන් ගේ ඇඟේ හැප්පෙමින් ඔහුගේ බෑගයද රැගෙන ඔවුන් අසලින් ගියේය..

James:- ස්ලිදරින්..ස්ලිදරින්... නවත්ත ගන්න ඔයාගේ ඔය වෙව්ලන එක ඇල්..හී..හී.. කෝච්චියට නගින්න වෙලාව හරි

Harry:- ඕනෙ නැති විහිළු එපා ජේම්ස්...

Albus:- නත්තලට හමුවෙන්නම්.. තාත්තා..

හැරී ඇල්බස් දෙස දුක්මුසු ලෙස බැලුවේය.

Harry:- ඇල්...

Albus:- මගේ නම ඇල්බස් ඇල් නෙමේ ...

Harry:- අනික් අනිත් ළමයිනුත් ඔයාලට කරදර කරනවද? හොඳ නැද්ද තව යාළුවො ටිකක් ඇතිකර ගත්තොත්..හර්මයිනී සහ රොන් නැතිම මම හොග්වෝර්ට්ස් වල මැරෙන්නෙ නැතුව හිටිය පුදුමයි.. එයාලා නැත්නම් මට දිවි දිවි ගලවා ගන්න ලැබෙන්නේ නෑ...

Albus:- නමුත් මට හර්මයිනීවත් රොන් වත් ඕනෙ නෑ.. මට මගේම යාළුවෙක් ඉන්නවා.. එයා ස්කෝපියස්. මම දන්නවා ඔයා එයාට කැමති නෑ කියල. නමුත් මට එයාව විතරයි ඕනි.

Harry:- බලන්න ඔයා ගොඩ කාලෙකට පස්සෙ සතුටින් ඉන්නවා මට වැදගත් වෙන්නේ එච්චරයි..

Albus:- තාත්තේ ...අනිත් දවසේ ඔයා මාව ඇරලවන්න දුම්රිය ස්ථානයට එන්න එපා..

ඇල්බස් තමන්ගේ ගමන් මලුත් රැගෙන දුම්රියට නැඟීමට ගියේය..

Harry:- නමුත් මට මෙතනට එන්න ඕනේ...

නමුත් ඒ වනවිටත් ඇල්බස් නොපෙනී ගොස්ය..

ඩ්‍රැකෝ මැල්ෆෝයි.. ඔහුගේ ඇඳුම අගනා එකකි. හිස අලංකාරව පීරා ඇත. කොණ්ඩය තරමක් වවා පිටුපසට කර ගැට ගසා ඇත. ඔහු සෙනඟ අතරින් මතු වී හැරී පසෙකට ආවේය...

Draco Malfoy:- මට උදව්වක් ඕනේ

Harty:- ඩ්‍රැකෝ...

Draco Malfoy:- මේ කටකතා..මගේ ළමයාගේ මව පියා ගැන කියවෙන ඒවා..හොග්වෝර්ට්ස් වල අනිත් ළමයි කෲර විදියට සමච්චල් කරනවා මේ කටකතාවලින් මගෙ ලමයට. අමාත්‍යාංශයට පුළුවන්නම්.. සියලුම කාල යන්ත්‍ර අභිරහස් කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සටනින් පස්සේ විනාශ වුණා කියලා ප්‍රකාශයක් ගේන්න...

Harry:- ඩ්‍රැකෝ ඒවාට පැතිරිලා යන්නෙ ඉඩ දෙන්න.. ඉක්මනටම නැතිවෙලා යාවි...

Draco Malfoy:- මගේ පුතා වේදනා විඳිනවා විඳිනවා ඇස්ටෝරියා.. ළඟක ඉඳන් සනීපෙන් නෙමේ ඉන්නේ...

Harry:- ඔයා ඕපදූප වලට උත්තර දෙන්න ගියොත් ඒකෙන් වෙන්නේ ඔයා ඒවට පොහොර දාන එක.. අවුරුදු ගාණක ඉඳලා කටකතා තියනවනෙ.. වොල්ඩමෝර්ට් ට ළමයෙක් හිටියා කියලා ඒ ගැන දොස් කියන්න පුළුවන් එකම කෙනා ස්කෝපියස් නෙමේනේ. ඔයාගෙත් අපෙත් හොඳට අමාත්‍යාංශය මේ ගැන හරියට හොයලා බලනවා නේ ...

නමුත් ඩ්‍රැකෝ රවමින් කරදර කරමින් හැරීට ඒත්තු ගැන්වීමට උත්සාහ කළේය. (දර්ශනය මාරුවෙමින්)ඇල්බස් සහ රෝස් එයාලගේ ගමන් මලු සමග...

Rose:- කෝච්චිය ගියොත් ඔයාට මාත් එක්ක කතා කරන්න වෙන්නෙ නැහැ කියල ඔයා දන්නවා නේ ...

Harry:- මම දන්නවා. ලොකු අය ඉස්සරහ අපිට බොරුවට අඟවන්න වෙනවා...

මේ අතර ස්කෝපියස් දුවගෙන ඔවුන් අසලට ආවේය. විශාල ගමන් මල්ලක් මෙන් ම අපේක්ෂා ගොඩක් හිතේ දරාගෙන.

Scorpius:- (අපේක්ෂාවෙන්) හායි .. රෝස්

Rose:- (ස්ථිර ස්වරයෙන්) බායි ඇල්බස් ....

Scorpius:- (තවමත් අපේක්ෂාවෙන්)ඇය වූ දියවෙලා යනවා වගේ නේ...

එක්වරම ඔවුන් ශ්‍රේෂ්ඨ ශාලාවේ විය. මහාචාර්ය මැගෝනිගල් මුව පිරුණු සිනාවක් සමග රැඳී සිටියාය.(දර්ශනය මාරුවීමක්)

Prof Mcgonagall:- මම මේ මොහොතේ ගොඩක් සතුටින් ප්‍රකාශ කර සිටිනවා අපේ ක්විඩිච් කන්ඩායමේ නවතම සාමාජිකයා වන ඔයාලගේ සුපිරි අලුත් ලුහුබඳින්නා රෝස් ග්‍රේන්ජර් වීස්ලි....

මුළු ශාලාවම පිරි ඉතිරී යන හඬින් ප්‍රීති ඝෝෂාවක් නැගුනි. මේ අතර ස්කෝර්පියස් ද පැත්තක සිටිමින් අප්පුඩි ගසන්නට විය

Albus:- ඔයාත් එයාට අත්පුඩි ගහනව ද? අපි ක්විඩිච් වලට වෛර කරනවනේ. අනික එයා වෙන නිවාසයකනේ....

Scorpius :- එයා ඔයාගෙ නෑනා ඇල්බස්...

Albus :- ඔයා හිතන්නේ එයා මම වෙනුවෙන් අත්පුඩි ගහයි කියලා ද???

Scorpius :- මම හිතන්නේ ඇය විශිෂ්ඨයි.

එක්වරම මායා බෙහෙත් පංතියේ ළමයි ඇල්බස් ව වටකරගෙන සිටියහ. (දර්ශනය මාරුවීමක්)

Polly chapman :- ඇල්බස් පොටර්... පන්තියට වැඩකට නැතිම එකා... අඩුම තරමින් මෙතනට එනකොට පඩිපෙල් මාරුවෙලා වෙන අතක ගියා නම් කොච්චර හොඳද....

ඇල්බස් කලකිරීමෙන් බලාසිටියේය...

Albus:- අපි ඊළඟට එකතු කරන්න ඕනේ අගක් ද නැත්නම් වෙන දෙයක්ද....

Karl jenkins :- එයාව අතාරින්න. එයයි එයාගේ වොල්ඩමෝර්ට්ගෙ පුතාටයි කරගන්න දීලා.....

Albus:- සැලමැන්දරාවෙක් ගේ ලේ ස්වල්පයක් එක්ක....

මායා බෙහෙත එක්වරම මහ හඬින් පිපිරී ගියේය ..

Scorpius :- මොනවද අපිට වැරදුනේ?? මොනවද වෙනස් කරන්න ඕනේ??

Albus:- හැමදේම

එයත් සමගම කාලය ඉක්මනින් ගෙවී ගියේය.. ඇල්බස්ගේ ඇස් අඳුරු වෙමින් තිබුණි. ඔහුගේ මුහුණ තවත් සුදුමැලි වෙමින් තිබුණි.එනමුත් තවමත් ඔහු ආකර්ෂණීය පිරිමි ළමයෙකි.නමුත් ඔහු ඒ ගැන සිතුවේ නැත..

එක්වරම ඔහුගේ පියා සමග වේදිකා අංක 9 3/4 විය. තවමත් තම පුතු ගැන සොයා බලන පියා එහි විය. ඔහු අසලින් විය. නමුත් දෙදෙනාම අවුරුද්දකින් මහලු වී ඇත...

Harry:- තුන්වන අවුරුද්ද වැදගත් අවුරුද්දක්. මෙන්න, ඔයාගේ අවසර ලිපිය හොග්ස්මීඩ් වලට යන්න..

Albus :- මට පේන්න බෑ හොග්ස්මීඩ්.

Harry :- ඔයාට කොහොමද එපා වෙන්නේ... දැනටමත් ගිහිල්ල නැති තැනක් ගැන..

Albus :- මොකද මම දන්නවා එතන හොග්වෝර්ට්ස් සිසුන් ගෙන් පිරුණු තැනක් කියලා..

ඇල්බස් කඩදාසි ගුලි කර දැමුවේය.

Harry :- අයියෝ.. යන්න දෙන්න ඒකට.. ඒ ගැන හිතන්න එපා.මේක හොඳම අවස්ථාව ඔයාගේ අම්මට දැනගන්න ඉඩ තියන්නෙ නැතුව හනීඩියුක්ස් වලින් රසකැවිලි කන්න තියෙන..

Albus :- (ඔහුගේ මායා යෂ්ටිය දිගුකරමින්)ඉන්සෙන්ඩියෝ..

කඩදාසි ගුලිය දැවී අළුවී එම අළු වේදිකාව හරහා පාවී ගියේය..

Harry :- හොඳයි.. කළ මෝඩ වැඩේ..

Albus :- මම ඒක හරියට වෙයි කියලා බලාපොරොත්තු වුණේ නෑ. (උපහාසයෙන්) මම මන්ත්‍රවලට හරිම දුර්වලයි...

Harry :- ඇල්බස් මම මහාචාර්ය මැගෝනිගල් සමග ලිපි කිහිපයක් බකමූණන් මගින් හුවමාරු කරගත්තා. ඔයා හුදෙකලා වෙලා ඉන්නවා කියලා ඇය ලියා එවා තිබුණා. ඔයා පාඩම් වලට කිසිම සහයෝගයක් දෙන්නේ නෑලු.ඔයා..ඇත්තටම ඔයා...

Albus:- ඉතිං ඔයා කැමති මම මොනවා කරනවටද?? මාව ප්‍රසිද්ධ වෙන්න මට මැජික් එකක් කරගන්නද කියන්නේ? මම මාව අනිත් නිවාසයකට තේරෙන්න බන්ධනය කර ගන්නද කියන්නේ? මම යහපත් ශිෂ්‍යයෙක් බවට හරවා ගන්නද කියන්නේ? නිකං මේ මන්තරයක් මතුරලා.... තාත්තේ මාව එහෙනම් ඔයාට ඕන කෙනෙක් විදියට හදලා ගන්නකෝ.. හරිද... ඒක ගොඩක් හොද වේවි අපි දෙන්නටම.... යන්න වෙනවා. කෝච්චිය අල්ලගන්න. යාළුවෝ හොයා ගන්න.

ඇල්බස් ස්කෝපියස් වෙත දිව ගියේය.

Albus:- කවුද මේ ගමන් මල්ලක් උඩ ඉඳගෙන ඉන්න කොල්ලා... හේයි... මේ ලෝකෙට ආව නම් නරකද කොල්ලෝ...😂😂

(ප්‍රීතියෙන්)ස්කෝපියස්.. (නැවත ඕනෑකමින්)

ස්කෝපියස්.. ඔයා හොදින්ද??

Scorpius :- මොකුත් නෑ.. (ඇල්බස් ඔහුගේ යහළුවාගේ ඇස් දෙස බලා වටහා ගන්නට උත්සාහ කළේය.)

Albus :- ඔයාගේ අම්මා??එයාගේ තත්වය නරක අතට හැරිලද???

Scorpius :- ඒක ගොඩක් නරක අතට හැරිලා තියෙන්නෙ... තවත් ඉතින් මොනව වෙන්නද?

ඇල්බස් ස්කෝපියස් පසෙකින් හිඳ ගත්තේය

Albus :- මම හිතුවේ ඔයා බකමූණෙක් එවයි කියල..

Scorpius :- මට හිතාගන්න බැරි උනා මොනවා කියලා ලියල එවන්න කියලා...

Albus :- ඉතින් දැන් මම දන්නේ මොනවා කියන්නද කියලා...

Scorpius :-මොකුත් කියන්න එපා ..

Albus :- වෙන මුකුත් වෙන්න එහෙම තියනවද?

Scorpius :- මල ගෙදර එන්න.

Albus :- අනිවාර්යයෙන්ම එන්නම්.

Scorpius :- ඒ වගේම මගේ හොදම යාලුවා වෙන්න.

එක්වරම තේරීම් තොප්පිය සමග ශ්‍රේෂ්ඨ ශාලාව තුළ (දර්ශනය මාරුවීමක්)

Sorting Hat:-

ඔයා බය වෙලාද ඉන්නේ ඔබට මොනවා ඇහෙයිද කියලා

මම කියන්න ඉන්න නම අහල ඔබ බය වෙලාද ඉන්නේ

ස්ලිදරින් නොවේ.ග්‍රිෆින්ඩෝර් නොවේ.

හපල්පෆ් නොවේ.රේවන්ක්ලෝද නොවේ.

බය වෙන්න එපා දරුවනේ මම මගේ රාජකාරිය දනිමි

ඔබ සිනාසෙන්න ඉගෙන ගනීවි මුලින් ඔබ ඉකිබින්දොත්...

ලිලී පොටර්....

ග්‍රිෆින්ඩෝර්...

Rose:- නියමයි

Albus :- ෂා... ඒකත් මරු ...

Scorpius :- ඔයා.. ඇත්තටම එයත් අපිත් එක්ක එකතු වෙයි කියලා හිතුවද??පොටර්ලා කවදාවත් ස්ලිදරින් වලට එන්නෙ නෑ....

Albus :- මේ එක්කෙනා ආවනේ..ඉතින්..

ඔහු වටා පිටාව ගැන අවධානය යොමු කළේය.අනිත් ළමයි සිනාසෙමින් සිටී.ඔහු ඔවුන් දෙස බැලුවේය.

මම තේරුවේ නෑ.. ඔයා දන්නවනේ ඒක... මම එයාව තේරුවේ නෑ එයාගේ පුතා වෙන්න...

---



පලමුවෙනි ජවනිකාව,5වන දර්ශනය

මායා ආමත්‍යාංශය හැරීගේ කාර්යාලය

ලිපි කඩදාසි පොත් වලින් පිරුණු හැරීගේ හැඩි වූ කාර්යාලය පුටුව මත හර්මයිනී වාඩිවී සිටියා.ඇය සෙමින් ඒ අතරින් යමක් තෝරමින් සිටියාය. හැරී කඩිමුඩියේ කාර්යාලයට ඇතුළු වූයේය. ඔහුගේ කම්මුල දිගේ ඩහදිය බේරෙමින් තිබුණි.

Hermione :- කොහොමද එක ගියේ??

Harry :- ඒක ඇත්තක්

Hermione :- තියඩෝර් නොට්??

Harry :- හිර භාරයේ

Hermione :- එතකොට එයා ගාව තිබුන කාල යන්ත්‍රය

හැරී සඟවාගෙන සිටි කාල යන්ත්‍රය පෙන්විය.එය සිත පොළඹවන සුළු දීමකින් යුතුවිය.

Hermione :- එය සැබෑ එකක් ද? එය වැඩ කරනවාද? ඒක නිකම් පැයක් ආපස්සට යන එකක් නෙමේනෙ.මේකෙන් ඊට වඩා දුර යන්න පුලුවන් නේද?

Harry:- තාම දන්නෙ නෑ.මට ඒක අත්හදා බලන්න හිතුනත් එක නුවණට හුරු දෙයක් නෙමෙයි කියල හිතුනා...

Hermione :- හරි,දැන් අපි ගාව ඒක තියෙනවනේ...

Harry :- ඒ වගේම ඔයාට විශ්වාසද ඔයා ලග මේක තියාගන්න ඕන කියල..

Hermione :- මට හිතෙන්නේ අපිට වෙන තීරණයක් නැහැ.බලන්න ඒක දිහා. මා ළඟ තිබුණු එකට හාත්පසින්ම වෙනස් නේ.

Harry :- පෙනෙන හැටියට නම් අපිට පොඩි කාලේ ඉඳන්ම මෝහනය කරන්න වෙයි වගේ

Hermione :- ඔයාගෙන් ලේ ගලනවා

හැරී ඔහුගේ මුහුණ කණ්නාඩියෙන් බැලුවේය. ඔහු තම නිල ඇඳුමින් තුවාලය පිස දැමුවේය.

Harry :- බයවෙන්න එපා ඒක පොඩි සීරීමක් විතරයි.

Harry :- ඔයා මගේ කාර්යාලයේ මොකද කරන්නේ හර්මයිනී??

Hermione :- මම ගල් ගැහුණා.තියඩෝර් නොට් ගැන අහන්න ලැබුණාම. මම හිතුවේ ඔයා ඔයාගේ පොරොන්දුව රකී ද කියලා මේ ලිපි වල වැඩ කටයුතුත් එක්ක.

Harry :- අනේ, මම එහෙම නෑ.. නෑ ..

Hermione :- නෑ..ඔයා එහෙම නෑ... හැරී ඔයා කොහොමද එක වැඩක්වත් කරන්නේ මේ අවුල් ජාලය අස්සේ...

හැරී ඔහුගේ යෂ්ටිය ගෙන ඉහලට ඔසවා සැලුවේය.පොත් සහ ලිපිගොණු නියමිත තැන්වලට පාවී ගොස් කාර්යාලය පිලිවෙල විය. හැරී මද සිනාවක් පෑවේය.

Harry :- ඔන්න දැන් හරි තව දුරටත් අවුල් ජාලයක් නෙමේ .

Hermione :- නෑ... තවමත් මම පිළිගන්නේ නෑ.. ඔයා දන්නවනේ මෙතන සිත් ඇදගන්නා සුළු දේවල් තියෙනවා...ඔයා දන්නවනේ හංගේරියාව හරහා කඳුකර අඟුටු මිට්ටෝ ග්‍රැප්හෝන්ස්ලා පැදගෙන යනවා.පිටේ පියාපත් වල පච්ච ගහගත්තු යෝධයෝ ග්‍රීක මුහුද තරණය කරමින් ඉන්නවා. ඒ වගේම නර වෘකයෝ සම්පූර්ණ පාතාලේ පුරාම ගැවසෙනවා...

Harry :- නියමයිනේ.. එහෙනම් අපි ඒ දිහාවට යමු.. මම කණ්ඩායමක් ලෑස්ති කරන්නම්..

Hermione :- හැරී මම තේරුම් ගත්තා..ලිපි වැඩ කටයුතු කම්මැලි කියලා...

Harry :- ඔයාට ඉතින් එහෙම නෑනේ ....

Hermione :- මම මගේ වැඩත් එක්ක ඇති තරම් කාර්යබහුල වෙලා ඉන්නේ.වොල්ඩමෝර්ට්ගේ යුද්දෙදි මේ මිනිස්සුයි මෘගයෝයි එකම පැත්තක ඉඳන් සටන් කලේ. එයාලා අඳුරේ මිත්‍ර පාක්ෂිකයන්. මේ දෙගොල්ලන් එකතු වෙන්න හදන එකෙනුයි තියඩෝර් නොට්ස් ගැනයි හිතුවාම මොනවහරි දෙයක් හැඟවෙනවා වගේනේ. ඒ උනාට මායාවියේ ප්‍රධානි තුමා තියඩෝර්ගෙ ලිපි ගැන තාම සොයා බැලුවේ නෑ..

Harry :- ඒ උනාට මට ඒක කියවන්න උවමනාවත් නෑ.. මට එළියේ කසුකුසු වලින් ඒකේ තියෙන දේවල් අහගන්න ලැබුණා.. ඔයා මට ඒ ගැන කියන්න එන්න ඕනේ නෑ..

හර්මයිනී හැරීගේ මුහුණ දෙස බැලුවා ය. මේකනම් පරිස්සමින් කරන්න ඕන...

Hermione :- ඔයාට ටොෆියජ් එහෙම කන්න ආස නැද්ද??රොන්ට නම් කියන්න එපා හොදේ...

Harry :- ඔය මාතෘකාව වෙනස් කරන්න හදනවා ...

Hermione :- මම ඇත්තටම කියන්නේ. ටොෆිය....

Harry :- බැහැ. අපි මේ වෙලාවේ පැණි රස දේවල් වලින් වැළකිලා ඉන්නෙ. (ශබ්දයක්) ඔයා දන්නවනේ ඔයා ඒවාට ඇබ්බැහි වෙන්න පුළුවන්....

Hermione :- මම මොනව කියන්නද.. මගේ දෙමව්පියෝ දන්ත වෛද්‍යවරුන්නේ.. මම ඉතින් පැණි සම්බන්ධ කාරණාවේදී එයාලා ල එක්කත් කැරලි ගහලා තියෙනවා..

අර හතලිස් දෙනා පොඩි වෙලාවක පමාවකින් කාරණාව අතැරලා දාවි. නමුත් ඔයා කලේ නියම වැඩක්. ඔයා ඉතින් මට ඒ ගැන කියන්න ඕනෙ නෑ... මට ඕනි ඔයාව ඔයාගේ ලිපි වල තියෙන වැඩකටයුතු ගැන මේ වෙලාවේ වගේම හැමතිස්සෙම හරියට කර ගන්නවද කියලා බලන්න.. මායා අමාත්‍යාංශයේ ගරු කටයුතු ලෙස සැලකීමක් විදිහට හිතාගන්නකෝ... වැලමිටෙන් හැරීට තට්ටුවක් දමන ගමන් ඇය පැවසුවාය...

කොහොමද ජිනීට? ඇල්බස්ට???

Harry :- මට පේන්නේ මම ලිපි කටයුතු කටයුතුවලටයි.. පීතෘත්වය කියන මාතෘකාව ටයි තියෙන්නේ සමාන දක්ෂකමක් ද කොහෙද... රෝස් ට කොහොමද? හියුගෝ ?

Hermione :- (දත් පෙන්නා විරිත්තමින්) ඔයා දන්නවද රොන් හිතන්නේ බොහෝ දුරට මම එයාගෙ බිරිඳට වඩා ලේකම්වරිය වගේ කියලා. ඔයා හිතන්නේ අපිට මොකක් හරි කාරණාවත් තියෙනවද තෝරාගැනීමක් හදා ගන්න අවස්ථාවක්.. නිකන් හරියට වසරේ හොඳම මව හෝ පියා නැත්නම් වසරේ හොඳම අමාත්‍යාංශ නිලධාරියා විදියට හරි... යන්න හැරී.. යන්න... ඔයාගේ ගෙදරට.. පවුල බලන්න.. හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් එක තව අවුරුද්දකට පිටත් වෙනවා. ගිහිල්ලා ඔයාගේ නැතිවුනු වෙලාව අරන් සතුටු වෙලා ඉන්න.

ඒ වගේම නැවත ඔයා ආයිම මෙහේ එනකොට ඔලුව ටිකක් සැහැල්ලු කරගෙන මේ ලිපි ගොනු ටික කියවල එන්න...

Harry :- ඔයා හිතන්නේ මේ ඔක්කොම දේවල් වලින් යම් දෙයක් හැඟ වෙනවා කියලද ??

Hermione :-(සිනාවක් සමග) එහෙම වෙන්න පුළුවන්. හැබැයි ඒක එහෙම උනත් අපිට පෙරලා සටන් කරන්න ක්‍රමයකුත් තියේවි. අපිට හැම වෙලාවෙම ක්‍රමයක් තියෙනවා නේ...

Hermione :- ඇය තවත් සිනාසෙන්නට විය.ටොෆියක් කටේ දාගෙන හපන ගමන් කාර්යාලයෙන් ඇය පිටත් විය.හැරී කාර්යාලය තනිවිය.ඔහුගේ බෑගය අසුරමින් සිටියේය. ඔහු කාර්යාලයෙන් පිට වී කොරිඩෝව දිගේ පහළට යන්නට විය. මුළු ලෝකයේම උගේ උරහිස් මත මෙන් විය.ඔහු මහන්සියෙන් දුරකථන කුටිය වෙත ගමන් කර 6 2 4 4 2 ලෙස අංක එබුවේය.

Telephone :- ආයුබෝවන් හැරී පොටර්..

එම මොහොතේ ක්ෂණිකව ඔහු අමාත්‍යාංශයෙන් අතුරුදහන් වී ගියේය.

---

පළමුවැනි ජවනිකාව 6වන දර්ශනය

හැරී සහ ජිනී පොටර්ගේ නිවහන

ඇල්බස්ට නිදා ගැනීම අපහසු වූ බැවින් ඔහු තරප්පු පෙළ මුදුනේ ඉඳගෙන සිටියේ ය. ඔහුට පහළින් කට හඬවල් කිහිපයක් ඇසෙන්නට වූ අතර ඔහු ඒ හැරී යැයි හඳුනාගැනීමට පෙර හැරීගේ කටහඬ ඇසෙන්නට පටන් ගත්තේ ය.. හැරී සමඟ රෝද පුටුවක වාඩිවී සිටි මහලු මිනිසෙකි. ඔහු ආමෝස් ඩිගරි වේ..

Harry :- ආමෝස්, මට තේරෙනවා. මට ඇත්තටම තේරෙනවා... ඒත් මම මේ ගෙදර ආවා විතරයි..

Amos :- මම අමාත්‍යාංශයේ අයත් එක්ක සාකච්ඡා කරන්න ඇපොයිමන්ට් එකක් දාගන්න උත්සාහ කළා.. එයාලා හැමදාම මට කිව්වේ,
"ආහ් මිස්ටර් ඩිගරි අපිට ඔයාගෙන් එපොයිමන්ට් එකක් තියනවා නේ.. අපි බලමු තව මාස දෙකකින් විතර.." ඉතිං
මම බලන් හිටියා ගොඩක් ඉවසීමෙන් ඒකට..

Harry :- මේ මහ රෑ මගේ ගෙදරට ඇවිත්, මගේ ළමයි අලුත් අවුරුද්දට පාසල් යන්න ඉන්නෙ ඩිගරි මහත්මයා... මේක නම් සාධාරණ වැඩක් නෙමෙයි...

Amos :- මාස දෙකක් ගත වුණා.. දවසක් මට බස්සෙක් ආවා.. ඒකෙ තිබුණෙ මොනවද කියලා ඔයා දන්නවද.? "මිස්ටර් ඩිගරි ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කරන්න වෙනවා. හැරී පොටර් මහත්මයා ඉතාමත් වැදගත් හදිසි රාජකාරි කටයුත්තක් සඳහා බැහැරව ගොස් සිටිනවා.. ඒ නිසා අපිට ඔබගේ වැඩේ ටිකක් කල් දාන්න වෙනවා.. ඔබ තවමත් ඇපොයිමන්ට් එකේ රැඳී සිටිනවා ද..?අපි තව මාස දෙකකින් බලමු"
ඒ පණිවිඩය නැවත නැවත කියවෙන්න ගත්තා.. ඔයා මාව නොසලකා හරිනවා හැරී පොටර්....

Harry :- ඇත්තටම එහෙම නෑ ..මම ඇත්තට ම ටිකක් කාර්යබහුල වුණා. නීති බලගැන්වීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හැටියට මට බය හිතුණා.. මම වගකියන්න ඕනනේ...

Amos :- ඔයා වගකියන්න ඕන දේවල් කීපයක්ම තියෙනවා...

Harry :- සමාවෙන්න... මොකක්ද කිව්වේ...?

Amos :- මගේ පුතා,සෙඩ්‍රික් ඔයාට මතකද සෙඩ්‍රික්.. මතකයි නේද..?

(සෙඩ්‍රික්ව මතක් කිරීම හැරීට වේදනා ගෙනදෙන්නක් විය.)

Harry :- ඔව්.. මට මතකයි ඔබේ පුතාව.. ඔහුව අහිමිවීම..

Amos :- වොල්ඩමෝර්ට්ට ඕනේ උනේ ඔයාව.. මගේ පුතාව නෙමේ.. ඔයාමයි මට ඒක කිව්වේ.. ඔහු කිව්වේ වැඩිපුර එකාව මරලා දාන්න කියලා.. වැඩිපුර එකාව... මගේ පුතා..

මගෙ ලස්සන කොලු පැටියා.. අන්තිමට වැඩිපුර එකෙක් වුනා.. කාගෙවත් අතකොළුවක් උනා...

Harry :- මිස්ටර් ඩිගරි ඔයා දන්න විදියට, මම කණගාටුව ප්‍රකාශ කරනවා සෙඩ්‍රික් ගැන මතක් කිරීමෙන් ඔබට දැනෙන මතකයන්, හැඟීම් වලට , ඒත්..

Amos :- මතකයන්....!!!! මට් තවදුරටත් මතකයන් ගැන කිසිම උනන්දුවක් නෑ.. මම දැන් වයසක මිනිහෙක්. මරණාසන්න වයසක මිනිහෙක්.. මම මෙහෙට ආවෙ ඔයාගෙන් අහන්න, ඔයාගෙන් බැගෑපත් වෙලා ඉල්ලන්න.. ඔහුව නැවත ගේන්න කියලා උදව් කරන්න...

(හැරී පුදුමයෙන් උඩ බිම බැලුවේය.)

Harry :- නැවත එයාව ගේන්න..!! ආමෝස් ඒක කරන්න අමාරු වැඩක්..

Amos :- අමාත්‍යාංශය සතුව කාල යන්ත්‍රයක් තියෙනවා, එහෙම නේද...??

Harry :- කාල යන්ත්‍ර ඔක්කොම විනාශ කළා...

Amos :- මම මෙච්චර හදිස්සියෙන් එන්න හේතු වුණු කාරණාව තමා.. මට ඇහුනු කටකතාව, ඒ බලවත් කටකතාව... අමාත්‍යාංශය නීති විරෝධී කාල යන්ත්‍රයක් තියඩෝර් නොට්ගෙන් අත්පත් කරගෙන තියාගෙන තියෙනවා, විමර්ශන කටයුතු සඳහා.. මට ඒ කාල යන්ත්‍රය පාවිච්චි කරන්න අවස්ථාව ලබා දෙන්න.. මට මගේ පුතාව නැවත මේ ලෝකෙට ගේන්න..

ඉන්පසු දිගු නිහැඩියාවක් පැතිරගියේ ය... මෙය ඉතාමත් බැරෑරුම් කටයුත්තක් බව හැරීට තේරුම් ගිය අතර ඇල්බස් හීන්සීරුවේ පඩිපෙලේ ටිකක් පහළට පැමිණ රහසින් ඊට කන්යොමා සිටියේ ය..

Harry :- ආමෝස් කාලය සමඟ සෙල්ලම් කිරීම...!!! අපිට ඒක කරන්න බෑ..

Amos :- ජීවත්වුණ ළමයා (හැරී-Boy who lived) වෙනුවෙන් මිනිස්සු කී දෙනෙක් තමන්ගේ ජීවිතය පූජා කලාද..? මම ඉල්ලන්නේ එයින් එක්කෙනෙක් බේරලා දෙන්න කියලා විතරයි...

මෙය හැරීට ඉතාමත් වේදනා ගෙනදෙන්නක් විය.. ඔහු කල්පනාවේ නිමග්නව සිටිය අතර ඔහුගේ මූණ දැඩි ස්වරූපයක් ගත්තේය..

Harry :- ඔයාට මොනවා ඇහුණත්,තියඩෝර් නොට් කියන්නේ ප්‍රබන්ධයක් විතරයි.. මට සමාවෙන්න...

Delphi :- හෙලෝ... කොහොමද...

ඇල්බස් එක්වරම පසෙකට පැන්නේ ය. අවුරුදු විස්සක පමණ ධෛර්යවන්ත මුහුණක් තිබූ කාන්තාවක් ඔහු අසළින් මතුවිය. ඇය පඩිපෙළ හරහා ඔහු දෙස බලා සිටියේ ය.

Delphi :- ඔහ්.. සමාවෙන්න බය කරන්න හිතුවේ නෑ.. මගේ හිතේ හැටියට මෙතන ලොකු "පඩිපෙල් ඇහුම්කන්දෙන්නෙක්" ඉන්නවා වගේ.. මම මේ අතන ඉඳගෙන හිටියේ කාත් එක්ක හරි ටිකක් ආස හිතෙන දෙයක් ගැන කතා කරන්න..

ඇය හිඳසිටි ස්ථානය පෙන්වමින් කීවා ය.

Albus :-ඔයා කවුද..? එක්තරා විදිහකට ගත්තම.. මේක මගේ ගෙදර... ඒ වගේම..

Delphi :- මම හොරෙක්..ඇත්ත වශයෙන්ම කිව්වොත් මම ආවේ ඔයා සතු හැමදේම හොරකම් කරන්න..
"දෙනවා මට ඔයාගේ ඔක්කොම රත්තරන් ටිකයි මායා යෂ්ටි ටිකයි... චොකලට් ගෙම්බො ටිකයි..."
(ඇය දරුණු ලෙස ඇල්බස් බලා සිනාසෙන්නට විය.)
කියන්න අමතක උනා. මම ඩෙල්ෆිනි.. ඇය පඩිපෙලෙන් නැගිට අත දිගු කළා ය..
ඩෙල්ෆිනි ඩිගරි.. මම ආමෝස්ක බලාකියා ගන්නවා..
ඇත්තටම.. මම එහෙම කරන්න උත්සාහ කරනව..(ඇය ඩිගරිව පෙන්වමින් කීවාය..)
එතකොට ඔයා..?

Albus :- (පසුතැවිල්ලෙන් දත නියවමින්) මම ඇල්බස්...

Delphi :- ඇත්තෙන්ම....ඇල්බස් පොටර්,ඒ කියන්නේ හැරී ඔයාගේ තාත්තා, ඒක නම් ටිකක් නියමයි.. එහෙම නේද..??

Albus :- ඇත්තටම නෑ....

Delphi :- අහ්..!! මට එහෙට ඔලුව එහෙම දාගන්න පුළුවන් වෙයිද දන්නෙ නෑ.. එයාලා මට ඉස්කෝලෙදි මොකක් කියලා කතා කරයිද දන්නෑ.. ඩෙල්ෆිනි ඩිගරි... මට හාරන්න තරම් වලක් නම් එහෙම නැතුව ඇති..නේ.. (Dig යනු ඉංග්‍රීසියෙන් හෑරීමයි.. ඉතින් Diggory කියලා වලවල් හාරන එක කියලා විහිලු කිරීමක් ගැන කියන්නෙ හොදේ..)

Albus :-එයාලා මගේ නමටත් කියන්න පුළුවන් හැම විදිහෙන් ම විහිළු කළා..

මද නිහැඩියාවක් අතරතුර ඇය ඇල්බස්ගේ මුහුණ දෙස පරීක්ෂාකර ලෙස බැලුවා ය.

Amos :- ඩෙල්ෆි.....

ඇය යාමට සැරසී නැවත කල්පනා කර ඇල්බස් දෙස බලා සිනාසුනා ය...

Delphi :- අපි කාටද අයිති වෙන්නේ කියලා අපි තෝරන්නේ නැනේ.. එහෙම නේද..? ආමෝස්.. ඒ මගේ ඉවසීම නෙමේද..? එයා මගේ මාමා.. ඒකයි හේතුව මම upper flagley වල සේවය කරන්න.. ඒ වුනාට ඒ වැඩේ අමාරුයි... අතීතයේ මතකයන් එක්ක හිරවුනු මිනිස්සු එක්ක ජීවත් වෙන එක... එහෙම නේද..??

Amos:- ඩෙල්ෆී....

Albus :- upper flagley කිව්වෙ..?

Delphi :- වයසක මායාකරුවන් හා මායාකාරියන් සඳහා වන St.ඔස්වල්ඩ්ගේ ගෙදර.. වෙලාවක එන්න අපිව බලලා යන්න.. ඔයා කැමති නම් විතරක්..

Amos :- ඩෙල්....ෆී...ලමයෝ....

ඇය සිනාවක් පාමින් හැරී සහ ආමෝස් සිටි කාමරයට ඇතුළු විය.. ඇල්බස් ඇය දෙස බලා සිටියේය..

Delphi :- ඔව් මාමේ..

Amos:- හමුවෙන්න ශ්‍රේෂ්ඨ හැරී පොටර්. දැන්නම් මෙයා අමාත්‍යාංශයේ දරදඬු පුද්ගලයෙක්.. මම ඔයාට නිදහසේ ඉන්න දීලා යන්නම්කෝ හැරී මහත්තයෝ.. ඔයා ඒකට කියන හරි නම "නිදහස" නම්.. ඩෙල්ෆ්..මගේ රෝදපුටුව

Delphi :- හා හරි මාමේ..

ආමෝස් තම රෝදපුටුව තල්ලු කරගෙන කාමරයෙන් එළියට ගිය පසු හැරී කාමරයේ තනි විය... ඔහු අනාථ වූවාක් මෙන් විය.. ඇල්බස් එදෙස බලාගෙන සැලකිල්ලෙන් කල්පනා කරමින් සිටියේ ය..

___



🟤පළමුවැනි ජවනිකාව 7වන දර්ශනය

🏠හැරී සහ ජිනී පොටර්ගේ නිවහන ඇල්බස්ගේ කාමරය🏠

ඇල්බස් ඇඳේ නිදාගෙන සිටියි. ඔහුට මුළු ලෝකයම තම කාමරයේ දොරින් එපිටට ගොස් ඇත.ජේම්ස්ගේ කෑගැසීමක් ඇසේ.

Ginny :- දෙයියනේ ජේම්ස් කරුණාකරලා ඔයාගේ කොන්ඩේ ගැන හිතන් නැතුව ඉන්න. මේ ජරා කාමරය අස් කරගන්න.

James :-මම කොහොමද මගෙ කොණ්ඩෙ ගැන හිතන්නේ නැතුව ඉන්නෙ.ඒක රෝස පාටයි.ඒක රෝස පාටයි...නේ.මට මගේ නොපෙනෙන ලෝගුව පාවිච්චි කරන්න වෙනවා මේක වහගන්න නම්....

ඔහු දොර අසලින් පෙනෙන්නට විය.ඔහුගේ හිසකෙස් රෝස පාටය.

Ginny :- ඒකට නෙමෙයි...ඔයාගෙ තාත්තා ඔයාට නොපෙනෙන ලෝගුව දුන්නේ..

Lilly :- කවුද මගේ මායා බෙහෙත් වට්ටෝරු පොත දැක්කේ....

Ginny :- ලිලී පොටර්!!!මම හිතන්නේ ඔයා ඕවා හෙට ඉස්කෝලෙට ඇඳගෙන යන එකක් එකක් නෑ නේද??

ලිලී ඇල්බස්ගේ දොර ගාව සිටියාය.ඇය සුරගන පියාපත් දෙකක් සවි කරගෙන ඒවා සොලවමින් සිටියාය.

Lilly :- මම ඒවට ආදරෙයි.ඒවා ලස්සනට සැලෙනවා...☺☺☺☺

ඇය දොර දෙසින් මෑත් වනවාත් සමගම හැරී දොර තුළින් මතු වූයේය වූයේය.ඔහු කාමරය හරහා ඇල්බස් දෙස බැලුවේය..

Harry :- හායි!!!

ඔවුන් දෙදෙනා අතර නුහුරු නිහැඬියාවක් ඇතිවිය.ජිනී දොර අසලින් යන්නට විය. ඇයට සිදුවන්නේ කුමක්දැයි තේරුම් ගියාය. ඇය මොහොතක් එතැන රැඳී සිටියාය.

Harry :- මම මේ හොග්වෝර්ට්ස් යන්න කලින් දෙන තෑගි බෙදන ගමන් හිටියේ.මේ....තෑග්ග ඔයාට, මේක රොන් එවලා තියෙන්නෙ.

Albus :- හරි මම මායා බෙහෙත් වට්ටෝරු වලට කැමති නෑ...හරිනේ.

Harry :- මම හිතන්නේ ඒක එක්තරා විදිහක විහිලුවක් එහෙම නේද?හරි... මම දන්නෑ ඒ මොකක් කිව්වද කියලා.. ලිලීට පඩ අරින බහිරවයෝ වගයක් ලැබිලා.ජේම්ස්ට පනාවක් හම්බවෙලා පීරුවම කොන්ඩේ රෝස පාට වෙන..හොඳයිනේ...රොන්..රොන් තමා ඉතින් දවසකට හරි මිනිහා.ඔයා දන්නවද?

හැරී ඇල්බස්ගේ ආදර වශිය සහිත මායා බෙහෙත් බෝතලය ඇඳ උඩ තැබුන ගමන් පැවසුවේය..

Harry :- ම්.. ම්..ඒ වගේම මේක මගෙන් ඔයාට.

ඔහු කුඩා බ්ලැන්කට්ටුවක් පෙන්වීය.ජිනී එදෙස බලා සිටියාය. හැරී ඇල්බස් සමඟ කතා කිරීමට උත්සාහ කරමින් සිටින බව තේරුම් යාමත් සමග ඇය එතැනින් නික්ම ගියාය.

Albus :- මොකක් පරණ බ්ලැන්කට්ටුවක්!!

Harry :- මම ගොඩක් හිතුවා.මේ අවුරුද්දේ ඔයාට මොනවද දෙන්න ඕන කියලා.ජේම්ස් නොපෙනෙන ලෝගුව ගැන දන්න කාලේ ඉඳන්ම ඒ ගැන කියව කියව හිටියෙ..ලිලී ඒ සුරඟන පියාපත් වලට කැමති..නමුත් ඔයා, ඔයාට දැන් අවුරුදු 14 ක් වෙනවා.ඉතිං ඔයාට මොනවා හරි අර්ථයක් තියෙන දෙයක් දෙන්න හිතුවා.මේක...මේක මට මගේ අම්මාගෙන් ලැබුණු අන්තිම දේ..මාව ඩර්ස්ලිලාට දෙනකොට අන්තිමට පොරවලා තිබුන දේ..මම හිතුවේ ඒක සදහටම නැතිවෙලා ගිහින් කියලා.නමුත් ඊට පස්සේ මගේ පෙටූනියා පුංචි අම්මා මැරුණහම එයා රහසේ හංගලා තියාගත්තු දේවල් අතර මේක තිබිලා.පුදුමෙ කියන්නෙ ඩඩ්ලි ඒක හොයාගෙන නොපමාව මා වෙත එවා තිබුණා.එදා ඉඳන් මම...අද වෙනකන් මට වාසනාව ඕන වෙලාවක මම මේක හොයාගෙන ටික වෙලාවක් අල්ලගෙන ඉන්නවා.. මම හිතනවා ඔයත්..

Albus :- මම ඒක අල්ලගෙන ඉන්න ඕන කියල.. එහෙම නේ....හරි එහෙනම් අපි හිතමු ඒක මට වාසනාව ගෙන ගෙනේවි කියලා.මට ඇත්තටම වාසනාව ටිකක් ඕනේ.

ඔහු බ්ලැන්කට්ටුව ඇල්ලුවේ ය

Harry :- නමුත් ඔයා ඒක තියාගන්න ඕනෙ

මම...නම් හිතන්නේ පෙටූනියා පුංචි අම්මා ඒක තියාගත්තෙ මට ඒක දෙන්න වෙන්න ඇති.ඒ නිසා දැන් මට ඕනේ ඒක ඔයාට දෙන්න.මම මගේ අම්මා ගැන මම වැඩි දෙයක් දන්නෙ නෑ.නමුත් මම හිතනවා ඇයත් ඔයාට මේක ලැබෙන්න ඕන ඇති කියලා හිතන්න ඇති. ඒ වගේම සමහර විට halloween සැන්දෑවේදී මට ඔයාව හොයාගන්න පුළුවන් වුණොත්...මම කැමතියි එයාලා මැරුණු දවසෙ ඔයා මේකත් එක්ක ඉන්නවනම්..ඒ වගේම ඒක අපි දෙන්නටම හොඳ වේවි..

Albus :- මේ අහන්න..මට ගොඩක් අසුරගන්න බඩු තියෙනවා.ඒ වගේම මට සහතික වශයෙන් කියන්න පුළුවන් ඔයාට හිස මුදුනට අමාත්‍යාංශයේ වැඩ ගොඩ ගැහිලා ඇති කියලා..ඉතින්...

Harry :- ඇල්බස් මට ඕනි උනේ ඔයාට බ්ලැන්කට් එක දෙන්න..

Albus :- ඉතිං මම මේක එක්ක මොනවා කරන්නද??!!සුරගන තටු, නොපෙනෙන ලෝගුවෙන් වැඩක් ගන්න පුළුවන්.. නමුත්, මේකෙන්, ඇත්තටම තාත්තේ !!!

හැරීගේ හදවත පෑරී ගියේය.ඔහු ඔහුගේ පුතා දෙස බලාපොරොත්තු සුන්වූ ලෙස බැලුවේය...

Harry :- මගෙන් උදව්වක් එහෙම ඕනෙද. බඩු ඇසුර ගන්න. මම හැමවෙලේම බඩු අසුරන්න කැමතියි..මම කියන්නේ ප්‍රිවෙට් ඩ්‍රයිව් වල ඉඳලා හොග්වෝර්ට්ස් වලට යනකොට.මොකක් උනත්...හරි මම දන්නව ඔයා ඒකට කැමැති නෑ කියලා...නමුත්,

Albus :- ඔයාට නම්,ඒක මේ ලෝකේ ගොඩක්ම වටින තැන වෙන්න.ඇති අසරණ අනාථයා...ඔයාගේ මාමයි නැන්දයි උස්මහත් කරපු...

Harry :- ඇල්බස් කරුණාකරලා...අපිට පොඩ්ඩක්,

ඊට පස්සේ ...එක පාරක් ඔයාගේ ඥාති සහෝදරයා භූතාරක්ශකයන්ට අහු වෙලා කම්පනයට පත් වුනා...පස්සේ එයාව හොග්වෝර්ට්ස් වලින් බේරගත්තා...මම ඕක දන්නවා තාත්තේ...බ්ලාහ්..බ්ලාහ් ...බ්ලාහ්

Harry :- මම ඔයාගේ පෙළඹවීම වැඩි කරන්න හදන්නෙ ඇල්බස් පොටර්...

Albus :- අපි ඔක්කෝවම බේරගන්න ගියපු අසරණ අනාථයා.. ඉතින් මට කියන්න පුළුවන්ද මායාකාරයෙක් විදිහට ඔයාගේ වීර ක්‍රියාවට කොහොමද අපි ගරු කරන්න ඕනේ කියලා... අපි ඔයාට හිස නමා ආචාර කරන්න ඕනෙද!!! එහෙම නොකලොත් අපිව ශාපලත් අය වෙනවද??

Harry :- ඇල්බස් කරුණාකරලා ඔයා දන්නවනේ...ඒකට මට කෘතඥතාවක් ඕනේ නෑ කියලා...

Albus :- නමුත් මේ මොහොතේ මට ඉවවහා ගිහිල්ලා තියෙන්නේ ඒකත් එක්ක... මම හිතන්නේ මට එහෙම වෙන්න ඇත්තේ ඔයා දුන්න ජරා බ්ලැන්කට් එක නිසා වෙන්න ඇති..

Harry :- ජරා බ්ලැන්කට්ටුව!!!

Albus :- නැතුව ඔයා ඉතිං හිතුවේ මොකක් වෙයි කියලද?අපි වැළඳගනී කියලද? වැළඳගෙන මම ඔයාට හැමදාම ආදරෙයි තාත්තේ කියලා කියලා කියයි කියලද..නැත්නම් මොකක්ද...මොකක්ද....

අවසානයේ ඔහුගේ තරහ ඇවිස්සී ගියේය

Harry :- ඔයා දන්නවද මොකක්ද කියලා, මම ඔයාගේ අසතුටට හේතු වන වැඩ කරලා ඇති තමා.ඒ වුනත් අඩුම තරමේ ඔයාට තාත්තා කෙනෙක්වත් ඉන්නවා මොකද මට එහෙම කෙනෙක් ඒ කාලේ හිටියේ නෑ හරිද....

Albus :- ඉතිං ඔයා හිතන්නේ ඒක වාසනාවක් කියලද!!!මට නං එහෙම නෑ...

Harry :- ඔයා ප්‍රාර්ථනා කරන්නේ මම මැරුණා නම් හොඳයි කියලද???

Albus :- නෑ!!!මම ප්‍රාර්ථනා කරන්නේ ඔයා මගේ තාත්තා නොවුනනම් කියලා...

Harry :- (මුහුණ රතු වී)හොඳයි,මටත් කාලයක් තිබ්බ ඔයා මගේ පුතා නොවුනනම් කියල හිතුන....

නිහැඬියාවකි.ඇල්බස් බලාසිටියේය.හැරී ඔහුට පැවසුවේ කුමක්ද කියා තේරුම් ගත්තේය...

Harry :- නෑ මම අදහස් කලේ ඒක නෙමෙයි

Albus :- ඔයා ඒක තමයි කිව්වේ

Harry :- ඇල්බස් ඔයා මගේ හිත රිද්දන්න හොඳට දන්නවනේ...නේ...

Albus :- ඔයා අදහස් කළේ ඒක තමයි තාත්තේ.ඒ වගේම අවංකවම මම ඔයාට ඒකට බනින්නේ නෑ..

දැඩි නිශ්ශබ්දතාවක්

Albus :- ඔයා දැන් මට තනියෙන් ඉන්න දීලා ගියොත් හොඳයි

Harry :- ඇල්බස්.. කරුණාකරලා...

ඇල්බස් බ්ලැන්කට්ටුව ගෙන එය විසි කළේය.එය ආදර වශියේ වැදී එය පෙරලි බ්ලැන්කට්ටුව සහ ඇඳ පුරා හැලී ගියේය. එයින් කුඩා දුමාරයක් නිදහස් විය.

Albus :- දැක්කනේ කිසිම ආදරයක්, වාසනාවක් මට නෑ.

ඇල්බස් කාමරෙන් එළියට දිව්වේ ය. හැරී ඔහු පසුපස ගියේය.

Harry :- ඇල්බස්...ඇල්බස් ...කරුණාකරලා

---

පළමුවන ජවනිකාව 8වන දර්ශණය

😌සිහිනය,ගල මත කුඩා නිවහන🏠

එක්වරම විශාල පිපිරීමක්,ඉන්පසු මහ හඬින් යමක ගැටෙන හඬක්,ඩඩ්ලි ,පෙටූනියා පුංචි අම්මා,වර්නන් බාප්පා ඇඳ පිටුපසට ගොස් සැඟවී ගත්හ.

Dudley :- අම්මේ,මම නම් මේකට කැමැති නෑ.

Petunia :- මම දන්නවා,අපි මෙහෙට ඇවිත් කරගත්තේ ලොකු වැරැද්දක්.වර්නන් අපිට හැංගෙන්න කිසිතැනක් නෑ.අඩුම තරමින් ප්‍රදීපාගාරයටත් යන්න බෑ..දුර වැඩි නිසා.

නැවතත් විශාල පිපිරීමක්...

Vernon :- ඔහොමම ඉන්න.ඔහොමම ඉන්න ඒක මොකක් උනත් ඒක මෙතනට එන්නෙ නෑ...

Petunia :- අපිව ශාපයකට අහුවෙලා.එයා අපිට ශාප කරලා.අර ළමයා අපිට ශාප කරලා.

තරුණ කොලුවා දෙස බලමින්

මේක සම්පූර්ණයෙන්ම ඔයාගේ වැරැද්ද.යනවා තමුසේ අර මුල්ලට...

හැරී වර්නන් බාප්පා රයිෆලය අතට ගත් සැටි දැක තවත් මුල්ලට වී ගුලි විය..

Vernon :- කවුරු හිටියත් මම අනතුරු අඟවනවා මම සන්නද්ධ වෙලා ඉන්නේ...

එක්වරම අතිවිශාල තඩිබෑමක් ඇසුණි. එමගින් දොර අසව් වලින් ගැලවී බිම පතිත විය.එයින් මතු වූයේ විශාල ශරීරයක් හිමි යෝධ හැග්‍රිඩ්ය.ඔහු කාමරයේ සිටි සියලු දෙනාම දිහා බැලුවේ ය.

Hagrid :- කාටවත් මට තේ එකක් එහෙම පිළිගන්වන වුවමනාවක් නැද්ද!! මොකද ඒක ගොඩක් දුෂ්කර ගමනක්...

Dudley :- බලන්නකෝ!!!ඒකා දිහා...

Vernon :- පස්සට වෙන්න..පස්සට වෙන්න.. මගේ පස්සට වෙලා ඉන්න.. පෙටූනියා ඔයත් පිටිපස්සට වෙලා ඉන්න.බය වෙන්න එපා ඩඩ්ලි...මම ඉක්මනටම මේ විකෘතියා මෙතනම ඉවර කරලා දාන්නම්...

Hagrid :- විකෘති...මොකක්..කිව්වා..!!!

ඔහු වර්නන් බාප්පාගේ රයිෆලය උදුරා ගත්තේය..

Hagrid :- මේ වගේ එකක් කාලෙකින් දැක්කේ නෑ.ඔහු තුවක්කු බටයේ ඉදිරි කෙළවර නමා එය අඹරා ගැටයක් හැදුවේය.

අනේ හපොයි!!!

එක්වරම ඔහු මවිත විය.ඔහු තවමත් යෞවන වියෙහි පසුවූ හැරීම දුටුවේය.

Hagrid :- හැරී පොටර්!!!!!

Young harry :- හෙලෝ...

Hagrid :- අන්තිමට අන්තිම පාරට මම ඔයාව දකිනකොට ඔයා අත දරුවෙක්..ගොඩක් දුරට තාත්තගෙ මූණ...නමුත් ඒව...ඒවානම් අම්මගේ ඇස්මයි...

Young harry :- ඔයා මගේ දෙමව්පියන්ව දැනගෙන හිටියද!!!

Hagrid :- අයියෝ කොහෙද මගේ මේ ආචාරවිධි....සුහම සුභ උපන්දිනයක් වේවා!! ඔයාට යමක් ගෙනාවා..සමහර විට මට පොඩ්ඩක් ඒක යටවෙලා තැලිලා එහෙමඇති. ඒ උනාට රසය නම් කිසිම වෙනසක් වෙලා නැතුව ඇති...

ඔහු තම කබාය තුලින් චොකලට් වලින් අයිසින් කළ happy birthday harry ලෙස කොළ පාට අයිසින් වලින් ලියූ කේක් එකක් එලියට ගත්තේය ...

young harry :- ඔයා කවුද

Hagrid :- සිනාසෙමින්,

ඇත්ත,මම කවුද කියලා හඳුන්වල දුන්නෙ නෑනෙ..රූබියස් හැග්‍රිඩ් හොග්වෝර්ට්ස් වල යතුරු සහ වතු බලා ගන්නා..ඔහු වටපිට බැලුවේය

කෝ එතකොට මගේ තේ එක...මට තේ එකක් තරම් ඒ වෙලාවේ ඇඟට හයියක් දෙන වෙන මුකුත් නෑ...මොකුත් හිතන්නේ නැත්නම් තේ එකක්....

Young harry :- හොග්.!!!..කොහේ කියලද කිව්වේ...

Hagrid :- හොග්වෝර්ට්ස් !!!ඔයා හොග්වෝර්ට්ස් ගැන ඔක්කොම දන්නවනේ!!

Young harry :- ස..ස..සමාවෙන්න,නෑ මොකුත් දන්නෙ නෑ.

Hagrid :- සමාවෙන්න!!!එයාලයි සමාව ඉල්ලන්න ඕනේ.මම දැනගෙන හිටියා කොහොමත් ලියුමක් නම් ලැබෙන එකක් නෑ කියලා.ඒ වුණාට මම කීයටවත් හිතුවෙ නෑ ඔයා හොග්වෝර්ට්ස් ගැන නොදැන ඉඳීවි කියලා.හයියෙන් අඩන්නයි වටින්නේ.ඔයාට කවදාවත් පුදුම හිතුනේ නැද්ද ඔයාගේ දෙමව්පියෝ මේවා කොහෙන් ඉගෙන ගත්තද කියලා...

Young harry :- ඉගෙනගත්ත මොනවද...

හැග්‍රිඩ් තර්ජනාත්මක ලෙස වර්නන් බාප්පා දෙස බැලුවේය...

Hagrid :- ඔයා මට කියන්නේ මේ ඉන්න ළමයා.... මේ ලමයා...කිසිම දෙයක්.

.කිසිම දෙයක් ගැන දන්නෑ කියලද...

Vernon :- මම ඔයාටත්,මේ ළමයාට මුකුත් කියන්න ඉඩ දෙන්නේ නෑ...

young harry :- මට කියන්නෙ මොකක්ද කියලා

හැරී වර්නන් බාප්පා සහ හැග්‍රිඩ් දෙස මාරුවෙන් මාරුවට බැළුවේය....

Hagrid :- හැරී ඔයා මායාකරුවෙක්.ඔයා හැම දේම වෙනස් කලා..ඔයා තමා ගොඩක්ම ජනප්‍රිය මායාකාරයා මායා ලෝකයේ...

කාමරයේ සෑම තැනකින්ම,අඳුරු මුලු වලින් පවා මිමිනීමක් ඇසෙන්නට විය.එම මුමුණුවේ වදන් කියවුනේ නොවරදින කටහඬකිනි ...

වොල්ඩමෝර්ට්ගේ කටහඬ...

Voldermort :- හැ...රී...පො..ට..ර්....

______________________________________________



🌑පලමුවන ජවනිකාව, 9වන දර්ශණය

🏠හැරි සහ පොටර් ගේ නිවස,නිදන කාමරය🏠

හැරී හදිසියේම වේගයෙන් හුස්ම ගනිමින් එක්වරම නින්දෙන් නැගිට්ටේය.

ඔහු ටිකක් වෙලා ඒ සිටි ලෙසටම සිටියේය.ඔහු ඔහුව සන්සුන් කර ගැනීමට උත්සාහ කලේය.මොහොතක් ගතවූ තැන ඔහුට ඔහුගේ නළලේ තිබූ කැලල රිදුම් දෙන්නට විය.ඔහු වටා අඳුරු මායාවන් පා වෙන්නාක් මෙන් ඔහුට දැනුණි.

Ginny :- හැරී!!!

Harry :- මම හොඳින්.ඔයා නිදාගන්න..

Ginny :- ලූමෝස්...

මුලු කාමරය ඇගේ යෂ්ටියෙන් නිකුත් වූ එළියෙන් ආලෝකමත් විය.හැරී ඇය දෙස බලා සිටියේය.

Ginny :- නපුරු හීනයක් ද??

Harry :- ඔව්

Ginny :- මොකක් ගැනද!!

Harry :- ඩර්ස්ලිලා ගැන.හරි,ඒ හීනේ එයාලගෙන් තමයි පටන් ගත්තේ ,ඒ වුණාට අන්තිමට ඒක වෙනම දෙයක් වුනා..

Ginny :- ඔයාට නින්ද යන්න මම මොනවහරි දෙන්නද...

Harry :- නෑ,මම හොඳින් ඔයා නිදාගන්න..

Ginny :- ඔයා හොඳින් නෙමේ වගේ පේන්නේ හැරී...

හැරී කිසිවක් පැවසුවේ නැත.

ඔහුගේ මුහුණින් කැළඹුනු ස්වරයක් පෙනුණි.

Harry :- මට පේන්නේ ආමෝස් ඩිගරි එක්ක ලේසි වෙන්නේ නෑ...

මට මගේ තරහ එක්ක ගනුදෙනු කරන්න පුළුවන්.ඒ උනාට වැඩේ තියෙන්නේ එයා කියන කියන කාරණාව තිත්ත උනත් ඇත්ත.ආමෝස්ට පුතා නැති වුණේ මම නිසානේ...

Ginny :- ඒකෙන් පේන්නේ නෑ සම්පූර්ණයෙන්ම ඒක ඔයාගේ වැරැද්දක් කියලා...

Harry :- ඉතින් මම හරි කියලා කියන්න මට කිසි දෙයක් නෑ.මට කිසිම කෙනෙක්ට කියන්න දෙයක් නෑ...එහෙම නෑ කියන්නේ...ඒක තමා වැරැද්ද...ඇත්තෙන්ම

ඔහු මේ පවසන්නේ කුමක්ද,කවුරුන් ගැනදැයි ජිනී දැනගෙන සිටියාය.

Ginny :- එතකොට ඒක තමා කනස්සල්ලට හේතුව.ඇල්බස් හොග්වෝර්ට්ස් යන්න කලින් රාත්‍රිය...ඒක නේද හේතුව...ඔයාට යන්න ඕනෙ උනේ නැත්නම් ඒක කොහෙත්ම නරක රාත්‍රියක් නොවෙන්න තිබ්බා...බලැන්කට්ටුව දෙන්න උත්සාහ කරපු එක...ඒක හොඳ උත්සාහයක්...

Harry :- ඒක හොඳට කෙරීගෙන ගියා. පස්සෙ තමා...මම...මම යමක් එයාට පැවසුවා.

Ginny :- මට ඇහුනා.

Harry :- ආහ්!!!ඔයාට ඇහුනා!!!
නමුත් ඔයා තවමත් මාත් එක්ක හොඳින් කතා කරනවනේ...

Ginny :- මම දන්නවා වෙලාව ආවම ඔයා සමාව ගනී කියලා. ඔයා ඉතින් ඒ දේ නෙමේ නේ අදහස් කළේ.ඔයා සමහරවිට අර්ථයක් එක්කනේ ඒක කියන්න ඇත්තේ.අනිත් එක ඔයා එයාට අවංක වෙන්න ඕන හැරී,එච්චරයි එයාට ඕනෙ...

Harry :- මම ප්‍රාර්ථනා කරනවා එයා ගොඩක් දුරට ලිලී සහ ජේම්ස් වගේ උනානම් කියලා....

Ginny :- හොඳයි ඒ උනාට ඔය වගේ දේවල් කියන්න් තරම් අවංක වෙන්න එපා...

Harry :- නෑ..මට ඔහුගේ දෙයක් වෙනස් කරන්න බැරි වේවි ගොඩක් දුරට...නමුත් මට එයාලව තේරුම් ගන්න පුළුවන්...

Ginny :- ඇල්බස් වෙනස් තමයි...ඉතින් ඒක හොඳ දෙයක් නෙමේ ද..ඒ වගේම එයාට කියන්න පුළුවන්,ඔයා දන්නවනේ,ඔයා ඔයාගේ හැරී පොටර් චරිතය ආරූඪ කර ගත්තම...නමුත් එයාට ඕනෙ ඔයා ආරූඪ කරගන්න හැරී පොටර්ව නෙමේ..ඔයාගෙ ඇතුලේ ඉන්න කෙනාව දකින්න...

Harry :- "ඇත්ත කියන දේ ලස්සනයි පුදුමාකාරයි ,ඒ උනාට භයානක දේ තමා, ඒවා පිළිගැන්වෙන්නේ භයානක ඵලවිපාකත් එක්ක..."

ජිනී ඔහු දෙස පුදුමයෙන් බැලුවාය

Ginny :- ඩම්බ්ල්ඩෝර්...එයා නේද ඕක කිව්වේ...

ළමයෙක්ට කිව්ව පුදුම හිතෙන දෙයක්!!!

Harry :- ඔයාලා ඒ ළමයාව විශ්වාස කළ නිසා නේ,ලෝකය බේරගන්න ඒ ලමයා ජීවිතය පවා පරදුවට තිබ්බේ...

හැරී නැවතත් අමාරුවෙන් හුස්ම ගනිමින් සිටියේය.ඔහුට ඔහුගේ අතින් නලලේ කැළල ඇල්ලීමට ද නොහැකි තරම් විය.එය එතරම් රිදුම් දෙන්නට විය...

Ginny :- හැරී!!!මොකක්ද වෙන්නේ...

Harry :- හොඳින්,මම හොඳින්...මට ඔයාව ඇහෙනවා.මම උත්සාහ කරන්නේ...

Ginny :- ඔයාගේ කැළල රිදුම් දෙනවද??

Harry :- නෑ..නෑ..මම හොඳින්, දැන් අපි නිදාගන්න බලමු...

Ginny :- හැරී ඔය කැළල රිදෙන්න අරන් කොච්චර කල්ද??

හැරී ජිනී දෙසට හැරුණි.එයට පිලිතුර ඔහු මුවින් පවසීමට පෙර මුහුණෙන් එය පවසා හමාරය...

Harry :- අවුරුදු විසි දෙකක්!!!!

🔴පළමුවන ජවනිකාව, 10වන දර්ශණය

🚂 හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් 🚂

ඇල්බස් දුම්රිය තුලින් ඉක්මනින් ඇවිදගෙන යමින් සිටියේය...

Rose :- ඇල්බස් මම ඔයාව හොය හොයාමයි හිටියේ...

Albus :- මාව!!!ඇයි ??

රෝස් කියන්න ආ කාරණාව කෙසේ ගලපා ගන්නේ දැයි තේරුම් ගනිමින් සිටියාය...

Rose :- ඇල්බස්, මේ 4වන අවුරුද්ද ආරම්භ වෙන්නේ.ඉතිං අලුත් අවුරුද්දේ අලුත් ආරම්භයක් විදියට මට ආයෙම අපි දෙන්නා යාළුවො විදියට ඉන්න ඕන..

Albus :- අපි කවදාවත් යාලුවෝ වෙලා හිටියේ නෑ...

Rose :- හරි නරකයි!!!මට අවුරුදු 6දි හොඳම යාළුවා උනේ ඔයානේ...

Albus :- ඒ ඉතින් ගොඩකාලෙකට කලින්නේ...

ඔහු නැවත ඇවිද යන්නට සැරසුණේය. එක්වරම ඇය ඔහුව හිස් දුම්රිය කුටියකට ඇද ගත්තාය..

Rose :-ඔයාට කටකතා ඇහුනද??
ප්‍රධාන අමාත්‍යාංශයේ මේ ලඟදි වැටලීමක් කරලලු.ඔයාගේ තාත්තාත් නිර්භීත ලෙස ඒ රාජකාරියේ පෙනී ඉඳලා තියෙනවා..

Albus :- ඔයා කොහොමද හැම වෙලේම මේ දේවල් ගැන දැන ගන්නෙත්,ඒ වගේම මම නොදැන ඉන්නෙත්?????

Rose:- එයාලා වටලලා තියෙන්නේ කාගේ ගෙදරද දන්නවද තියඩෝර් නොට් කියන මායාකාරයාගේ ගෙදරලු.. එයා ළඟ එක්තරා විදියක නීතිවිරෝධී මානවකෘති වගයක් සහ නීති විරෝධි දේවල් තිබිලා තියෙනවා.තව එයා නීති ගොඩක් කඩකරලලු.ආහ්..හොඳම දේ තමයි..එයාලා එයාව අල්ලගන්න කොට එයාළඟ නීති විරෝධී කාල යන්ත්‍රයක් තිබිලලු..ඒ වගේම ඒක ඉස්තරම්ම වර්ගයේ වැඩි දියුණු කල එකක්ලු...

ඇල්බස් රෝස් දිහා බැලුවේ ය.දැන් ඔක්කොම තොරතුරු එකම තැනකට ගලා එමින් තිබුණි...

Albus :-කාල යන්ත්‍රයක්!!!!තාත්තට කාල යන්ත්‍රයක් හම්බවෙලාද????

Rose:- ෂ්...ෂ්...මම දන්නවා.. නියමයි නේ...එහෙම නේද??

Albus :- ඔයාට හොඳටම විශ්වාසද??

Rose :- සම්පූර්ණයෙන්ම.

Albus :-දැන් මම ස්කෝපියස්ව හොයාගන්න ඕන.

ඔහු දුම්රිය දිගේ ඇවිදගෙන ගියේය.රෝස් ඔහු පසුපස ගියාය.ඇය තවමත් ඇයට පැවසීමට තිබූ දේ ගැන ඇය සිතමින් සිටියා ය...

Rose :- ඇල්බස්...

ඇල්බස් තීරණාත්මක ස්වරයෙන් හැරුණේය..

Rose :-හරි... සමහර විට ඔයාගේ අම්මා අපේ තාත්තට බකමූණෙක් එවලා ඇති.ඒ මුකුත් නිසා නෙමේ..ඇය ඔයා ගැන වද වෙන නිසා...ඉතින් මම හිතුවේ...

Albus :- මට තනියම ඉන්න දෙන්න රෝස්..

ස්කෝර්පියස් ඔහුගේ සුපුරුදු කුටියේ වාඩිවී සිටියේය.ඇල්බස් එයට පළමුව ඇතුල්විය.රෝස් තවමත් ඔහු පසුපසය...

Scorpius :- ඇල්බස්...ඕහ්..හෙලෝ රෝස්...ඔයා මාර සුවඳයිනේ..

Rose :- මොකක්,මම සුවඳයි!!!!

Scorpius :-නෑ නෑ..මම කියන්නේ...
ඒක හොඳ දෙයක්...ඔයා ගාවින් නැවුම් මල් සහ නැවුම් පාන් එකතු වුණාම එන සුවඳක් ඔයාගෙන් එන්නේ...

Rose :- ඇල්බස්,මම මෙතන ඉන්නවා හරිද...ඔයාට මාව ඕනෙ වුනොත් එහෙම.

Scorpius :- මම අදහස් කලේ,හොඳ පාන්.. රසවත් පාන් ගැන....මොකක්ද අනේ පාන් වල තියන අවුල..

රෝස් හිස දෙපසට වනමින් එතනින් නික්ම ගියාය...

Scorpius :- ඇත්තටම,මොකද්ද පාන්වල තියෙන අවුල!!!!!

Albus :- මම ඔයාව හැමතැනම හෙව්වා..

Scorpius :- හරි දැන් ඔයා මාව හොයා ගත්තනේ.ටා...ඩා... මම බොහොම අමාරුවෙන් හැංගිලා හිටියේ.
ඔයා දන්නවද මම උදෙන්ම කෝච්චියට නගින්න ආස ඇයි කියලා.මිනිස්සු මගේ දිහා බලනවට, වොල්ඩමෝර්ට්ගේ පුතා කියලා කෑගහනවට,මගේ ට්‍රන්කා පෙට්ටිය උඩ වොල්ඩමෝර්ට්ගෙ පුතා කියලා ලියනවට....
ඒවා නම් කොච්චර කාලයක් ගියත් ඉවර වෙන එකක් නෑ..මේ ඒක නෙමේ...රෝස් ඇත්තටම මට කැමති නෑ නේද??එහෙම නේද???

ඇල්බස් ඔහුගේ මිතුරා ඇඩිව වැළඳ ගත්තේය.ස්කෝපියස් මෙයින් පුදුමයට පත් විය...

Scorpius :- හරි...මේ,හලෝ..අම්... අපි මීට කලින් වැළඳගෙන තියෙනවද..අපි වැළඳ ගන්නවාද!!!!!

Albus :- ඔයා දන්නවද,ඊයෙනම් මහ එපා කරපු දවසක්...

Scorpius :- ඇයි මොකද්ද ඔයාට වුනේ!!!!

Albus :- මම පස්සේ විස්තර කියන්නම්. මුලින්ම අපි මේ දුම්රියෙන් පැනගන්න ඕනෙ..

දුම්රියේ නලා හඬ ඇසෙන්නට විය.දුම්රිය ගමන ආරම්භ විය...

Scorpius :- පරක්කු වැඩියි.දැන් කෝච්චිය යනවනේ.දැන් ඉතින් හොග්වෝර්ට්ස් තමා...

Albus :- එහෙනම් අපිට යන කෝච්චියෙන් පනින්න වෙනවා...

මේ අතර ට්‍රොලි විච් තම රසකැවිලි කරත්තය ද තල්ලු කරගෙන එමින් සිටින බව ඇසෙන්නට විය...

Trolly witch:- රසකැවිලි මොනවත් ඕනෙද ළමයිනේ???

ඇල්බස් ඔවුන්ගේ කුටියේ ජනේලයක් හැර එයින් දුම්රිය වහලයට නැගීමට උත්සාහ කළේය...

Scorpius :- ගමන් කරන මායා කෝච්චියකින් පනින්න?!?!?!

Trolly witch :- කන්න කන්න ආස හිතෙන පම්කින් පේස්ට්‍රි...රස වැහෙන කොල්ඩ්‍රෝන් කේක්...තව ඔයාලගේ ආසම චොකලට් ගෙම්බොත් ඉන්නවා....

Scorpius :- ඇල්බස් සෙවරස් පොටර්,
ඔයාගෙ ඔය ඇස් වල තියන පුදුමය දනවන කාරණාව මොකක්ද????

Albus :- පළමුවන ප්‍රශ්නය,ඔයා මොනවද දන්නෙ ට්‍රයිවිසාර්ඩ් තරගාවලිය ගැන...

Scorpius :- (සතුටින්)
ඕ...හෝ...ප්‍රශ්නයක්!!
පාසල් තුනක් මගින් තෝරාගන්නා විශිෂ්ඨයින් තුන්දෙනෙක් දුෂ්කර කාර්යයන් තුනක් සම්පූර්ණ කරන්න උත්සාහ දරනවා එක කුසලානයක් වෙනුවෙන්.මොකද්ද ඒකෙන් ඇති වැඩේ දැන්??

Albus :- ඔයා නම්.. නිකං අති පණ්ඩිතයෙක් වගේ..ඔයා දන්නවද ඒක...

Scorpius :- ඔව්... අනිවාර්යයෙන්..හී...හී😂😂

Albus :- දෙවන ප්‍රශ්නය.දැන් ඇයි ට්‍රයි විසාර්ඩ් තරගාවලිය අවුරුදු විස්සක් තිස්සේ පවත්වන්නේ නැත්තේ...

Scorpius :- අන්තිම තරඟෙට ඔයාගේ තාත්තයි තව සෙඩ්‍රික් ඩිගරි කියලා ළමයෙකුයි සහභාගී වෙලා තියෙනවා. එයාලා එකතුවෙලා දිනන්න උත්සහ කරලා තියෙන්නේ. නමුත් කුසලානය පෝර්ට්කී එකක් වෙලා තියනවා. ඒ වගේම එයාලා එකෙන් වොල්ඩමෝර්ට් ගාවට තමයි යැව්ලා තියෙන්න.සෙඩ්‍රික් එහිදී මැරුම් කාලා තියනවා.ඉතිං එදායින් පස්සෙ ඉතාමත් ඉක්මනින් තරඟාවලිය නවත්තලා තියෙනවා...

Albus :- හොදයි,තුන්වන ප්‍රශ්නය.සෙඩ්‍රික් එහෙම මැරෙන්න ඕනැ කෙනෙක්ද ??
ලේසි ප්‍රශ්නයක් ලේසි උත්තරයක්...නෑ එහෙම වෙන්න ඕනේ නෑ... මොකද වොල්ඩමෝර්ට් කියලා තියෙන්නේ සහයකයා මරලා දාන්න කියලා..සහායකයාව... එයාව මැරුවේ මගේ තාත්තා එක්ක හිටපු නිසා විතරයි.ඒ වගේම මගේ තාත්තට එයාව බේරගන්න බැරිවුණා.නමුත් අපිට පුලුවන්.අපි වැරැද්ද හරිගස්සන්න ඕන.අපි කාල යන්ත්‍රයක් භාවිතා කරන්න යන්නේ.අපි එයාව නැවත ගේන්න හදන්නේ....

Scorpius :- ඇල්බස් ඇත්තම කාරණාව තමා.. මම වැඩිය කාල යන්ත්‍ර වලට කැමති කෙනෙක් නෙමෙයි...

Albus :- ආමෝස් ඩිගරි කාල යන්ත්‍රය ගැන තාත්තාගෙන් අහනකොට එයා ඒක තියාගෙන ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කලා.එයා තම පුතාව නැවත ගෙන ඒමට උත්සාහ කරන අසරණ මහලු මිනිහෙක්ට බොරු කළා.ඒ වගේම එයා එහෙම කළේ මොකද එයාට ගානක්

නෑ..එයාට උනන්දුවක් නෑ ඒ ගැන...ඔක්කොම අය කතා කරන්නේ තාත්තා කරපු නිර්භීත වැඩ විතරයි.ඒ වුණාට එයා අතින් යම් යම් වැරදි වෙලා තියනවා.සමහර ඒවා ලොකු වැරදි... මට ඕනි ඒ වැරදි වලින් එකක් හරි...
හරි ගස්සන්න..ඒකට අපි දෙන්නවම ඕනෙ. සෙඩ්‍රික්ව බේරගන්නනම්..

Scorpius :- හරි, මොකක් ඔයා ඔයාගේ ඔය ඔළුව ඇතුලෙ හිර කරගෙන හිටියත් කමක් නෑ... දෙන්නම එකට වැඩ කරමු.

Albus:- මම මේක කරන්නේ ස්කෝපියස් මම මේක කළ යුතු නිසා.ඒ වගේම ඔයත් දන්නවා මම මේක කරන්න ඕන කියලා. අනිත් කාරනේ තමයි ඔයා නැත්නම් මම මුළු වැඩේම අනා ගන්නවා..සිකුරුයි...

ඔහු කට කොනින් හිනා විය .ඒ මොහොතේ එක්වරම ඇල්බස් ජනේලයෙන් වහලට නැග නොපෙනී ගියේය.ස්කෝපියස්ද තම සිත දැඩි කරගෙන ජනේලයෙන් වහලට නැග නොපෙනී ගියේය....

---

පළමුවන ජවනිකාව 11වන දර්ශනය

හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස්හි වහල මත

සුළඟ සැම අතටම හමමින් තිබිණි.එය ප්‍රචණ්ඩ සුළං හැමීමකි.

Scorpius :- හරි,දැන් අපි කෝච්චිය වහල මත ඉන්නෙ.එක වේගවත්.ඒක බය හිතෙනවා.මේකනම් හැබැයි මාර ජොලි වෙයි.මට මං ගැනම ලොකු ආඩම්බරයක් ඇති වෙනවා.ඔයා ගැනත් යමක්,නමුත්....

Albus :- මගේ ගණනය කිරීම්වලට අනුව තව ටිකකින් අපි බෝක්කු පාරකට ළඟා වෙන්න ඕන.එතනින් අපිට පොඩ්ඩක් කන්ද තරණය කළාම මහලු මායාකරුවන් මායාකාරියන්ගේ නවාතැන වන St.Oswald ගේ ගෙදරට යන්න පුලුවන්.

Scorpius :- මොකක් කිව්වා??කොහේද?? බලන්න!!මම පලවෙනි වතාවට ගොඩක් පුදුම වෙලා ඉන්නේ මගේ මේ කැරලිකාර ස්වභාවයට...යාහ්.. කෝච්චි වහල... විනෝදයි....නමුත්...දැන්...ඕහ්...

ස්කෝපියස් දකින්නට බලාපොරොත්තු නොවූ දෙයක් දුටුවේය.

Albus :- බෝක්කු පාරෙ වතුර පාර අපිට ගොඩක් ලොකු පිහිටක් වෙයි cushioning charm(මේ ගැන අපේ මායා කොසු ගැන ලිපියේ වැඩි විස්තර තියෙනවා) එක වැඩ නොකලොත්...

Scorpius :- ඇල්බස්..බලන්න...ට්‍රොලි විච්!!!!

Albus :- ඔයාට අපේ ගමනට මොනවා හරි කටේ දාගන්න එහෙම ඕනෙද...හී...හී...

Scorpius :- නෑ ඇල්බස්....බලන්නකො ට්‍රොලි විච් අපි දිහාවට එනවා.....

Albus :- නෑ ඒක වෙන්න බෑ!!!අපි ඉන්නේ කෝච්චියේ වහල උඩනේ...

ස්කෝපියස් ඇල්බස්ට ඇය පැමිණෙමින් තිබූ දිශාව පෙන්වීය. දැන් ඔහුට ට්‍රොලි විච් ව හොඳහැටි දර්ශනය විය.ඇය නොසැලකිලිමත් ලෙස තම ට්‍රොලිය තල්ලු කරගෙන ඔවුන්ට සමීප වෙමින් සිටියාය.

Trolly witch :- ට්‍රොලියෙන් මොනවහරි රස කැවිලි ඕනෙද ළමයිනේ???වට්ටක්කා පේස්ට්‍රි,චොකලට් ගෙම්බෝ,කොල්ඩ්‍රෝන් කේක්???

Albus :- ඕහ්!!!!

Trolly witch :- මිනිස්සු මම ගැන ගොඩක් දේවල් දන්නෙ නෑ.එයාලා මගේ කොල්ඩ්‍රෝන් කේක් මිලට ගන්නවා.නමුත් එයාලා කවදාවත් ඇත්තටම මාව හඳුනා ගත්තේ නෑ.මට මතක නෑ අන්තිම වතාවට මගේ නම කවුරු හරි ඇහුවද කියලා..

Albus :- මොකක්ද ඔයාගේ නම???

Trolly witch :- මට මතක නෑ.මට මතක තියෙන එකම දේ තමයි හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් එක පටන් ගත්ත දවසේ කොට ඔටලයින් ගැම්බල් මහත්මිය මට මේ රාජකාරිය පැවරුවා කියලා විතරයි...(මේ ගැන හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් එක ගැන ලිපියේ වැඩිදුර කරුණු තියෙනවා හොඳේ)

Scorpius :- ඒ කියන්නේ අවුරුදු 190කට කලින්.මොකක්??ඔයා මේ රාජකාරිය අවුරුදු එකසිය අනූවක් තිස්සේ ඉඳන් කරනවද!!!

Trolly witch :- මේ අත් වලින් වට්ටක්කා පේස්ට්‍රි මිලියන 6ක් විතර හදලා ඇති. මම ඒවා හදන්න ගොඩක් දක්ෂයි.ඒ උනාට මොන මිනිහද හඳුනා ගත්තේ ඒවා ලේසියෙන්ම වෙන දෙයක් බවට පරිවර්තනය කරන්න පුළුවන් කියලා!!

ඇය වට්ටක්කා පේස්ට්‍රියක් ගෙන අප දෙසට විසි කළාය .එය අත් බෝම්බයක් මෙන් පුපුරා ගියේය.

Trolly witch :- ආහ්!!ඒ වගේම ඔයාලා දන්නේ නැතුව ඇති මට මොනවද කරන්න පුළුවන් කියලා මගේ චොකලට් ගෙම්බෝ එක්ක.
මේ වගේ දේවල් නිකන් නෙමේ මම හදලා තියෙන්නේ...මේ කෝච්චිය ගමනාන්තයට යන්න කලින් කාටවත් මේ කෝච්චියෙන් පනින්න මම ඉඩ තියයිද!!!
කවදාවත් නෑ!!!කවදාවත් නෑ!!!
සමහර අය උත්සහ කළා.සිරියස් බ්ලැක් සහ එයාගේ සහචරයෝ ටිකයි,ෆ්‍රෙඩ්,ජෝර්ජ් වීස්ලි ජෝඩුවයි. ඔක්කොම අය අසමත් වුණා.මොකද කෝච්චිය කැමති නෑ කවුරුත් මේකෙන් පනිනවට...හාහ්..හහ්..හහ්..හා.....

ට්‍රොලි විච්ගේ අත්,දිග උල් සහිත ඒවා බවට පත් වන්නට විය.ඇය බියකරු ලෙස සිනාසුනාය.

Trolly witch :- ඒ නිසා කරුණාකරල ගමන ඉවර වෙනකන් ඔයාලගේ ආසන වලට වෙලා ඉන්න...

Albus :- ඔයා හරි ස්කෝපියස් මේ දුම්රිය මායාකාරී එකක්...

Scorpius :- මේ හොඳම මොහොත මට ඔයාට දෙයක් කියන්න..මොකද හරියටම කියනවනම්,මට නම් කිසිම සතුටක් නෑ මේ වැඩේ හරි යයි කියලා...

Albus :- ඒ වුණාට මට සතුටුයිනේ...බෝක්කු පාර ගැනයි..ඒකෙ යට තියෙන වතුර පාර ගැනයි.. මේ තමයි වෙලාව cushioning charm එකට...

Scorpius :- ඇල්බස් මේක නරක අදහසක්...

Albus :- එහෙමද?
(ඔහු මොහොතක් බලා හිඳ,බලා හිඳීමේ කාලය අවසන් බව තේරුම් ගත්තේය.) දැන් ඕවා හිතන්න පරක්කු වැඩියි..3..2..1..යි...

Molliare....(cushioning charm එකේ ස්පෙල් එක)

ඔහු මන්තරය ජප කරමින් පැන්නේය

Scorpius :- ඇල්බස්...ඇල්බස්....

ඔහු බලාපොරොත්තු සුන් වූ ස්වරයෙන් ඔහුගේ යහළුවා හිඳීදැයි පහල බැළුවේය. ට්‍රොලි විච් ඔහුට සමීප වන බව ඔහු දැක්කේය.ඇගේ කොණ්ඩය කිසිදු පිළිවෙලකට පීරා නැත.ඇයගේ උල් වූ නිය පිරි අත් තවත් උල් වෙමින් තිබුණි.

Scorpius :- හොඳයි ඔයාගේ මේ තියන පෙනුමත් එක්ක මට සිද්ධ වෙනවා මගේ යාලුවත් එක්ක යන්න...

ඔහු තම නහය තද කරගෙන පැන්නේය... ඔහුද මන්තර ජප කරමින් සිටියේය

Scorpius :- Molliare....

🟤 පළමුවන ජවනිකාව 12වන දර්ශනය

මායා ආමාත්‍යාංශය ප්‍රධාන රැස්වීම් කාමරය

මුළු වේදිකාවම මායාකරුවන් හා මායාකාරියන්ගෙන් පිරී ඇත.ඔවුන් සියලු දෙනාම කතා කළේ හරියට සියලුම මායාකරුවන් මායාකාරියන් අහිංසක, නිවැරදි අය ලෙසයි.ඒ අය අතරින් ජිනී,ඩ්‍රැකෝ සහ රොන් ද විය.ඔවුන්ට ඉහළ වේදිකාවක හර්මයිනි සහ හැරී විය.

hermione :- ඔඩර්...ඔඩර්...මට නිශ්ශබ්ද කිරීමේ බන්ධනයක් කරන්න වෙයිද!!
ඇය ඇගේ මායා යෂ්ටිය දිගු කරමින් රැස්ව සිටි පිරිසට එලෙස පැවසුවා ය..
හොඳයි අද්භූත දේවල් සම්බන්ධ ප්‍රධාන රැස්වීමට සියලු දෙනාම පිලිගන්නවා.මම බොහොමත්ම සතුටු වෙනවා ගොඩක් අය පැමිණීම ගැන.අපේ මායාකාරි ලෝකය දැන් අවුරුදු ගානක් තිස්සේ සාමකාමීව පැවතුනා.මීට අවුරුදු 22කට කලින් අපි වොල්ඩමෝර්ට්ව හොග්වෝර්ට්ස් වලදී පැරැද්දුවට පස්සේ ඉඳන්.මම සතුටින් කියන්න කැමතියි මේ වෙනකම් ඇතිවුණේ මේ නව පරම්පරාව නිසා ඇතිවුන පොඩි පොඩි අරගල විතරයි...දැන් වෙනකම්...හැරී

Harry :- වොල්ඩමෝර්ට්ගේ කණ්ඩායම් මාස කීපයකට කලින් ඉඳන් ගමනේ යෙදෙනවා. අපි කඳුකර අඟුටුමිට්ටන්ව යුරෝපය හරහා ගමන් කරන තෙක් ලුහුබැන්දා.ඒ වගේම යෝධයෝ මුහුද තරණය කරන්න අරන්.ඒ වගේම නරවෘකයෝ...මට කියන්න කණගාටුයි සති කිහිපයකට කලින් අපිට ඔවුන්ව මඟහැරුණා.මම දන්නේ නෑ එයාලා කොහොමද යන්නේ කියලා සහ ඔවුන්ට නායකත්වය අනුබල දෙන්නේ කවුද කියලා.ඒ වුණාට අපි සැලකිලිමත් වෙන්න ඕන එයාලගේ මේ ගමන් ගැන වගේම එකේ තේරුම මොකක්ද කියලා.ඉතින් අපි අහන්නේ කවුරුහරි මොනවාහරි දැක්ක නම් තමන්ගේ මායා යෂ්ටිය ඔසවන්න පුළුවන්..
අපිට හැමෝගෙම කතාවල් ඇහෙනවා... ඔව් කියන්න..මහාචාර්ය මැගෝනිගල් ස්තුතියි...

Prof Mcgonagall :- ග්‍රීෂ්ම ඍතු නිවාඩුවට පස්සෙ මම ආවෙ.මායා බෙහෙත් ගබඩාවට නිකන් වගේ ගිහින් බැලුවම දැකගන්න ලැබුණා,සමහර මායා ද්‍රව්‍ය අතුරුදහන් වෙලා තියෙනවා කියලා. ගොඩක් නෙමෙයි ටිකක් පමණ බූම්ස්ලැන්ග් හම්(ඇහැටුල්ලන් වගේ සර්පයෝ ජාතියක්) ටිකක්, ලේස්වින්ග් මැස්සෝ ටිකක් වගේ..(ලේස්වින්ග් මැස්සන් යනු කොළ පැහැති විනිවිද පෙනෙන පිහාටු ඇති මැස්සන් විශේෂයක් හොඳේ)
මේවා මුකුත් රෙජිස්ටර් කරන පොතේ ලියල නෙමේ අරගෙන තියෙන්නේ.අපි ඒවා ලියල තියෙන්නේ peeves ට දැනගන්න.. (peeves යනු වන හොග්වෝර්ට්ස් වල ගෙවල භූතයෙක්)

Hermione :- ස්තූතියි මහාචාර්යතුමියනි..අපි ඒ ගැන පරීක්ෂණයක් කරන්නම්.හර්මයිනී කාමරය පුරා බැලුවා.

තව කවුරුහරි ඉන්නවද??හොඳයි දැන් මම කියන දේ හොඳින් අහගන්න..මේක වොල්ඩමෝර්ට් සිද්ධියෙන් පස්සෙ වෙන්න බැරි දෙයක්.නමුත් හැරීගේ කැළල නැවත රිදුම් දෙන්න පටන් අරන්...

Draco :- මොකක්...ඒක වෙන්න බෑ...වොල්ඩමෝර්ට් මැරිලා.එයා මැරිලා ඉවරයි...

Hermione :- ඔව්..ඩ්‍රැකෝ.. ඔහු මැරිලා. නමුත් මේ සිද්ධවෙන හැම දෙයක්ම අපිව යොමු කරන්නේ මෙතන මොකක්මහරි අවස්ථාවක් තියෙනවා වොල්ඩමෝර්ට් හරි නැත්නම් වොල්ඩමෝර්ට්ගේ මොනවහරි අංශුමාත්‍රයක් නැවතත් ඇවිල්ලා කියලා...

Harry :- හරි..දැන් මේක අමාරු තත්වයක් තමයි.නමුත් අපිට අහන්න වගේම ඒක පාලනය කරන්නත් සිද්ද වෙනවා.ඔයාලා වගේ අඳුරු සලකුණක් දරපු අයට මොනවා හරි එහෙම දැනුණේ නැද්ද ඩ්‍රැකෝ??මම කියන්නේ හදිසි වේදනාවක් වගේ එහෙම!!!

Draco :- ඉස්සර වගේ අවිචාරවත් විදිහටද මේ අඳුරු සලකුණු දරපු අය ගැන සලකන්නේ...මේ අපිව...හැරී????

Hermione :- නැහැ ඩ්‍රැකෝ.. හැරී උත්සහ කළේ..

Draco :- ඔයා දන්නවද මෙයා මොකාටද එන්නෙ කියලා..එයාට ඕනේ පත්තරේ ආයිම මූණ දාගන්න..අපි දැක්කා ඩේලි ප්‍රොෆිට් එකෙන් වොල්ඩමෝර්ට් යළි පැමිණේවි කියලා ලියල තිබුන කටකතා ගැන.අවුරුද්දකට සැරයක් වගේම හැම අවුරුද්දකම...

Harry :- ඒත් ඒ එකක්වත් මම කියපු කතා නෙමෙයි...

Draco :- ඇත්ත....එතකොට ඔයාගේ බිරිඳ නෙමේද ඩේලි ප්‍රොෆිට් එකේ සංස්කරණ ශිල්පිණිය...

ජිනී ඔහු දෙසට පියවර කීපයක් කෝපාවිෂ්ඨ බැල්මෙන් යුතුව තැබුවාය.

Ginny :- ක්‍රීඩා ලිපි සම්බන්ධව විතරයි...

Hermione :- ඩ්‍රැකෝ, හැරී මේ කාරණාව ගෙනාවේ අමාත්‍යාංශයේ අවධානය මෙයට යොමු කරන්න..ඉතින් මායා අමාත්‍යාංශයේ ඇමති විදියට මම ..

Draco :- ඔයාගේ ප්‍රණාමය එයාට ලැබෙන්නේ...මොකද ඔයා එයාගේ යාළුවෙක් නිසා විතරයි...එච්චරයි කතාව

රොන් ද ජිනී මෙන් ඩ්‍රැකෝ අසලට මුහුණට මුහුණ මෙන් ළංවිය...

Ron:- ඔයාගේ දත් ටික බඩට යවා ගන්න ඕනද....

Draco :- එයාගේ කීර්තිමත් ගැටුම් ටික ආයෙම මතු කරන්න හදන්නෙ.එතකොට කොච්චර හොඳද ඔක්කොම අය මුමුණන්න ගත්තාම පොටර්ගේ නම ආයිමත්....
ඒ වගේම...
(හැරීගේ හඬ අනුකරණය කරමින්)
"මගේ කැලල රිදුම් දෙනවා...මගේ කැලල රිදුම් දෙනවා..."කිව්වම කොහොමත් ජනප්‍රිය වෙයි.ඉතින් මේ හැමදේකම තේරුම මොකක්ද දන්නවද කටකතා පතුරවන්නන්ට ආයිම අවස්ථාවක් ලැබෙනවා මගේ පුතාට නිග්‍රහ කරන්න... මේ එපා කරපු කටකතාව...එයාගේ මව්පිය භාවය ගැන....

Harry :- ඩ්‍රැකෝ,කවුරුත් කියන්නෙ නෑ මේකේ ස්කෝපියස් එක්ක කිසිම සම්බන්ධයක් තියෙනවා කියලා...

Draco :- හොඳයි...
හිතන්නකෝ මට විතරක් මේක මහ රැවටිලිකාර රූස්වීමක් කියලා.ඒ නිසා මම යනවා යන්න...

ඔහු යන්න ගියේය.අනිත් අය ද ඔහුට පසු පසින් කාමරයෙන් නික්ම යන්නට විය.

Hermione :- නෑ ඒක නෙමෙයි විදිහ...නැවත එන්න...අපිට උපායක් ඕනේ මේකට මුහුණ දෙන්න....

පලමුවෙනි ජවනිකාව 13වනදර්ශනය

🏠මහලු මායාකරුවන්,මායාකාරියන්ට නවාතැන වූ St.Oswaldගේ නිවහන🏠

මෙම නිවහන කොටින්ම අවුල් ජාලයකි.මෙය මායාවකි.මහලු මායා කරුවන්ට මායාකාරියන්ට ඔහුගේ නිවස ඔබ සමහරවිට සිතූ ලෙසම අපූරු එකකි.

සෙලවෙන රූපරාමු ජීවිතවලට බන්ධනය කර ඇත.ඉබේ ගෙතෙන වූල් විවීමට වශී කර ඇත.ඒ වගේම පිරිමි හෙදියන්ව ටැංගො නැටුම් සඳහා බන්ධනය කර ඇත..
මෙය දුටුවන්ගේ ඇස් මවිත කරවන දසුනකි...

වෙන මිනිස්සු මායා කර්ම සිදු කරන්නේ යම්කිසි අරමුණක් ඇතිවය.නමුත් මේ මහලු මායාකරුවන් හා මායාකාරියන් මේවා සිදු කරන්නේ විනෝදය පිනිස පමනි. ඒවගේම එයාලා කරන දෙයින් එයාල හොඳ විනෝදයක් ද ලබති...

ඇල්බස් සහ ස්කෝපියස් ඔවුන් දෙස බලමින් ඇතුළුවිය.තරමක් බියෙන් නමුත් ඔවුන් එයට මුහුණ දෙමින් ඇතුලට පිවිසියහ...

Albus and Scorpius :- අම්...සමාවෙන්න.. සමාවෙන්න..සමාවෙන්න...(මහ හඬින්)

Scorpius :- හොඳයි මෙතැන හරිම අවුල්...

Albus :- අපි ආවේ ආමෝස් ඩිගරිව හොයාගෙන

එක්වරම දැඩි නිශ්ශබ්දතාවක් ඇති විය. සෑම දෙයක්ම තිබූ තැන්වලම නතරවිය.

එක් මහලු කාන්තාවක් නිහැඩියාව බිඳිමින් කතා කලාය..

Wool woman :- ඉතිං...ඔය කොලුවො දෙන්නට ඒ වැදගම්මකට නැති මිනිහගෙන් මොනවද ඕන...

ඒ මොහොතේ ඩෙල්ෆි සිනහවක් සමඟ පැමිණියාය...

Delphi :- ඇල්බස්!!!ඇල්බස් ඔයා ආවා එහෙනම්!!!
කොතරම් අපූරුද...
එන්න ඇවිත් හෙලෝ කියන්න ආමෝස්ට..

---

🟤පළමුවැනි ජවනිකාව 14වන දර්ශනය

🏠St.Oswald මහලු මායාකරුවන් හා මායාකාරියන්ගේ නිවහන🏠

Amos Scorpius හා Albus දෙස බැලුවේය.Delphi ඔවුන් තිදෙනා දෙස බලා සිටියාය.

Amos Diggory :- හරි,මට කෙලින්ම කියන්න.ඔයා අපේ කතාවට හොරෙන් ඇහුම්කන් දුන්නා.ඔයාට අදාල වෙන්නේ නැති කතාවක් ඔයා අහගෙන හිටියා. ඉතින් ඔයා තීරණය කළා කිසිම සෙවිල්ලක් බැලිල්ලක් නැතිව ම වෙන කෙනෙක්ගෙ දේකට මැදිහත් වෙන්න.එහෙම නේද?

Albus :- මගේ තාත්තා ඔයාට බොරු කළා. මම දන්නවා එයා එහෙම කළා කියලා.එයා ගාව කාල යන්ත්‍රයක් තියෙනවා..

Amos diggory :- ඔව්..අනිවාර්යයෙන්ම,එයාලා ගාව තියෙන්න ඕනේ..ඒකත් හරිනේ දැන්..ඔයා ආපු අතක් බලාගෙන ගියොත් හොදයි...

Albus :- මොකක්?නෑ..අපි ආවේ උදව් කරන්න...

Amos Diggory :- උදව්??මේ දෙහිගෙඩි දෙකක් තරම් උසනැති කොලු ගැටව් දෙන්නගෙන් මට වෙන උදව්ව මොකක්ද??

Albus :- මගේ තාත්තා ඔප්පු කරලා තියෙනවා මායා ලෝකේ වෙනසක් කරන්න ලොකු පොඩිකමෙන් වැඩක් නෑ කියලා..

Amos diggory :- ඉතින් මම ඔයාට ඉඩ දෙන්න ඕනේ මේක කරන්න...මොකද ඔයා පොටර් කෙනෙක් නිසා ඔයා ඔයාගේ ප්‍රසිද්ධ පොටර් නාමය ගැන විශ්වාසය තබනවා...එහෙම නේද...

Albus :- නෑ...

Amos diggory :- ස්ලිදරින් නිවාසයේ පොටර්වරයා.ඔව්.මම ඔයා ගැන කියවලා තියෙනවා.ඒ වගේම මාව බලන්න මැල්ෆෝයි කෙනෙක්ව එක්ක ආපු කෙනා. එහෙම නේ....
සමහරවිට ඔය මැල්ෆෝයි voldermort වෙන්න බැරිකමක් නෑ..කවුද දන්නේ ඔයා මෙයාගේ අඳුරු මායාවකට එහෙම බන්ධනය වෙලාද කියලා...

Albus :- නමුත්...

Amos diggory :- ඔයාගේ තොරතුරු නම් අගෙයි.නමුත් ඒවා තහවුරු කිරීම වඩා වැදගත්. ඔයාගේ තාත්තා බොරු කලා..
දැන් මෙතනින් යන්න.ඔය දෙන්නටම කිව්වේ...මගේ කාලේ නාස්ති කරන්න එපා.

Albus :- (ශක්තියෙන් හා බලයෙන් යුතුව)
නෑ ඔයා මට ඇහුම්කන් දෙන්න ඕන.ඔයා ඒක ඔයාටම කියා ගත්තා.මගේ තාත්තාගේ අත් වල කොච්චර ලේ ගෑවිලා තියෙනවාද කියලා...
මට ඒක වෙනස් කරන්න ඉඩදෙන්න.මට එයාගේ එක වැරැද්දක් නිවැරදි කරන්න ඉඩ දෙන්න මාව විශ්වාස කරන්න..

Amos diggory :- ඔහුගේ හඬ තීව්‍ර විය. ඔයාට මම කියපු දේ ඇහුනේ නැද්ද ළමයෝ. මට පේන්නේ මට කිසිම හේතුවක් නෑ ඔයාව විශ්වාස කරන්න.ඒ නිසා දැන් යන්න මම ඔයාව යවන්න කලින්..

ඔහු අනතුරු අගවන්නාක් මෙන් ඔහුගේ මායා යෂ්ටිය එසවීය.ඇල්බස් යශ්ටිය දෙස බැලුවේය.එකෙණෙහිම ඔහු හුලං ඇරියාක් මෙන් ඇඹරී බිම වැටුණි.Amos ඔහුට ශාපකර ඇත.
.
Scorpius :- අයියෝ!! මචං අපි එක හොඳ දෙයක් හරි දැනගත්තනේ...ඒ අපි අදාල නැති තැනක අපි ඉන්නේ කියලා...

ඇල්බස් සෙලවීමට උත්සාහ කළේය.ස්කෝපියස් ඔහුව ඇදගෙන කරට ගත්තේය.පසුව ඔවුන් දෙදෙනා ඉවතට ඇවිද යන්නට විය..

Delphi :- මම හිතන්නේ එක හේතුවක් මම දන්නවා මට එයාලව විශ්වාස කරන්න පුළුවන්.

ඔවුන් නැවතුණි!!

Delphi :- එයාලා තමයි උදව් කරන්න ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වුණ එකම අය. එයාලා නිර්භීත විදියට එයාලගෙ ජීවිත පවා පරදුවට තිබ්බා ඔයාගෙ පුතාව නැවත ඔයාට ගෙනල්ලා දෙන්න.ඒ වගේම මට විශ්වාසයි එයාලා එහෙම කරාවි කියල මෙතන ඉදන් ඉදිරියටත්...

Amos diggory :- අපි මේ කතා කරන්නේ සෙඩ්‍රික් ගැන..

Delphi :- ඇයි ඒ වගේම ඔයා කිව්වෙ හොග්වෝර්ට්ස් ඇතුලේ කෙනෙක් ඉන්නවනම් ගොඩක් ලොකු පහසුවක් කියලා...

ඩෙල්ෆි Amosගේ නලල සිපගත්තාය.ඔහු ඇය දෙස බලා නැවත කොලු ගැටව් දෙදෙනා දෙස බැලුවේය..

Amos diggory :- ඇයි???
ඇයි,ඔයා ඔයාගේ ජීවිතය අවදානමක දාන්නෙ?
ඇයි ඔයා මේකට කැමැති වුණේ?

Albus :- මම දන්නවා සහායකයා උනාම වෙන්නෙ මොකද්ද කියල.ඔයාගෙ පුතා මැරෙන්න සුදුසු නැහැ මහත්තයා.අපිට උදව් කරන්න පුළුවන් එයාව නැවත ගේන්න...

Amos diggory :- (අන්තිමට හැඟීම්බර වී) මගේ පුතා...
මගේ පුතා තමයි මට තිබුන ලොකුම සම්පත.ඒ වගේම ඔයා හරි.ඒක අසාධාරණයි...ලොකු අසාධාරණයක්..ඔයා බරපතළ ලෙස සලකනවානම්...

Albus :- අපි මැරෙන්න වුණත් සූදානම්...

Amos diggory :- මේක ගොඩක් අවදානම් සහගත වෙන්න පුළුවන්...

Albus :- අපි දන්නවා...

Scorpius :- අපි දන්නවද..!!!

Amos diggory :- Delphi සමහරවිට ඔයත් මෙයාලා එක්ක ගියා නම්...

Delphi :- ඒක ඔයාට සතුටක් නම් මාමේ...

ඇය Albus දෙස බලා සිනාසුනාය.ඔහුද පෙරළා සිනාසුනේය..

Amos diggory :- ඔයාලා තේරුම් ගන්න ඕනේ කාල යන්ත්‍රය ගන්න එකෙනුත් ඔයාලගෙ ජීවිතේ අවදානමට වැටේවි කියලා...

Albus :- අපි අපේ ජීවිත අවදානමක දාන්න සූදානම්..

Scorpius :- ඇත්තටම අපි එහෙමද..!!!

Amos diggory :- (බරපතල ලෙස)
මම හිතනවා ඔයා ගාව කාල යන්ත්‍රය ඇති කියලා...

පලවන ජවනිකාව 15වන දර්ශනය

හැරී සහ ජිනී පොටර්ගේ මුළුතැන්ගෙය.

හැරී,රොන්,හර්මයිනී සහ ජිනී එකට හිදිමින් ආහාර ගනිති...

Hermione :- මම Dracoට ආයි ආයිම කිව්වා. අමාත්‍යාංශයේ කවුරුත් scorpius ගැන කතා කරන්නෙ නෑ කියලා.කටකතා පැතිරුවේ අපි නෙමෙයි කියලා...

Ginny :- මම එයාට ලිව්වා.Astoria මැරුණට පස්සේ.අපිට එයා වෙනුවෙන් මොනවා හරි ම කරන්න පුලුවන්ද කියලා අහලා.මම හිතුවේ සමහර විට ඇල්බස්ට එයා හොඳ මිතුරෙක් වෙයි කියලා.සමහරවිට scorpiusට නත්තල් නිවාඩුවේදී නැවතිලා ඉන්න ඕනේ ඇති...
මොකද මගේ බකමූණා ගෙනාපු ලියුමේ තිබ්බේ කෙටි වාක්‍යයක් විතරයි.
"ඔයාගේ සැමියාට කියන්න මගේ පුතා ගැන තියෙන දෝෂාරෝපණ සියල්ල ඉවත් කරන්න කියලා,සදහටම"

Hermione :- එයාගෙ හිතට ගොඩක් ඒක බලපාලා වගේ..

Ginny :- එයා අවුල් ජාලයක්...ලොකුම ලොකු අවුල් ජාලයක්....

Ron :- මට කණගාටුයි එයාගේ අභිමිචීම ගැන.නමුත් ඔහු හර්මයිනීට දොස් පවරන කොට ඒ...
හොඳයි...(ඔහු හැරී දෙස බැලුවේය)
ආහ්..එල්ලා වැටෙන යට කලිසම්..
මම හැමතිස්සෙම ඇයට කිව්වා වගේම ඒක වෙන මොනවත් දෙයක් නෙමෙයි...

Hermione :- ඇයට!!

Ron:- අර එදා ඔයා කිව්ව කතාව...
අගුටුමිට්ටෝ යනවා ඇත්තේ පාටියකට.යෝධයෝ යනවා ඇත්තේ මඟුල් ගෙදරකට.ඔයාට නරක හීන පේන්න ඇත්තේ ඔයා ඇල්බස් ගැන වද වෙන නිසා. ඔයාගේ කැලල රිදෙන්න අරන් ඇත්තේ ඔයා නාකි නිසා...

Harry :- නාකි වෙලා නිසා!!!මේ මම!!
ස්තූතියි ඒක කිව්වට...

Ron :- ඇත්තටම හැම තිස්සෙම මම නිදාගත්තම මම "ඌෆ්" කියලා ශබ්දයක් දානව.ආහ් ඌෆ් මගෙ කකුල.
මගෙ කකුලේ පොඩි රිදුමක් තියෙනවා. මගේ කකුලේ රිදුම ගැන සින්දු ලියන්න පුළුවන් තරම් රිදුමක් දෙනවා.මම හිතන්නේ ඔයාගේ කැළලත් ඒ වගේ ඇති.

Ginny :- ඔයා කියවන්නෙම වැඩකට නැති දේවල්...

Ron :- මම ඒක මගේ විශේෂත්වය විදියට සලකනවා.ඒ වගේම මගේ ආදරේ ඔක්කෝටම පුදකරනවා...කෙට්ටු ජිනී ඔයාටත් එක්කම....

Ginny :- ඔයා හරියට හැසිරුණේ නැත්නම් රොන් වීස්ලි.....
මම අම්මට කියනවා..හරිද!!

Ron :- ඔයාට බැහැ!!!

Hermione :- වොල්ඩමෝර්ට් මොකක්මහරි විදිහකින් අඩුමතරමේ එයාගේ ජීවිතේ කොටසක් හරි පණ බේරගෙන තියෙනවා නම් මොකක්මහරි වේශයකින්...
අපි ලෑස්ති වෙලා ඉන්න ඕන ඒකට මුහුණ දෙන්න..ඒ වගේම මම බය වෙලා ඉන්නේ මේ වෙන දේවල් එක්ක...

Ginny :- මමත් බයයි...

Ron :- මම නම් බය නෑ...අම්මට ඇරෙන්න

Hermione :- මම අදහස් කලේ හැරී,මම මේකෙදි Cornelius Fudge වගේ නම් වෙන්නේ නෑ.මම කළගලේ ඔළුව ගහ ගන්නෙ නෑ..
ඒ වගේම මට කිසිම ප්‍රශ්නයක් නැහැ..ඩ්‍රැකෝ කිව්ව දේවල් නිසා මාව කොච්චර මහජනයාට ප්‍රිය නොවුනත්...

Ron :- ඔයා කොහොමත් එහෙම මහජනයාට ප්‍රිය කෙනෙක් උනේ නැනේ..එහෙම නේද!!!!

හර්මයිනී රෞද්‍ර ලෙස රොන් දෙස බලන ගමන් ඔහුට පහරදීමට සැරසුනු නමුත් ඊට පෙර රොන් ඉවතට පැන ගත්තේය...

Ron :- ඔයාට මග හැරුණා....

එක්වරම ජිනී ඔහුට පහරක් දුන්නය.ඔහු වේදනාවෙන් හැකිලුණි...

Ron:- ඒකනම් නියම පහරක්..ගොඩක් ශක්තිමත් පහරක්..

එක්වරම බකමූණෙක් කාමරයට ඇතුළු විය.ඌ පහතින් පියාඹාවිත් හැරීගේ පිගානට ලිපියක් දැමුවේය.

Hermione :- මේ වෙලාවේ බකමූණෙක්!!! හිතාගන්නත් අමාරුයි නේද???

හැරී පුදුමයෙන් ලිපිය විවෘත කළේය.

Harry :- ඒක මහාචාර්ය McGonagallගෙන්..

Ginny :- මොකක්ද ඒකෙන් කියන්නේ...

හැරීගේ මුහුණ මැලවිණි...

Harry :- ජිනී..ඒ ඇල්බස් ගැන...
එයාලා ඉස්කෝලෙට ගිහින් නෑ...
එයාලා අතුරුදහන් වෙලා....

---

◍ පළමුවැනි ජවනිකාව 16වැනි දර්ශනය

වයිට් වෝල්ස් බිම්ගෙය

Scorpius චපර ඇසින් බෝතලය දෙස බලා සිටියේය.

Scorpius :- ඉතින් අපි ඒක පාවිච්චි කරනවද

Albus :- scorpius මම ඔයාට වෙනම පැහැදිලි කරලා දෙන්න ඕනද??
උද්භිත විද්‍යාව සහ මායා බෙහෙත් ගැන හසල දැනුමක් තියෙන ඔයාට polly juice වලින් වෙන්නෙ මොකක්ද කියල අමුතුවෙන් කියන්න ඕන ද..delphiගේ ප්‍රඥාවන්ත අදහස නිසා අපිට කරන්න තියෙන්නේ මේ බෙහෙත බීලා වෙස් මාරුකරගෙන හොරෙන්ම මායා අමාත්‍යාංශයට රිංගන එක ...

Scorpius :- හරි...ප්‍රශ්න දෙකක් තියෙනවා මට... එක...
ඒක බොන එක වේදනා සහගත ද?

Delphi :- මම දන්න විදියට නම් ගොඩක්...

Scorpius :- ස්තුතියි..දැනගත්ත එක හොඳයි. දෙවැනි කාරණාව තමයි,ඔයා දන්නවද Polly juice මොන රසද කියලා...

Scorpius :- මොකද මම අහල තියෙන විදිහට ඒක මාළු රසයි.එහෙම වුණොත් මම ඒක නැවත එළියට වමනේ දාවි.මට වැඩිය මාළු රස දිරවන්නෙ නෑ..දිරවලත් නෑ... ඉස්සරහට එහෙම වෙන්නෙත් නැහැ

Delphi :- අවවාදයක් විදිහට සලකන්නම්කෝ.. (ඇය මායා බෙහෙත්වලින් උගුරක් බිව්වාය.)
ඒකෙ ඇත්තටම මාළු රසක් එන්නේ නෑ..(ඇයගේ වේශය පරිවර්තනය වෙමින් තිබුණි.එය බලවත් ලෙස වේදනාකාරී විය.)
ඇත්තටම ඒකෙ යම්තාක් දුරකට හොද රසයක් තියෙනවා..
ම්ම්...යමී...
ඒක වේදනාකාරියි..නමුත්...
(ඇය මහ හඩින් රාමතෙල් හැරියාය) හපොයි...මම කිව්ව දේ ආපසු ගන්නම්..ඒකේ පොඩි...
(ඇය නැවත රාමතෙල් හැරියාය)
පසුව ඇය හර්මයිනී බවට පත්විය. ඔව් ඔයා හරි scorpius ඒකෙ දරාගන්න බැරි මාලු රසයක් එනවා...

Albus :- හොඳයි...ඒක දැනගත්ත එක හොඳයි වගේ...

Scorpius :- දැනගත්ත ඒක හොඳයි!!!
ඒක පුදුමෙනුත් පුදුමයක්...

Delphi/Hermione :- ඇත්තටම මට මේකෙන් දැනෙන්නේ නැහැ...අඩුම තරමේ මට මගේ කටහඬ වත් නෑ...ඒකත් හමයිනිගේ වගේ...ඒක නම් ගොඩක්ම පුදුම සහගත දෙයක්...

Albus :- හොඳයි එහෙනම් මම ඊළඟට

Scorpius :- නෑ...නෑ... අපි මේක කරනවා නම් දෙන්නම එකට කරමු.(ඔහු එක වගේ පෙනුමෙන් යුත් වීදුරු දෙකක් ගෙන එයට polly juice පිරවූයේය.)
එකටම...

3....2....1....

ඔවුන් එකවර බීගෙන ගියහ.

හපොයි නෑ...ඒකනම් එච්චර හොඳ නැහැ වගේ.ඔහු වේදනාවෙන් ඇඹරෙමින් කීවේය.

දෙදෙනාම පරිවර්තනය වීමට පටන් ගැණුනි.

ඇල්බස් රොන් ලෙස ද ස්කෝපියස් හැරී බවට ද පරිවර්තනය විය.ඔවුන් දෙදෙනා ඔවුන් දෙදෙනා දෙස ම බලා සිටියහ.

Albus :- මේකනම් ටිකක් එක්තරා විදිහකට විකාරයක් වගේ.එහෙම නේද...

Scorpius/Harry :- (සිදුවූ වෙනස විහිළුවකට ගනිමින්)
යනවා තමන්ගේ කාමරයට කෙලින්ම යනවා... උඹ මහ එපා කරපු නැහැදිච්ච ලමයෙක් වෙලා දැන්...

Albus/Ron :- (මුව පුරා සිනාවක් සමඟින්)
ස්කෝපියස්.....

Scorpius/Harry :- (ඔහුගේ කබාය එහාට මෙහාට වනමින්)
ඒක ඔයාගේ අදහසක්නේ..මම හැරී වෙනවා ඔයා රොන් වෙනවා කියපු එක.මට ඕනි උනේ පොඩි විනෝදයක් ගන්න මම... (ඔහු මහ හඬින් රාමතෙල් හැරියේය) හොඳයි,ඒක නම් සම්පූර්ණයෙන්ම බය හිතෙන වැඩක්

Albus/Ron :- ඔයා දන්නවද...රොන් මාමාගේ බඩ ටිකක් වැඩියි...ඒ වුනාට එයා ඒක නියමෙට හංගගෙන වැඩ කරනවා...

Delphi/Hermione :- අපි දැන්ම ගියොත් නරකද

ඔවුන් එක් වරම පටු පාරකින් මතුවිය.පාරේ කොනක තිබූ දුරකතන කුටියකට ඔවුන් සියලු දෙනා ඇතුළු වී 6 2 4 4 2 අංක එබූහ.

Telephone box :- සාදරයෙන් පිලිගන්නවා.. harry potter , Hermione granger , Ron weasly....

ඔවුන් එක් වරම දුරකතන කුටියේ පොළොවෙන් අතුරුදහන් වී ගියහ..

පලවෙනි ජවනිකාව 17වන දර්ශනය

මායා අමාත්‍යාංශය රැස්වීම් කාමරය

හැර,හර්මයිනී,ජිනී සහ ඩ්‍රැකෝ කුඩා කාමරයක සිටියි...

Draco :- අපි රේල් පාර දෙපැත්තේ ඒ අසල දිගටම හෙව්වනේ...

Harry :- මගේ දෙපාර්තමේන්තුව එක පාරක් සොයා බැලුවා.දැන් නැවත වරක් සොයා බලමින් ඉන්නවා. ...

Draco :- ඒ වගේම Trolly witchගෙන් අපිට වැදගත් වෙන කිසිම දෙයක් දැනගන්න ලැබුනේ නෑ...

Hermione :- Trolly witch ගැනනම් හිතාගන්න බැහැ.ඇය දිගටම ottaline gambol ගැන දිගටම කියවන්නේ.(ottaline gambol,trolly witchගැන hogwarts express ලිපියේ විස්තර කර ඇත.)ඇය බොහොම ආඩම්බර වෙනවා ඇගේ සේවාව ගැන හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් එකේදි කරපු...

Ginny :- සාමාන්‍ය මිනිස්සු මොනවා හරි මැජික් වලට සම්බන්ධ සිද්ධියක් ගැන එහෙම වාර්තා කරලා තියෙනවාද??

Hermione :- තවම නම් නෑ.මම සාමාන්‍ය මිනිස්සුන්ගේ අගමැතිවරයාට අනතුරු ඇඟෙව්වා.එයා ඒක වැරදීමක් කියලා ගොනුකරයි.මායාවක් වගේ නේ...එහෙම නේ....

Draco :- ඉතිං අපි සාමාන්‍ය මිනිසුන් මත අපේ ළමයින්ව සොයාගැනීම ගැන විශ්වාසය තබනවද??අපි එයාලට හැරීගේ කැලල රිදෙන එක ගැනත් කිව්වද...

Hermione :- අපි හුදෙක් සාමාන්‍ය මිනිසුන්ගේ උදව් ඉල්ලුවා විතරයි...ඒ වුනාට කවුද දන්නේ හැරීගේ කැළල ටිකක් හරි මේකට සම්බන්ධ නම්...අපි ඒක ගොඩක් බරපතව හිතන්න ඕන කාරණාවක් නේද...
අපේ සහයකයෝ හොයා බලනවා කාටහරි අඳුරු මයාවන් එහෙම බලපාලද කියලා. ඒවගේම...

Draco :- මේක Death eatersලා ගැන දෙයක් නෙමේනේ...

Hermione :- මට විශ්වාස නෑ ඔයාගෙ නිශ්චය කිරීම ගැන...

Draco :- මම නිගමනය කරන්නේ නෑ..මම නිවැරදියි.අඳුරු මායාවන් පසුපස හඹායන්නේ... දැනගන්න,මගේ පුතා මැල්ෆෝයි කෙනෙක් ඒකෙ කිසිම අභියෝග කරන්න දෙයක් නෑ.

Harry :- එහෙම නැත්නම් එළියේ වෙන අලුත් දෙයක් තියෙනවා..මොකකට හරි..

Ginny :- මම ඩ්‍රැකෝ එක්ක එකගයි..මේක පැහැරගැනීමක්.එයාලා ඇල්බස්ව පැහැරගෙන.මට තේරෙනවා කවුරු නමුත් ඒ දෙන්නවම පැහැරගෙන...

හැරී ජිනීගේ දෑස් දෙස බැලුවේය.ඒවා ඉතා හොඳින් හැරීට යමක් පැවසීමට මෙන් පැහැදිලි වී තිබිණි....

Draco :- scorpius කියන්නේ නායකයෙක් නෙමෙයි.එයා හැමතිස්සෙම යම් අයෙකු අනුගමනය කරන්නෙක්.මම ඒ දේවල් හරිගස්සලා එයාගෙ ඔලුවට කොච්චර දාන්න උත්සාහ කළත් වැඩක් වුනේ නෑ.ඒ නිසා මට කිසි සැකයක් නෑ albus එයාවත් අරන් දුම්රියෙන් පැනලා තියෙන්නේ.මට තියෙන ප්‍රශ්නය එයාව කොහෙටද ඇල්බස් අරගෙන ගියේ කියලා...

Ginny :- හැරී එයාලා පැනලා ගිහිල්ලා.ඔයයි මමයි ඒක දන්නවනේ

ඩ්‍රැකෝ,හැරී සහ ජිනී මුහුණට මුහුණ බලන අයුරු දුටුවේය...

Draco :- ඔයාලා??ඔයාලා දන්නවද... ඔයාලා මොනවද අපෙන් හංගන්නේ???

නිහඬතාවක්

මොනයම් හෝ කාරණාවක් වුණත් කමක් නෑ මම කියන්නේ ඒක මට කියන්න කියලා

Harry :- ඇල්බසුයි මමයි අතරේ පොඩි රණ්ඩුවක් වුනා පහුවුණ අන්තිම රාත්‍රියේදී

Draco :- ඉතිං...

හැරී මඳක් සුසුම් හෙලා නිර්භීතව කෙලින් ඩ්‍රැකෝ දෙස බැලුවේය.

Harry :- ඉතින් මට කියවුනා.ඔහු මගේ පුතා නොවුණ නම් හොඳයි කියලා මට හිතුන කාල තිබ්බ කියලා...

නැවතත් නිශ්ශබ්දතාවයක්.එය දැඩි වේදනාත්මක නිශ්ශබ්දතාවයකි.එහිදී ඩ්‍රැකෝ වෛරයෙන් පිරි පියවර කිහිපයක් හැරී අසලට තැබුවේය...

Draco :- scorpious ට මොනවහරි උනොත් එහෙම...

ජිනී වහාම ඔවුන් දෙදෙනා අතරට පියවර තැබුවා ය...

Ginny :- ඔහොම තර්ජන එල්ල කරන්න එපා..කරුණාකරලා ඔහොම කරන්න එපා..

Draco :- (කෑගසමින්) මගේ දරුවා අතුරුදහන් වෙලා...

Ginny :- (ඒ වගේම කෑගසමින්) මගේ දරුවත් එහෙමයි දෙයියනේ...

ඔහුට ඇයගේ මුහුණේ ස්වරූපය දෙනෙතට හසුවිය.කාමරය හැඟීම්වලින් පිරී ගියේය...

Draco :- (තොල අඹරවමින් ඔහුගේ පියා මෙන්)
ඔයාලට රත්තරන් ඕනේ නම් මුළු මැල්ෆෝයි පරම්පරාවෙම.....
එයා තමයි මගේ එකම උරුමය..එයා තමයි මගේ...මගේ එකම පවුල...

Hermione :- අමාත්‍යාංශය සතුව ඇති තරම් රත්තරන් තියෙනවා...
ස්තුතියි මැල්ෆෝයි

draco යාමට සැරසුනි.ඔහු එක්වරම නැවතී හැරී දෙස බලමින්..

Draco :- මට වැඩක් නෑ ඔයා මොනවා කලාද කාව බේරුවද කියලා.නමුත් ඔයා සදාකාලික ශාපයක් අපේ පවුලට,හැරී පොටර්...

මායා අමාත්‍යාංශයේ කොරිඩෝව

Scorpius/Harry :- ඔයාට විශ්වාසෙට ඒක මෙතන කියලා?

මුරකාරයෙක් ඔවුන් පසුකර ගියේය.හැරී ලෙස සිටි scorpious ද හර්මයිනී ලෙස සිටි ඩෙල්ෆි ද බොරුවට කතා කරන බව හැඟවීය...

scorpius/Harry :- ඔව... අමාත්‍යතුමියනි. මම හිතන්නේ අපි හොඳින් ඕනෑකමින් සොයා බැලිය යුතු කාරණාවක් කියලා...

Guard :- (හිස නමමින්) ඇමතිතුමනි..

Delphi/Hermione :- හරි ..පි ඒ ගැන එකට එකතුවෙලා හොයල බලමු.

මුරකරු නොපෙනී ගියේය.

ඔවුන් සැනසුම් සුසුම් හෙලූහ.

Delphi/Hermione :- Veritaserum එක පාවිච්චි කරන වැඩේ මගේ මාමාගේ අදහසක්.අපි හිමින් සැරේ ඒක ඇමතිගේ නිල පානයට දැම්මා.ඔහු අපිට කිව්වා කාල යන්ත්‍රය තියලා තියෙන්නෙ කොහෙද කියලා.ඒක තියෙන්නෙ ප්‍රධාන මායා ඇමතිනියගේ කාර්යාලයේ...

ඇය දොරක් පෙන්වමින් කීවාය. එවිටම ඔවුන්ට කතා කරන ශබ්දයක් ඇසුණි.

Hermione :- (ඇතින් ඇසේ)හැරී අපි ඒ ගැන කථා කරන්න ඕන...

Harry :- (ඇතින් ඇසේ) ඒ ගැන කතාකරන්න මුකුත්ම නෑ ...

Delphi/Hermione :- හපොයි..නෑ නෑ

Albus/Ron :- හර්මයිනී... තාත්තයි...

ඔවුන් එක් වර බියෙන් ගල්ගැසී බලා සිටියහ.

Scorpius/Harry :- හරි හැංගෙන්න තැනක් බලන්න.හැංගෙන්න තැනක් නෑ වගේ...කවුරු හරි දන්නවද නොපෙනී ඉන්න පුළුවන් මන්ත්‍ර එහෙම...

Delphi/Harry :- මොකද කියන්නේ අපි ඇයගේ කාර්යාලයට රිංගමු ද?

Albus/Ron :- ඇය ඇගේ කාමරයට ඒවිනේ..

Delphi/Hermione :- ඉතින් වෙන තැනක් නෑනේ.

ඇය දොර ඇරීමට බැලුවාය.නැවතත් උත්සාහ කළාය.

Hermione :- (ඇතින් ඇසේ) ඔයා ඒ ගැන මාත් එක්ක හරි කතා කරන්නෙ නැත්නම්..

Scorpius/Harry :- පස්සට වෙන්න..Alohomora...

ඔහුගේ යෂ්ටිය දොර දෙසට එල්ල කළේය.දොර එක් වරම සෙලවී ඇරී ගියේය. ඔහු තරමක් ආඩම්බරකාර සිනාවක් පෑවේය

Scorpius/Harry :- ඇල්බස් ඇයව නවත්වන්න.ඒ ඔයාට කරන්න වෙන වැඩක්.

Harry :- (ඇතින් ඇසේ) මොනවද මට කියන්න තියෙන්නේ...

Albus/Ron :- මම!!! ඇයි මම???

Delphi/Hermione :- මොකද ඒ අපි දෙන්නට කරන්න පුළුවන් දෙයක් නෙමේ...මොකද එතන ඉන්නේ අපි දෙන්නා නිසා...

Hermione :- (ඇතින්)ඔයා එතැනදී කියපු දේ නම් සම්පූර්ණයෙන්ම වැරදියි...
නමුත් දැන් අපිට මෙතැන මෙතන කරන්නේ ඊට වඩා රාජකාරියක් තියෙනවා...

Albus/Ron :- ඒ උනාට..මට බෑ...මට බෑ අයියෝ...

රොන් මෙන් සිටි ඇල්බස් ඉන්පසුව හමයිනිගේ කාර්යාලය අසල රැඳී සිටියේ ය.

Harry :- හර්මයිනී මම ඔයාගේ සැලකිල්ල ගැන ගොඩක් සතුටු වෙනවා.නමුත් එහෙම කරන්න ඕන නෑ...

Hermione :- රොන්!!!!

Albus/Ron :- සප්‍රයිස්.....

Hermione :- ඔයා මොකද මෙතන කරන්නෙ..

Albus/Ron :- මනුස්සයෙක්ට එයාගෙ නෝනව බලන්න එන්න හේතු ඕනෙද...

ඔහු හර්මයිනීව ආදරයෙන් සිප ගත්තේ ය.

Harry :- මම ගියානම් හරි වගේ..නේ...

Hermione :- හැරී මම නම් කියන්නෙ...ඩ්‍රැකෝ මොනවා කිව්වත් ඔයා ඇල්බස්ට කියපු දේ...
මම නම් හිතන්නේ නෑ ඒක අපි කාටවත් හොඳ දෙයක් විදියට පේනවා කියලා...

Albus/Ron :- ආහ්..ඔයා මේ කියන්නෙ අර... අර සමහර වෙලාවට එයා ප්‍රාර්තනා කරා මාව....(ඔහු එය නැවත ඉක්මනින් නිවැරදි කළේය.)නෑ ඇල්බස් එයාගේ පුතා නොවුනනම් කියලද....

Hermione :- රොන්......

Albus/Ron :- ඔයාට කියාගන්න බැරි උන ටික ඉතින් මම කිව්වේ.

Hermione :- ඔහු දැනගනීවි.අපි කියන හැමදේකින්ම...ඔයා අදහස් කළේ එයා හිතන දේ නෙමේ කියලා...

Albus/Ron :- නමුත්,අපි කියන්නේ අපි අදහස් කරන දේ ම නම්...මොකක්ද එහෙනම්?

Hermione :- රොන...කරුණාකරලා නවත්තගන්න.දැන් ඕකට වෙලාව නෙමේ...

Albus/Ron :- ඔව් ඇත්තෙන්ම.මේ ඒකට වෙලාව නෙවේ...බයි..බායි.. මගේ සොඳුරිය.

Albus/ron ඇය යන දෙස බලා සිටියේ ඇය ඇගේ කාර්යාලය පසුකර යාවි යැයි දැඩි විශ්වාසයෙනි.නමුත් එසේ සිදු නොවිණි.රොන් මෙන් සිටි ඇල්බස් වහා දිව ගොස් හමයිනිගේ මඟ අහුරමින් ඇයව වැලැක්වූයේය.ඔහු එක්වරක් ඇයව වැලැක්වූයේ.නැවතත් ඔහු ඒ දෙයම කළේය.ඔහු එහාට මෙහාට පනිමින් ඇයව වැලැක්වූයේය...

Hermione :- ඇයි ඔයා මගේ කාර්යාලයට යන එකෙන් මාව වළක්වන්න හදන්නේ...

Albus/Ron :- මේ මම...නෑ මම මොකුත් වළක්වන්නේ නෑනේ...

ඇය නැවතත් දොර ඇරීමට උත්සාහ කළාය. ඔහු නැවතත් ඇයව වැලැක්වූයේය.

Hermione :- ඔයානම්,මගේ කාර්යාලයට යන්න ඉඩ දෙනවා රොන්...

Albus/Ron :- අපි තව ළමයෙක් හදමු!!!

හර්මයිනී ඔහුව පසෙකට තල්ලු කරමින් දොර වෙත යාමට සැරසුනි..

Hermione :- මොකක්!?!??

Albus/Ron :- නැත්නම් තව ළමයෙක් නෙමෙයි..මම කියන්නේ තව නිවාඩුවක්.මට ළමයෙක් හරි නිවාඩුවක් හරි ඕනෙ කියලා මම බල කරල ඉල්ලනවා ඔයාගෙන්.මට ඒ ගැන ඔයත් එක්ක කතා කරන්න ඕනේ මගේ පැටියෝ....

ඇය ඇගේ කාර්යාලයට යාමට අවසන් උත්සාහයත් දැරුවා.ඒ මොහොතේ ඔහු ඇයව වළක්වමින් හාදුවක් දුන්නේය.එය ඉතාමත් හොඳ වළක්වා ගැනීමේ ක්‍රමයක් විය..

Albus/Ron :- සමහර විට leaky cauldron එකක් බොන ගමන්.ඔයාට ගොඩාක්... ආදරෙයිනෙ මම....

Hermione :- (ඇගේ ක්‍රෝධය අඩු කර ගනිමින්)

හැබැයි මේක ඔයා කරනවා වගේ ජරා මෝඩ විහිළුවක් නම්,අඩුම තරමේ මර්ලින්ටවත් ඔයාට උදව් කරන්න බැරි වේව.(මර්ලින්ටවත් බෑ..මෙය ඔවුන්ගේ විහිලු ක්‍රමයක්.)අපිට සාමාන්‍ය මිනිස්සුන්ව දැනුවත් කරන්නත් තියෙනවා...

ඇය හැරී සමග නික්ම ගියාය.Albus/Ron දොර දෙසට හැරුනි.නැවත හර්මයිනී තනියම පැමිණියාය.

Hermione :- බබෙක්ද ඕනෙ..නැත්නම් නිවාඩුවක්ද..
සමහර දවස් වලට ඔයා නම් හරිම අමුතුයි.. ඔයා ඒක දන්නවද!!!

Albus/Ron :- ඉතින් ඒකනේ ඔයා මාව කසාද බැන්දේ.එහෙම නේද.මට විනෝදකාමී දගකාර හැඟීම්නේ තියෙන්නේ...

ඇය නික්ම ගියාය.Albus/ron දොර ඇරීමට උත්සාහ කරන විට නැවත ඇය පැමිණියාය. ඔහු එක්වරම දොර වසා දැමුවේය.

Hermione :- මට මාළු රසක් දැනුනා.මම ඔයාට කිව්වා පිශ්පින්ගර්ස් සැන්ව්විචර්ස් වලින් ඇත්වෙලා ඉන්න කියලා හොදේ...

Albus/Ron :- ඔයා හරි..මම එහෙම කරන්නම්...

ඇය නැවත නික්ම ගියාය.ඔහු,ඇය මෙවර යන්න ගියේ දැයි සැක හැර දැනගත් පසු දොර විවෘත කළේය.

---

1 වන ජවනිකාව (19 වන දර්ශනය)

මායා ආමාත්‍යංශය , හර්මයිනිගේ කාර්යාලය

Scorpius/harry , Delphi/hermione හර්මයිනීගේ කාර්යාලය තුළ රැඳී සිටියහ.Albus/ron ඒ වෙලාවෙහි ම හතිලමින් එයට ඇතුළු විය....

Albus/ron :- ඒකනම් ගොඩක් ම එපාවෙන වැඩක්...

Delphi/hermione :- ඔයා නියමයිනේ..ඒකනම් නියම නවත්වා ගැනීමේ ක්‍රමයක්...

Scorpius/harry :- මම ඔයත් එක්ක 5ක් දාන්නද නැත්නම් ඔයාට රවන්නද කියලා මට තේරෙන්නේ නෑ..මොකද ඔයා ඔයාගෙ නැන්දව සිපගත්තා...

Albus/ron :- රොන් කියන්නේ ආදරණීය කෙනෙක්..මම හැදුවේ එයාව ඒකෙන් නොමග යවන්න..මම කොහොමහරි එයාව නොමග යැව්වා...

Scorpius/harry :- එතකොට ඔයාගෙ තාත්තා කිව්වේ මොකක්ද...

Albus/ron :- ඔයාට ඒක ඇහුණ ද??

Delphi/hermione :- කොහෙද හර්මයිනී මේ කාල යන්ත්‍රය හංගලා ඇත්තේ...
ඇය වටපිට බලනවිට පොත් රාක්කයක් දක්නට ලැබීය.
මේ පොත් රාක්කේ හොයලා බලමු...

ඔවුන් සෙවීම ඇරඹීය.Scorpius/harry ඔහුගේ යහළුවා දෙස බැලුවේය...

Scorpius/harry :- ඇයි ඔයා මට ඒක කිව්වේ නැත්තේ...

Albus/ron :- මගේ තාත්තා කියනවා මම එයාගෙ පුතෙක් නොවුණා නම් හොඳයි කියලා..ඒ වගේ දේකින් කතාබහක් ඇති කරගන්න අමාරුයි...
හරි එහෙම නැද්ද කියන්නකෝ...

Scorpius/harry ඔහුට කීමට යමක් සිතමින් සිටියේය...

Scorpius/harry :- මම දන්නවා අර වොල්ඩමෝර්ට්ගේ කාරණාව ඇත්තක් නෙමෙයි කියලා.ඒවගේ ම ඔයා දන්නවා සමහර විට මට මගේ තාත්තා හිතන විදිහ ගැන තේරෙනවා කියලා...

Albus/ron :- නමුත් තාමත් මගේ තාත්තට වඩා ඔයාගෙ තාත්තා ඔයාට ආදරෙයිනේ.. මට හොඳටම විශ්වාසයි මගේ තාත්තා හිතන වෙලාවෙන් වැඩි කොටසක් යොදවා ඇත්තේ මට "කොහොමද..?" "සමාවෙන්න" කියලා කියන්න වෙන්න ඇති...

Delphi/hermione සහ Scorpius/harry පොත් රාක්කය ඇවිස්සූහ...

Delphi/hermione :- සමහරවිට අපිට පුළුවන් වෙයිද අපි මේ දැන් කරන කාරණාවට හිත යොදවන්න....

Scorpius/harry :- මගේ අදහස නම් අපි යාළුවො වෙන්න මොකක්හරි ම තේරුමක් තියෙන්න ඕනේ.. ඇල්බස් අපි එකිනෙකා හමුවුන හේතුව,ඔයා දන්නවනේ.? ඒ වගේම මේක කොච්චර ත්‍රාසජනක ද කියලත්....

ඒ වෙලාවේ ඔහුට එක් පොතක් නෙත ගැටිණි...

Scorpius/Harry :- ඔයාලා දැක්කද මේ රාක්කවල තියෙන පොත්...
ඒවා සමහරක් වටිනා වගේම භයානක පොත්..සමහර ඒවා නීතිවිරෝධී පොත්.ශාප කරන පොත්...

Albus/ron :- ස්කෝපියස්ගේ ගැටලු සහගත දුක හිතෙන හැඟීම් නැති කරන්න හොඳම ක්‍රමය මොකක්ද..ඒකට හොඳම දේ තමයි එයාව පුස්තකාලයකට එක්කන් යන එක..

Scorpius/harry :- මේ හැම පොතක්ම පරිශීලකයන්ට සීමා කරපු කාණ්ඩයට අදාළ ඒවා වගේම තවත් සමහර ඒවා...Magic mostle Evile , 15th century friends , Sonnets of a sorcerer...මේවා හොග්වෝර්ට්ස්වලවත් නැහැනේ...

Albus/ton :- Shadows and spirits , The nightshade guide to Necromancy...

Delphi/hermione :- ඒවා නිකන් දේවල් විතරයි නේ...එහෙමනේ...

Albus/ron :- the true history of the opal fire , the imperius curse and how to use it...

Scorpius/harry :- ඒවගේම බලන්නකෝ මේ දිහා....my eyes and how to see past them by Sybill Trelawney..
දිවැස් කියන්න පුළුවන් පොතක්.හර්මයිනි ග්‍රේන්ජර්ට පේන්න බැනේ දිවැස් බලන එක. මේකනම් සිත් ඇදගන්නා සුලු පාටයි.. මේක නම් හොයාගන්න....

ඔහු එම පොත ඇද්දේය..එය බිම වැටී විවර වී කතාකරන්න පටන් ගත්තේය..

Book :- පළමුවැන්න 4 වැන්නයි ,
කලකිරවන සලකුණකි.
ඔබ එය සොයාගනීවි පාක් කලවිට
(english word එක "parked" හැබැයි උද්‍යානය නොවේ..
(ජේනවනේ පලවෙනි word එකේ "ed" තියෙනවා..)

Scorpius/harry :- හොඳයි ඒ කිව්ව දේවල් ඒවනම් ටිකක් අමුතුයි...

Book :- දෙවැන්න වන්නේ..
දෙපයින් ඇවිදිනවා.
කුණු තැවරුණු ,
කෙස් ඇති බිත්තරයක ඇති ලෙඩකි..
ඒ වගේම තුන්වැන්න,
ගමන් මාර්ගයක් තෝරගන්න
වගේම කන්දක් නැගීමට
කියන දෙකටම ඕන දෙයකි...

Albus/ron :- ඒක ප්‍රහේලිකාවක්..ඒක අපිට ප්‍රෙහෙලිකාවක් දීලා තියෙන්නේ

Book :- නගරයක හැරවුමක්..
විලක් හරහා ලිස්සායාමක්...

Delphi/hermione :- මොකද්ද අනේ ඔයා මේ කළේ... විකාරයි වගේ මේක නම්...

Scorpius/harry :- මම...ආහ්.. මම පොතක් දිග ඇරියා.. මම මේ ලෝකෙ ඉන්න තාක් කල් කරපු භයානකම වැඩේ මේක නෙමේනේ...

පොත් රාක්කයෙන් එළියට විසිවී ගොස් Albus/ron අල්ලා ගත්තේය.ඔහු ඒවා මග හරිමින් හයියෙන් හුස්ම ගනිමින් සිටියේය..

Albus/ron :- මොකද්ද ඒ වෙන්නේ...

Delphi/hermione :- ඇය සන්නද්ධ වෙලා ඉඳලා තියෙන්නේ.ඇය ඇගේ පුස්තකාලය සන්නද්ධ කරලා.එතන තමයි කාල යන්ත්‍රය තියෙන්න ඕන.ප්‍රෙහේලිකාව විසඳගන්න අපිට ඒක හොයා ගන්න ලැබේවි...

Albus/ron :- පළමු වැන්න 4 වැන්නයි ඔබට එය ගාල් කරාම ලැබේවි..නමුත් පාක් එකකදී නොවේ..Ed...Ed...

පොත් වලින් Delphi/hermione ගිල ගැනීමට පටන් ගැනිණි...

Scorpius/harry :- දෙවැන්න බිත්තරයක රෝගයකි..දෙපයින් ඇවිදියි...

Delphi/hermione :- (හැඟීම්බරව) මිනිස්සු!!
De - men..tors..අපි භූතආරක්ෂකයන් ගැන තියෙන පොතක් හොයන්න ඕනෙ.
පොත් රාක්කය ඇයව ඇතුලට ඇද ගනිමින් සිටියේය.
ඇල්බස්......

Albus/ron :- ඩෙල්ෆී..... මොකක්ද වෙන්න යන්නෙ??

Scorpius/harry :- හිත එකඟ කරගන්න ඇල්බස්.. එයා මොකක්ද කිව්වෙ..භූත ආරක්ෂකයන් ගැන පොතක් හොයන්න හැබැයි පරිස්සමින්...

Albus/ron :- මෙන්න.භූත ආරක්ෂකයන්ගේ පැවතීම.ඇස්කබාන් සත්‍ය ඉතිහාසය..

පොත එක්වරම පාවී ගොස් විවෘත වී ඔවුන් දෙදෙනා ඉදිරිපිට පැද්දෙන්නට විය.

Book :- කවුද නිවැරැදි මාර්ගය රවටලා යන්න හදන්නේ??

ඇල්බස් පොත් අස්සෙන් රිංගමින් නැවත පොත් රාක්කය අසලට යාමට ගත් උත්සාහය පොත වැළැක්වීය....

Book :- මම ඉපදුනේ කූඩුවක
නමුත් එය වෛරයෙන් පිරී තිබුනේ
මම ඇතුලෙන් කෘශයි
මේ ප්‍රහේලිකාවෙන් මාව නිදහස් කරන්න එයයි මා නැවැත්වීමට නම් ඔබ කළ යුත්තේ

Albus/ron :- වොල්ඩමෝර්ට්

ඩෙල්ෆි පොත් අතර ගිලෙමින් සිටියාය.මේ වනවිට ඇය ඩෙල්ෆි බවට පරිවර්තනය වී තිබිණි...

Delphi/hermione :- ඉක්මනට උත්සාහ කරන්න...

ඇය නැවත ඇතුලට ඇද ගත්තාය.ඇය කෑ ගැසුවාය...

Albus/ron :- ඩෙල්ෆි...ඩෙල්ෆී....

ඇයගේ අත අල්ලා ගැනීමට උත්සාහ කළත් ඒ වන විටත් ඇය පොත් අතර ගිලී ගොස් සිටියාය...

Scorpius/harry :- එයා නැවත ඩෙල්ෆි වුනා.. ඔයා ඒක දැක්කද...

Albus/ron :- නෑ,මොකද මම ගොඩක්ම වද උනේ ඇයව පොත් රාක්කයක් මගින් ගිලගත්ත එක ගැන...සොයන්න!
තව පාරක් උත්සාහ කරන්න..

ඔහු පොතක් සොයා ගත්තේය.

"ස්ලිදරින්වල ඉතිහාසය" මොකද ඔයා හිතන්නේ...

ඔහු පොත රාක්කයෙන් එළියට ඇද්දේය.. එය නැවත ඇතුළට තල්ලු විය.ඒ සමගම Albus/ron එලියට ගැනීමට උත්සාහ කල පොත සමගම පොත් රාක්කය තුළට ඇදී ගොස් නොපෙනී ගියේය....

Scorpius/harry :- ඇල්බස්...ඇල්බස් !!!

නමුත් ඇල්බස් පොත් රාක්කය තුල නොපෙනී ගොස්ය...

හොඳයි ඒක නොවේ එහෙනම්.....

ඔහු පොත් රාක්ක හොඳින් පිරික්සුවේය.

මාවලෝ...ඇත්ත යනු...සමහරවිට මේක..

ඔහු එය ඇද්ද විට එම පොත විවෘතවිය. එයද නැවත පැද්දීමට පටන් ගැනිනි.මඳ ආලෝකයක් ද මතු කරමින් පෙර පොතෙන් ආ කටහඬට වඩා ගැඹුරු කට හඬකින් කථා කළේය...

Book :- මම තමයි ඔබ නොදැකපු ජීවියා. මම ඔබයි.මම මමමයි.කලින් නොදැකපු අනුකරණයයි
සමහර විට ඉදිරියෙන් සමහරවිට පසුපසින් ස්ථිර බැඳීමකින් අපි බැඳී සිටිනවා...

ඇල්බස්ව නැවත වරක් පොත් අතරින් පෙනී සිටින්නට විය.ඔහු නැවත ඇල්බස් බවට පරිවර්තනය වී තිබේ.

Scorpius/harry :- ඇල්බස්.....

ස්කෝපියස් ඔහුව අල්ලා ගැනීමට උත්සාහ කළේ ය

Albus/ron :- නෑ...හිතන්...හි..ත..න්..න...

ඇල්බස්ව නැවතත් දරුණු ලෙස පොත් රාක්කය තුළට ඇද ගත්තේය...

Scorpius/harry :- නමුත් මට බෑ... නොපෙනෙන අනුකරණයක්...
මොකද්ද ඒ??
මම දක්ෂ එකම ද,දෙයක් ගැන හිතන්න ඒ වගේම මට හිතන්න ඕනි උනාම මට ඒක කරගන්න බෑ...

පොත් රාක්කය ඔහුව එක්වරම ඇතුලට ඇද ගත්හ.ඔහු බල රහිත විය.මෙය බිය දනවන සුලු වැඩකි.

පසුව කාමරය නිශ්ශබ්දතාවකින් ගිලී ගියේය...

එක්වරම පිපිරීම් හඬක් සමගින් පොත් රාක්කයෙන් පොත් ගංගාවක් ගලා ගියේය.එසැනින් ස්කෝපියස් පෙනී සිටින්නට විය.ඔහු පොත් එහෙට මෙහෙට තල්ලු කරමින් විසි කරන්නට විය.

Scorpius :- නෑ...ඔයාට බැහැ Sybill Trelawney...නෑ...!!!

ඔහු වටපිට බැලුවේය.ඔහුව නැවත පොත් අතර ගිලී යෑමට ආසන්න වුවත් ඔහු ශක්තියෙන් යුක්ත විය.මේ හැම දේම වැරදියි..
ඔයාට මාව ඇහෙනවද ඇල්බස්??
මේ හැමදේම මගුල් කාල යන්ත්‍රයක් නිසාන...
හිතන්න...හිතන්න...හිතන්න ස්කෝපියස්..

පොත් ඔහුව දැඩිව අල්ලාගෙන සිටියේය

ස්ථිර බැඳීමක්.සමහරවිට ඉදිරියෙන් සමහර වෙලාවට පසුපසින්.ඔහොම ඉන්න මට අමතක වුනා..
"සෙවනැල්ල"
ඔබ සෙවනැල්ලක... සෙවනැලි සහ ආත්ම ඒක වෙන්න ඕන..

ඔහු පොත් රාක්කයේ උඩට නැග්ගේය.ඔහු ඉහලටම නැගුනු..තබන තබන පියවරක් පාසා පොත් ඔහුව අල්ලා ගැනීමට උත්සාහ කළේය

ඔහු සෙවණැලි සහ ආත්ම නම් පොත රාක්කයෙන් ඇද්දේය.එය එළියට ඇදෙත්ම මෙතෙක් වූ ශබ්දය සහ අවුල් ජාලය නිම විය..

ඒකද එතකොට...

එකවරම විශාල ශබ්දයක් සමග ඇල්බස් හා ඩෙල්ෆි පොත් රාක්කයෙන් එළියට තල්ලු වී බිම වැටුණි...

අපි පරාද කළා...අපි පුස්තකාලය පරාද කළා...

Albus :- ඩෙල්ෆි,ඔයාට ...

Delphi :- නියමයිනේ...මරු ගමන...

ඇල්බස් , ස්කෝපියස් පපුවට තුරුළු කරගෙන සිටි පොත දැක්කේය..

Albus :- ඒකද පොත??ස්කෝපියස්?? මොකක්ද පොත ඇතුලෙ තියෙන්නෙ??

Delphi :- මම හිතන්නේ අපි ඒක හොයාගන්න ඕනෙ නේද...

ස්කෝපියස් පොත විවෘත කළේය.එහි මැද දිලිසෙන කාලයන්ත්‍රය තිබිණි..ම්

Scorpius :- අපි කාල යන්ත්‍රය සොයා ගත්තා. මම හිතුවේ නෑ අපිට මෙච්චර ඉක්මනට එක ලැබෙයි කියලා.

Albus :- මචං..දැන් අපිට මේක ලැබිලා තියෙන්නේ.දැන් දෙවන පියවර තමයි සෙඩ්‍රික්ව බේරගන්න එක.අපේ ගමන තාම පටන් ගත්තා විතරයි...

Scorpius :- තාම පටන්ගත්තා විතරයි..ඒ උනාට අපිව බාගෙට මැරිලා වගේ..
හොඳයි..මේක නම් හොඳ වෙයි වගේ..

කොඳුරන හඬවල් රාශියක් වටපිටාවෙන් ඇසෙන්නට විය...එය ටික වේලාවකින් ඝෝෂාවක් බවට පත්වෙමින් තිබුණි... එක්වරම සියල්ල අඳුරු විය

=====================================

✊දෙවන ජවනිකාව ඇරඹුන වගයි✊

🌑දෙවැනි ජවනිකාව (1වන දර්ශනය)

😴 සිහිනය, ප්‍රිවෙට් ඩ්‍රයිව් , පඩිපෙළ යට කබඩ් එක🏠

Aunt petunia :- හැරී..හැරී..
මේ භාජන පිරිසිදු කරලා නෑ මේ භාජන අපිරිසිදුයි...හැරී පොටර්..නැගිටින්න

කුඩා හැරී නැගිට ඔහුට යටිගිරියෙන් කෑ ගැසීමට හේතු විමසීය.

Young harry :- petunia පුංචි අම්මේ දැන් වෙලාව කීයද ??

Aunt petunia :- වෙලාව අවසානයි..
ඔයා දන්නවනේ අපි ඔයාව ගෙදරට අරගන්න එකඟ වුණේ අපි හිතුවා ඔයාව හොඳ හැදිච්ච සදාචාර සම්පන්න මනුස්සයෙක් කරන්න පුළුවන් වෙයි කියලා. ඉතින් මම හිතනවා ඔයා එහෙම වෙන්නේ නැත්නම් අපිට බනින්න සිද්දවෙනවා කියල..
කොච්චර නරක බලාපොරොත්තු කඩ වීමක් ද ඒක...

Young harry :- මම උත්සාහ කරන්නම්..

Aunt petunia :- උත්සාහ කරන්නම්..
කියන එක දියුණු වීමේ සිතුවිල්ලක් නෙමේ.එහෙමනේද?..
වීදුරුවල තෙල් ගෑවිච්ච පාරවල් තියනවා.තේ පෝච්චියේ වගේම තව භාජනවල අත් පාරවල් තියෙනවා.දැන් නැගිටලා කුස්සියට ගිහින් ඒවා අතුල්ලන්න පටන් ගන්න...

ඔහු ඇඳෙන් බැස්සේය.ඔහුගේ දිග කලිසමේ තෙත පැල්ලමක් සටහන්වී තිබුනි...

අපොයි නෑ...අපොයි නෑ...ඔයා ආයිම ඇඳුම් තෙත් කරලා නේද

ඇය ඇඳ කවර අයින් කළාය.

ඒක නම් කොහෙත්ම පිළිගන්න පුළුවන් වැඩක් නෙවෙයි..

Young harry :- මට සමාවෙන්න මම හිතන්නේ මම නරක හීනයක් දැකලා..

Aunt petunia :- ඔයා මහ පිළිකුල් සහගත ළමයෙක්.තිරිසන් සත්තු විතරයි ඉන්න තැනම තෙමා ගන්නේ.තිරිසන් සත්තුයි පිළිකුල් සහගත පොඩි කොලුවොයි..

Young harry :- ඒක මගේ අම්මගෙයි තාත්තගෙයි ගැන හීනයක්.මම හිතන්නේ මම එයාලව දැක්කා මම හිතන්නේ මම එයාල මැරෙනවා දැක්කා..

Aunt petunia :- එහෙමද...ඒකෙන් කියන්නේ මම ඔයාගේ කතාව පොඩ්ඩක් හරි අහන්න ඕනේ කියලනේ..එහෙනම් කියමුකො බලන්න...

Young harry :- එතන හිටපු එක මනුස්සයෙක් Ad..Ada..... නිකං Acabra වගේ වචනයකුයි...ඊට පස්සේ නයෙක් වගේ පිඹිනවා ඇහුනා.
ඊට පස්සේ මගේ අම්මා කෑ ගහනවා ඇහුනා...

හැරී කියූ දෙයින් අන්ද මන්ද වී සිටි petunia පුංචි අම්මා නැවත පියවි සිහියට ඒමට උත්සාහ ගනිමින් සිටියාය...

Aunt petunia :- ඔයාට ඇත්තටම එයා මැරුණ විදිහ දැනගන්න ඕනේ නම් ඔයාට ඇහෙන්නේ විශාල බ්‍රේක් පාරක හඩක් එක්ක බය හිතෙන හැප්පීමක් විතරයි. ඔයාගේ දෙමව්පියෝ මැරුනේ වාහන අනතුරකින් ඔයා දන්නවනේ ඒක.මම හිතන්නේ නෑ ඔයාගේ අම්මට කෑගහන්නවත් වෙලාවක් ඉතුරු වුණා ද කියලා..ඒකෙන් වැඩක් නෑ දැන්..
ඇඳුම් ගලවලා දාල , ශීට්ස් ටික අයින් කරලා කුස්සියට යන්.ගිහිල්ලා අතුල්ලන්න පටන් ගන්න.මම ඔයාට තව සැරයක් ඔයාට කියන්න ඉඩ තියන්න එපා...

ඇය විශාල ශබ්දයක් නගමින් පිටවී ගියාය.

එවිට කුඩා හැරී ඇඳේ කවර ඉවත් කරමින් සිටියේය...

එක්වරම ගස් ගොන්නක් මතුවී සිහිනය වෙනස්ම ආකාරයට මාරුවිය...
එම ගස් ගොන්න අතරින් ඇල්බස් මතුවිය. ඔහු හැරී දෙස බලා සිටියේය.


මේ අතර කාමරයේ අඳුරු මුල්ලකින් පටන් ගෙන මුලු කාමරය පුරාම parseltounge භාෂාවෙන්(සර්ප භාෂාව) කෙදිරිලි හඬවල් ගොඩක් මතුවිය..

ඔ..හු එ..න..වා...ඔහු..එනවා

ඉතා පැහැදිලි කටහඬකින් වචන ගලා එන්නට විය...වොල්ඩමෝර්ට්ගේ කටහඬ...

හැ...රී...පො..ට...ර්...

---




දෙවැනි ජවනිකාව 2වන දර්ශනය

හැරී සහ ජිනී පොටර්ගේ නිවසේ තරප්පු පෙළ

හැරී එක්වරම අඳුරේ අවදි විය.ඔහු තදින් හුස්ම ගනිමින් සිටියේය.ඔහුගෙන් අධික වෙහෙසකර බවක් පැහැදිලි ලෙස පෙන්නුම් කෙරිණ.ඔහුගේ බය වැඩිවෙමින් වෙමින් තිබුණි...

Harry :- lumos...

ජිනී එම එලියෙන් පුදුම වී ඇහැරුනාය...

Ginny :- ඔයා හොඳින්ද හැරී !!!

Harry :- මම නිදාගෙන හිටියේ..

Ginny :- ඔව් ඔයාගේ නිදාගෙන තමයි හිටියේ...

Harry :- ඔයාගේ ආවේ නැද්ද කිසිම ආරංචියක්!! කිසිම බකමූණෙක්??නැත්නම්..

Ginny :- කිසිවක් නැහැ...

Harry :- මම හීනයක් දැක්කා.මම පඩිපෙළ යට කබඩ් එකේ හිටියේ..මට කටහඬක් ඇහුනා..වොල්ඩමෝර්ට්ගේ..හොදට පැහැදිලිව...

Ginny :- වොල්ඩමෝර්ට්ගේ !!!

Harry :- ඒ වගේම ඊටපස්සේ මම දැක්කා ඇල්බස්ව.එයා රතුපාට ඇඳුමක් ඇඳගෙන හිටියේ..එයා ඩර්ම්ස්ට්‍රැන්ග් නිල ඇඳුමක් ඇඳගෙන හිටියේ..

Ginny :- ඩර්ම්ස්ට්‍රැන්ග් නිල ඇඳුමක් !!!!

හැරී කල්පනා කළේය.

Harry :- ජිනී මම හිතන්නේ මම දන්නවා එයා කොහෙද ඉන්නේ කියලා...

දෙවැනි ජවනිකාව 3වන දර්ශනය

හොග්වෝර්ට්ස් වල පාසල් විදුහල්පතිනියගේ කාර්යාලය

හැරී සහ ජිනී මහාචාර්ය මැගෝනිගල් ගේ කාර්යාලයේ විය.

Prof macgonigal :- ඉතිං අපි දන්නේ නෑ අඳුරු වනාන්තරය ඇතුලේ කොයි හරියෙද කියලා...

Harry :- මම අවුරුදු ගානකින් එහෙම හීනයක් දැකලා නෑ..නමුත් ඇල්බස් එහේ ඉන්නවා.. මම ඒක දන්නවා.

Ginny :- අපි පුලුවන් ඉක්මනින් එයාලව හොයාගන්න ඕනෙ....

Prof macgonigal :- මට ඔයාට මහාචාර්ය longbottomගේ සහයෝගය අරන් දෙන්න පුළුවන්.ශාක පිලිබද එයාගේ දැනුම ඔයාලට වැදගත් වේවි.ඒ වගේම....

එක්වරම කාර්යාලය චිමිනිය තුලින් යමෙක් දහලන ශබ්දයක් සමග ඉන් හර්මයිනී පිටතට පැමිණියාය...

Hermione :- ඒක ඇත්තක්ද මට උදව් කරන්න පුළුවන්ද ...!!!

Prof macgonigal :- ඇමතිතුමියනි මේක නම් බලාපොරොත්තු නොවුන දෙයක්...

Ginny :- ඒක මගේ වැරැද්ද මම ඩේලිප්‍රොෆිට් එකේ හදිසි ප්‍රකාශනයක් නිකුත් කරන්නේ එයාලව නම්ම ගත්තා.. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන අයව හොයාගන්න...

Prof macgonigal :- හොඳයි...ඒකනම් මොලේ ඇති වැඩක්...මම අපේක්ෂා කරනවා තව කවුරුහරි එකතුවෙයි කියලා..

රොන් ද එකවර කඩා පාත් විය.ඔහු දැලි වලින් නැහැවී තිබුණි.එමෙන්ම ඔහු හොදි ගෑවුනු නැප්කින් එකක්ද හැද සිටියේය....

Ron :- මට මොනවා හරි මග හැරුණද..
මට හිතාගන්න බැරි හිටියේ කොහෙටද යන්න ඕන කියලා..කොහොමහරි මම කුස්සියට ඇවිත් තිබුණා..(ඔහු ඔහුගේ නැප්කින් ඉවත් කරන විට හර්මයිනී රවා බැලුවාය) මොකද.....

එක්වරම තවත් ශබ්දයක් චිමිනිය තුලින් ඇසිනි....එම මොහොතේ විශාල දැලි සහ දූවිලි ගොඩක් මැදින් ඩ්‍රැකෝ මතු විය...

සියලු දෙනාම මවිත වී ඔහු දෙස බලා සිටියහ..ඔහු තම කබායේ දූහුවිලි සහ දැලි පිස දමන්නට විය...

Draco :- ඔයාගේ පොලවට වෙච්ච දේ ගැන සමාවෙන්න මිනර්වා...

Prof macgonigal :- සමහරවිට මම ඒක මගේ වැරැද්දක් විදියට බාර ගන්නම් මොකද මට චිමිනියක් තිබුණ නිසා...

Harry :- ඔයාව දැකීම පුදුමයක් ඩ්‍රැකෝ..
මම හිතුවේ ඔයා මගේ හීන ගැන විශ්වාස කරන්නේ නෑ කියලා...

Draco :- නෑ තමයි...
නමුත් ඔයාට හැමදාම වාසනාව තියෙනවා. හැරී පොටර් ඔයා හරිම වෙලාවේ හරිම තැන ඉන්නවා...ඒ වගේම මට මගේ ළමයාව ආරක්ෂිතව නැවත මගේ ලගට ගන්නත් ඕන...

Ginny :- අපි අඳුරු වනාන්තරයට ගිහින් ඒ දෙන්නව සොයාගමු...

දෙවන ජවනිකාව 4වන දර්ශනය

අඳුරු අඳුරු වනාන්තරය අද්දර සිට

ඇල්බස් සහ ඩෙල්ෆි මූණට මූණ බලාගෙන තමන්ගෙ යෂ්ටි අතේ තබාගෙන සිටියහ..

Albus :- Explliarmus!!!

ඩෙල්ෆිගේ යෂ්ටිය අවකාශයෙහි විසිවී ගියේය...

Delphi :- ඔන්න දැන්නම් ටිකක් හොදයි වගේ...
ඔයා ටික ටික මේක ඉගෙන ගන්නවා....

ඇය නැවතත් ඇල්බස්ගෙන් තම යෂ්ටිය ගනිමින් පැවසීය...

(වැදගත් ස්වරයෙන්)
ඔයා නියමෙට කෙනෙක්ව නිරායුධ කරනවා තරුණ කොල්ලෝ...

Albus :- Expelliarmus!!!!

ඇයගේ යෂ්ටිය නැවතත් විසි වී ගියාය...

Delphi :- ඔන්න ඒ වගේම අපිට දැන් ජයග්‍රාහකයකු ඉන්නවා...

පහක් දාන්න

Albus :- මම කවදාවත් මන්ත්‍ර ජප කරන එකට දක්ශ වෙලා නෑනෙ...

එවෙලේ scorpius ද එතැනට පැමිණියේය. ඇල්බස් ගැහැණු ළමයෙක් සමඟ කථා කරමින් සිටියේය..scorpiusගේ සිතේ එක කොටසක් එයට කැමැති වූ අතර අනෙක් කොටස එයට අකමැති විය....

Delphi :- මමත් වැඩකට නැති කුණු ගොඩක් ඉස්සර...ඒ උනාට මම පස්සේ යමක් කමක් ඉගෙන ගත්තා.ඒ වගේම ඔයාටත් ඒක පුළුවන් මම කියන්නේ ඔයා සුපිරි මායා කරුවෙක් හරි වෙනයම් කෙනෙක් වෙයිද කියලා...නමුත් මම හිතන්නේ ඔයා හොඳ මායාකාරයෙක් වෙයි ඇල්බස් පොටර්...

Albus :- නම් ඔයා මගේ ලගින්ම ඉදන් මට තව හොඳට උගන්වන්න...

Delphi :- ඇත්තෙන්ම..මම ලගින් ඉන්නම්.අපි යාලුවොනේ..එහෙම නේද??

Albus :- ඔව්..ඔව්... අනිවාර්යයෙන්ම යාලුවො අනිවාර්යයෙන්ම...

Delphi :- නියමයි wizzo..(wizard එක කෙටි කර යාලුකමට කියන වදනකි)

Scorpius :- මොකක්ද wizzo කියන්නේ...

scorpius තීරණාත්මක ලෙස පියවර තබමින් ඉදිරියට පැමිණෙන ගමන් ඇසුවේය....

Albus :- මම බන්ධනය කැඩුවා..මම කිව්වේ ඒකතාම ප්‍රාථමික මට්ටමේ,නමුත් මම ඒක හොඳට කළා...

Scorpius :- (උද්යෝගයෙන් පිරී ගොස් කණ්ඩායමට එක්වී) ඒ වගේම මමත් හොයාගත්ත ඉස්කෝලෙට යන්න පාරක්.. ඔයාලට විශ්වාස ද මේ වැඩේ වැඩකරයි කියල???

Delphi :- ඔව්...

Albus :- ඒක නියම අදහසක් රහස තමයි අපි සෙඩ්‍රික්ට triwizard තරගාවලිය දිනන්න ඉඩ දෙන්න හොඳ නෑ..එයා දිනුවේ නැත්නම් එයා මැරෙන්නෙ නැනෙ...

Scorpius :- හරි මට තේරෙනවා නමුත්...

Albus :- ඉතින් අපි එයාගේ අවස්ථාවන් අපිට පුළුවන් උපරිමයෙන්ම කඩාකප්පල් කරලා දාන්න ඕනේ..පලවෙනි කාර්යයේ ඉඳලම පලවෙනි වැඩේ තමා මකරාගෙන් රත්තරන් බිත්තර ගන්න එක සෙඩ්‍රික් කොහොමද මකරව නොමගහැරියේ...

ඩෙල්ෆි ඇගේ අත අහසට දිගු කළාය.ඇල්බස් කට ආයාගෙන ඇය දෙස බලා සිටියේය..ඔවුන් දෙදෙනා දැන් දැන් හොඳින් මිත්‍ර වෙමින් සිටියහ...

Diggory....

Delphi :- කොහොමද දන්නවද සාමාන්‍ය ගලක් බල්ලෙක් බවට පරිවර්තනය කරලා...

Albus :- හොඳයි පොඩි expelliarmus මන්තරයකින් එක වලක්වා ගන්න පුළුවන් වෙයි අපිට...

ස්කෝපියස්ට ඔවුන් දෙදෙනාගේ මේ ක්‍රියා කරන ආකාරය ගැන වැඩි පැහැදීමක් නොවීය...

Scorpius :- හොඳයි කාරණා දෙකක් තියනවා.මුල්ම එක...
අපි සහතික වෙන්නේ කොහොමද මකරා එයාව මරන්නේ නැතිවෙයි කියලා...

Delphi :- එයා ගාව හැම තිස්සෙම කාරණා දෙකක් තියෙනවානේ..එහෙම නේද...
අනිවාර්යයෙන්ම එහෙම වෙන එකක් නෑ. මොකද මේ හොග්වෝර්ට්ස්.. එයාලා කිසිම තරඟකාරයෙක්ට හානිවෙන්න ඉඩ තියන්නේ නැතුව ඇති...

Scorpius :- හරි දෙවැනි කාරණාව...

ගොඩක්ම සිත් ඇදගන්නා කාරණාව.අපි කිසිම දෙයක් දන්නෙ නැතුව අතීතයට යන්න හදන්නේ..ඒක විනෝදයි වගේ තමයි. හොඳ නැද්ද මුලින්ම පැයක් විතර ආපස්සට ගිහිල්ලා උත්සාහ කරල බැලුවොත්....

Delphi :- මට සමාවෙන්න ස්කෝපියස්.. අපිට නාස්ති කරන්න කාලයක් නෑ. ඉස්කෝලෙට මෙච්චර ගොඩක් ළඟ තැනක මෙහෙම රැඳිලා ඉන්න එක ගොඩක් භයානක වෙන්න පුලුවන් දැනටමත් එයාලා ඔයාවයි මාවයි...

Albus :- ඇය හරි....

Delphi :- දැන් ඔයා මේක ඇඳ ගන්න හදන්නෙ...

ඇය ලොකු මලු දෙකක් ඇදලා ගත්තාය. කොළුවෝ දෙදෙනා මලු වලින් නිලඇඳුම් දෙකක් එලියට ගත්හ..

Albus :- නමුත් මේවා ඩර්ම්ස්ට්‍රැන්ග් නිල ඇඳුම්නේ...

Delphi :- මගේ මාමගේ අදහසක්.ඔයා හොග්වෝර්ට්ස් නිල ඇඳුමක් ඇදගෙන හිටියොත් මිනිසුන් හඳුනා ගනීවි ඔයා කවුද කියලා....
ඒ වුණාට triwizard එකට තවත් ඉස්කෝල දෙකක් සහභාගී වෙනවනේ.. ඔයාව ඒ තියෙන පසුබිමත් එක්ක ඔයාව අඳුරගන්න අමාරු වෙයි එහෙම නේද...

Albus :- නියම අදහසක්,පොඩ්ඩක් ඉන්න.කෝ ඔයාගේ නිල ඇඳුම...

Delphi :- ඇල්බස්,මට අනිත් අයව මට රවට්ටන්න පුළුවන්.ඒ වුනාට මම හිතන්නේ නෑ මට ශිෂ්‍යයෙක් වගේ රඟපාන්න පුළුවන් කියලා.ඔයා එහෙම හිතනව ද??
ඒ උනාට මම ඔයාල අහල පහලින් ඉන්න බලන්නම්.මම කවුරු හරි විදිහට ඉන්නම්.. ඕහ්...
සමහරවිට මට මකරු හීලෑ කරන්නෙක් විදිහට ඉන්න පුළුවන් වෙයි.හැබැයි ඔයා තමයි මන්ත්‍ර කියන වැඩ ටික කරන්න ඕන..

ස්කෝපියස් ඇය දෙස සහ නැවත ඇල්බස් දෙස බැලුවේය...

Scorpius :- ඔයා එන එක හොඳ නැහැ...

Delphi :- මොකක් !!!!

Scorpius :- ඔයා හරි.අපිට මන්ත්‍රය කියන්නත් ඔයාව ඕනෙ නැනෙ.ඔයා නිල ඇඳුමක් අදින්නෙත් නැනේ.ඉතිං ඒක ගොඩක් ලොකු අවදානමක්..
සමාවෙන්න ඩෙල්ෆි ඔයා එන එක හොඳ නැහැ...

Delphi :- නමුත් මම එන්න ඕනනේ..එයා මගේ ඥාති සහෝදරයනේ..ඇල්බස්???

Albus :- ඒත් මම හිතන්නේ ඔහු හරි..මට සමාවෙන්න

Delphi :- මොකක් !!!

Albus :- අපිට වැඩේ නාගන්න ඕනෙ නැහැනේ....

Delphi :- නමුත් මම නැතුව ඔයාලට කාල යන්ත්‍රය ක්‍රියා කරවන්න බැනේ...

Scorpius :- ඔයා කියලා දෙන්න අපිට ඒක පාවිච්චි කරන විදිහ...

ඩෙල්ෆි දැඩි ලෙස කණගාටුවට පත්විය.

Delphi :- නෑ මම ඔයාලට මේක කරන්න දෙන්නෙ නෑ...

Albus :- ඔයා ඔයාගේ මාමට කිව්වා අපිව විශ්වාස කරන්න කියලා..
දැන් ඔයාගෙ වාරේ.. දැන් ඉස්කෝලේ වහල ඇත්තේ අපිට සිද්ධ වෙනවා ඔයාව මෙතන දාල යන්න...

ඩෙල්ෆි ඔවුන් දෙදෙනා දෙස බලා ගැඹුරු හුස්මක් ගත්තාය.ඇය හිස වනමින් සිනාසෙන්නට විය...

Delphi :- එහෙනම් යන්න..නමුත් මතක තියාගන්න මේ අද ඔයාලට ලැබෙන්නෙ පොඩි අවස්ථාවක් විතරයි..ඔයාලා අතීතය වෙනස් කරන්න යන්නේ..ඔයාලා කාලය වෙනස් කරන්න යන්නේ..
නමුත් ඒ ඔක්කෝටම වඩා ඔයාලා කරන්න හදන්නේ මහලු මිනිහෙක්ට තමන්ගේ පුතාව ගෙනල්ලා දෙන්න දරන උත්සාහයක් කියලා මතක තියාගන්න...

ඇය සිනා විය ඇය ඇල්බස් දෙස බලා ටිකක් පහළට නැමී ඔහුගේ කම්මුල් දෙකම සිප ගත්තාය...

ඇය කැලෑව තුළට පියමං කලාය.ඇල්බස් ඇය යන දෙස බලා සිටියේය...

Scorpius :- ඇය මාව සිප ගත්තේ නැහැනේ. ඔයා ඒක දැක්ක ද..ඔහු තම යහළුවා දෙස බලමින් පැවසීය.ඔයා හොදින්ද ඇල්බස්?? ඔයා ටිකක් සුදුමැලි වෙලා වගේනෙ..ඒ වගේම රතු පාට වෙලා...
සුදුමැලි වෙලා,රතුපාට වෙලා එකම මොහොතේ...

Albus :- අපි මේක කරමු!!!!

---

2වන ජවනිකාව , 5වන දර්ශනය

අදුරු වනාන්තරය

වනාන්තරය විශාලයි.ඒ වගේම අඳුරු විය. මේ ගස් අතර අතුරුදන් වූ මායාකරුවන් දෙදෙනා සොයන මිනිසුන් රැසකි.නමුත් ක්‍රම ක්‍රමයෙන් එම මිනිසුන්ගෙන් හැරී වෙන්වී තනිවම ගමන් කරන්නට විය

ඔහුට යමක් ඇසුණි.ඔහු තම දකුණු පසින් ශබ්දය ආ දෙස බැලුවේය...

Harry :- ඇල්බස්??ස්කෝපියස්??ඇල්බස්???

එවේලෙහි ඔහුට හූ හඬක් ඇසුණි.ඔහු තරමක් බිය විය.මෙම හඬ එන්නේ කුමන දිශාවෙන් දැයි සොයා බැලුවේය...

එක්වරම බේන් ඔහු ඉදිරියට පැමිණියේය. ඔහු මනබඳිනා ශක්තිමත් නරාශ්වයෙකි.

Bane :- හැරී පොටර්...

Harry :- හොදයිනේ,ඔයා මාව අඳුරගත්තා එහෙනම්,බේන්...

Bane :- ඔයා දැන් ගොඩක් වැඩිමල් පාටයි නේ...

Harry :- එහෙම තමයි...

Bane :- නමුත් ප්‍රඥාවන්ත නම් නෑ...
මොකද අපි භූමියට අනවසරයෙන් ඇතුල් වෙලා තියෙන නිසා...

Harry :- මම හැමතිස්සෙම නවකයින්ට ගරු කරනවා.අපි සතුරෝ නෙමෙයි.ඔයා ගොඩක් නිර්භීතව සටන් කලා හොග්වෝර්ට්ස් වල උන යුද්දෙදි.මමත් ඔයත් එක්ක සටන් කලා..

Bane :- මම මගේ කොටස ඉටු කළා.මගේ රංචුව වගේම ගෞරවය වෙනුවෙන් එහෙම කළේ.එහෙම කලේ ඔයා ගැන හිතලා නෙමෙයි.ඒ යුද්ධයෙන් පස්සේ මේ භූමිය නරාශ්වයින්ගේ භූමියක් විදිහට සළකන්නෙ.ඉතින් අපේ භූමියට අවසර නැතිව යම් කෙනෙක් ඇවිල්ල නම් එයාලා අපේ සතුරෝ තමයි...

Harry :- මගේ දරුවා අතුරුදහන් වෙලා බේන් එයාව හොයාගන්න උදව් ඕනේ

Bane :- එතකොට එයා මෙහේද??අපේ කැලෑව ඇතුළෙ ???

Harry :- ඔව්

Bane :- එහෙනම් එයත් ඔයා වගේ මෝඩයෙක් වෙන්න ඇති.

Harry :- මට උදව් කරන්න පුළුවන්ද බේන්..

(නිහැඩියාවකින්) බේන් හැරී දෙස උදාරම් ලීලාවෙන් බැලුවේය.

Bane :- මට කරන්න පුළුවන් එකම දේ මම දන්න දේ කියන එක විතරයි.නමුත් මම මේක කියන්නේ ඔයාගේ හොඳට නෙමෙයි. මගේ ආරක්ෂාවට මොකද නරාශ්වයන්ට තවත් යුද්ධයක් ඕනේ කරලා නෑ...

Harry :- අපිටත් එහෙම තමයි.මොනවද ඔයා දන්නේ??

Bane :- මම ඔයාගෙ පුතාව දැක්කා හැරී පොටර්.මම එයාව තරු අතර ඇවිදිනවා දැක්කා...

Harry :- ඔයා මගේ පුතාව තරු අතර දැක්කා!!!

Bane :- මට කියන්න බෑ එයා කොහෙද ඉන්නේ කියලා.මට කියන්න දන්නෑ ඔයාට එයාව කොහොම හොයාගන්නද කියලා..

Harry :- ඔයා යමක් දැක්කා..ඔයා යමක් දිවැසින් දැක්කා

Bane :- ඔයාගේ පුතා වටා අඳුරු වලාකුලක් තිබ්බා.භයානක අඳුරු වලාකුලක්.

Harry :- ඇල්බස් වටේට..

Bane :- සමහරවිට ඒ කළු වළාකුල අපි හැමෝටම අනතුරුදායක දෙයක් වෙන්න පුලුවන්.ඔයාට ඔයාගේ පුතා නැවත හමුවේවි හැරී පොටර.නමුත් ඒ වෙනකොට ඔයාගේ පුතා ඔයාට නැති වෙලා තියේවි.

ඔහු අශ්වයෙක් මෙන් හඬලෑවේය. හැරී වටා වට කීපයක් ගොස් ඉදිරිපස ගාත් ඔසවා නැවත හඬ නගා හැරී පසුපසින් නොපෙනී ගියේය.හැරී නැවත සෙවීම ඇරඹිය.

Hrry :- ඇල්බස් !! ඇල්බස් !!!

2වන ජවනිකාව,6වන දර්ශනය

අඳුරු වනාන්තරයේ මායිම

ගස් අතරින් ඈතින් එලියක් දිස්විය.එය ඉතාමත් දර්ශනීය ආලෝකයකි.

Scorpius :- අන්න ඒක තියෙනවා....හොග්වෝර්ට්ස්...මම කවදාවත් ඒක මේ විදියට දැකලා නෑ..

Albus :- ඔයා ඒක දැක්කට පස්සෙත්...නිකන් තාම පොපියනවා වගේනේ..

හොග්වෝර්ට්ස්හි පෞරාණික ගොඩනැගිලි සහ උස් කුලුණු විශාල ප්‍රමාණයක් ගස් අතරින් ඔවුන්ට පෙනෙන්නට විය.

Scorpius :- මුලින්ම මට ඉස්කෝලේ ගැන අහන්න ලැබුනාම මට දෙගිඩියාවක් ඇතිවුනේ...මගේ තාත්තා විස්තර කරපු විදියටනම් එයා හොග්වෝර්ට්ස් වලට වැඩි කැමැත්තක් තිබිලා නෑ.මම අවුරුදු දහයේ ඉඳන් හැමදාම උදේට daily profit පත්තරය බැලුවා මොකද හොග්වෝර්ට්ස්වල මොනයම් හරි ශෝකාන්තයක් සිදුවෙලාද කියලා දැනගන්න..එතකොට ස්පීරවම මට එහෙට යන්න වුවමනාවක් වෙන්නේ නැනේ..

Albus :- ඒ කියන්නේ ඔයා එතනට ආවොත් ඒක ගොඩක් දරුණු දෙයක් වෙන්න පුලුවන් කියලද???

Scorpius :- මට නෙමේ...

ඇල්බස් ඔහුගේ යහළුවා දෙස තිගැස්මෙන් යුතුව බැළුවේය...

මට හොග්වෝර්ට්ස් ගිහින් ඕන උන එකම දේ මට හිතවත් සගයෙක් එක්ක මිත්‍ර වෙන්..හරියට නිකං හැරී පොටර් වගේ.
මම එයාගේ පුතාව අල්ලගත්තා කොච්චර පිස්සු වාසනාවක්ද ඒක...

Albus :- නමුත් මම මගේ තාත්තා වගේ නෙමේ නේ....

Scorpius :- ඔයා ගොඩක් හොඳයි..ඔයා තමයි මගේ හොඳම යාළුවා.ඒ වගේම මේ යාළුකම අපි පාසලෙන් ඉවත් උනාමත් තියාගමු.
මේ දේවල් හොඳයි..ගොඩක් විනෝදයි...ඒක නිකම්...මට කියන්න තියෙන්නේ...මගේ හිතට ටිකක් හරි නෑ.. මට චුට්ටක් විතර...නිකන්..චුට්ටක් විතර බයයි...

ඇල්බස් ස්කෝර්පියස් දෙස බලා මඳ සිනාවක් පෑවේය...

Albus :- ඔයත් මගේ හොඳම යාළුවා තමයි. ඒ වගේම මට ප්‍රශ්නයක් නෑ.මට මේ අපි කරන දේ ගැන තියෙන්නෙ හොඳ දැක්මක්..

රොන්ගේ කටහඬ ඇතින් ඇසෙන්නට විය. ඔහු හරියටම මොවුනට ළඟාවෙමින් සිටියේය..

Ron :- ඇල්බස් .... ඇල්බස් ...

ඇල්බස්ට එය ඇසෙන්නට විය.ඔහු බය විය...

Albus :- දැන් අපිට යන්න වෙනව..දැන්මම..

ඇල්බස් කාලයන්ත්‍රය ස්කෝපියස්ගෙන් අර ගත්තේ ය.ඔහු එය අතින් තදකර කැරකැවූවේය.කාල යන්ත්‍රය කම්පනය වීමට පටන් ගෙන එය කැරකෙමින් කුණාටුවක ස්වරූපයක් ගත්තේය...

එක්වරම පරිසරය වෙනස් වන්නට විය. කොලු ගැටව් දෙදෙනා ඒ දෙස බලා සිටියහ..

එක්වරම විශාල ශබ්දයක් සමග එළියක් ඇතිවිය ....

ඉන්පසු කාලය නැවතුනි...කාලය ආපස්සට යාමට පටන් ගත්තේය..ටිකක් විතර...පසුව එය වේගයෙන් පසුපසට යාමට පටන් ගත්තේ ය...මුලින් සෙමින්...පසුව වේගවත් ලෙස.....

දෙවැනි ජවනිකාව 7 වන දර්ශණය

ට්‍රයි විසාර්ඩ් තරගාවලිය.අඳුරු වනාන්තරය අද්දර.වර්ෂ 1994.

ක්ෂණිකව සියලු දෙයක්ම අධික ඝෝෂාවක් බවට පත් විය.වටපිටාවේ මිනිසුන් රාශියක් පිරී සිටි අතර එම මිනිසුන්ගෙන් ඇල්බස් සහ ස්කෝපියස් තෙරපී සිටියහ.

Ludo bagman :- එක්වරම..
"ලෝකයේ ශ්‍රේෂ්ඨතම සර්කස් භාරකරු"

(ඔහුගේ වචන අපේ නොවේ)
වේදිකාව මත වේ.ඔහුගේ වදන් ගාම්භීර විය.. ඒවා ගැඹුරු කටහඬකින් යුක්ත වූ අතර සියලු දෙනා අතර රැව් පිළිරැව් දෙන්නට විය.ඒ වගේම ඔහු අත බෝලයක් විය.

නෝනාවරුනි මහත්වරුනි දරු දැරියනි මම ඔබලාට ලබාදෙනවා.

ශ්‍රේෂ්ඨතම මනස්කාන්ත ත්‍රයිවිසාර්ඩ් තරඟාවලිය...

අධික ශබ්ධයෙන් යුතු ඔල්වරසන් හඬක් ඇතිවිය...

ඔබ හොග්වෝර්ට්ස් වලින් නම් අත්පොළසන් නාදයක් ලබාදෙන්න...

ලොකු අත්පොළසන් නාදයක් ඇසිණි...

ඔබ Durmstrang වලින් නම් තවත් අත්පොළසන් නාදයක් ලබාදෙන්න..

එවරද විශාල ප්‍රීති ඝෝෂාවකි.

ඔබ Beauxbatons වලින් නම් තව හොද අත්පොළසන් නාදයක් දෙන්න..

එවර විනීත සිහින් ප්‍රීති ඝෝෂාවක් ඇතිවිය.

Scorpius :- (සිනාසෙමින්) ඒක වැඩ කරලා.. අර ඉන්නේ Ludo bagman

Ludo bagman :- හරි නෝනාවරුනි මහත්වරුනි , දරු දැරියනි.මම ඔබට ඉදිරිපත් කරනවා අපි සියලු දෙනාම මෙතන රැස්වෙලා ඉන්නේ හේතුව.ඒ තමයි තරගාවලියේ වීරයන්..

කොතරම් අගනා ඇහිබැම් ද කොතරම් පෞරුෂයක් ද කොතරම් අපූරු කොලු ගැටයෙක් ද.මායා කොස්සට නැඟුණු පසු ඔහුට අභියෝග කිරීමට අන් අයෙක් නොමැත...මේ ඔහුයි.... Victor Krazy Krum

Scorpius and Albus :- (Durmstrang සිසුන් මෙන් උද්දාමයට පත්වී)යන්න...යන්න...ක්‍රේසි ක්‍රම්...යන්න...දිනන්න...ක්‍රේසි ක්‍රම්...

Ludo bagman :- Beaxbatons ඇකඩමියෙන් ඉදිරිපත් වන්නේ Fleur Delacour....

සිහින් ඔල්වරසන් නාදයක් ඇසුණි.

ඒ වගේම හොග්වෝර්ට්ස් වලින් එක් අයෙක් නොව දෙදෙනෙකි.ඔහු සියලු දෙනා අභිබවායාමට සමත්ය..ඔහු තමයි Cedric Diggory...

රැස්ව සිටි පිරිස ඉතා උස් හඬින් ප්‍රීතිඝෝෂා නැගූහ.

ඒ වගේම අනිත් තරගකරු ඔබ ඔහුව දන්නේ Boy who lived ලෙසයි..

ඒ වගේම මම දන්නවා ඔහු අපි සියලුදෙනාවම පුදුම කරන ළමයාත් වේවි..

Albus :- ඒ මගේ තාත්තා

ඔව්,මේ හැරී ප්ලකී පොටර්..

ප්‍රීතිඝෝෂාවකි.පැත්තක සිට මේ ප්‍රීතිඝෝෂාවට සහභාගි වූ තවත් නොවිසිලිමත් කමින් යුත් දැරියකි.ඇය යෞවන අවධියේ පසු වූ හර්මයිනී විය.ඇයත් රෝස්ගේ මෙන් හැඩහුරුකම් දැරුවාය.එමෙන්ම සෙඩ්‍රික්ට වඩා හැරී වෙනුවෙන් ජයඝෝෂා නැගීම ද ඇයගේ කැපී පෙනෙන්නට වූ ලක්ෂණයක් විය.

හරි දැන් සියලු දෙනාම නිශ්ශබ්දවන්න.දැන් තියෙන්නේ පළමු කාර්යය රත්තරන් බිත්තර සොරාගැනීමයි.. කාගෙන්ද හොරකම් කරන්නේ........
නෝනාවරුනි මහත්වරුනි මම ඔබට ඉදිරිපත් කරනවා මකරු..ඒ වගේම මකරුන්ගේ භාරකරු චාලි වීස්ලි..

තවත් ප්‍රීතිඝෝෂා නැගුණි.

Young Hermione :- ඔයා තව ළං වෙන්න හැදුවොත් ඔයාට තවත් හුස්ම ගන්න නහයක් ඉතුරු වෙන එකක් නෑ...

Scorpius :- රෝස්!!!ඔයා මොකද මෙහේ කරන්නේ??

Young Hermione :- කවුද රෝස්??මොකක්ද ඔයා මේ කතා කරන විදිහ...

Albus :- සමාවෙන්න හර්මයිනී..මෙයා ඔයත් එක්ක වෙන කවුරුහරි පටලවාගෙන

Young Hermione :- ඔයා කොහොමද මගේ නම දන්නෙ??

Ludo bagman :- අපිට නාස්ති කරන්න වෙලාවක් නෑ..එහෙනම් අපි අපේ මුල්ම තරගකරුගෙන් අරඹමු..

ඔහු මයික්‍රොෆෝනයෙන් ඒ නම ප්‍රකාශ කළේය...

සෙඩ්‍රික් ඩිගරි..

මකරෙකුගේ භයානක ගෙරවීමක් සමගම හර්මයිනීගේ සිත ඒ දෙසට යොමු වූ අතර ඒ මොහොතෙන් ඇල්බස් තම යෂ්ටිය සූදානම් කර ගත්තේය...

සෙඩ්‍රික් ඩිගරි වේදිකාවට ඇතුලු විය.ඔහු සූදානම් පිට සිටියේය.තරමක් බිය වී සිටි නමුත් ඔහු මනා සූදානමකින් සිටියේය.

ඔහු මෙම කාර්යය මග හැරී යාවිද??ඔහු මෙම කාර්යය දක්ෂ ලෙස අවසන් කරාවිද??

ගැහැණු ළමුන් ඔහුගේ සිත දිරිමත් කළහ. සමහරෙක් හැඬුහ.කරුණාකරලා අපේ ඩිගරිට හානි කරන්න එපා මකරෝ...

Scorpius ඕනෑකමින් බැලුවේ ය

Scorpius :- ඇල්බස් මොකක් හරි වැරැද්දක් තියෙනවා...කාල යන්ත්‍රය ඒක සෙලවෙනවා...

ටික් ටික් ශබ්දයක් මතුවිණි.එය ටික වෙලාවකින් අධික ශබ්දයකට පෙරලිනි. එම ශබ්දය පැමිණියේ කාල යන්ත්‍රයෙනි.

සෙඩ්‍රික් වේදිකාවේ වම් පැත්තේ අයින දිගේ ගොස් වල තුළට පැමිණියේය.ඔහු තම යෂ්ටිය සූදානම් කර ගත්තේය.දැන් මෙම තරුණ නිර්භීත කඩවසම් කොල්ලා තම යෂ්ටිය අමෝරාගෙන සිටියි..

Cedric :- (ඔහුගේ යෂ්ටිය දිගුකරමින්) Expelliarmus

සෙඩ්‍රික්ගේ යෂ්ටිය ඔහු අතින් ගිලිහී ගියේය...

Ludo bagman :- නමුත්...නෑ...කුමක්ද ඒ සිදුවුනේ...

කුමක් හෝ අඳුරු මායාවක් ද..නැත්නම් වෙනයම් දෙයක්ද.ඔහුගේ යෂ්ටිය අවකාශයේ විසිවී වැටුණි.සෙඩ්‍රික් ඩිගරි දැන් නිරායුධයි.

Scorpius :- ඇල්බස් මම හිතන්නේ කාල යන්ත්‍රය...ඒකෙ මොකක් හරි අවුලක්...

කාල යන්ත්‍රය තවමත් හයියෙන් කම්පනය වෙනවා..

දැන්නම් ඩිගරිට සියල්ල වැරදී ගොසින්ය. මෙය ඔහුගේ කාර්යයන්වල අවසානය විය හැක.මෙය ඔහුගේ තරගාවලියේ ද අවසානය විය හැක...

ස්කෝපියස් ඇල්බස්ව අල්ලා ගත්තේය.

එක්වරම ටික් ටික් ශබ්දය සමග තද ආලෝකයක් ඇතිවිය.ඒ වගේම නැවත කාලය ගමන් කර ඔවුන් වර්තමානයට පැමිණියහ.ඇල්බස් වේදනාවෙන් මිරිකෙමින් සිටියේය...

Scorpius :- ඇල්බස් ඔයාට ඒක රිදුනද.. ඇල්බස් ඔයා හොදින්ද

Albus :- මොකද වුනේ !!!

Scorpius :- මම හිතන්නේ මේකේ වෙලාවක් ඇති...මම හිතන්නේ කාල යන්ත්‍රයට යම් කාල සීමාවක් ඇති...

Albus :- ඔයා හිතන්නේ අපි අපේ වැඩේ කළා කියලද..අපි මොනව හරි වෙනස් කළා කියලද...

එක්වරම හැරී සහ රොන් එතැනට පැමිණියේ..එමෙන්ම ජිනී සහ ඩ්‍රැකෝ එතනට කඩාපාත් විය.ස්කෝපියස් ඔවුන් සියලු දෙනා දෙස බැලුවේය.ඔහු කාල යන්ත්‍රය ක්ෂණිකව තම සාක්කුව තුල රුවා ගත්තේය.ඇල්බස් ඔවුන් දෙස හිස් බැල්මෙන් යුතුව බලා සිටියේය.ඔහු ගොඩක් වේදනාවෙන් සිටියේය..

Ron :- මම කිව්වේ,මම කිව්වේ...මම එයාලව දැක්කා කියලා

Scorpius :- මම හිතන්නේ අපි එයාලව සොයාගත්තා..

Albus :- හලෝ තාත්තේ,මොකක් හරි ප්‍රශ්නයක් ද...

හැරී තම පුතු දෙස අවිශ්වාසයෙන් යුතුව බැළුවේය.

Harry :- ඔව්,ඔයාට ඒ ගැන කියන්න පුළුවන් වේවි..

ඇල්බස් එක්වරම ක්ලාන්ත වී බිම වැටුණි. හැරී සහ ජිනී එක්ව ඔහුව කෙලින් කර ගත්හ.

දෙවැනි ජවනිකාව 8වන දර්ශනය

🏰හොග්වෝර්ට්ස් රෝහල🏥

ඇල්බස් රෝහලේ සයනයක වැතිර සිටියේය.හැරී කනස්සල්ලෙන් යුතුව ඔහු දෙස බලා සිටියේය.හැරී ඔහුගේ ඇස් දෙක පිරිමදිමින් සිටියේය.ඔහු නැගිට කාමරයේ වටපිට බලමින් ඇවිදින ගමන් ඔහුගේ කොන්ද පොඩ්ඩක් දෙපසට නමා හිරි ඇර ගත්තේය.

ඔහු ඇල්බස් අසල වාඩිවී සිටින විට ඔවුන් දෙදෙනාට ඉහළින් කරුණාවන්ත ලෙස සිනාසී සිටින මිනිසෙකු ගේ සිතුවමක් තිබුණි.හැරීට මේ මොහොතේ එම සිතුවම නෙත ගැටුණි.එහි බියගන්වන පෙනුමක් දිස් වූ අතර හැරීද බියමුසු බැල්මෙන් නැවත ඒ දෙස බැලුවේය..

Harry :- මහාචාර්ය ඩම්බිල්ඩෝර්...

Dumbeldore :- සුබ සැන්දෑවක් හැරී !!!

Harry :- මට ඔයාව ගොඩාක් මතක් වෙනවා. ඔබ විදුහල්පති ධූරයෙන් ඉවත් වුණාට පස්සේ ඔයාගේ රූපරාමු ඔක්කොම හිස් වෙලා නේ තිබුණේ.

Dumbeldore :- ආහ්,හොඳයි මම වඩාත් කැමැති තැනින් තැනට මාරු වෙන්න.(ඔහු ඇල්බස් දෙස බැලුවේය.)

එයාට හොඳ වෙයි නේද??

Harry :- එයා දැන් පැය 24 ක ටත් වඩා ඔහොම තමයි හිටියේ.මැඩම් Pomfrey කිව්ව විදියට නම් එයාට ඇල්බස්ගේ අත නැවත යථා තත්ත්වයට පත් කරන්න පුළුවන්ලු..එයා කියනවා පුදුමය කියන්නෙ ඒ ඒ අත කැඩිලා අවුරුදු විස්සකට වඩා ලූ..

Dumbeldore :- ඒක අමාරු වැඩක් මම හිතන්නේ තමන්ගේ දරුවා වේදනාවෙන් ඉන්නවා බලන් ඉන්න එක

හැරී dumbledore දෙස බලා නැවතත් ඇල්බස් දෙස බැලුවේය

Harry :- මම ඔයාගෙන් කවදාවත් මම ගැන ඔයාට දැනුනේ කොහොමද කියල අහල නෑ නේද??ඇහුවද මම??

Dumbeldore :- අවංකවම හැරී එක ඔයා වගේ අසරණ ළමයෙක් මත පටවන්න වෙන ලොකු බරක්..

Harry :-මට ඔයාගේ උදව් ඕනේ.මට ඔයාගේ උපදෙස් ඕනේ.බේන් කිව්ව ඇල්බස් ඉන්නේ අනතුරක කියලා. කොහොමද මම මගේ පුතාව බේරගන්න මහාචාර්යතුමනි??

Dumbeldore :- ඔයා මගෙන් අහන්නේ කොහොමද කොල්ලෙක්ව ලොකු කරදරේකින් බේරගන්න කියලනේ.අපිට තරුණ අයව ඒ වගේ දේවල් වලින් ආරක්ෂා කරන්න බෑ.එයාලා කරන කියන දේවල් වල වේදනාව අනිවාර්යයි වගේම ඒක ඉදිරියටත් බලපාවි.

Harry :- ඉතින් මට මුකුත් නොකර බලා ඉන්නද කියන්නේ..

Dumbeldore :- නැහැ.ඔයා එයාට එයාගේ ජීවිතේ තේරුම් ගන්න කියලා දෙන්න ඕනේ..

Harry :- කොහොමද?ඇහුම්කන් දෙන්නෙ නැනෙ...

Dumbeldore :- සමහරවිට ඔයා එයාව නියම විදියට දකිනකන් එයා බලාගෙන ඉන්නවා වෙන්න ඇති..

හැරී බැමි හකුලමින් එය ඉවසාගෙන අසා සිටියේය.

(හැඟීම්බරව) මේකනම් ශාපයක් නමුත් සමහර වෙලාවට ආශිර්වාදයක්..මොකද මට අහන්න ලැබෙනවා පාසලේදි , අමාත්‍යාංශයේදි මිනිස්සු කතා වෙන දේවල්..

Harry :- එතකොට මගෙයි,මගේ පුතා ගැනයි පැතිරෙන කට කතාව මොකක්ද?

Dumbeldore :- කට කතාවක් නොවේ.සලකා බැලිය යුතු කාරණාවක්.ඔය දෙන්නා රණ්ඩු වෙනවා මොකද ඔහුත් ආඩම්බරයිනේ.ඒ වගේම ඔයා සමඟ තරගයක් තියෙන නිසා මට දැනෙන හැඟීමට අනුව නම් සමහරවිට ඔයා එයාට තියෙන ආදරය නිසා ඔබ අන්ධ වෙලා ඉන්නේ...

Harry :- අන්ධ වෙලා !!!!

Dumbeldore :- ඔයා එයාව එයාගේ විදිහට දකින්න හැරී.හොයා බලන්න ඕනේ එයාට වේදනා ගෙනදෙන්නේ මොකක් නිසාද කියල...

Harry :- මම ඔහුව ඔහු ලෙස දකින්නේ නැද්ද?
(ඔහුමේ කල්පනා කරමින් )
නැත්නම්....දෙයක් නෙමේ..යම් අයෙක් මගේ පුතාව වේදනාවට පත් කරන්නේ...

Albus :- (අඩ නින්දේ පසු වෙමින් මුමුණයි) තාත්තේ..

Harry :- මේ කළු වලාකුල යම් කෙනෙක් එහෙම නේද..නැතිව යම් දෙයක් නෙවෙයි.

Dumbeldore :- ආහ් ඇත්තට , මගේ අදහස්වලින් තවදුරටත් ඇති වැඩේ මොකක්ද මම නිකන් පින්තූරයක් වගේම මතකයක් විතරයිනේ.
මම , හැරී පින්තූරයක් වගේම මතකයක් විතරයි. තේරුනාද!!!
ඒ වගේම මට පුතෙක් හිටියෙත් නෑ.

Harry :- නමුත් මට ඔයාගේ උපදෙස් ඕනේ.

Albus :- තාත්තේ....

හැරී ඇල්බස් දෙස බලා නැවත ඩම්බ්ල්ඩෝර් දෙස බැලුවේය.නමුත් ඒ වන විට ඔහු නොපෙනී ගොසින්ය.

Harry :- නෑ..ඒ පාර ඔයා කොහෙද ගියේ?

Albus :- අපි ඇතුලෙද ඉන්නෙ..අපි ස්පිරිතාලෙද ඉන්නේ.

හැරී නැවතත් තම අවධානය පුතු වෙත යොමු කළේ ය.

Harry :- ඔව්. ඒ වගේම ඔයාට ඉක්මනට සනීප වේවි.ඔයා ප්‍රකෘති තත්වයට ගේන්න මැඩම් pomfreyට හරියට අදහසක් තිබුණෙ නෑ ඔයාට දෙන්න ඕනේ ඖෂධ ගැන.ඒ නිසා එයා කිව්වා සමහරවිට ගොඩක් චොකලට් කෑවොත් ඔයාට හොඳ වේවි කියලා.ඇත්තටම ඔයා අකමැති නැත්නම් මම ටිකක් කතාකරන්නද.. මට ඔයාට දෙයක් කියන්න තියෙනවා.ඒ වගේම ඔයා ඒ කියන දේට අකමැති වේවි.

ඇල්බස් ඔහුගේ පියා දෙස බලා සිටියේය. ඔහු පැවසීමට යන්නේ කුමක් වුවත් තාත්තා සමග වාද නොකිරීමට සිතා ගත්තේය..

Harry :- හොඳයි මම හිතනවා..

හැරී චොකලට් එකක් ගෙන එයින් විශාල කෑබැල්ලක් මුව තුල රුවා ගත්තේය.එදෙස ඇල්බස් බලාසිටියේය..

දැන් හොදයිද ඔයාට..!!

Albus :- ගොඩක් දුරට..

ඔහු තම පුතුට චොකලට් එක දිගුකළේය.ඇල්බස් ද කෑල්ලක් කඩා ගත්තේ ය.පියපුතු දෙපල එය හොඳින් රස විඳින්නට විය

Harry :- දැන් කොහොමද ඒක...

ඇල්බස් අත නවා බැලුවේය.

Albus :- එක දැන් ගොඩක් හොදයි..

Harry :- (මෘදු ස්වරයෙන්)
ඔයා කොහෙද ගියේ ඇල්බස්.මට ඔයාට කියන්න තියෙන්නේ ඒකෙන් අපිට මොනවද වුණේ කියලා.ඔයාගේ අම්මා ගොඩක් දුක් වෙලාම ලෙඩ වුනා.ඇල්බස් තම පියා දෙස බැලුවේ ය.ඔහු නියම බොරුකාරයෙකි යැයි ඔහුට සිතුණි.

Albus :- අපි තීරණය කළා අපිට පාසලට එන්න ඕනේ නෑ කියලා.අපි හිතුවා අපිට සාමාන්‍ය ලෝක ඉඳන් නැවැත වැඩ කරන එක අරඹන්න.නමුත් අපි වැරදියි.අපි ආයිම හොග්වෝර්ට්ස් වලට එනකොට තමා ඔයාලට අපිව හම්බුණේ.

Harry :- Durmstrang නිල ඇඳුම් වලින්..

Albus :- නිල ඇඳුම්ද!!! ආහ් ..ඒවා මමයි ස්කෝපියසුයි ඒ ගැන හිතුවෙ නෑ..

Harry :- ඉතින් ඇයි , ඇයි ඔයා පැනලා ගියේ? මම නිසාද?මම කිව්ව දේ නිසා ද??

Albus :- මම දන්නෙ නෑ.හොග්වෝර්ට්ස් ඒ තරම් සිත්ගන්නා තැනක් නෙමේ ඒකට හරියට හැඩගැසුණේ නැත්නම්...

Harry :- ස්කෝපියස් ඔයාව දිරිමත් කලාද පැනලා යන්න?

Albus :- ස්කෝපියස් !!! නැහැ.

හැරී ඇල්බස් දෙස බැලුවේය. ඔහු දෙස ගැඹුරු කල්පනාවෙන් යුක්තව බැලුවේය.

Harry :- ඔයා ස්කෝපියස් මැල්ෆෝයිගෙන් ඈත් වෙලා හිටියොත් හොඳයි.

Albus :- මොකක් ස්කෝපියස්ගෙන්

Harry :- මම දන්නේ නෑ ඔයාලා කොහොම හොඳම යාළුවො වුණාද කියලා.නමුත් ඔයාලා එහෙම වුණා.ඒ වගේම දැන් මට ඕනෙ...

Albus :- මගේ හොඳම යාළුවා??මගේ එකම යාළුවා!!!

Harry :- ඔහු භයානකයි.

Albus :- ස්කෝපියස් භයානකයි!!!!
ඔයාට එයාව මුන ගැහිලා තියෙනවද? තාත්තේ ඔයා ඇත්තටම හිතෙනවා නම් වොල්ඩමෝර්ට්ගේ පුතා කියලා.

Scorpius :- මම දන්නෑ එයා කවුද කියලා. මම දන්නේ ඔයා එයාගෙන් ඈත් වෙලා ඉන්න ඕනේ කියලා විතරයි.බේන් මට කිව්වා...

Albus :- කවුද බේන්?

Harry :- එයා දිවැස් දකින්න පුළුවන් නරාශ්වයෙක්.ඔහු කිව්වා ඔයා වටා අඳුරු වලාකුලක් තියෙනවා කියල.ඒ වගේම...

Albus :- අඳුරු වලාකුලක් ???

Harry :- ඒ වගේම මට හොඳ හේතුවක් තියනවා විශ්වාස කරන්න අඳුරු මයාවන් වල පුනරුත්පත්තිය ගැන වගේම ඒවායින් ඔයාව ආරක්ෂා කරන්නත්.

ඇල්බස් මොහොතක් බලා හිද ධෛර්යවන්තව මෙසේ පැවසීය.

Albus :- හරි මම එහෙම කරන්න ඕනෙ නැත්නම්...එයාගෙන් ඈත් වෙන්න ඕනේ නැත්නම්...

හැරී තම පුතු දෙස බලමින් වේගයෙන් සිතන්නට විය...

Harry :- සිතියමක් තියෙනවා.ඒක මේ වගේ අවස්ථා වලට යොදාගන්න පුළුවන් වුනාට කලින් එහෙම දේවල් වලට යොදාගත්තේ නෑ.දැන් අපි ඒක පාවිච්චි කරන්න යන්නේ.දැන් අපි ඒක පාවිච්චි කරන්න යන්නෙ ඔයාලා දෙන්න දිහා ඇහැ ගහගෙන ඉන්න.දිගටම ඇහැගහගෙන ඉන්න මහාචාර්ය මැගෝනිගල් ඔයා තියන හැම පියවරක් ගැනම ඇහැ ගහගෙන ඉදීවි.ඔයාලා දෙන්නා එකට ඉන්නවා දැක්කොත් ක්ෂණික ව ඇය එතැනට පැමිණේවි.ඒ වගේම ඒ ඕන වෙලාවක ඔයාව හොග්වෝර්ට්ස් වලින් ගෙදර එවන්නත් ඉඩ තියෙනව.මම හිතනවා ඔයා ඔයාගේ පාඩම් වැඩවලට සහභාගි වෙයි කියලා.ඔයා ස්කෝපියස් එක්ක ඉස්සරහට මොනවා බෙදාගන්න හිටියත් ඒ හැම වෙලාවෙම ඔයාට ග්‍රිෆින්ඩෝර් පොදු කාමරේ ඉන්න ලැබේවි...

Albus :- ඔයාට බෑ මාව ග්‍රිෆින්ඩෝර් වලට යවන්න.මම ස්ලිදරින් ..

Harry :- සෙල්ලම් කරන්න හදන්නෙපා.ඇල්බස් ඔයා දන්නව ඔයා මොන නිවාසෙටද අයිති කියලා.ඇල්බස් ඔයා ස්කෝපියස් එක්ක ඉන්නවා හසු වුණොත් මම මන්ත්‍රයක් මතුරනවා ඔයාගේ හැම දෙයක් ගැනම මට ඔත්තු බලන්න පුළුවන් වෙන විදිහට.ඔයා කතා කරන සෑම වචනයක් පාසා ඒ වෙලාවෙදිම විමර්ශනය කරන්න ආරම්භ වේවි මගේ දෙපාර්තමේන්තුවෙන්...

Albus :- (හැඬීමට පටන් ගත්තේය.)නමුත් තාත්තේ...ඔයාට බැහැ...ඒක එහෙම නෙමෙයි වෙන්න ඕන...

Harry :- මම ගොඩක් කල් ඉඳන් හිතුවෙ මට ඔයාට හොඳ තාත්තා කෙනෙක් වෙන්න බැරි උනේ මොකද ඔයා මට අකමැති නිසා කියලා.නමුත් මම තේරුම් ගත්තා මේ මොහොතේ මට අවශ්‍ය නෑ ඔයා මට කැමති වෙන්න ඕනි කියල.ඔයා මට කීකරු වෙන්නයි ඕන.මොකද මම ඔයාගේ තාත්තා නිසා.ඒ වගේම මම ඒක කරන්න හොඳටම දන්නව..
මට සමාවෙන්න ඇල්බස් ඒක මේ විදියටයි වෙන්න ඕන...

---

🔴දෙවැනි ජවනිකාව 9වන දර්ශනය

🏘️හොග්වෝර්ට්ස් පඩිපෙළ🏘️

හැරී ඇල්බස් පසුපසින් ගමන් කරමින් සිටියි.

Albus :- මොකද වෙන්නේ මම දිව්වොත්!! මම දුවනවා..

Harry :- ඇල්බස් නැවත ගිහිල්ලා නිදා ගන්න

Albus :- මම ආයිම පැනලා යනවා

Harry :- නෑ ඔයාට එහෙම කරන්න බැහැ

Albus :- මම කරනවා.ඒ වගේම මේ පාර අපිව රොන්ට හොයාගන්න බැරි වේවි.

Ron :- මට මගේ නම කියනවා වගේ ඇහුනද මන්දා...

රොන් පඩිපෙළ අසලින් මතුවිය.
ඔහුගේ ඇඳුම ඉතා අලංකාර එකක් විය.
නමුත් එම නිල ඇඳුම ඔහුට ටිකක් පමණ කොට විය.ඔහුගේ ඇඳුම්වල විශිෂ්ඨභාවයක් මෙන්ම මනා සංයමයක් ගැබ්ව තිබුණි...

Albus :- රොන් මාමා!!! ඩම්බ්ල්ඩෝර්ට ස්තුති වෙන්න(දෙයියන්ට ස්තූති වෙන්න වගේ වාක්‍යක්) අපිට ඔයාගේ විහිලු ඕනේ උනා නම් කවදා හරි මේ තමයි ඒකට හොදම වෙලාව...

රොන් කලබලයට පත් වූ බවක් පෙන්විය.

Ron :- විහිලු මම මුකුත් විහිලු දන්නේ නෑනේ...

Albus :- මොකද නැත්තේ,ඔයා joke shop එකක්නේ කරගෙන යන්නෙ...

Ron :- මේ මොන මගුලක්ද..මේ ඇත්තටම ඔයා නෙමේ නේද...හොඳයි කොහොම වෙතත් මම ගියානම් හොඳයි වගේ.මට හඩ පණිවිඩයක් යවන්න තියෙනවා..

ඔහු නැවත ආ ගමන යන්නට සැරසුනි. ඔහුට මේ සිදු වී ඇති දේ වටහා ගැනීමට නොහැකිව සිටියේය....

Albus :- නමුත් ඒකෙන් මුකුත් කියවෙන්නේ නෑනේ??

Harry :- ඇල්බස් ඔයා කොච්චර බොරුවට රඟපෑවත් ඒක හරියන්නෙ නෑ.මගේ අදහස මම වෙනස් කරන්නේ නෑ...

Albus :- තාත්තේ,ඔයාට තෝරාගැනීම් දෙකක් තියෙනවා ඔයා මාව අරගෙන යන්න ඕන..

Harry :- නෑ ඔයා තමයි තෝරගන්න ඕන කෙනා ඇල්බස්.මේ දේ කළේ ඔයා.මේ ප්‍රශ්නෙ තව තවත් අවුල් කරන්න හැදුවොත් එහෙම...ඔයාට තේරෙනවනේ මම කියන දේ.....

Scorpius :- ඔයා හොඳින්ද,ඒක නම් නියමයි...

Harry :- එයාට දැන් සම්පූර්ණයෙන්ම සුවයි. අපි මේ යන්න හදන්නේ

ඇල්බස් ස්කෝර්පියස් දෙස බැලුවේය. ඔහුගේ හදවත බිඳී ගොස් ඇත්තාක් මෙනි. ඔහු ඉදිරියට ඇවිදගෙන ගියේය.

Scorpius :- ඔයා මාත් එක්ක තරහා වෙලාද!!! මොකද මේ වෙන්නෙ...

ඔහු නැවත ස්කෝර්පියස් දෙසට හැරුනි.

Albus :- ඒක වැඩ කලාද මොකක් හරි දෙයක් වැඩකරලද???

Scorpius :- න!!!නමුත් ඇල්බස්

Harry :- ඇල්බස් ඔයා මොන අනංමනං කියෙව්වත් කමක් නෑ.දැන්ම ඕක නවත්තන්න ඕන...දැන්ම..මේ මගේ අන්තිම අවවාදය!!!!

ඇල්බස් තම පියා යාලුවා දෙස බැලුවේය

Albus :- මට බෑ හරිද...

Harry :- ඔයාට බැරි මොකක්ද...???

Albus :- අපි වැඩිය ආශ්‍රය නොකර ඉමු මීට පස්සේ හරි ද....

ඔහු ස්කෝර්පියස්ව තනිකර දමා නික්ම ගියේය...

▨ දෙවැනි ජවනිකාව 10වන දර්ශනය

🏰 හොග්වෝර්ට්ස් වල විදුහල්පති කාර්යාලය 🏰

මහාචාර්ය මැගෝනිගල් අසතුටින් පිරී ගොස්ය.හැරීට වගකීම් ගොඩ ගැසිලා ඇත. ජිනී තමන් කළ යුත්තේ කුමක්ද කියා වටහා ගත නොහැකිව සිටියි.

Prof macgonigal :- මම හිතන්නේ නෑ මැරඩෝර්ගේ සිතියම මේ වගේ දෙයකට යොදා ගන්න ඕන කියලා..

Harry :- ඔයා එයාලා එකට ඉන්නවා දැක්කොත්..ඉක්මනටම ගිහිල්ලා ඒ දෙන්නව වෙන් කරන්න..එච්චරයි !!!

Prof macgonigal :- ඔයාට විශ්වාස මේක හරි තීරණය කියලා.මොකද මම නං නරාඅශ්වයන්ගේ දැනුමට වඩා දන්න කෙනෙක් නෙමෙයි.නමුත් බේන් කියන්නේ ගොඩක් තරහ යන නරාශ්වයෙක් වගේම ඔහුගේ අභිමතය පරිදි තාරකාවන්ගේ චලිතය වෙනස් කර පැවසුවාද කවුද දන්නේ...!!!

Harry :- මම බේන්ව විශ්වාස කරනවා.ඇල්බස් ස්කෝපියස්ගෙන් ඈත් වෙලා ඉඳීවි.එයාගෙත් අනිත් අයගෙත් හොඳට...

Ginny :- මම හිතන්නේ හැරී අදහස් කලේ...

Harry :- (තරමක් ස්ථිර ස්වරයෙන්) මහාචාර්යවරිය දන්නවා මම මොකක්ද අදහස් කලේ කියලා

හැරී ඇයට කතාකළ ආකාරය දෙස පුදුමයෙන් ඇය ඔහු දෙස බැලුවාය.

Prof macgonigal :- ඇල්බස්ව රටේ ඉන්න හොඳම මායාකාරයොයි මායාකාරීනුයි පරීක්ෂාකරල බැලුවනේ.ඒ උනාට කාටවත්ම කිසිම හැඟීමක්,ශාපයක්, ගුරුකමක් හොයාගන්න ලැබුණේ නෑනේ...

Harry :- ඒ වගේම ඩම්බල්ඩෝර්.... ඩම්බල්ඩෝර් කිව්වා

Prof macgonigal :- මොකක්ද

Harry :- ඔහුගේ මතකය,අපි එකිනෙකා සමග කතා කළා.ඔහු යම් දෙයක් හැඟවෙන දේවල් ටිකක් කිව්වා.

prof macgonigal :- ඩම්බල්ඩෝර් මැරිලා හැරී.ඒ වගේම මම ඔයාට කලිනුත් කියලා තියෙනවා ඒවල තියෙන මතකයන් ඔවුන්ගේ ජීවිතයෙන් බාගයක්වත් නිරූපණය කරන්නේ නෑ කියලා...

Harry :- ඔහු කිව්වා මාව ආදරයෙන් අන්ධ වෙලා කියලා...

Prof macgonigal :- විදුහල්පතිගේ රූපරාමුව නිබන්ධනයක් විතරයි.ඒක මම ගන්න තීරණ වලට උපකාරී වන ලෙස තමයි ඒක නිපදවල තියෙන්නෙ.ඒ වගේම මම මේ තනතුර බාර ගන්නකොට චිත්‍රයකින් තවත් කෙනෙක්ට කරදරයක් නොවෙන්න මම අවවාද කරලා තිබ්බේ.ඒ වගේම ඔයාටත් මම ඒ විදියටම අවවාද කරනවා...

Harry :- නමුත් ඔහු කිව්ව දේ හරිනේ.මම ඒ දේ දැන් අත්දකිනවනේ...

Prof macgonigal :- හැරී ඔයා ලොකු පීඩනයකට පත් වෙලා ඉන්නේ.ඇල්බස්ගේ වෙන්වීම,ඔහුව සොයා යාම,ඔයාගේ කැළල නිසා ඔයාට ඇතිවෙලා තියෙන බය ඔය වගේ දේවල්වලින්.නමුත් මාව විශ්වාස කරන්න මම ඔයාට කියන්න වන්නේ ඔයා කරගන්න හදන්නෙ වැරැද්දක් කියලා...

Harry :- ඇල්බස් මට ඉස්සරත් කැමති නෑ.. ඉදිරියටත් කැමති නැති වේවි.නමුත් ඔහු ආරක්ෂා වේවි.මම ගෞරවයෙන් කියන්නේ මිනර්වා ඔයාට දරුවෝ නෑනේ....

Ginny :- හැරී........

Harry :- ඒ නිසා ඔයාට තේරෙන්නේ නෑ

Prof macgonigal :- (හද පත්ලෙන්ම රිදුම් දෙමින්) මම හිතන්නේ මම ගුරු වෘත්තියේ යෙදුණු කාලය පුරාවටම.......

Harry :- මේ සිතියම මගේ පුතා කොහෙද ඉන්නේ කියලා හැම වෙලාවෙම ඔයාට පෙන්වයි.මම හිතනවා ඔබ එය පාවිච්චි කරයි කියලා.ඒ වගේම ඔබ මෙය පාවිච්චි කරන්නෙ නෑ කියලා මම දැනගන්න ලැබුනොත් ඒ වෙලාවෙම මම පාසලට පැමිණෙනවා මගේ සියළුම බලතල පාවිච්චි කරන්න බලාගෙන..ඔයාට තේරුනා ද...

Prof macgonigal :- (මේ තදපරුෂ දැනුමෙන් වික්ෂිප්තව) නියමයි...

හැරීට කුමක් වී ඇත්දැයි දැනගැනීමට මෙන් ජිනී හැරී දෙස බැලුවාය.නමුත් ඔහු ඇය දෙස නොබැලුවේය...

දෙවැනි ජවනිකාව 11වන දර්ශනය

අඳුරු මායාවන්ට එරෙහිවීමට කියා දෙන පන්ති කාමරය

ඇල්බස් තරමක් අවිශ්වාසයෙන් පන්ති කාමරයට ඇතුළු විය.

Hermione :- ආහ්..හරි.. මෙන්න අපේ දුම්රියෙන් පැනල ගිය කොල්ල අන්තිමට අපි එක්ක එකතු වෙලා ඉන්නවා..

Albus :- හර්මයිනී ???

ඔහු පුදුමයෙන් බැළුවේය.හර්මයිනී පංති කාමරය ඉදිරියේ හිදිමින් පාඩම කියාදෙමින් සිටියාය...

Hermione :- මහාචාර්ය ග්‍රේන්ජර් මම හිතන්නේ..ඒක තමා මගේ නම පොටර්..

Albus :- ඔයා මොකද මෙතන කරන්නේ?/

Hermione :- මගේ ශිෂ්‍යයන්ට උගන්වනවා. ඔයා මොකද මෙතන කරන්නේ??මම හිතන්නේ ඉගෙන ගන්නවා වෙන්න ඇති..

Albus :- නමුත් ඔයාට මායා අමාත්‍යාංශයේ ප්‍රධාන ඇමතිනේ..

Hermione :- ඔයා දවල් හීන දකිනවද??ඔයා තවමත් ඒවා දකිනවාද පොටර්??අද අපි කතා කරන්න යන්නේ පෙට්‍රොනාස් වශිය ගැන...

Albus :- (පුදුමයෙන්) ඔයා අපේ,අඳුරු මයාවන්ට එරෙහි වෙන්න උගන්වන පන්තියේ ගුරුතුමිය????

ඇල්බස් කැකිරි සිනාවක් පාන ගමන් පැවසීය.

Hermione :- දැන්නම් ඉවසීමේ සීමාව පනිනවා.ලකුණු දහයක් කපනවා ග්‍රිෆින්ඩෝර්වලින් මෝඩකමට...

Polly chapman :- (සම්පූර්ණ විරෝධයෙන් නැගී සිටිමින්)නෑ..නෑ..එයා ඒක කළේ හිතාමතාමයි.එයා ග්‍රිෆින්ඩෝර් වලට වෛර කරනවා..කවුරුත් ඒක දන්නව

Hermione :- කරුණාකර ඉඳගන්න පොලි චැප්මන් මේක තවත් නරක අතට හැරෙන්න කලින.(පොලි චැප්මන් හිඳගත්තේය)
ඒ වගේම මම යෝජනා කරනවා ඔබ ඇයත් සමග එකතු වේවි. (ගැහැණු ළමයෙක් පෙන්වමින්)ඒ වගේම මේ මෝඩ විකාර සෙල්ලම නවත්වාවි කියලා...

Albus :- නමුත් මේ ඔයා නෙමේ නේ ...

Hermione :- ඔන්න එහෙනම් ලකුණු 20ක් ග්‍රිෆින්ඩෝර් වලින් ඉවත් කරනවා.ඒ වගේම මේ මම තමයි ඇල්බස් පොටර්....

Yann fredericks :- ඔයා දැන්ම හිඳ ගත්තේ නැති වුනොත්....
(ඇල්බස් හිඳගත්තේ ය)

Albus :- මට කියන්න පුලුවන්ද ???

Hermione :- නෑ ඔයාට බැහැ.කටවහගෙන ඉන්න පොටර් නැත්තම් ඔයා ඔය තියං ඉන්න ජනප්‍රියකම මම නැති කරලා දානවා. දැන් කාටද කියන්න පුලුවන් මොකක්ද පෙට්‍රොනාස් කියන්නේ කියලා.කවුරුත් නැද්ද???
ඔයාලා නම් කිසිම වැඩකට නැති පොඩි උන් ටිකක්.(මතකද කට්ටියට මෙහෙම කියන තව කෙනෙක්ව 😉)

හර්මයිනී කට සිහින් කරමින් සිනහ විය.ඒ ඇ ඇත්තටම එලෙස අදහස් කළ නිසාය.

Albus :- නෑ මේක මහ විකාරයක්.කොහෙද රෝස??එයා දැක්කොත් කියයි ඔයා මහා විහිළුවක් කියලා...

Hermione :- කවුද??ඔයාගේ අදෘශ්‍යමාන මිත්‍රයෙක්ද ??

Albus :- රෝස් ග්‍රේන්ජර් වීස්ලි ... ඔයාගෙ දුව.
(ඔහු එක්වරම තේරුම් ගත්තේය) ඇත්තටම...මොකද ඔයයි රොනුයි විවාහ වෙලා නැනෙ ඉතිං රෝස්....

පන්ති කාමරයෙන් පොඩි මුළුවක් ඇසුණි..

Hermione :- මොකක්??කොහොමද ඔයා මෙහෙම හැසිරෙන්නේ...ලකුණු 50ක් කපනවා ග්‍රිෆින්ඩෝර් වලින් ඒ වගේම මම තරයේ කියා සිටිනවා තව කවුරුහරිම මට බාධා කලොත් ඒක ලකුණු 100ක් වෙයි කියලා...

ඇය කාමරයේ සිටි ළමුන් දෙස බැලුවාය. කවුරුත්ම කටක් හෙල්ලුවේ නැත...

Hermione :- හොඳයි පෙට්‍රොනාස් කියන්නේ මායා වශියක්.ඔයාලා හැමෝම ගාව තියෙන යහපත් හැගීම් වල ප්‍රතිබිම්බයක්. ඒ වගේම ඒක ඔයාගේ හිතේ ගැඹුරින්ම කැමති,සබඳතාවක් දක්වන සත්වයාගේ රූපය ගන්නවා.එය ආලෝකයේ ත්‍යාගයකි. ඔබ පෙට්‍රොනාස් මන්තරේ මැතිරුවොත් ඔබට ඔබව ලෝකයෙන් ආරක්ෂා කරගන්න පුළුවන.නිකන් හරියට සමහර ප්‍රශ්න වලදී කල් යන්න කලින් අවශ්‍යතාව මතු වීමක් වගේ...

🌑දෙවැනි ජවනිකාව 12වනදර්ශනය

🏘 හොග්වෝර්ට්ස්වල පඩිපෙළ 🏘

ඇල්බස් වටපිට බලමින් ඇවිදගෙන ගියේය.

ඔහුට කිසිවක් දැක ගන්නට නොලැබුණි. පඩි පෙළවල් නැටුමක් ආකාරයෙන් එහා මෙහා ගමන් කරන්නට විය..

ස්කෝපියස් ඔහුට පසුපසින් පඩිපෙළවල් වලට ඇතුළු විය.ඔහු සිතුවේ ඇල්බස්ව දැකගන්නට ලැබේවි කියායි.නමුත් ඔහු එතැන නොවීය.

ස්කෝපියස්ට පඩිපෙළවල් කැරකැවීම නිසා යන මග සොයාගත නොහැකිවිය...

එවිටම මැඩම් හූච් පැමිණ ඔහුට යා යුතු දිශාව ගැන සංඥා මඟින් කියා දුන්නේය...

ඔහු තමන්ගේ අවිනිශ්චිතබව තනිකර දමා පැහැදිලි මනසක් ඇතිකර ගත්තේය..

එවිටම ඇල්බස් ඇතුළුවී පඩි පෙළක් දිගේ නගිමින් සිටියේය.ඔහු වෙන පඩිපෙලක ඇවිදිමින් සිටියේය.

පඩිපෙළවල් දෙක සම්බන්ධ විය.කොලු පැටව් දෙදෙනා ඔවුනොවුන් දෙස බලා සිටියහ...

සැමදාම වගේ අභිමි වීම සහ බලාපොරොත්තු සහගතව බලා සිටියහ..

මොහොතකට පසු ඇල්බස් අහක බලා ගත්තේය.

දැන් පඩිපෙල් දෙකෙහි,එක් පැත්තක වරදකාරී හැඟීමෙන් බලා සිටින ඇල්බස් ද අනෙක් පස වේදනාවෙන් පිරුණු හැඟීම්වලින් යුතු ස්කෝපියස්ය. ඔවුන් දෙදෙනාම අසතුටෙන් පසුවිය.

---

▨දෙවන ජවනිකාව , 13වන දර්ශනය

🏠හැරී සහ ජිනී පොටර්ගේ නිවසේ මුලුතැන්ගෙය🏠

ජිනී සහ හැරී ඔවුනොවුන් දෙස බලා සිටියහ.ඔවුන් දෙදෙනා අතර මතභේදයක් හටගන්න බව ඔවුනොවුන් හොඳින්ම දැන සිටියහ

Harry :- මේක තමා හොඳම තීරණය.

Ginny :- ඔයා ඒක දැනටමත් ඒත්තු ගන්වලා ඉවරයිනේ.

Harry :- ඔයා මට එයත් එක්ක අවංක වෙන්න කියලා.නමුත් මට ඇත්තටම ඕනේ වුනේ මාත් එක්කම අවංක වෙන්න.මට ඕනෙ වුනේ මගේ හදවත කියන දේ විශ්වාස කරන්න.

Ginny :- හැරී ඔයාට තියෙන්නෙ ජීවත් වුන මායාකරුවන්ගෙන් ගත්තහම ශ්‍රේෂ්ඨ හදවතක්..ඉතින් මම හිතන්නෙ නෑ ඔයාගේ හදවත මේ තීරණයට ඉඩ දුන්නා කියලා.

එවිටම වාගේ දොරට තට්ටු කරන හඬක් ඇසුණි.දොර ඇරලා තියෙන්නෙ.ඇය පැවසුවාය.එවිට තරහෙන පිපිරෙමින් ඒ තරහව සැඟවීමට උත්සාහ දරමින් සිටි ඩ්‍රැකෝ මුලුතැන්ගෙට ඇතුලු විය.

Draco :- මට ගොඩක් වෙලා රැඳී ඉන්න බෑ.මට ගොඩක් වෙලා ඉන්න ඕනෙත් නෑ.

Harry :- කොහොමද මම ඔයාට උපකාර කරන්න ඕනෙ??

Draco :- මම ආවෙ මෙතනට ඔයත් එක්ක වාද කරන්න නෙමේ.නමුත් මගේ දරුවා හඬාගත්තු ගමන් ඉන්නෙ.ඉතින් එයාගේ තාත්තා විදියට මම මෙතනට ආවේ..හොදම යාලුවෝ දෙන්නෙක් වෙන් කරන්න හේතුව මොකක්ද කියලා දැනගන්නයි...

Harry :- මම එයාලව වෙන් කලේ නෑ.

Draco :- ඔයා පාසලේ කාල සටහන වෙනස් කරලා.ඒ වගේම ඔයා ගොඩක් ගුරුවරුන්ටත් අනතුරු හඟවලා තියෙනවා.ඇල්බස්ටත් එහෙම කරලා.ඇයි??

හැරී ඩ්‍රැකෝ දෙස පරිස්සමින් බලා අහක බලා ගත්තේය.

Harry :- මට මගේ පුතාව ආරක්ෂා කරගන්න ඕනෙ.

Draco :- ස්කෝපියස්ගෙන්ද??

Harry :- බේන් පැවසුවා ඔහුට දැනෙනවා කියලා මගේ පුතා වටා අඳුර පවතිනවා කියලා.

Draco :- මොකක්ද ඔයා මේ වටින්ගොඩින් කියන්න හදන්නේ පොටර්???

හැරී එක්වරම ඩ්‍රැකෝ දෙස ක්ෂණික බැල්මක් හෙලුවේය.

Harry :- ඔයාට විශ්වාසද??...ඔයාට ඇත්තටම විශ්වාසද ඩ්‍රැකෝ ඔයාගේ පුතා කියලා.එක්වරම ගැඹුරු නිශ්ශබ්දතාවකි.

Draco :- ඔයා කිව්ව දේට මේ දැන්ම සමාව ගන්න ඕනේ..මේ දැන්ම

නමුත් හැරී ගනනකටවත් ගත්තේ නැත.මේ නිසා උරන වූ ඩ්‍රැකෝ තම යෂ්ටිය එලියට ගත්තේය.

Harry :- ඔයා මේ දේ කරන්න ඕනේ නෑ, ඩ්‍රැකෝ.

Draco :- නැහැ මම කරනවා

Harry :- මට ඔයාට අනතුරක් කරන්න ඕනේ නෑ

Draco :- අනේ!! මට හරි බයයි පොටර්..දැනගන්නවා දැන් මට ඕනේ ඔයාට අනතුරක් කරන්නමයි...

දෙදෙනාම තම යෂ්ටිය මුදා හලහ..

Draco and Harry :- expelliarmus !!!

ඔවුන් දෙදෙනාගේ යෂ්ටි වලින් ආලෝක ධාරා මතුවී විසිවී ගියහ....

Draco :- incarcerous!!

හැරී ඩ්‍රැකෝගේ යෂ්ටියෙන් ආ වශියෙන් බේරී පැන ගත්තේය..

Harry :- tarantallegra!!!

ඩ්‍රැකෝ විසිවී ගියේය...

ඔයා තව පුරුදු උනොත් හොඳ හිත ඩ්‍රැකෝ

Draco :- ඒ වගේම ඔයා වැඩකට නැති එකෙක් පොටර්,Densaugeo!!!

හැරී එයද මගහැරීමට වගබලා ගත්තේය

Harry :- rictusempra!!!

ඩ්‍රැකෝ පුටුවක් පාවිච්චි කර එය මගහැරීමට කටයුතු කළේය...

Draco :- flipendo

ජැරී වටේ කැරකෙමින් එයින් බේරීමට උත්සහ කලේය.ඩ්‍රැකෝ සමච්චල් සිනාවකින් මුව සරසාගෙන සිටියේය. කරගෙන යන්න නාකි මිනිහෝ...

Harry :- අපි එකම වයසේ ඩ්‍රැකෝ

Draco :- මම ඒක හොඳටම දන්නවා

Harry :- brachiabindo!!! ඩ්‍රැකෝ තදින් සිරවිය.

Draco :- ඒකද ඔයාට තියෙන හොඳම එක..

ඩ්‍රැකෝ තමන්ගේ බැමි ලිහා ගත්තේය.

Levicorpus

හැරී විසි වී ගොස් බිම වැටුණි..

Mobilicorpus!!! ඕහ්...මේකනම් ගොඩක් විනෝදයි..

ඩ්‍රැකෝ හැරීව උඩට පල්ලෙහාට කරමින් සිටියේය.ඉන් මිදුනු හැරී පෙරළී ගොස් මේසයකින් පහලට වැටුණි.එක්වරම ඩ්‍රැකෝ මේසය උඩ පැන යෂ්ටිය සූදානම් කර ගත්තද ඊට පෙර හැරී ඉක්මන් විය.

Harry :- obscuro!!!

ඩ්‍රැකෝද එවෙලේම මන්ත්‍රයක් කීවේය. නැවත හැරී පුටුවක් විසි කළේය.ඩ්‍රැකෝ එය අහසේ පා වීමට සැලැස් වීය..

Ginny :- මම මේ කාමරයෙන් මිනිත්තු තුනකටයි ගියේ.....

ඇය මුළුතැන්ගෙය තුළ වූ අවුල් ජාලය දෙස බැලුවාය.පාවෙමින් තිබුණ පුටු දැක ඒවා නැවත පොළොවට ගැනීමට ඇය යෂ්ටිය දිගු කළා.(තරහෙන් පිපිරෙමින්)මොකක්ද මම නැති අතරෙ වුනේ....

⚫දෙවන ජවනිකාව,14 වන දර්ශනය

🏰 හොග්වෝර්ට්ස් පඩිපෙළ 🏰

ස්කෝපියස් පඩිපෙළක් දිගේ අසතුටින් බැහැ ගෙන ගියේය...

එක්වරම අනිත් පසින් ඩෙල්ෆි දඩිබිඩි ගා පඩිපෙළ නගිමින් සිටියාය...

Delphi :- හොඳයි...හරිනම්...මම මෙතන ඉන්න ඕනේ නැහැ තමයි

Scorpius :- ඩෙල්ෆි !!!

Delphi :- ඇත්ත වශයෙන්ම මම අපේ මුළු කාර්යයම අනතුරේ දාල තියෙන්නෙ.හොඳයි මම සාමාන්‍යයෙන් ඔයා දන්නවා වගේ අවදානම් ගන්න කැමති කෙනෙක් නෙවෙයි. මම කවදාවත් හොග්වෝර්ට්ස් ගිහින් නෑ. මෙහෙ තියෙන්නෙ හරිම ලිහිල් ආරක්ෂක පද්ධතියක්.එහෙම නේද ??ඒ වගේම ගොඩක් පිළිරූ , කොරිඩෝවල් සහ භූතයන් අර ඔළුව නැති පුදුම පෙනුමක් තියෙන හොල්මන කිව්වා මට ඔයාව හොයා ගන්න පුළුවන් තැන ගැන..ඔයාට ඒක විශ්වාස කරන්නවත් පුළුවන්ද???

Scorpius :- ඔයා කවදාවත් මීට කලින් හොග්වෝර්ට්ස් ඇවිත් නැද්ද???

Delphi :- මම ආවා.. කුඩා ළමයෙක් කාලේ අසනීප වෙලා.කාලෙකට කලින්.අනිත් මිනිස්සුන්ට යන්න වුනා නමුත් මම ගියේ නෑ...

Scorpius :- ඔයා අසනීප වෙලා හිටියද?? සමාවෙන්න,මම ඒ ගැන දැනගෙන හිටියේ නෑ

Delphi :- මම ඉතින් ඒ වගේ තොරතුරු ප්‍රදර්ශනය කරන්න යන්නේ නෑ.මම ගොඩක්ම කැමති ඒ වගේ දුක්ඛදායක සිදුවීම් ඛේදවාචක විදියට සලකන්නෙ නැතුව ඉන්න.ඔයා දන්නවද වැඩක් ...

ස්කෝපියස් සතුව පංති නාම ලේඛන කිහිපයක් විය.ඔහු යමක් කීමට සැරසෙන විටම ඩෙල්ෆි ඉක්මනින් අසල තිබූ අඳුරු තැනකට ගොස් වසන් වි.ඒ මොහොතේම සිසුන් පිරිසක් ඔහුව පසු කර ගියේය.ස්කෝපියස් ළමුන් පිරිස ඔහුව පසුකර යන තෙක් කිසිදු දෙයක් නොවුණා සේ සැහැල්ලුවෙන් සිටීමට වගබලා ගත්තේය

Delphi :- එයාලා ගියාද ??

Scorpius :- ඩෙල්ෆි ,සමහරවිට ඔයා මෙතන ඉන්න අනතුරු දායක වෙන්න පුළුවන්

Delphi :- හොඳයි ,එහෙනම් කාට හරි මේකට මොකක් හරි කරන්න වෙයි නේ

Scorpius :- ඩෙල්ෆි ,අපි කල කිසි වැඩක් හරි ගිහිල්ල නෑ.කාලය වෙනස් කරන්න හදපු එක...අපි පරාදයි.

Delphi :- මම දන්නවා.ඇල්බස් මට බකමූණෙක් එව්වා.ඉතිහාස පොත් වෙනස් වෙලා..නමුත් ඒ මදි.සෙඩ්‍රික් තාමත් මැරිලා.ඇත්තටම එයා පලවෙනි කාර්ය පැරදුන නිසා දෙවන කාර්යය හොඳින් ගොඩක් දිරිමත් වෙලා කරලා තියෙනවා..

Scorpius :- ඒ වගේම රොන් , හර්මයිනී දෙන්නා සම්පූර්ණයෙන්ම වෙනස් චරිත දෙකක් වෙල.මට තාම හොයා ගන්න බැහැ ඇයි කියලා...

Delphi :- අන්න ඒ නිසයි සෙඩ්‍රික්ව බලාගෙන ඉන්න වුනේ.ඒ ඔක්කොම දේවල් ටිකක් අවුල් වෙන්න ගත්තා.ඒ වගේම ඔයා කාලයන්ත්‍රය තියා ගත්ත එකත් හොඳට ගියා.නමුත් මම කියන්නේ කවුරු හරි මොනවා හරි කරන්න යන්නේ ඔය දෙන්නට

Scorpius :- ඔහ්....

Delphi :- ඔයාලා දෙන්නා හොඳම යාළුවෝ. ඇල්බස් එවපු හැම ලිපියකින්ම ඔයා නැති අඩුව ඔයාට හොඳටම දැනෙනවා කියලා මට තේරුණා.ඒකෙන් එයාව විනාශ වෙලා යයි...

Scorpius :- මට පෙනෙන්නේ එයාට දුක බෙදාගන්න කෙනෙක් හමුවෙලා වගේ!!! එයා ඔයාට බකමූණෝ කීයක් එව්වද??

ඩෙල්ෆි සැහැල්ලුවෙන් සිනාවිය.

සමාවෙන්න ඒක එහෙම නෙමෙයි මම අදහස් කලේ.මට තේරෙන්නේ නෑ මේ මොකක්ද වෙන්නෙ කියලා.මම එයාව හමුවෙන්න උත්සාහ කළා , එයාට කතා කරන්න උත්සාහ කළා , ඒ හැම වාරයකදීම ඔහු මාව මග හැරියා...

Delphi :- ඔයා දන්නවද මම ඔයාගෙ වයසෙ ඉන්නකොට මට ඔහොම හොඳ යාලුවෙක් හිටිය නෑ..මට එහෙම කෙනෙක් ඕන උනා.. මම පොඩි කාලේ එහෙම කෙනෙක්ව හිතින් මවා ගත්තා...නමුත් ....

Scorpius :- මටත් එහෙම කෙනෙක් හිටියා.Flurry කියලා..නමුත් අපි Gobstones (ටීක් බෝල ගහනවා වගේ සෙල්ලමක් හදේ) සෙල්ලම් කරන්න යද්දී අපි දෙන්නා අතරේ ප්‍රශ්න ඇති වුණා...

Delphi :- ඇල්බස්ට ඔයාව ඕනේ ස්කෝපියස්. එක හරිම පුදුමාකාර දෙයක්..

Scorpius :- එයාට මාව ඕනේ මොකක් කරන්නද ??

Delphi :- ඒක තමයි දේ.එහෙම නේද? යාළුකම සම්බන්ධව.ඔයා දන්නෙ නෑ එයාට මොනවද ඕනි කියල.ඔයා දන්නේ එයාට ඒ දේ ඕනේ කියලා විතරයි.එයාව හොයා ගන්න ස්කෝපියස්.ඔයාල දෙන්න... ඔයාල දෙන්නා එකිනෙකාට සම්බන්ධයි.

▨ දෙවන ජවනිකාව , 15වන දර්ශනය

🏠 හැරී සහ ජිනීගේ නිවසේ මුළුතැන්ගෙය

හැරී සහ ඩ්‍රැකෝ දෙදෙනා තරමක් ඈත් වී හිඳගෙන සිටි අතර ඔවුන් දෙදෙනා මැද ජිනී සිටගෙන සිටියාය.

Draco :- මට සමාවෙන්න ඔයාගේ කුස්සිය ගැන ජිනී..

Ginny :- ආහ්..එක මගේ කුස්සියෙ නෙමේ.. හැරී තමා මේකෙ වැඩිපුරම උයන්නේ.

Draco :- මට ඩ්‍රැකෝට කතා කරන්නවත් බෑ ඇස්ටෝරියා මැරුණට පස්සේ.මට අඩුම තරමේ ඔහුව රැකබලා ගත් ඇය ගැනවත් ඇගේ මරණින් පස්සේ එයත් එක්ක කතා කරන්න බෑ.මම කොච්චර උත්සාහ කලත් මට ලං වෙන්න බෑ.ඔයාට ඇල්බස්ට කතා කරන්න

බැහැ.මට ස්කෝපියස්ට කතා කරන්න බෑ..මේකයි දැන් තියන තත්ත්වෙ.. මගේ පුතා යක්ෂයෙක් වෙනවා කියන එක නෙමෙයි...මොකද අහංකාර නරාශ්වයෙකුගේ කීම ඔයා පිළිගත්තත් ඔයා දන්නවා යාලුකමේ තියෙන බලය කොච්චරද කියලා...

Harry :- ඩ්‍රැකෝ ඔයා මොනව හිතුවත් ...

Draco :- මම හැමවිටම එයාලට ඊර්ෂ්‍යා කළා...ඔයා දන්නවනේ වීස්ලි සහ ග්‍රේන්ජර්ට....මටත් එහෙම හිටියා...

Ginny :- ක්‍රැබුයි ගොයිලුයි...

Draco :- කොසු මිටක් තරම්වත් මොලයක් නැති මෝඩයෝ දෙන්නෙක්... ඔයා.. ඔයාලා තුන්දෙනා...ඔයාලා තුන් දෙනා එකිනෙකාට කැමතියි. ඔයාලා දන්නවනේ...එකිනෙකා ගැන ඔයාලා හොයලා බලනවා. ඔයාලා විනෝදවුනා. මම හැම දේකටම වඩා ඔයාලගේ යාලුකමට තමයි ඊර්ෂ්‍යා කලේ..

Ginny :- මමත් එයාලට ඊර්ෂ්‍යා කළා...

හැරී පුදුමයෙන් ජිනී දෙස බැලුවාය.

Harry :- මට එයාව ආරක්ෂා කරගන්න ඕන.

Draco :- මගෙ තාත්තත් හිතුවේ එයා මාව ආරක්ෂා කරනවා කියලා .ම හිතන්නේ ඔයා, ඔයාම උන වෙලාවක ඔයාට තීරණයක් ගන්න වෙයි.ඒ වෙලාවෙදි මම කියන්නේ ඔයාට ඕනෙ යාලුවෙක් ද දෙමව්පියන්ගෙන් කෙනෙක්වද ,ඒ වගේම ඔයා දෙමව්පියන්ට වෛර කරන්න ඉගෙන ගත්තෙත් ඒ මොහොතේ ඉඳන් ඔයාට යාලුවෝ නැති වෙනවා.එතකොට එයා සම්පූර්ණයෙන් තනිවෙනවා.තනිකමින් ඉන්න එක අමාරු වැඩක්.මම එහෙම ඉදල තියෙනවා.ඒ වගේම ඒක මාව ඇත්තටම අඳුරු පැත්තට යොමු කළා.කාලෙකට කලින්

ටොම් රිඩ්ල් කියන්නෙත් තනිකම්න් හිටපු ළමයෙක්.හැරී සමහරවිට ඔයාට මේවා තේරෙන්නෙ නැතිව ඇති.නමුත් මට තේරෙනවා වගේම මම හිතනවා ජිනීත් ඒ ගැන දන්නවා..

Ginny :- එයා හරි..

Draco :- ටොම් රිඩ්ල් එයාගේ අඳුරු වාසස්ථානයෙන් නැවත ආවෙ න.ඒ වගේම පස්සෙ කාලෙ ටොම් රිඩ්ල් බලවත් voldemort වුනා.සමහර විට බේන් දැක්ක අඳුරු වලාකුල ඇල්බස්ගේ තනිකම වෙන්න ඇති.එයාගේ වේදනාව.එයාගේ නොරිස්සුම් ගතිය.දරුවව නැති කරගන්න එපා පොටර්. ඔයාට ඒකට වන්දි ගෙවන්න වෙයි.මොකද ඔහුට ඔයාව වගේම ස්කෝපියස්වත් ඕනෙ.කොහොමවුනත් නැතත් දැන් ඔහු ඒක දන්නවා...

හැරී ඩ්‍රැකෝ දෙස බලා කල්පනාවකට වැටුණි.පසුව ඔහු ඩ්‍රැකෝට යමක් කියන්න ගොස් නවත එය ගිල ගත්තේය.

Ginny :- හැරී ඔයා පිටි ටික ගේනවද නැත්නම් මම ගේන්නද ...

හැරී තම බිරිඳ දෙස බලා සිටියේය...

---

◍ දෙවැනි ජවනිකාව 16වන දර්ශනය

🏰 🏰 හොග්වෝර්ට්ස් පුස්තකාලය 🏰 🏰

scorpious පුස්තකාලයට ඇතුළු විය.ඔහු වටපිට බැලූවේය.එහිදී ඔහුට ඇල්බස්ව දැකගන්නට ලැබුනි.ඒ වගේම ඇල්බස්ද ඔහුව දුටුවේය.

Scorpius :- හායි...

Albus :- scorpius මට බැහැ..

Scorpius :- මම දන්නවා ඔයා දැන් ග්‍රිෆින්ඩෝර් නිවාසයේ කියලා.මම දන්නවා ඔයාට මාව දැන් දකින්නවත් ඕනේ නෑ කියලා.නමුත් මෙන්න මම ඉන්නවා ඔයාට කතා කරකර...

Albus :- හොඳයි මට කතා කරන්න ගොඩක්...

Scorpius :- ඔයාට කතා කරන්නම වෙනවා.ඔයා හිතන්නේ ඔයා කළ හැම දේටම ඔයාව නොසලකා හැරලා ඉන්න පුලුවන් කියලද? මුළු ලෝකෙම පිස්සුවක් වෙලා.ඔයාට ඒක තේරුම් ගියාද??

Albus :- මම දන්නවා හරිද...රොන් අමුතු වෙලා...හර්මයිනී මහාචාර්යවරියක්.ඒ ඔක්කොම කණපිට හැරිලා..නමුත්...

Scorpius :- ඒ වගේම රෝස් කියල කෙනෙකුත් නෑ ....

Albus :- මම දන්නවා බලන්න මට හැමදේම තේරුම් ගන්න බෑ.නමුත් ඔයාට මෙතන ඉන්න බෑ.

Scorpius :- මොකද අපි කල දේ නිසා අඩුම තරමේ රෝස් ඉපදිලාවත් නෑ.ඔයාට මතකද ට්‍රයිවිසාර්ඩ් තරගාවලිය ගැන yule ball මොනවද කිව්වේ කියලා.සෑම කෙනෙක්ම තමන්ගේ සහකාරයෙක් සහකාරියක් හොයාගන්න ඕන..ඔයාගේ තාත්තා තෝරගත්තේ පාර්වතී පටෙල්.ඒ වගේම වික්ටර් ක්‍රම් තෝරගත්තේ ....

Albus :- හර්මයිනී..ඒ වගේම රොන් ඒකට ඉරිසියාවෙන් මෝඩයෙක් වගේ හැසිරුණා...

Scorpius :- නෑ එහෙම නෑ.මම හොයාගත්තා Rita skeeterගේ පොතක් එයාලා ගැන ලිව්ව.එකේ හැටියට කතාව ගොඩක් වෙනස්.රොන් හර්මයිනීව නැටුමට අරන් ගිහින්...

Albus :- මොකක්....

Polly chapman :- ශ්...ශ්....

scorpius පොලී දෙස බලා තම ශබ්දය අඩු කර ගත්තේය

Scorpius :- යාලුවෝ විදියට...පස්සේ එයාලා නටලා.යාලුවෝ විදියට...මේක හොඳට ගිහිල්ලා.පස්සේ රොන් පද්මා එක්ක නටන්න ගිහින්.එයාට ඒක ගොඩක්ම හිතට අල්ලලා ගිහින්.පස්සේ ඒ දෙන්න හමුවෙන්න අරගෙන.ඔහු පොඩ්ඩක් වෙනස් වෙලා ඒකෙන් එයාලා කසාද බැඳලා. ඊට ටික කාලෙකට පස්සේ හර්මයිනී...

Albus :- පිස්සියක් වෙලා....

Scorpius :- හර්මයිනී ඉදලා තියෙන්නේ ක්‍රම් එක්ක නැටුමට යන්න.ඔයා දන්නවද ඇයි එයා එහෙම නොකලේ කියල?ඇය ඩර්ම්ස්ට්‍රැන්ග් කොල්ලෝ දෙන්නෙක් ගැන සැක කරලා තියෙනවා සෙඩ්‍රික්ගේ යශ්ටිය අතුරුදන්වීම ගැන ට්‍රයිවිසාර්ඩ් තරගාවලියේ පළමු කාර්යයේදී...එයා විශ්වාස කරලා අපි victorගේ නියෝග මත සෙඩ්‍රික්ට ඒ වැඩේ දුන්නා කියලා...

Albus :- වාව්...

Scorpius :- ඉතිං වික්ටර් ක්‍රම් නැති නිසා රොන්ට කවදාවත් හමයිනී ගැන ඊර්ෂ්‍යා හිතුනේ නෑ.ඉතින් ඒ ඊර්ෂ්‍යාවක් නැතිවුණ නිසා එයාලා හැමදාම යාළුවො වගේ හිටියා මිසක් ආදරෙන් වෙළුනෙවත් බැන්දෙවත් නෑ..රෝස්ව ලැබුනෙත් නෑ ...

Albus :- ආහ් ඒක තමයි එහෙනම් තාත්තත්... එයත් වෙනස්වෙලාද??

Scorpius :- මට නම් හොඳටම විශ්වාසයි ඔයාගේ තාත්තා වෙනස් වෙලා නෑ කියලා මායා නීති බලගැන්වීමේ ප්‍රධානියා.ජිනීව මැරි කරලා ළමයි තුන් දෙනෙකුත් ඉන්නවා

Albus :- ඒත් ඇයි එයා මෙච්චර...

පුස්තකාලාධිපතිවරයා කාමරයට ඇතුළු විය..

Scorpius :- ඔයාට මාව ඇහුනද ඇල්බස්?? දැන් මේක ඔයායි ඔයාගේ තාත්තටයි වඩා ලොකු දෙයක්.මහාචාර්ය ක්‍රොකර්ගේ නියමය "කවුරුහරි කෙනෙක් පැය පහකට වඩා අතීතයට ගමන් කළොත් ඒ ගමන් කරන කෙනාට එම කාල රාමුවට හානි වේ" කියලා තියෙනවා..ඉතින් අපි අවුරුදු ගාණක් ආපස්සට ගියානේ..අපි ඒක පුංචි මොහොතකින් එක පොඩි වෙනසකින් ලොකු අවුල් ජාලයක් ඇති කරලා තියෙනව.ඒ වගේම අපි නරකම නරක අවුල් ඇති කරලා තියෙන්නේ.රෝස් කවදාවත් ඉපදුනේ නෑ අපි කරපු දේ නිසා...

Librarian :- ශ්......

ඇල්බස් වේගයෙන් සිතන්නට විය.

Albus :- හරි හොඳයි අපි නැවත අතීතයට යමු.හරිගස්සමු ඒක.සෙඩ්‍රික්වයි රෝස්වයි නැවත ගේමු..

Scorpius :- ඒක තමයි වැරදි උත්තරේ

Albus :- ඔයා ගාව තාම කාලයන්ත්‍රය තියනවනේ.කවුරුත් හොයා ගත්තෙ නෑනෙ.
scorpius සාක්කුවෙන් එය එළියට ගත්තේය

Scorpius :- ඔව් නමුත්

ඇල්බස් එය ඔහුගෙන් උදුරා ගත්තේය.

නෑ එපා..ඔයාට තේරෙන්නැද්ද ඕකෙන් කොච්චර ප්‍රශ්නයක් වෙනවද කියලා...

ස්කෝපියස් කාල යන්ත්‍රය තදින් අල්ලා ගත්තේය.

albus ඔහුව තල්ලු කළේය.ඔවුන් අඩදබර කර ගැනීමට පටන් ගැනිණි...

Albus :- දේවල් නිවැරදි කරන්න ඕන ස්කෝපියස්.සෙඩ්‍රික්ව බේරගන්න ඕනෙ. රෝස්ව නැවත ගේන්න ඕනේ.අපි තව පරිස්සම් වෙමු.ක්‍රොකර් මොනව කිව්වත් මාව විශ්වාස කරන්න.අපිව විශ්වාස කරන්න.අපි මේ පාර හරියටම කරමු...

Scorpius :- නෑ අපිට බැහැ.ඇල්බස් ඒක ආපසු දෙන්න.. ආපසු දෙන්න

Albus :- මට බැහැ.මේක ගොඩක් වැදගත් දෙයක් මේක ගොඩක් වැදගත්

Scorpius :- නමුත් අපි මේක එක්ක වැඩ කරන්න දක්ෂ නෑ අපිට වරදීවි

Albus :- කවුද කියන්නෙ අපිට වරදීවි කියල

Scorpius :- මම කියන්නෙ.මොකද ඒක තමයි අපි කරන්නෙ. අපි දේවල් අවුල් කරනවා.අපි පරදිනවා.අපි පරාජිතයෝ... සම්පූර්ණ පරාජිතයෝ...ඔයාට තාම ඒක තේරුම් ගියේ නැද්ද

ඇල්බස් අවසානයේ අත ඉහලට ඔසවා ස්කෝපියස්ට බිම වැටෙන්න ඇන්නේය.

Albus :- හොඳයි මම පරාජිතයෙක් නොවේ.. ඔයාව මුනගැහුනෙ කලින්

Scorpius :- ඔයා ඔයාගේ තාත්තට මොනව ඔප්පු කරන්න හැදුවත් දැන් ඒක කරන්න හොඳම වෙලාව නෙමෙයි..

Albus :- මට මගේ තාත්තට කිසි දෙයක් ඔප්පු කරන්න ඕනේ නෑ.මට සෙඩ්‍රික්වයි රෝස්වයි බේරගන්න.සමහරවිට මට ඔයා නැතිව මේක හොඳට කරන්න පුළුවන් වේවි

Scorpius :- මම නැතිව..!!!අසරණ ඇල්බස් පොටර්...ඔයාගේ ඔලුව ඉදිමිලා හොඳටම... ඇල්බස් පොටර් හරිම දුකයි...

Albus :- මොකක්ද ඔයා කියන්නේ

Scorpius :- (කෑගසමින්) මගේ ජීවිතේ පල්ලා.මිනිස්සු ඔයා දිහා බලන්නේ ඔයාගේ තාත්තා ජනප්‍රිය හැරී පොටර් හා මායා ලෝකය ගැලවුම්කාරයා නිසා..මිනිස්සු මගේ දිහා බලන්නේ මගේ තාත්තා voldemort කියලා හිතෙන නිසා..voldemort....

Albus :- තවත් කියවන්න එපා

Scorpius :- ඔයාට අඩුම තරමේ ඒක කොයි විදියද කියලවත් හිතාගන්න පුළුවන්ද.ඔයා කවදා හරි එහෙම උත්සාහ කරලවත් තියෙනවද..නැහැ, මොකද ඔයාට ඔයාගේ නහයෙන් එහාට දෙයක් පේන්නෙ නෑ. මොකද ඔයාට ඔයාගේ තාත්ත එක්ක තියෙන මෝඩ ප්‍රශ්නයෙන් එහාට දෙයක් පේන්නෙ නැන.එයා හැමතිස්සෙම හැරී පොටර් වෙලා ඉඳීවි.ඔයත් දන්නවනේ... හරිනේ...ඒ වගේම හැම තිස්සෙම ඔයා එයාගේ පුතා වෙලා ඉඳීවි.මම දන්නවා ඒක අමාරුයි කියලා.ඒවගේම අනිත් ළමයින්ටත් ඒකට ඊර්ෂ්‍යායි.. නමුත් ඔයාට ඒකත් එක්ක ජීවත් වෙන්න වෙනවා. මොකද එපාම කරපු දේවල් එක්කත් ජීවත් වෙන්න වෙනවා.. හරිද ...

ශබ්දයක්

එක වෙලාවක් තිබ්බා මම ගොඩක්ම පුදුම වෙච්ච මම කාලය වෙනස් වෙලා කියල තේරුම් ගත්තාම මම හිතුවා මගේ අම්මා අසනීප වෙලා නැතුව හොඳට ඉදීවි කියලා. මගේ අම්මා මැරිලා නැතුව ඇති කියලා. නමුත් එහෙම වෙනස් වෙලා නැහැ ඇය මිය ගිහින්.මම තවමත් voldemortගේ පුතා අම්මෙක් නැතුව... මේ අනුකම්පා සහගත කොල්ලට කිසිම දෙයක් නැවත දීලා නෑ නමුත් මට සමාවෙන්න මම ඔයාගේ ජීවිතය විනාශ කළා නම්..මොකද මම ඔයාට කියනවා..ඔයාට මගේ ජීවිතේ විනාශ කරන්න වෙලාවක් හමුවුණේ නෑනේ.... මොකද ඒක දැනටමත් විනාශ වෙලානේ...ඔයා ඒක තවත් හොඳට කලේ නෑ...මොකද ඔයා තමා එපාම කරපු යාළුවා

ඇල්බස්ට තමා කී දේවල් අවධාරණය විය.ඔහු තම යාලුවට කළේ කුමක්දැයි මෙන් ඔහු දෙස බැලුවේය....

Prof macgonigal :- ඇල්බස් ?ඇල්බස් පොටර් ??ස්කෝපියස් මැල්ෆෝයි??

ඔයාලා දෙන්නා ඇතුලේ ඉන්නවද...දෙන්නා එකටද ඉන්නේ...මොකද මම අවවාද කළා දෙන්නට එක ළඟ ඉන්න එපා කියලා

ඇල්බස් ස්කෝපියස් දෙස බැලුවේය.ඔහු තම බෑගයෙන් කබායක් ඇදලා ගත්තේය

Albus :- ඉක්මන් කරන්.අපි හැංගෙන්න ඕන.

Scorpius :- මොකක් !!!!

Albus :- මගේ දිහා බලන්න ස්කෝපියස්

Scorpius :- ඒක නොපෙනෙන කබාය නේද.. ඒක ජේම්ස්ගේ නේද

Albus :- ඇය අපිව හොයා ගත්තොත් අපිව සදහටම වෙන් කරාවි.කරුණාකරලා.. මම තේරුම් ගත්තෙ නෑ කලින්..කරුණාකරලා

Prof macgonigal :- (ඇතින් ඔවුන්ට අවස්ථාවක් ලබාදීමට මෙන්)මම ඇතුළු වෙන්නයි හදන්නේ...

මහාචාර්ය මැගෝනිගල් කාමරේට ඇතුලු විය.මැරඩෝර්ගේ සිතියම ඇය අත විය. කොලුවන් දෙදෙනා කබාය මගින් අතුරුදන් වී ගොස්ය. ඇය කුපිත වී වටපිට බැළුවාය.

හොඳයි කොහෙද මෙයාලා. මෙහෙම මාත් එක්ක සෙල්ලම් කරන්න ගියොත් මට මේ සිතියමෙන් කවදාවත් වැඩක් ගන්න වෙන්නේ නෑ

ඇය කල්පනා කළාය.නැවත සිතියම දෙස බැලුවාය.ඇය ඔවුන් සිටිය යුතුයැයි සිතූ ප්‍රදේශ හඳුනා ගත්තාය.කාමරය සිසාරා බැලුවාය.ඇයට ඔවුන් යන දිශාව පෙනුනි. ඇය ඔවුන්ව වැළැක්වීමට තැත් කළාය. නමුත් ඇයව මඟහැර ඔවුන් පළා ගියහ.

අහ් එහෙමද...!!!ඔයාගේ තාත්තගේ කබාය.

එය නැවත සිතියම දෙස බැලුවාය.ඇය කොලුවන් දෙදෙනාගේ අඩි සටහන් දෙස බැලුවාය.එහෙත් ඇය සිනාසෙමින් කල්පනාවක නිගම්ය...

හොඳයි මම ඔයාලව දැක්කේ නැත්නම් මම දැක්කේ නෑ...

ඇය පිටවුනාය.යාළුවන් දෙදෙනා කබාය ඉවත්කර මොහොතක් නිශ්ශබ්දව සිටියහ.

Albus :- ඔව්... මම මේක ජේම්ස්ගෙන් සොරකම් කළා.ඔහුගෙන් හොරකම් කරන්න හරිම පහසුයි එයාගේ ට්‍රංක පෙට්ටියේ එයාගේ පලවෙනි කොස්ස ගත්ත දවසේ ඉඳන් තියෙන දේවල් වලින් පිරිලා.. ඉතින් මට කබාය ලේසියෙන්ම ලැබුණා.

scorpius මද සිනාවක් පෑවේය ...

මට සමාවෙන්න ඔයාගේ අම්මා ගැන.අපිට ඒ ගැන කතාකරන්න වෙලාවක් ලැබුනෙ නෑ නේ.නමුත් මම හිතනවා ඔයා දන්නවා ඇති කියල.මට සමාවෙන්න..ඒ ගැන හිතන්න එපා වැඩිය..ඔයාට මොකද වුනේ ඇයට මොකද වුනේ කියලා...

Scorpius :- ස්තූතියි

Albus :- මගේ තාත්තා කිව්වා ඔයාලු මම වටේ ඉන්න අඳුරු වළාකුළ කියලා.මගේ තාත්තා ඒවෙලේ හිත හිත හිටියෙ...ඉතින් මම දැනගත්තා ඔයාගෙන් ඈත් වෙලා ඉන්න වෙනවා කියලා එහෙම නැතිවුනොත් තාත්තා කිව්වා එයා...

Scorpius :- ඔයාගේ තාත්තා හිතන්නේ කටකතා ඇත්ත කියලා මම තමයි voldemort පුතා කියලා

Albus :- ඔහුගේ දෙපාර්තමේන්තුව දැනටමත් ඒ ගැන විමර්ශනය කරන්න පටන් අරගෙන

Scorpius :- හොඳයි එයාලට ඉඩ දෙන්න කරගෙන යන්න..සමහර විට මට මගේ ගැන හොයාගන්න ලැබේවි. සමහරවිට එයාලා හරි වෙන්නත් පුළුවන්...

Albus :- නෑ එයාලා හරි නෑ.ඒ වගේම මම කියන්නද ඒ ඇයි කියල.මොකද මම හිතන්නේ voldemortට මෙච්චර කරුණාවන්ත පුතෙක් ලැබෙන්න තරං එයා සුදුසුයි කියල.ඔයාගෙ ඔළුවෙ ඉඳන් දෙපතුල දක්වාම ඔයා වගේ කරුණාවන්ත පුතෙක් ලැබෙන්න විදියක්

නෑ..මම ඇත්තටම විශ්වාස කරනවා voldemort ගැන..නමුත් ඔයා වගේ පුතෙක් නම් එයාට ලැබෙන්නේ නෑ...

Scorpius :- ඒක හොඳයි...ඒක ගොඩක් හොඳයි කිව්වා එක...

Albus :- ඒ වගේම තව දෙයක් තියෙනවා මම ගොඩ කාලෙකට කලින් ඉදන් කියන්න හිතප...ඇත්තටම මම දැනගෙන හිටපු හොඳම ඔයා පුද්ගලයා වෙන්න ඕන.ඒ වගේම ඔයාට බෑ මාව පස්සට අදින්න.. ඔයා මාව ශක්තිමත් කළා තාත්තා අපි දෙන්නව වෙන් කරන්න උත්සාහ කරද්දීත්..

Scorpius :- මමත් මගේ ජීවිතේට,ඔයා නැති වුණා නම් මෙච්චර ආදරේ කරන්නෙ නෑ...

Albus :- ඒ වගේම මම දන්නවා මම හැමවෙලේම හැරී පොටර්ගේ පුතා කියලා. මම ඒක මගේ ඔළුවේ තියාගන්නවා. ඒ වගේම මම දන්නවා මගේ ජීවිතය අනිත් ඒවත් එක්ක සසඳද්දි ගොඩක් හොඳයි කියලත් මමයි තාත්තයි ගොඩක් වාසනාවන්තයි කියලත්...

Scorpius :- (කතාවට බාධාකරමින්) මම කණගාටුවෙන් වුනත් කියන්න වෙනවා කතාව නම් නියමයි...ඒ උනාට ඔයා නැවත වරක් මං ගැන කියනවට වඩා ඔයා ගැනමයි කියවන්නේ.ඉතින් සමහර විට හොඳයි ඔයා තව ඔයා ගැනම කියවනවනම් කතාව නවත්වන එක...

ඇල්බස් සිනාසී ස්කෝපියස්ට අත දිගුකළේය.

Albus :- එහෙනම් යාලුවොනේ..

Scorpius :- හැම වෙලාවෙම...

ස්කෝපියස් ද අත දිගු කළේය.ඇල්බස් ඔහුගේ අත ඇදගෙන ඔහුව වැළඳ ගත්තේය..

Scorpius :- මේ දෙවැනි පාර ඔයා ඕක කරපු

කොල්ලන්ද දෙදෙනා සිනාසීමට පටන් ගත්හ.

Albus :- නමුත් මට සතුටුයි මොකද මේ රණ්ඩුව නිසා මට හොඳ අදහසක් පහළ වුණා...

Scorpius :- මොකක් ගැනද

Albus :- ඒකේ දෙවෙනි කටයුත්තට අදාලයි.ඒ වගේම ඒක අපකීර්තියක්...

Scorpius :- ඔයා තාමත් කියවන්නෙ අතීතයට යන එක ගැන අපි මේ ආයෙම පරණ සංවාදයට යන්නයි ලැස්ති වෙන්නේ.. ඔයා හරි..අපි පරාජිතයෝ තමයි.අපි පරාද වෙන්න උපන් හපන්නු.ඉතිං අපි අපි බුද්ධිය මේකට යොමු කරමු. අපේම බලයන් පරාජිතයන් පරාජිතයන්ටම උගන්වගමු.ඒ වගේම එක ක්‍රමයක් තියෙනවා පරාජිතයන්ට උගන්වන්න පුළුවන්.ඒක අපි අනිත් කාටත් වඩා හොදට දන්නවා.ඒ තමයි නින්දා කිරීම.අපි ඔහුට නින්දා කරන්න ඕන..ඔන්න ඕක තමයි අපි කරන්න යන වැඩේ

scorpious බොහෝ වේලාවක් කල්පනා කර සිනාසිය...

Scorpius :- ඒක නම් හොඳ උපායක්

Albus :- මම දන්නවා

Scorpius :- මම අදහස් කලේ ඒක විශිෂ්ඨයි.. සෙඩ්‍රික්ට නින්දාකරනවා සෙඩ්‍රික්ව බේරගන්න..දක්ෂයි..එතකොට රෝස්...

Albus :- ආහ්...මම කරන්නේ පුදුමයකුත් එක්ක.මට ඒක ඔයා නැතුව කරන්න පුළුවන්.නමුත් මට ඔයාව ඕනේ.මොකද මට ඕනේ මේක අපි දෙන්නම එකතු වෙලා කරන්න එකට එකතු වෙලා මේවා හරිගස්සන්න.ඉතිං ඔයා එනවා නේද ??

Scorpius :- නමුත්,පොඩ්ඩක් ඉන්න දෙවෙනි රාජකාරිය කියන්නේ විලේ තිබුන එක නේද?? ඒ වගේම ඔයාට පාසල් ගොඩනැගිල්ලේ පිටතට යහපත් තහනම් නේද ...

ඇල්බස් කපටි ලෙස සිනාසුනේය...

Albus :- අන්න ඒකට තමයි අපි පළවෙන මහලේ ගැහැනු ළමයින්ගෙ නානකාමරය සොයාගන්න ඕන...

---

◍ දෙවැනි ජවනිකාව 17වන දර්ශනය

🏰 හොග්වෝර්ට්ස්හි පඩිපෙළ 🏰

රොන් බර කල්පනාවකට වැටී පඩිපෙළෙන් බසිමින් සිටියේය.එක්වරම ඔහුට හර්මයිනී දක්නට ලැබීමෙන් ඔහුගේ මුහුණේ ඉරියව් සම්පූර්ණයෙන්ම වෙනස් වී ගියේය.

Ron :- මහාචාර්ය ග්‍රේන්ජර්

සමයේ දෙස බැලුවාය ඇගේ හදවත මේකෙන් කෙරෙන්නට පිය ඇයට එය නවත්වා ගත නොහැකිවිය

Hermione :- රොන් ඔයා මොනවද මෙහෙ කරන්නේ

Ron :- පන්ජු මායා බෙහෙත් පන්තියෙ පොඩි ප්‍රශ්නයක් දාගෙන.ඇත්තටම වැඩ පෙන්නන්න ගිහින් වරද්දගෙන.එයා වැරදි දේකට වැරදි දෙයක් දාලා ඒකෙන් එයාගෙ ඇහිබැම නැතිවෙලා ගිහිල්ලා ඒ මදිවට ලොකු උඩු රැවුලක් වැවිලා එයාට කොහෙත්ම ගැලපෙන්නේ නැති.මම එන්න නෙමෙයි හිටියේ නමුත් පද්මා කිව්වා මේ වගේ දෙයක් වුනාම පුතාලට එයාලගේ තාත්තලා ඕනේ වෙන්නේ කියලා..ඔයා ඔයාගේ කොණ්ඩෙට මොනවා හරි කලාද

Hermione :- මම හිතන්නේ ඒක නිකම් පීරලා විතරයි...

Ron :- හොඳයිනේ..පීරුවම ඔයාට ඒක ගැලපෙනවා..

හර්මයිනී රොන් දෙස පුදුමයෙන් බැලුවාය..

Hermione :- රොන්,ඔයාට පුළුවන්ද කරුණාකරලා මා දිහා ඔය විදියට බලන එක නවත්තන්න...

Ron :- (පියවි සිහියට එමින්) ඔයා දන්නවද හැරීගේ කොල්ලා ඇල්බස්,මේ පහුවුන දවසක කියනවා එයා හිතුවලු මමයි ඔයයි කසාද බැඳලා කියලා..හහ්..හා..හහ්..හා... විකාරයක්නේ...මම දන්නවා....

Hermione :- ලොකුම ලොකු විකාරයක්!!!

Ron :- ඒ විතරක් නෙමේ හිතලා තියෙනවා අපිට දුවෙකුත් ඉන්නවා කියලා.ඒක පුදුම නැද්ද ??

හර්මයිනීගේ සහ රොන්ගේ නෙත් එකිනෙක ගැටුන.එක්වරම අහක බලා ගත්තාය.

Hermione :- ඒක නම් පුදුමයකට වඩා දෙයක්...

Ron :- ඇත්තටම,අපි යාලුවෝ විතරයි. එතනින් එහාට දෙයක් නෑ...

Hermione :- ඇත්ත වශයෙන්ම යාලුවෝ විතරයි...

Ron :- යාලුවෝ විතරයි.."යාළුවෙක්" හරිම විහිළු වචනයක්..මම කිව්වේ එහෙම විහිළු නෙමේ..නිකන් වචනයක් විතරයි. යාළුවා..මම කිව්වේ..යාළුවා..මගේ විහිළුකාර යාළුවා...

මගේ හර්මයිනී ...

නෑනේ මගේ හර්මයිනී නෙමේනේ..නෑ මගේ නෙමේ...මගේ හර්මයිනී නෙමේ වැරදුන..ඔයා දන්නවනේ..නමුත්...

Hermione :- මම දන්නවා

නිශ්ශබ්දතාවකි.ඔවුන් දෙදෙනා එක් අඟලක් හෝ සෙලවුනේ නැත.එක් සෙලවීමක් හෝ මොහොතකට වැදගත්විය. එක්වරම රොන් කැස්සේය..

Ron :- හොඳයි දැන් මම ගියානම් හරි වගේ. පංජුට එයාගේ රැවුල පිරිමැදලා ලස්සනට තියාගන්න කියලා දෙන්න ඕනේ ...

ඔහු ඇවිදන් ගියේය..යන අතර නැවත හර්මයිනී දෙස හැරී බැලුවේය. ඇයද නැවත බැලුවාය.ඔහු නැවත පැමිණි...

Ron :- ඔයාගේ කොණ්ඩේ ඔයාට ගොඩක්ම ලස්සනට ගැලපෙනවා...

දෙවැනි ජවනිකාව , 18 වැනි දර්ශනය

හොග්වෝර්ට්ස්හි විදුහල්පති කාර්යාලය

මහාචාර්ය මැගෝනිගල්, කාර්යාලයේ මේසය මත වූ මැරඩෝර්ගේ සිතියම දෙස බලා සිටිමින් සිනාවිය.ඇය තම යෂ්ඨියෙන් සිතියමට තට්ටුවක් දමා තමා ගත්තේ නිවැරදි තීරණයක් යැයි සිතන ලෙස මෙන් තමාටම සිනාවිය...

Prof macgonigal :- මිස්චීෆ් මැනේජ්ඩ්...

එක්වරම සෙලවීමකි.

මුලු කාමරයම දෙදරන්නට විය.

ජිනී මුලින්ම කාමරයට පැමිනියාය...ඉන්පසු හැරීද පැමිනියේය..

Ginny :- මහාචාර්යතුමියනි...සමාවෙන්න ඒක ගෞරවාන්විතව පැමිණීමක් නොවේ...

Prof macgonigal :- පොටර්,ඔයා ආපහු ඇවිත්..ඒ වගේම මට පේන්නේ අන්තිමට මගේ කාපට් එකත් ඔයා කිලිටි කරලා වගේ...

Harry :- මට මගේ පුතාව හොයාගන්න.අපි දැන්ම හොයාගන්න ඕනෙ...

Prof macgonigal :- හැරී මට කරුණාවෙන් කියන්න වෙනවා මට ඒකෙ කොටස් කාරයෙක් වෙන්න බැ කියලා...ඔයා මොනවා කියලා තර්ජනය කළත් මට...

Harry :- මිනර්වා , මම ආවෙ යුද්ධ කරන්න, වාද කරන්න නෙවෙයි.මම ආවේ සාමකාමීව කතා කරන්න.ඒ වගේම මම කලින් ඔයාට කතා කරපු විදිහත් වැරදියි තමා...

Prof macgonigal :- මම හිතන්නේ නෑ මට යාලුකමකට විරුද්ධව මැදිහත් වෙන්න පුළුවන් කියලා..ඒ වගේම මම විශ්වාස කරනවා...

Harry :- මට ඕනේ ඔයාටයි හැරීටයි සමාවෙන්න කියන්න.ඔයා මට ඒ අවස්ථාව අරගෙන දෙනවද ..

එක්වරම ඩ්‍රැකෝද දූවිලි වලාවක් සමගින් එතැනට පැමිණියේය...

Prof macgonigal :- ඩ්‍රැකෝ...!!!

Draco :- එයාට එයාගේ පුතාව දකින්න ඕන වගේම මට මගේ පුතාවත් බලන්න ඕන

Harry :- මම කිව්ව විදිහට යුද්ධයක් නෙවෙයි , සාමකාමීව විසදගන්න...

මහාචාර්ය මැගෝනිගල් හැරීගේ මුහුණේ ඉරියව් නිරීක්ෂණය කළාය..ඇය ඇයට දකින්න වුවමනා වූ දේ දැක්කාය.ඇයගේ සාක්කුවෙන් සිතියම ගෙන දිග හැරියාය...

Prof macgonigal :- හොදයි..සාමකාමීව විසදගන්න දෙයක්නම් මට ඒකට මැදිහත් වෙන්න පුලුවන්.ඇය ඇගේ යෂ්ටියෙන් සිතියමට තට්ටුවක් දැමුවාය...

"මම දිවුරා පොරොන්දු වෙනවා කිසි දිනක හොඳ වැඩ නොකරන බවට.."

සිතියම ක්‍රියාත්මක විය...

හොඳයි...එයාලා එකට ඉන්නෙ...

Draco :- 1 වන මහලේ ගැණු ළමයින්ගේ නාන කාමරේ!?!?!?!

මොන මගුලක්ද එයාලා එතනට වෙලා කරන්නේ...

දෙවැනි ජවනිකාව 19වන දර්ශනය

🛁👙ගැහැනු ලමුන්ගෙ නානකාමරය👙🛁

ස්කෝපියස් සහ ඇල්බස් නාන කාමරයට ඇතුළු විය.එහි මැද විශාල වික්ටෝරියා සින්ක් එකක් විය....

Scorpius :- පොඩ්ඩක් ඉන්න මම මේක පැහැදිලි කරගන්න..ඔයා හදන්නේ Engorgio වශීය කරන්නද?

(Engorgio කියන්නේ යමක් වර්ධනය කරන්න පුළුවන් මන්ත්‍රයක්..ඔයාලා අපේ තිමිර සහෝදරයගේ ස්පෙල් ක්ලාස් එකට බ්‍රහස්පතින්දා සහභාගි වෙනවනම් මේවා ඉගෙනගන්න පුලුවන් හොදේ...)

Albus :- ඔව්,ස්කෝපියස් අර සබන් කෑල්ල අරන් දෙන්න පුළුවන්ද ඔයාට...

ස්කෝපියස් සින්ක් එකෙන් එලියට එය ගත්තේ...

Engorgio

ඔහු තම යෂ්ටියෙන් අකුණක් වැනි ආලෝකයක් කාමරය හරහා සබන් කැටය වෙත යොමු කළේය.ක්ෂණිකව එය හතර ගුණයක් පමණ විශාල වන්නට විය...

Scorpius :- නියමයි .... මාවත් නිකන් ලොකු උනා වගේ සතුටක් ආවේ...

Albus :- දෙවෙනි කාර්යය තමයි විලේ තියෙන කාර්යය.එයාලගෙන් හොරකම් කරපු දේ නිසා එයාලා ඒක නැවත හරිගස්සන්න උත්සාහ කරාවි කියලා මිනිස්සු හිතයි...

Scorpius :- මිනිස්සු ඒකට කැමතියි...

Albus :- සෙඩ්‍රික් වායු බුබුලක් තමා විලේ පීනන්න පාවිච්චි කලේ.අපි කරන්න ඕනේ එයා පස්සෙ ගිහිල්ලා එයාව වෙන මොකක් හරි විශාල දෙයකට පරිවර්තනය කරන එක.අපි දන්නවා කාල යන්ත්‍රය අපිට වැඩි වෙලාවක් දෙන්නෙ නෑ කියල..ඒ නිසා අපි ඉක්මන් කරන්න ඕනේ..එයා ළඟට ගිහිල්ලා එයාගේ ඔලුව ලොකු කරලා පස්සෙ එයාව විලේ පාවෙලා යනවා බලාගෙන ඉමු...කරන වැඩෙන් ලස්සනට එයාව අයින් කරන්න පුළුවන් වගේම තරගාවලියෙනුත් අයින් වෙලා යාවි...

Scorpius :- නමුත් ඔයා තාම මට කිව්වේ නෑ අපි කොහොමද විල ඇතුලට යන්නේ කියලා....

එක සින්ක් එකෙන් ජලධාරාවක් පිටතට විහිදුවමින් කෑගහන මාට්ල් එතැනට පැමිණියාය...

Moaning myrtle :- ඒ වැඩේනම් හරිම විනෝදයි...කවදාවත් මම ඒක කරලා නෑ.නමුත් ඔයාල මගෙ වයසෙ හිටියනම් ඔයාලා ඔයාලට ඕන දේ කරාවි නේද...

Scorpius :- ඇත්තෙන්ම..කෑගහන මාට්ල්.... ඔයානම් නියමයි.....

කෑගහන මාට්ල්ස් එක්වරම පාවී අවුත් ස්කෝර්පියස් ඉදිරිපිට සිට ගත්තාය...

Moaning myrtle :- ඔයා මොකක් කියලද මට කිව්වේ..මම කෑ ගහනවද...මම දැන් කෑ ගහනවද...මේ මම...මේ මම....

Scorpius :- නැහැ මම ඒක නොවෙයි අදහස් කළේ

Moaning myrtle :- මොකක්ද මගේ නම

Scorpius :- මාට්ල්...

Moaning myrtle :- හරියට හරි...මාට්ල් එලිසබෙත් වෝරන්..මගේ නම ලස්සන නමක්...කෑ ගහන්න ඕනේ නෑ ඒකට...

Scorpius :- හොඳයි

Moaning myrtle :- කමක් නෑ ඒ ගොඩකාලෙකට කලින්නේ. පිරිමි ළමයි. මගේ නාන කාමරයේ.මගේ ගෑනු ළමයින්ගෙ නාන කාමරයේ.හොඳයි ඒක නම් හරියන වැඩක් නෙමෙයි.ඒ උනාට තාමත් මං ලග හැමතිස්සෙම උණුසුම් පිළිගැනීමක් තියෙනවා පොටර්ලා වෙනුවෙන්.ඒ වගේම මම ටිකක් විතර මැල්ෆෝයිලටත් පක්ෂපාති වෙලා හිටියා. හොඳයි දැන් ඔය දෙන්නට මම කොහොමද උදව් කරන්න ඕන...

Albus :- ඔයා එතන හිටියා මාට්ල්..මම කියන්නේ විල ලග..එයාලා ඒ ගැන ලියලා තිබ්බා.මේ පයිප්ප වලින් එතනට යන්න මාර්ගයක් තියෙන්න ඕන...

Moaning myrtle :- මම හැමතැනම ඉන්නවා නමුත්..නමුත් ඇයි ඔයාලා ඒ ගැනම ඇහුවේ...

Albus :- අවුරුදු 25 කට කලින් ට්‍රයිවිසාර්ඩ් තරගාවලියේ දෙවන කාර්යය..මම කියන්නේ විලේ තිබ්බ තරගය..මගේ තාත්තයි සෙඩ්‍රිකුයි...

Moaning myrtle :- කොච්චර ලැජ්ජාවක්ද ඒ කොල්ල මැරුණ එක..ඔයාගේ තාත්තා වගේ නෙවේ. හරිම කඩවසම් ඔයාලා පුදුම වෙයි මේ නාන කාමර ඇතුළේ කොච්චර ගැහැණු ළමයි එයා ගැන වර්ණනා කළා ද, එයාට හිතින් ආදරේ කලාද කියලා දැනගත්තොත්..ඒ වගේම එයා මැරුණට පස්සේ ඒ අය වැළපුන හැටිත් මට ඇහිලා තියෙනවා...

Albus :- උදව් කරන්න අපිට මාට්ල් අපිට ඒ විලට යන්න උදව් කරන්න

Moaning myrtle :- ඔයාලා කියන්නේ මට ඔයාලව කාලය හරහා අරං යන්න උදව් කරන්න කියලද

Albus :- අපිට ඕනෙ ඔයා රහසක් රැක ගන්න..

Moaning myrtle :- මම කැමති රහස් වලට මම භූතයෙක්ටවත් මම ඒ ගැන හෙළි කරන්නේ නෑ..මාව මරන්න හැදුවත් හරි... නැත්නම් ඒ වගේ දෙයක් කරන්න හැදුවත් මම කාටවත් කියන්නේ නෑ

ඇල්බස් ,ස්කෝර්පියස් දෙස බලා මද සිනාවක් පාමින් කාල යන්ත්‍රය එළියට ගත්තේය...

Albus :- අපිට කාලය හරහා යන්න පුළුවන්. ඔයා අපිට උදව් කරන්න පයිප්ප වලින් යන්න.අපි සෙඩ්‍රික්ව බේරගන්න හදන්නේ.

Moaning myrtle :- හොදයි..ඒකනම් විනෝදජනකපාටයි...

Albus :- ඒ වගේම අපිට වෙනස් කරන්න කාලයක් නෑ...

Moaning myrtle :- මේ සොරොව් බේසමේ(සින්ක් එක හොදේ)වතුර කෙලින්ම යන්නේ විලට..ඔයාලට මේකෙන් කිමිදිලා කෙලින්ම ඕන තැනට යන්න පුළුවන්..

ඇල්බස් තම කබායේ වූ දේවල් ගොඩ ගසන ලදි.ස්කෝර්පියස්ද එසේ කලේය. ඇල්බස් බෑගයක වූ කොළපාට පාසි වර්ගයක් ස්කෝර්පියස්ට දිගුකළේය...

Albus :- ටිකක් ඔයාට අනිත් ටික මට

Scorpius :- Gillyweed?? අපි Gillyweed පාවිච්චි කරනවද වතුර යට හුස්ම ගන්න..

Albus :- මගේ තාත්තා වගේ.. ඔයා ලෑස්තිද?

Scorpius :- මතක තියාගන්න මේ පාර ඔරලෝසුවේ වෙලාව ගැන අවධානයෙන් ඉන්න ඕන

Albus :- විනාඩි පහයි අපිට තියෙන්නෙ ඔරලෝසුවෙන් අපිව වර්තමානයට ගේන්න කලින්...

Scorpius :- මට කියන්න මේ ඔක්කොම හරියයි ද

Albus :- මේ ඔක්කොම සම්පූර්ණයෙන් හරි හරියාවි.. ඔයා ලෑස්තිද

ඇල්බස් gillyweed අහුරක් ගෙන කටේ දමාගෙන සින්ක් එකේ බටය දිගේ පහලට නොපෙනී ගියේය...

Scorpius :- නෑ..ඇල්බස් ...නෑ...

ඔහු නැවත වටපිට බැලුවේය...ඔහු සහ කෑගහන මාට්ල් පමණක් එහි තනිවී...

Moaning myrtle :- මම කැමති නිර්භීත පිරිමි ළමයින්ට

Scorpius :- (ටිකක් බයෙන් ටිකක් නිර්භීතව)එහෙනම් මම මොන දේ වුනත් බය නැතුව මේක කරනවා.ඔහුද gillyweed අහුරක් ගිල දමා සින්ක් එක තුලින් නොපෙනී ගියේය.

කැගහන මාට්ල් පමණක් එහි ඉතිරිවිය.

එක්වරම විශාල ෂූ ශබ්දයක්.. ආලෝකයක්... නැවත විශාල ශබ්දයක් ඇති විය.කාලය නතර විය.ඉන්පසු එය හැරෙන්නට විය.කෙමෙන් කෙමෙන්..පසුව වේගයෙන්... කාලය වේගයෙන් ආපසු යන්නට විය.

කොල්ලො දෙදෙනා අතුරුදහන්විය

එක්වරම නාන කාමරයට හැරීද හැරී පසුපසින් ඩ්‍රැකෝද , ජිනීද මහාචාර්ය මැගෝනිගල්ද ඇතුළුවිය.

Harry :- ඇල්බස් ...ඇල්බස් ....

Ginny :- එයාලා ගිහිල්ලා..

ඔවුන් පිරිමි ළමුන්ගේ කබායවල් එතැන තිබී සොයාගත්තා.

Prof macgonigal :- (සිතියම පිරික්සමින්) එයා අතුරුදහන් වෙලා නෑ..එයාලා හොග්වෝර්ට්ස් පිට්ටනියට යටින් ගමන් කරනවා ...නෑ...ඔහොම ඉන්න..එයාලා අතුරුදහන් වුනා...

Draco :- එයාලා කොහොමද ඒක කරන්නෙ

Moaning myrtle :- එයා පොඩි දිලිසෙන දෙයක් පාවිච්චි කරනවා...

Harry :- මාට්ල් !!!!

Moaning myrtle :- ඔයා මාව අල්ලගත්තා එහෙනම්.මම ගොඩක් අමාරුවෙන් හැංගිලා ඉන්න හැදුවේ.හෙලෝ හැරී ...හෙලෝ ඩ්‍රැකෝ... ඔයාලා ආයිම නරක ලමයි වෙන්නද යන්නේ...

Harry :- මොන වගේ දිලිසෙන දෙයක්ද එයා පාවිච්චි කලේ...

Moaning myrtle :- මම හිතන්නේ ඒක රහසක්..ඒ උනාට මම ඔයාගෙන් කිසිම රහසක් හංගන්නේ නෑනේ..බලන්න ඔයා වයසට යන්න යන්න තරුණ පාටයි, කඩවසම් පාටයි.ඒ වගේම ඔයා උස ගිහින්.

Harry :- මගේ පුතා අනතුරක ඉන්නේ.මට ඔයාගේ උදව් ඕනෙ.මොනවද එයාලා කරන්න හදන්නේ මාට්ල්??

Moaning myrtle :- එයා හදන්නේ මන බදින කොල්ලව බේරගන්න.කඩවසම් සෙඩ්‍රික් ඩිගරිව බේරගන්න....

හැරී ක්ෂණිකව සිදුවන දේ තේරුම් ගත්තේය. ඔහු බෙහෙවින් බිය විය...

Prof macgonigal :- නමුත් සෙඩ්‍රික් ඩිගරි මැරිලා ගොඩක් කල්නේ...

Moaning myrtle :- නමුත් එයා ඒ වග දැන දැනත් විශ්වාසයෙන් කටයුතු කළේ.එයා හරිම ආත්ම විශ්වාසයකින් වැඩ කරන්නේ... හරියට ඔයා වගේ හැරී...

Harry :- මම ආමෝස් ඩිගරි එක්ක කතා කල ඒවා එයා අහගෙන ඉදලා.නැත්නම් ඇහිලා. කාල යන්ත්‍රය....ඒක වෙන්න බැරි වැඩක්

Prof macgonigal :- අමාත්‍යාංශය සතුව කාල යන්ත්‍රයක් තියෙනවද??මම හිතුවෙම ඔක්කොම විනාශ කරලා කියලා...

Moaning myrtle :- කවුරුත් නරක ලමයි වෙන්නෙ නැද්ද??

Draco :- කවුරු හරි මට මේ මොකද වෙන්නේ කියලා පැහැදිලි කරනවද ....

Harry :- ඇල්බස් ස්කෝපියස් අතුරුදහන් වෙලා නැවත මතුවන්නේ නෑ...

එයාලා ගමන් කරනවා..

"එයාලා කාලය හරහා ගමන් කරනවා"

---

දෙවැනි ජවනිකාව 20වෙනි දර්ශනය

ට්‍රයිවිසාර්ඩ් තරඟාවලිය , වර්ෂය 1995

Ludo bagman :- නෝනාවරුනි මහත්වරුනි දරු දැරියනි.මම ඔබලාට ඉදිරිපත් කරනවා වසරේ උත්කර්ෂවත් මන බඳිනා ශ්‍රේෂ්ඨතම සහ එකම ට්‍රයිවිසාර්ඩ් තරගාවලිය.ඔබ හොග්වෝර්ට්ස් වලින් නම් දෙන්න හොද අත්පොලසන් නාදයක්..

විශාල ප්‍රීතිසෝෂාවකි.

මේ අතර ඇල්බස් සහ ස්කෝපියස් විල හරහා පිහිනමින් සිටියහ.ගලායන ජලය හරහා ඔවුන් පහසුවෙන් පිහිනීය.

ඔබ Durmstrang වලින් නම් දෙන්න හොද අත්පොළසන් නාදයක්.

එවරද විශාල ප්‍රීතිඝෝෂාවකි.

Beauxbatons වලින් නම් ලබා දෙන්න මට හොද අත්පොළසන් නාදයක්...

එවර වැඩි ශබ්දයක් නොමැති ලයාන්විත ඔල්වරසන් නාදයක් ඇසුණි.

තරගකරුවන් ගැන සඳහන් කළොත් වික්ටර් ක්‍රම් මෝරෙක් ලෙස වෙස් ගෙන ඇත.ඇත්තෙන්ම ඔහු මෝරෙක් වැනිය.ෆ්ලර් ඉතාම අලංකාරයි.ඒ වගේම කාගෙත් සිත්ගත් හැරී ජෙලිවීඩ් උපයෝගී කරගන්නවා.දක්ෂ හැරී...ගොඩක් දක්ෂයි. ඒ වගේම සෙඩ්‍රික්...ඔව් සෙඩ්‍රික් වායු බුබුලක් මගින් විල හරහා කිමිදෙන්න උත්සාහ කරාවි...

සෙඩ්‍රික් ඩිගරි ඔවුන් අසලින් ජල තලය අසලට ලගාවිය.ඔහුගේ හිස වසා ගනිමින් වායු බුබුලක් විය.ඇල්බස් සහ ස්කෝපියස් තම යෂ්ටි දිගුකර දෙදෙනාම එකවර ජලය මත සිටිමින් වර්ධනය කිරීමේ බන්ධනය යොමු කළේය.

සෙඩ්‍රික් ඔවුන් දෙස බැලුවේය.ඒ මොහොතේ බන්ධනය ඔහුට වැදුණි.ඔහු වටා වූ ජලය රත් පැහැයෙන් දිලිසෙන්නට විය.

ක්ෂණිකයෙන් සෙන්ඩ්‍රික් විශාල වන්නට විය.තවත් විශාල වන්නට විය.ඔහුට සිදුවන්නේ කුමක්දැයි තේරුම් ගැනීමට ඔහු උත්සාහ කළේය.නමුත් ඔහු සම්පූර්ණයෙන්ම සන්ත්‍රාසයට පත් වී ඇත.කොලුවන් දෙදෙනා ජලය මත අසරණ වී සිටින සෙඩ්‍රික් බලා සිටියහ..

Ludo bagman :- ඉන්න...මොකක්ද මේ වෙන්නේ ....

සෙඩ්‍රික් ඩිගරි විලෙන් එළියට ඇවිත්. මට පෙනෙන්නේ තරගයෙනුත් එළියට යයි වගේ.නෝනාවරුනි මහත්වරුනි අපිට තවම අපේ ජයග්‍රහකයා හමුනොවුනත් අපිට පරාජිතයෙක් සිටිනවා...

සෙඩ්‍රික් ඩිගරි බැලුමක් වෙලා ඒ බැළුමට දැන් පියාඹන්න ඕන වෙලා වගේ.පියාඹන්න..පියාඹන්න... තරගයෙන් එලියට පියාඹන්න...තරඟාවලියෙන් එලියට පියාඹන්න...මොන පුදුමයක්ද මේක එන්න එන්නම විනෝදකාමී වෙනවා. බලන්න සෙඩ්‍රික් වටේට මල්වෙඩි සංදර්ශනයකුත් සිදුවෙනවා.

"රොන් හර්මයිනීට ආදරෙයි"

අලංකාර වැකියක්.ජනතාව ඒකට ආදරය කරාවි.නෝනාවරුනි මහත්වරුනි බලන්න සෙඩ්‍රික්ගේ මුහුණ දෙස එය පිංතූරයකට කදිමට ගැලපෙනවා.එය කදිම දර්ශනයක්.බලන්න ඔහුගේ මුහුණ බේදාන්තයකින් පිරී ගොසින්. මෙය නම් ඔහුට නින්දා කිරීමක්මයි..මෙය විස්තර කල හැකි වෙනත් වචන නෑ..

ඇල්බස් මුවපුරා සිනාසෙන ගමන් ස්කෝපියස්ට පහක් ඇමුවේය.

ඉන්පසු ඇල්බස් සහ ස්කෝපියස් ඉවුරට පිහිනා යෑමට පටන් ගත්හ.සෙඩ්‍රික් දෙස බලමින් පැමිණ සිටි පිරිස සිනාසෙන්නට විය.

සියල්ල වෙනස් වේ.

ඇත්ත වශයෙන්ම ලෝකය අඳුරු වෙමින් තිබුණි.ලෝකය දැනටමත් අඳුරු වී ඇත.

එක්වරම විශාල ආලෝකයකි.ඒ සමඟ පිපිරීමක හඬක් සමගින් කාල යන්ත්‍රය වැඩ කිරීමට පටන් ගැනිණි.කාලය නැවතී..කෙමෙන් පසුව වේගයෙන් ගොස්. වර්තමානයට පැමිනියහ.

ස්කෝපියස් මතු වූ විගස ජලය තුළින් උඩට විත් දඟලමින් ජයෙන් උද්දාමයට පත්වූ අයෙක් ලෙස ජය ඝෝෂා නගන්නට විය.

Scorpius :- වූ..හූ...

ඔහු වටපිට බැලීය පුදුමයකි.ඇල්බස් කොහෙද ??

ඔහු ඔහුගේ අත එහා මෙහා යවමින් ඇල්බස් සෙවුවේය

Scorpius :- අපි ඒක කළා

ඔහු එයට පිළිතුරක් බලාපොරොත්තුවෙන් කන්යොමා සිටියේය

ඇල්බස් ?????

ඇල්බස් තවමත් මතුවී පෙනෙන්නට නාවේය.ඔහු නැවත ඒ මේ අත බැළුවේය. නැවත ජලය තුළ ගිලී ගොස් බැලුවේ ය. නමුත් ඔහු නොමැත.නැවත ජලය මතුපිටට ස්කෝපියස්ට පුදුමය මුසු බියක් ඇතිවිය...

ඇල්බස් ...ඇල්බස් ....ඇල්බස් ...

එක්වරම parseltounge භාෂාවෙන් කෙදිරීමක් විල සිසාරා පැතිර ගියේය.

ඔහු වෙනවා..ඔහු එනවා..ඔහු එනවා...

Dolores Umbridge :- ස්කෝපියස් මැල්ෆෝයි වහාම විලෙන් එලියට ...මේ දැන්ම...

ඇය ඔහුව විලෙන් එලියට ඇද ගත්තාය.

Scorpius :- මිස්,මට උදව්වක් ඕනේ. කරුණාකරලා මිස්...

Dolores umbridge :- මිස්?? මම මහාචාර්ය umbridge. ඔයාගේ පාසලේ විදුහල්පතිනිය. මම 'මිස්' නෙමෙයි.

Scorpius :- ඔයා විදුහල්පතිනිය??නමුත් මම...

Dolores umbridge :- මම තමයි විදුහල්පතිනිය.කොහොම නමුත් ඔයාගේ පවුලේ කොච්චර වැදගත් උසස් උනත් මට වැඩක් නෑ.ඒක ඔයා වැඩ අතපසු කරනවට නිදහස කාරණයක් කරගන්නේ නෑ..

Scorpius :- විලේ පිරිමි ළමයෙක් ඉන්නවා. ඔයා උදව් අරගෙන එන්න ඕනේ. මම මගේ යාලුවා සොයන්නේ මිස්...නෑ මේ...මහාචාර්යතුමියනි...විදුහල්පතිනිය...ග්‍රිෆින්ඩෝර් නිවාසයේ ශිෂ්‍යයෙක්ව මම සොයන්නෙ මිස් , මම සොයන්නේ ඇල්බස් පොටර්ව.

Dolores umbridge :- පොටර් ???ඇල්බස් පොටර් ???එහෙම ළමයෙක් නෑනේ ඇත්ත වශයෙන්ම අවුරුදු ගානකින් හොග්වෝර්ට්ස් වල පොටර් කෙනෙක් හිටියෙ නෑ.ඉතින් ඔය කියන විදිහෙ ළමයෙක් ඉන්න විදිහක් නෑ.හැරී පොටර් උනත් සාමයේ සැතපෙනවට වඩා සදාකාලික නෂ්ටාවශේෂයක් වෙලා ඉවරයි.. කරදරකාරයා...

Scorpius :- හැරී පොටර් මැරිලා !!!!!!

එක්වරම සුළඟ හුස්ම ගන්නා හඩක් මෙන් හඩක් ඇතිවි.කළුපාට ඇඳුම් වැනි යම් දේවල් වගයක් සුලගේ පාවී ආවේ.එම කළු ඇඳුම් තරමක් හැඩයක් ගත්හ.ඔවුන් තවදුරටත් ලංවූ විට භූතාරක්ශකයන් බව පෙනෙන්නට විය.

ඔවුන් වටා භූතාරක්ශකයෝ පියාඹා යන්නට විය.ඔවුන්ගේ කළු පැහැ ස්වරූප ඔවුන්ගේ මරණීය ස්වභාවය දකින ඕනෑම අයෙක් තුළ බිය ඇති කලේය.ඒ වගේම ඔවුන් ආත්මය උරා ගන්නන්ද විය..

සුලඟ දිගටම හමන්නට විය.එයින් පැහැදිලි කට හඬක් ඇසුණි.එය voldermortගේ කටහඬයි.

හැරී...පොටර්....

Dolores umbridge :- ඔයා මොනවහරි ජරාවක් කැවද එතනදි?? අපි කාටත් නොකියා මඩලේ කාරයෙක්වත් වුනාද?හැරී පොටර් මැරිලා දැන් වසර විස්සකටත් වැඩියි.පාසලේ තිබූ රාජ්‍ය විරෝධී කැරැල්ලේ දී ඩම්බ්ල්ඩෝර් ගේ හමුදාවේ නිර්භීතව ප්‍රහලව අපිට ප්‍රතිප්‍රහාර එල්ල කරපු කෙනා දැන් මැරිල.

දැන් එනවා යන්න.මම දන්නෑ ඔයා මොන නැටුමක් නටන්න හදනවද කියලා.නමුත් ඔයා භූතාරක්ශකයන්ව කලබල කරලා වොල්ඩමෝර්ට්ගේ දිනයත් විනාශ කරලා අවුල් කරන්න හදන්නේ...

එහිදී parseltounge භාෂාවෙන් (සර්ප භාෂාව හොඳේ හැරි පොටර් දෙවෙනි කතාවෙදි කියන්නෙ හැරී) ඇසුණු කෙදිරිලි හඬවල් එන්න එන්නම වැඩි විය.එය මහා ඝෝෂාවක් මෙන් තව තවත් ශබ්දයෙන් ඇසෙන්නට විය.තව ඉදිරියට ඇවිදගෙන යනවිට යන විට ඔහුට විශාල නයි සහිත ලාංඡන වලින් යුත් ධජයන් ලෙළදෙන අයුරු පෙනෙන්නට විය...

Scorpius :- Voldermortගේ දිනය

තුන්වන ජවනිකාව , 1වන දර්ශනය

🏰 හොග්වෝර්ට්ස් වල විදුහල්පතිනියගේ කාර්‍යාලය🏰

ස්කෝර්පියස් Umbridgeගේ කාර්යාලයට ඇතුළු විය.කළුපාට නිල ඇඳුමක් ඇඳගෙන සිටියේය.ඔහුගේ මුහුණේ කල්පනාකාරී සහාවක් දිස්විය.ඔහු නිරතුරුව විමසිල්ලෙන් සිටියේය.

Dolores umbridge :- scorpius බොහොම ස්තූතියි මාව බලන්න පැමිණියාට

Scorpius :- විදුහල්පතිනියනි.

Dolores umbridge :- Scorpius මම හිතුවේ ගොඩක් කාලෙක ඉඳලා ඔයා ළඟ හොඳ නායකයෙක්ගේ ගතිගුණ තියෙනවා.ඒ වගේම ඔයා දන්න විදිහට ඔයා පිරිසිදු ලේ ඇති කෙනෙක් වගේම ඉතාමත් හොඳ මලල ක්‍රීඩකයෙක්

Scorpius :- මලල ක්‍රීඩකයෙක් !!!!

( කතාව මුල ඉඳන් කියෙව්වනම් හොඳට මතකනම් මතක ඇති මේ හාදයට කිසිම මලල ක්‍රීඩාවක් බෑ කියල වගේම ක්විඩිච් කොහෙත්ම ආස නෑ කියලා)

Dolores umbridge :- ඔච්චර නිරහංකාර වෙන්න එපා scorpious.මම ඔයාව ක්විඩිච් පිටියේ දැකලා තියෙනවා.ඔයාට අල්ලගන්න බැරි උන ස්නිච් එකක් තියෙනවා නං ඒ ගොඩකම කලාතුරකින්. ඔයා ගොඩක් වටිනා ශිෂ්‍යයෙක.අපේ අධ්‍යාපන පීඨයට වටිනා ශිෂ්‍යයෙක්. විශේෂයෙන්ම මට වටිනා ශිෂ්‍යයෙක්.මම නිමිති ශාස්ත්‍රයෙන් ඔයාගේ අනාගතය ගැන බැලුවා.ඒක ඉතාමත් දීප්තිමත් අනාගතයක් ඉතිං අපි දෙන්නට එකතු වෙලා පුළුවන් අපේ මේ පාසල වැඩකට නැති ළමයින්ව අතුගාලා දාලා ආරක්ෂිත මෙන්ම පිරිසිදු (මේ කියන්නේ පිරිසිදු ලේ ඇති අය ගැන හොදේ)පාසලක් කරන්න...

Scorpius :- ඒක එහෙමද !!

ඈතින් ඔහුට යම් අයෙක් එක්වරම කෑගසන හඬ ඇසුනි.ස්කෝර්පියස් හඬ ආ දෙස බැළුවේය.නමුත් ඔහු ඒ ගැන සිතීම මගහැරියේය.මන්ද ඔහුව පාලනය කරගෙන මේ අවස්ථාවට මුහුණ දිය යුතු බැවිනි...

Dolores umbridge :- නමුත් දවස් 3කට කලින් මම ඔයාව විලෙන් හොයාගත්තට පස්සෙ ඉඳන් ඔයා ටිකෙන් ටික අමුතු වෙන්න...අමුතු වෙන්න..පටන් අරගෙන. විශේෂයෙන්ම මේ හදිසි හැරී පොටර් ගැන සිතේ ඇතිවුණු අදහසත් සමඟ...

Scorpius :- නෑ එහෙම නෑ ..

Dolores umbridge :- ඔයාට ඕන කෙනෙක්ගෙන් ප්‍රශ්න කරන්න පුළුවන් හොග්වෝර්ට්ස් වල යුද්ධය ගැන. කොහොමද පොටර් මැරුනේ..ඇයි පොටර් මැරුණේ...ඒ වගේම මොකක්ද මේ සෙඩ්‍රික් ඩිගරි ගැන තියෙන අවුල.ස්කෝපියස් අපි ඔයාව මන්ත්‍රයකට හරි වශියකට හරි අහු වෙලා ද කියලා පරීක්ෂාකර බැලුවා.නමුත් අපිට එහෙම මුකුත් දැකගන්න ලැබුනේ නෑ. ඉතින් මම මේ අහන්නේ ඔයාට යථා තත්වයට එන්න මට මොකක් හරි උපකාරයක් කරන්න පුළුවන් නම්...

Scorpius :- නෑ..නෑ.. මම හොඳ සිහි කල්පනාවෙන් ඉන්නවා.ඒක තාවකාලික නොමග යැවීමක.එච්චරයි...

Dolores umbridge :- ඒ කියන්නේ අපිට අපේ වැඩේ දිගටම කරගෙන යන්න පුලුවන්නේ?

Scorpius :- ඔව් පුලුවන්...

ඇය ඇගේ අත හදවතට තබා මැණික් කටු දෙක අල්ලා ගනිමින්...

Dolores umbridge :- "voldemort සහ ඔහුගේ උදාර බවට..."

Scorpius (එය කීමට උත්සාහ කරමින්) :- අම්..වොල්...උදාර..හ්ම්...

තුන්වන ජවනිකාව , දෙවන දර්ශනය

හොග්වෝර්ට්ස් පිට්ටනිය

Karl jenkins :- හේයි..ස්කෝපියස් කින්ග්...

ඔහු ස්කෝපියස්ට 5ක් දැමුවේය.එය වේදනාකාරී එකක් විය.

Yann fredericks :- අපි තාම ඉන්නවා හොදේ.. හෙට රෑට...

මොකද අපි ලෑස්ති වෙලා ඉන්නේ නියම මඩ ලේ කාරයෝ ටිකක ලේ වගුරවන්න.

polly chapman :- ස්කෝපියස්

පොලි චැප්මන් පඩිපෙළක් මත සිටගෙන සිටියාය.scorpius ඇය දෙසට හරුනි.ඇය කැවූ ඔහුගේ නම කියනු ඇසීමෙන් ඔහු පුදුම විය..

scorpius :- පොලි චැප්මන්...

Polly chapman :- අපි ඒක ඉවර කරල දාමුද. මම දන්නවා හැමෝම බලන් ඉන්න ඔයා කාගෙන්ද අහන්නේ යන්නේ කියලා.මොකද ඔයා දන්නවනේ ඔයාට කාගෙන් හරි අහන්න සිද්ද වෙනවා ඒවගේම දැනටමත් මගෙන් තුන් දෙනෙක් අහල තියෙනව.මම ඒ සියලු දෙනාවම ප්‍රතික්ෂේප කළා.ඉතින් බාග වෙලාවට ඔයා දන්නවනේ ඔයා මගෙන් අහන්න ඕනේ

Scorpius :- හරි

Polly chapman :- ඉතින් මොකද ගොඩක්ම ගැලපෙන එක.ඔයා වඩාත්ම කැමති.මොන කට කතාවද වැඩියෙන්ම කැමති??

මොකද මේ මොහොතේ මට පැහැදිලි කරගන්න ඕන මොකද මමත් ආසාවෙන් ඉන්නේ..ඒ වගේම ඒක කටකතාවක් නෙමේ..මට නං ඒක ඇත්තටම වටිනා තොරතුරක්.

Scorpius :- හොඳයි...ඒක ඉතින්..නමුත්...මේ අපි මොකක් ගැනද කතා කරන්නේ ????

Polly chapman :- බ්ලඩ් බෝල් එක ගැන අනේ..ඇත්තටම ඔයා කාවද ස්කෝපියස් කින්ග් බ්ලඩ් බෝල් එකට අරගෙන යන්නේ?

Scorpius :- ඔයාව....පොලි චැප්මන්..මම ඔයාව නැටුවට එක්කන් යන්නද ඕනෙ!!!

ඔහුට පිටුපසින් කවුරුන් හෝ මහ හඬින් කෑගසන හඬක් ඇසිණි...

Scorpius :- මොකක්ද ඒ කෑ ගැසීම

Polly chapman :- හිරේ ඉන්න මඩ ලේ කාරයෝ.ඔයාගේ අදහසක්නේ!!එහෙම නේද ???

මොකක්ද ඔයාට වෙලා තියෙන්නෙ ඇත්තටම , හපොයි පොටර් කිව්වලු(අර කලින් මර්ලින්ගේ රැවුල කිව්වලු වගේ දෙයක් හොදේ)මගේ සපත්තුවල ආයෙම ලේ ගැවිලා..

ඇය පහළට නැමී පරිස්සමෙන් සපත්තු වල වූ රුධිරය පිස දැමුවාය...

නක්ෂත්‍ර වලට කිව්වා වගේම අපේ අනාගතය හදාගන්න මෙන්ම මම ඉන්නවා. ඔයත් එක්ක එකතු වෙලා අපේ අනාගතය හදාගන්න.

"voldemote සහ ඔහුගේ උදාර බවට"

Scorpius :- වොල්ඩමෝර්ට්ට.......

පොලී ඇවිදගෙන ගියාය.ඔහු නැවත හැරී ඇය දෙස බැලුවේය..

"මොකක්ද මේ ලෝකය!!!!!!!!"

ස්කෝපියස් ගැඹුරු කල්පනාවක නිග්මෙන ගමන් ඔහුටම කියාගත්තේය.

---

🟤තුන්වන ජවනිකාව තුන්වන දර්ශනය

🏢මායා අමාත්‍යාංශය මායා නීති බලගැන්වීමේ ප්‍රධානියාගේ කාර්යාලය🏢

Draco :- ඔබ ප්‍රමාදයි

Scorpius :- මේක ඔයාගේ කාර්යාලයද?

Draco :- ඔයා පරක්කු වෙලා මෙතන ප්‍රශ්න අහන්නත් එනවද? සමහරවිට ඔයා ප්‍රශ්නේ තවත් අවුල් කරන්න මුරණ්ඩු වෙනවා ඇති..

Scorpius :- ඔයාද එතකොට මායා නීති බලගැන්වීමේ ප්‍රධානියා

Draco :- ඔයා කොහොමද !!!ඔයා කොහොමද මාව මේ විදියට අපහසුතාවයට පත් කරන්නේ,ඒ මදිවට මට බලන් ඉන්න සිද්ධ කරල සමාව ගන්නෙත් නැතුව ඒකට

Scorpius :- සමාවෙන්න..

Draco :- සර්...

Scorpius :- සමාවෙන්න සර්

Draco :- මම ඔයාව ඔහොම පිළිවෙලක් නැති විදිහට හැසිරෙන්න නෙමේ හදල තියෙන්නේ.ස්කෝපියස් , මම ඔයාව හොග්වෝර්ට්ස් වලට දැම්මේ මටම අපහාස කරගන්න හිතාගෙන නෙමෙයි..

Scorpius :- අපහාස කරන්න ඔබට !!!

Draco :- හැරී පොටර් ගැන එක එකාගෙන් ප්‍රශ්න අහන්නේ.ඕවා මාව අපහසුතාවයට පත් කරන දේවල්.අනික ඔයා කොහොමද "මැල්ෆෝයි" නමට ඔහොම නින්දා කරන්නේ???

Scorpius :- ඔහ්..නෑ ඔයා ඒවා විශ්වාස කරනවද?නෑ නෑ ඔයාට එහෙම කරන්න බෑ

Draco :- ස්කෝපියස්...

Scorpius :- අද daily profit පත්තරේ තිබුණා මායාකරුවන් තිදෙනෙක් සාමාන්‍ය ලෝකෙ පාලම් කීපයක් පුපුරවල දාලා කියලා. ඒකෙන් සාමාන්‍ය මිනිස්සු කීයක් එක පිපිරීමකින් මරන්න පුළුවන්ද කියලත් එයාලා ගනන් බලලා තියෙනව..ඒ වැඩේ කලේ ඔයාද...

Draco :- කට පරිස්සම් කරගත්තොත් හොදයි..

Scorpius :- මඩලේ කාරයෝ මරණ කඳවුරු , වධදීම් , පණපිටින් පුච්චන ඒවා ..මේවා ඔහුට කරන පුද සත්කාර ද ..ඔයා ඒවට කොච්චර දායක වෙනවද..අම්මා හැමවෙලාවෙම කිව්වේ මට ඔයාව පේනවට වඩා, ඔයා ගොඩක් හොඳ කෙනෙක් කියලා.නමුත් මේක තමා ඔයාගේ ඇත්ත ස්වරූපය එහෙම නේද? මිනීමරුවෙක් , වධකයෙක්...

ඩ්‍රැකෝ එකවර නැගිට ස්කෝපියස්ව මේසයකට තබා තද කළේය.ඔහුගේ ක්‍රෝධය පුදුමාකාර මෙන්ම මරණීය එකක් විය.

Draco :- ඇයගේ නම ඒ විදිහට විදිහට පාවිච්චි කරන්න එපා.scorpious ඔයා ඒ දේවල් කියලා ඔයාට ලකුණු දා ගන්න ලේස්ති වෙන්න එපා.ඇයට මීට වඩා දෙයක් ලැබෙන්න තිබුණා.

scorpious කිසිවක් පැවසුවේ නැත.ඔහු බියෙන් සිටියේය.ඩ්‍රැකෝට මෙය වැටහිණි. ඔහුගේ අත ලිහිල් කර scorpious ගේ හිස වෙත ගෙන ගියේය.ඔහු තම පුතුට තරවටු කිරීමට අකමැති විය.

නෑ මම නොවෙයි..මේ ඉන්නේ මෝඩයෝ තමා ඒ වැඩේ කරල තියෙන්නෙ.මම උනා නම් සාමාන්‍ය ලෝකයේ අගමැතිවරයාට පගාවක් දීලා මේක විසඳනවා.ඔයාගේ අම්මා ඇත්තටම මං ගැන එහෙම කිව්වද?

Scorpius :- එයා කිව්වා සීයා එයාට එච්චර කැමැති වුණේ නෑ කියලා.ඔයාලගේ සම්බන්ධයට එයා විරුද්ධ වුණාලු.ඇය හිතන්නේ ඇය ගොඩක් සාමාන්‍ය මිනිසුන්ට කැමති දුර්වල හිතක් තියෙන කෙනෙක් කියලලු.නමුත් ඔයා තාත්තාගේ කීම නොසලකා හැරලා ඇයට කැමති උනාලු. එයා කියනවා එයා දැකපු නිර්භීතම දේ ඒක කියලා...

Draco :- ඇයට ලේසියෙන්ම නිර්භීත වෙන්න පුළුවන්...ඔයාගේ අම්මට...

Scorpius :- නමුත් ඇය ඒ මට කිව්වේ මේ දැන් ඉන්න ඔයා ගැන නෙමේ.

ඔහු තම පියා දෙස බැළුවේය.ඩ්‍රැකෝ ඔහු දෙස බලා මද සිනාවක් පෑවේ ය.මම නරක වැඩ කරලා තියෙනවා.ඔයත් එහෙමය.ඉතින් අපි කරන ඒ දේවල් වලින් කොහොම කෙනෙක්ද වෙන්නේ තාත්තේ??

Draco :- අපි කවුරුත් වෙන්නේ නෑ.අපි සාමාන්‍ය අපිම තමයි...

Scorpius :- මැල්ෆෝයිලා..ඔයාලා හැම වෙලාවෙම මේ ලෝකයම අඳුරු කරන්න පුළුවන් ඔයාලගේ පවුල ගැනම විතරක් විශ්වාස කරනවා...එහෙම නේද තාත්තේ..

ඩ්‍රැකෝට තම නිවස එකවරම සිහි විය.ඔහු ස්කෝපියස් දෙස පරිස්සමින් බැළුවේය.

Draco :- ඔයා ඉස්කෝලෙ දි මේ කරන වැඩෙන් මොකද්ද එකෙන් බලාපොරොත්තු වෙන්නේ...

Scorpius :- මට මේ විදිහට ඉන්න ඕනේ කමක් නෑ...

Draco :- එහෙම අදහසක් එන්න මොකක්ද ඔයාට උනේ.

තම කතාව ඔහුට කෙසේ විස්තර කළ යුතුද කියා ස්කෝපියස් ගැඹුරින් සිතන්නට විය.

Scorpius :- මම මගේ ජීවිතේ මම ගැන , මීට වඩා වෙනස් විදිහට දැකලා තියෙනවා.

Draco :- ඔයා දන්නවද මම ඔයාගේ අම්මගේ වැඩියෙන්ම ආදරේ මොකටද කියලා ඇය හැම තිස්සෙම මට අඳුරෙන් ආලෝකයට එන්න උදව් කරපු එක.ඇය මගේ ලෝකය

හැඳුවා.මගේ ලෝකය නිවැරදි කළා.හොඳයි කොහොම නමුත්, මොකක්ද ඔයා ඒ කිව්ව වචනේ.."අඳුරු" එහෙම නේද??

Scorpius :- ඇය එහෙම කළාද...

ඩ්‍රැකෝ ඔහුගේ පුතාගේ ඉරියව් අධ්‍යානය කලේය...

මම හිතුවට වඩා එයාගේ ගොඩක් දේවල් තවම මගේ හිතේ තියෙනවා.

ඔහු ස්කෝපියස් දෙස බැලමින් කීවේය.

Draco :- ඔයා මොන දේ කලත් ඒක පරිස්සමින් කරන්න මට ඔයාවත් නැතිකරගන්න බෑ...

Scorpius :- හොඳයි සර්...

Draco :- voldermort සහ ඔහුගේ උදාර බවට..

ස්කෝපියස් ඔහු දෙස බලා කාමරයෙන් නික්මෙන මොහොතේ...

Scorpius :- voldermort සහ ඔහුගේ උදාර බවට...

⚫තුන්වැනි ජවනිකාව 4වන දර්ශනය

🏘හොග්වෝර්ට්ස් පුස්තකාලය🏘

scorpious පුස්තකාලයට ඇතුළු වී බලාපොරොත්තු සුන් වූ අයුරින් පොත් රාක්ක දෙස බලමින් සිටියේය.ඔහු ඉතිහාස පොතක් ගත්තේ.

සෙඩ්‍රික් කොහොමද ඩෙත් ඊටර් කෙනෙක් වුණෙ.මට මොකක්ද මගහැරුණේ..අඳුරේ ආලෝකයක් සොයාගන්න ඕන...මට ඔයාගේ රහස කියන්න...මට මොකක්ද මගහැරුණේ...

Craig Bowker Jr. :- ඇයි ඔයා මෙහේ

ස්කෝපියස් බලාපොරොත්තු නොවූ ඒ වදන් වලින් ක්‍රෙග් දෙස බැලුවේය.ඔහුගේ ඇඳුම් ඉරී ගොස් පරණ වී ඇත.

Scorpius :- ඇයි මට මෙතන ඉන්න බැරි ?

Craig Bowker Jr :- මෙතන ලේස්ති කරලා නෑ. මම මගේ පුලුවන් උපරිමයෙන් වැඩ කරනවා නමුත් මහාචාර්ය snape(ඔන්න යාලුවනේ ඔයාලගේ කැමතිම කෙනෙක් ලග ලග එනවා)වැඩක් පවරලා තිබුණා. රචනාවක් ආකාර දෙකකින් ලියන්න නියම කරලා තියෙන්නේ..මම අදහස් කරන්නේ... මම මේ පැමිණිලි කරනවා නෙමේ. සමාවෙන්න.

Scorpius :- මොකක්...ආයි මුල ඉඳන් කියන්න... මොකක්ද සූදානම් නෑ කියලා කිව්වේ...

Craig Bowker Jr :- ඔයාගෙ මායා බෙහෙත් පන්තියේ ගෙදර වැඩ..මම ඒවා කරන්නේ බොහොම කැමැත්තෙන්.එහෙම කරන එක ගොඩක් සතුටුය.ඒ වගේම මම දන්නවා ඔබ ගෙදර වැඩ වලට අකමැති බව.ඒ වගේම පොත් වලටත්..මම කිසි දවසක ඔයාට අපහාසයක් නොවෙන්න වැඩ කරන්නම්..ඔබ ඒක දන්නවනේ...

Scorpius :- මම ගෙදර වැඩ වලට වෛර කරනවා !!!!!

Craig Bowker Jr :- ඔබනේ ස්කෝපියස් කින්ග්...ඔව් ඔබ ගෙදර වැඩ වලට වෛර කරනවා.ඔබ මැජික් වල ඉතිහාසය කියන පොතත් එක්ක මොකද කරන්නෙ..මම ඒ පැවරුමත් කරන්න ඕනද...

Scorpius ක්‍රෙග් දෙස මොහොතක් බලා සිට නැවැත ඔහුගෙන් මිදී ඉවතට ඇවිදන් ගියේය..

සුළු මොහොතකට පසු ඔහු නැවත මද සිනාවක් පාමින් ආවේය...

Scorpius :- ඔයා කිව්වේ "ස්නේප්" කියලද??

තුන්වැනි ජවනිකාව 5වන දර්ශනය

මායා බෙහෙත් පන්තිය,හොග්වෝර්ට්ස්

ස්කෝර්පියස් මායා බෙහෙත් පන්තියට දුවගෙන ගොස් එකවර දොර කඩාගෙන මෙන් කාමරයට ඇතුළු විය.සෙවරස් ස්නේප් ඔහු දෙස නෙත් යොමා බලන්නට විය.

Prof Snape :- කවුරුත් ඔයාට කියලා දීලා නැද්ද දොරට තට්ටු කරලා ඇතුළුවෙන්න කොලුවෝ...

ස්කෝර්පියස් හුස්ම නොගෙන තරමක් අවිශ්වාසයෙන් නමුත් ප්‍රමුදිතව ස්නේප් දෙස බලාසිටියේය.

Scorpius :- සෙවරස් ස්නේප්..මේක ලොකු ගෞරවයක් මට.

Prof Snape:- මහාචාර්ය ස්නේප් කියල කිව්වනම් වඩා හොඳයි.ඔයා නිකන් හැසිරෙන්නේ පාසලේ රජතුමා වගේනේ. හැබැයි ඒකෙන් කියවෙන්නෙ නෑ ඔයා හැම විෂයකටම එහෙමයි කියලා....

Scorpius :- නමුත් ඔයා තමා ඒකට උත්තරය...

Prof Snape :- කොච්චර ප්‍රසන්න කෙනෙක්ද ඔයා??ඔයාට මොනවා හරිම කියන්න තියෙනවා නම් කරුණාකරලා ඒක පවසන්න කොල්ලෝ..එහෙම නැත්නම් ඔය දොරත් වහගෙන මෙතනින් ගියොත් හොඳයි...

Scorpius :- ඔබගෙන් මට උදව්වක් ඕනේ.

Prof Snape :- මම ඒක ප්‍රතික්ෂේප කරනවා

Scorpius :- මම ඇත්තටම දන්නෙ නෑ මට ඕන උදව්ව මොකක්ද කියලා.ඔයා තවමත් හොර රහසේ වැඩකටයුතු කරගෙන යනව ද..ඔබ තවමත් රහසේ ඩම්බල්ඩෝර්ට පක්ෂපාතීව කටයුතු කරනවද...

Prof Snape :- ඩම්බල්ඩෝර් මැරිලා ඒ වගේම මම එයාට වැඩ කරා කියන එක ප්‍රසිද්ධ පොදු කාරණාවක්.මම එයාගෙ පාසලේ ඉගැන්වීම් කටයුතු කළා.

Scorpius :- නෑ...ඒ ඔයා කළ හැමදේම නොවේ.ඔයා එයා වෙනුවෙන් ඩෙත් ඊටස්ලා ගැන බලාගත්තා.ඔබ ඔහුට අවවාද කළා. හැමෝම හිතුවේ ඔයා එයාව මැරුව කියල. නමුත් ඒක වෙන දෙයක්.ඔබ ඔහුට සහාය දීලා ඔබ ලෝකය බේරගත්තා ...

Prof Snape:- මේවා ගොඩක් බරපතල චෝදනා ළමයෝ.ඒ වගේම මතක තියාගන්න මගේ දඬුවම් කිරීම් වලට මැල්ෆෝයි කියන නමත් යටත් කියලා..

Scorpius :- මොකද වෙන්නේ මම කිව්වොත් තව ලෝකයක් තියෙනවා කියලා.වොල්ඩමෝර්ට් පරාජය වුණ හැරී පොටර් සහ ඩම්බ්ල්ඩෝර්ගේ හමුදාව ජයග්‍රහණය කළ ලෝකයක් තියෙනවා කියලා ඔයාට කිව්වොත්....ඔයාට කොහොම ඒක දැනේවිද...

Prof Snape :- මට පේන්නේ හොග්වෝර්ට්ස්වල ආදරණීය ස්කෝර්පියස් කින්ග් ගේ මොළේ හොඳ නැති වෙලා කියලා..හොඳ කටකතාවක් හැදෙයි වගේ...

Scorpius :- හොරකම් කළ කාල යන්ත්‍රයක් තියෙනවා.මම කාල යන්ත්‍රයක් හොරකම් කළත් අපි උත්සාහ කළේ සෙඩ්‍රික් ඩිගරිව නැවත මරණයෙන් බේරගන්න.මම කියන්නේ එයා මැරිලා ඉන්නකොට.අපි එයාව ට්‍රයිවිසාර්ඩ් තරගාවලිය ජයග්‍රහණය කරන එකෙන් වලක්වන්න උත්සාහ කලා. නමුත් අපි ඒක කරන්න උත්සාහ කරන අතරතුරේ දී ඔහු සම්පූර්ණයෙන්ම වෙනස් පුද්ගලයෙක් බවට පරිවර්තනය වෙලා තියෙනවා

Prof Snape :- හැරී පොටර් ඒ ට්‍රයිවිසාර්ඩ් තරගාවලිය ජයග්‍රහණය කළා...

Scorpius :- ඔහුට එක තනියම කරන්න වෙන්නේ නෑ.සෙඩ්‍රික් ඔහුත් සමඟ හිඳිමින් තමයි ඒක ජයග්‍රහණය කළේ.අපි ඔහුට නින්දා කළා තරගාවලියේදී.ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමා එයා ඩෙත් ඊටර් කෙනෙක් වෙලා තියෙන්නෙ.මම කියන්න දන්නෙ නෑ එයා හොග්වෝර්ට්ස්වල යුද්දෙදි මොනවහරි කලාද නැත්නම් කාවහරි මැරුවද එහෙමත් නැත්නම් වෙන දෙයක් කළාද කියලා...නමුත් , ඔහු යම් දෙයක් කළා එකෙන් හැමදේම වෙනස් වෙලා තියෙනවා...

Prof Snape :- සෙඩ්‍රික් මැරුවේ එකම එක මායාකරුවෙක් විතරයි.ඒකාත් වැදගම්මකට නැති එකෙක්.නෙවිල් ලෝන්ග්බොටම්ව...

Scorpius :- මොකක්..!!!

ඇත්තෙන්ම එහෙනම් ඒක තමයි. මහාචාර්ය ලෝන්ග්බොටම්ට නියම වෙලා තිබුනේ නගීනිව මරන්න.ඒ කියන්නේ වොල්ඩමෝර්ට්ගෙ සර්පයාව මරන්න.වොල්ඩමෝර්ට් මැරෙන්න නම් නගීනි මැරෙන්න ඕන.එහෙනම් ඒක තමයි. ඔයා මගේ ප්‍රශ්නේ විසඳුවා.අපි සෙඩ්‍රික්ට නින්දා කරලා එයාව විනාශ කළා.එයා ඩෙත් ඊටර් කෙනෙක් වෙලා නෙවිල්ව මැරුවා.ඒකෙන් වොල්ඩමෝර්ට් යුද්ධය ජය ගත්තා.ඔබට ජේනවද ඒක ..ඔබට ජේනවද වෙලා තියෙන දේ...

Prof Snape :- මට තේරෙනවා මේක මැල්ෆෝයිලගේ තවත් සෙල්ලමක් කියලා. කරුණාකරලා මෙතනින් බහිනවා එලියට මම ඔයාගේ තාත්තට මේ ගැන දැනුම් දීලා ඔයාට දඩුවම් කරලා කරදරේක දාන්න කලින්...

scorpious කල්පනා කළේය.ඔහු තමා අවසාන බලාපොරොත්තුවේ කාඩ්පතින් සෙල්ලම් කිරීමට ඉටාගත්තේය...

Scorpius :- ඔයා එයාගේ අම්මට ආදරේ කළා.මට හැමදේම මතක නෑ.ඔයා එයාගේ අම්මට ආදරේ කළා , හැරීගේ අම්මට..ලිලීට...
මම දන්නවා ඔයා අවුරුදු ගානක් රහසින් ඩම්බල්ඩෝර්ට වැඩ කළා කියලා.මම දන්නවා ඔයා නැතිව යුද්දේ දිනන්න පුළුවන් කමක් තිබුණෙ නෑ කියලා.ඔයාට හිතෙන්නේ නැද්ද මම මේ දේවල් දන්නෙ කොහොමද කියල මම කිව්ව විදිහෙ වෙන ලෝකයක් නැත්නම්...

ස්නේප් කිසිවක් නොපැවසීය.ඔහු සම්පූර්ණයෙන් එම කතාවෙන් විනාශ වී ගොස් ඇතිසේය.

ඩම්බල්ඩෝර් විතරයි දැනගෙන හිටියෙ මේ ගැන.මම හරි නේද??
ඒ වගේම ඔබට ඔහුව අහිමි වුණාම ඔයා ගොඩක් පාලුවෙන් හිටියේ. මම දන්නවා ඔයා හොඳ මිනිහෙක් කියලා.හැරි පොටර් එයාගේ පුතාට කියලා තියෙනවා ඔයා ශ්‍රේෂ්ඨ කෙනෙක් කියලා ...

ස්නේප් ස්කෝපියස් දෙස මේ සිදුවන්නේ කුමක් දැයි තෝරා බේරා ගන්නට නොහැකිව බලා සිටියේය.මෙය එක්තරා ආකාරයක උපායක්ද...එසේනම් ඔහු බැරෑරුම් ලෙස පරාජයට පත්වී ඇත...

Prof Snape :- හැරී පොටර් මැරිලා...

Scorpius :- මගේ ලෝකෙ එහෙම නෑ. ඔහු කිව්වා එයාට හමුවෙලා තියෙන නිර්භීතම පුද්ගලයා ඔයා කියලා.දැක්කනෙ එයා දන්නවා...එයා දන්නවා ඔයාගේ රහස.එයා දන්නවා ඔයා ඩම්බ්ල්ඩෝර් වෙනුවෙන් මොනවද කලේ කියලා.ඒවගේම එයා ගොඩක් ගෞරව කරනවා ඒ දේට..ඒ වගේම ඒක නිසා තමයි එයා එයාගේ පුතා , මගේ හොඳම යාළුවා ඔයාල දෙන්නගේ නම් වලින් නම් කළේ...ඇල්බස් සෙවරස් පොටර්..(කතාව ලියනකොටත් මටනම් මෙතනදී නිකන් කරන්ට් එකක් ඇග දිගේ ගියා වගේ උනා)

ස්නේප්ට තමාගේ හදවත නවතින්නාක් මෙන් දැනුණි.ඔහුගේ හිත මහා ගැඹුරකට ඇදී යන්නාක් මෙන් දැනුණි..

කරුණාකරලා ලිලී වෙනුවෙන්වත් ලෝකය වෙනුවෙන්වත් මට උදව් කරන්න...

ස්නේප් කල්පනා කරමින් ස්කෝපියස් අසලට පැමිණියේය.ඔහු තම යෂ්ටිය අතට ගත්තේය.බිය වූ ස්කෝපියස් මදක් පිටුපසට විණි.ස්නේප් එක්වරම තම යෂ්ටිය යොමු කරමින් එය ක්‍රියාත්මක කළේය....

Prof Snape :- Colloportus !

නොපෙනෙන අගුලක් බිම වැටෙන හඩක් ඇසුණි.ස්නේප් පන්ති කාමරයේ පිටුපස තිබු කුඩා දොරක් විවෘත කළේය...

හොඳයි එන්න එහෙනම්...

Scorpius :- එක් ප්‍රශ්නයක් තියෙනවා.නමුත් ඇත්තටම අපි කොහෙද යන්නේ...

Prof Snape :- අපිට ගොඩක් සැරයක් යන්න වේවි ඔයාලා විනාශ කරපු හැම තැනක්ම හරිගස්සන්න..මේ උමග අපිව වැළපෙන විලෝ ගහේ මුල් යට තියෙන රහස් කාමරයකට අරගෙන යාවි...

Scorpius :- හොඳයි කවුද අපි කියන්නේ...

Prof Snape :- ඔයා දැන ගනීවි....

ඊලග සතියේ "මුවින් නොකියූ ආදරයක් දලුලා වැඩී ඒමට මත්තෙන් විනාශ වී යාමක්" බලාපොරොත්තු වන්න😆😆😉

ඔයාලගේ "ස්නේප්හෙඩ්ලාට" අනිවා අද කොටස ශෙයාර් කරන්න අමතක කරන්න එපා😋😋✌✌

---

🌑 3වන ජවනිකාව , 6වන දර්ශනය

🏚සටන් මෙහෙයවන කාමරය🏚

අමුතු පුදුමාකාර පෙනුමක් තිබු හර්මයිනි විසින් ස්කෝපියස්ව මේසයකට තබා දැඟලීමට නොහැකිවන ලෙස තද කරගෙන සිටියි ...ඇයගේ අැදුම් වැරහැලි වී ගොස්ය.. ඇයගේ දැස් කෝපයෙන් දිලිසෙයි. අැය දැන් සම්පූර්ණයෙන්ම සටන්කාරියක් මෙනි..ඇත්තටම ඒවා සියල්ල අැයට ගැලපේ.

Hermione :- ඔයා පොඩ්ඩක් හරි හෙලවුනොත් එහෙම ඔයාගේ ඔලුව ගෙම්බෙක් කරලා අතපය රබර් කරනවා.

Snape :- බයවෙන්න එපා ඔහු අාරක්ෂිතයි. ඔයා දන්නවාද ඔයාට කවදාවත් අහන්න ලැබෙන එකක් නැහැ . ඔයානම් පුදුම කරච්චලයක් තිබුණ ලමයෙක්. ඔයා දැනුත් මහ බය හිතෙන විදිහට බෙරිහන් දෙන......කවුරුහරි කමක් නැහැ...

Hermione :- මම ඉතාමත් හොඳ දීප්තිමත් ශිෂ්‍යාවක්.

Snape:- ඔයා සාමාන්‍යයෙන් මධ්‍යස්ථයි. ඔහු අපේ පැත්තේ කෙනෙක්.

Scorpius :- මම හර්මයිනි......
(හර්මයිනි ස්කෝපියස් දෙස තවමත් අවිශ්වාසයෙන් යුතුව බලා සිටියාය.)

Hermione :- ගොඩාක් මිනිස්සු මාව දන්නේ ග්‍රේන්ජර් කියලානේ. මම විශ්වාස කරන්නේ නැහැ ඔයා මට එහෙම කතාකලා කියලා මැල්ෆෝයි.

Scorpius :- ඒක මගේ වැරද්ද, මගේ වැරැද්ද...ඒ වගේම...ඇල්බස්ගේ.

Hermione :- ඇල්බස්? ඇල්බස් ඩම්බල්ඩෝද? ඇල්බස් ඩම්බල්ඩෝට මොකක්ද මේකත් එක්ක තියෙන සම්බන්ධය

Snape :- එයා අදහස් කලේ ඩම්බල්ඩෝ ගැන නොවේ. ඔයා පොඩ්ඩක් ඉදගත්තොත් හොඳයි.

(එක්වරම කාමරයට රොන් දුවගෙන ආවේය. ඔහුගේ හිසකෙස් අවුල් වී තිබුණි. ඔහුගේ ඇදුම් අපිරිසිදු, අශෝබන ඒවා විය. නමුත් තරමක් දුරට හර්මයිනිට වඩා කැරලිකාර ස්වරූපයක් පෙන්නුම් කළේය.)

Ron :- ස්නේප් කොතරම් පුදුමාකාර පැමිණීමක්ද?

ඔහු ස්කෝපියස්ව දැක ක්ෂණිකව සන්නද්ධ විය.

මෙයා මොනවද මෙතන කරන්නේ?

ඔහු තම ඇදුම අතගා යෂ්ටිය එළියට ඇද ගත්තේය.

මම සන්නද්ධ වෙලා ඉන්නේ,ඒ වගේම මම ගොඩාක් භයානකයි වගේම,මම ඔයාට අවවාද කරනවා.

ඔහු තම යශ්ටිය දිගුකරගෙන ඇත්තේ වැරදි පැත්තට බව පසක් විය. නැවත ඔහු හරි පැත්තට අල්ලා ඔහුට දිගුකලේය.

හොඳට පරිස්සම් වෙලා ඉන්නවා.

Snape :- ඔහු ආරක්ෂිතයි රොන්
(රොන් හර්මයිනි දෙස බලා ශීර්ෂ ප්‍රණාමයක් කළේය.)

රොන්:- ඩම්බල්ඩෝට ස්තූති වෙන්න ඕනි.( නිකන් දෙයියන්ට ස්තූති වෙන්න ඕනේ වගේ හොඳේ.)

3වන ජවනිකාව , 7වන දර්ශනය

හර්මයිනි වාඩිවී එම කාලයන්ත්‍රය පරික්ශා කිරීමට පටන් ගත්තාය.
රොන් එම කාර්ය අවසාන වනතෙක් ඉවසීමෙන් බලාසිටියේය.

Ron :- දැන් ඔයා මට කියන්නේ මුලු ඉතිහාසයම රැඳිලා තියෙන්නේ ....නෙවිල් ලෝන්ග් බොටම් මත කියලාද? ඒකනම් මහා විකාරයක්.

Hermione :- ඒක ඇත්ත රොන්

Ron :- හොඳයි ඔයාට විශ්වාස මොකද?

Hermione :- කොහොමද ඔයා ස්නේප් ගැන දන්නෙ? අපි ගැන හැමදේම දන්නෙ ? එහෙම වෙන්න විදියක් නැහැ එයාට පුළුවන් නම් මිසක්..

Ron :- සමහරවිට එයා ඉතා හොඳ අනුමාන කරන්නෙක් වෙන්නැති.

Scorpius :- මම එහෙම නැහැ ...ඔයාට උදව් කරන්න පුළුවන්ද?

Ron :- අපිතමා ඒක කරන්න පුළුවන් එකම අය...ඩම්බල්ඩොගෙ ආමි එකේ උච්චතම අපේක්ෂාවට ලගාවෙනකොට අපිට ප්‍රශ්න ඇතිවෙන්න පටන් ගත්තා..කණ්ඩායමම දූර්වල වුනා ..ඇත්තවශයෙන්ම දැන් ඉතුරුවෙලා ඉන්නේ කිහිප දෙනයි, නමුත් අපි එක දිගටම සටන් කරනවා. අපි තැනිතලා බිම්වල හැංගිලා ඉඳලා පහර දීලා එයාලගේ නහයවල්,ඔලු කපලා දානවා ...ග්‍රේන්ජර් කියන්නේ මේ වෙනකොට දුටුතැන අල්ලන්න නියම වෙච්ච කෙනක්...මමත් එහෙමයි.

Snape :- (රලු ලෙස)හැබැයි ඇයට වඩා අඩුවෙන්....

Hermione :- මට මෙක ....මේ... පැහැදිලි කරගන්න අහගන්නේ..ඔයාගෙ අනිත් ලෝකේ..? මන් දැනගත්තා එහෙදී ඔයා මේ වැඩේට මැදිහත් වෙන්න කලින් ?

Scorpius :- වෝල්ඩමෝට් මැරිලා ...හොග්වර්ට්ස්වල යුද්ධයේදී එයාව මරලා...හැරී තමයි මායා නීති බලගැන්වීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා..ඒ වගේම ඔයා තමයි මැජික් පිළිබඳ ප්‍රධාන අමාත්‍යවරයා ...

හර්මයිනි ගොළුවිය, ඇය පුදුම විය. ඇය නැවත මද සිනාවක් සමඟ .....

Hermione :- මමද මැජික් පිළිබඳ ඇමති ?

Ron :- ( ඔහුටද මේ විනෝදයට එකතු වීමට අවශ්‍ය වෙමින්) නියමයි! එතකොට මම මොකද කරන්නේ ?

Scorpius :- ඔයා වීස්ලිලාගෙ විසාඩ් වීසස් කඩේ කරගෙන යනවා.

Ron :- හොඳයි ඒ කියන්නේ ඇය මැජික් වල අමාත්‍යවරිය... මම විහිළු සපයන කඩයක් කරගෙන යනවා .....

( ස්කොපියස් රොන්ගේ වේදනාබරිත මුහුණ දෙස බැලුවේය.)

Scorpius :- ඇත්තටම ඔයා ඔයාගෙ දරුවන් රැකබලාගන්න තමා වැඩි අවධානයක් යොමු කරන්නේ.

Ron :- විශිෂ්ටයි!මම බලාපොරොත්තු වෙනවා, අඩුමතරමේ අම්මා සරාගීවත් ඇති කියලා.

Scorpius :- ( ලැජ්ජාවෙන් රතු වෙමින් ) හොඳයි ...අම්.... මෙහෙමයි ඒක තීරණය වෙන්නේ ඔයා හිතන විදිහ අනුවයි.....ඒ තමයි ඔයාලා දෙන්නට දාව ඉන්නවා ළමයි,

පුතෙකුයි, දුවෙකුයි..

ඔවුන් දෙදෙනාම පුදුමයෙන් මුහුණට මුහුණ බලාගත්හ.

ඔයාලා බැඳලා ඉන්නේ..ආදරයෙන් ඉන්නේ...ඔයා අනිත් කාලයේදිත් කම්පනයට පත්වුණා මේක අහලා..ඔයා හර්මයිනි අඳුරු මායාවන්ට විරුද්ධ වෙන හැටි උගන්වන ගුරුතුමියක්. එතකොට ඔයා පද්මාව කසාද බැඳලා...ඔයාලා ඒකෙන්නම් ගොඩාක් පුදුම වෙයි . .

හර්මයිනි සහ රොන් නැවතත් එකිනෙකා දෙසබලා ඉවත බලාගත්හ. නමුත් රොන් නැවත ඇය දෙස බැලුවේය...ඔහු කීපවරක් උගුර පෑදුවේය.

Hermione :- ඔයා මගේ දිහා බලනකොට කටවහගෙන ඉන්න බලන්න වීස්ලි...
එතකොට ස්නේප් එයා මොනවද අනිත් ලෝකෙදි කලේ?

Snape :- මන් මැරිලා හිතෙන විදිහටනම්..

ඔහු මුහුණ අඳුරුවී සිටි ස්කොපියස් දෙස බැලුවේය..ස්නේප් යන්තම් කටකොනකින් සිනාව දැම්මේය.
ඔයා මාව දකිද්දී පුදුම වුණා? එහෙම නේ ?

Scorpius :- ඔව් ඇත්තෙන්ම..

Snape :- කවුද මාව...

Scorpius :- වෝල්ඩමෝට්

Snape :- මොකක්?..... ඔයා කොහොමද ? කොච්චර පීඩනයක්ද ඕක මට?

එකවරම ස්නේප්ගේ එම වදනින් සියල්ලෝම නිශ්ශබ්ද විය.
තවමත් ඩාර්ක්ලෝඩ් තම කීර්තියෙන් හැමදේම යටත් කරගෙන ඉන්නේ ...

Hermione :- මට සමාවෙන්න සෙවරස්

ස්නේප් ඇය දෙස බලා ඔහුගේ වේදනාව යටපත් කරගන්නට උත්සහ කලේය.රොන් හිස සොලවා ප්‍රතිචාර දැක්වූ බව ස්නේප් ඇස් කොනකින් දුටුවේය.

Snape :- හොඳයි අඩුමතරමේ මට එයාව බදින්න වුනේ නෑනේ

Hermione :- මොන මන්තරයද ඔයා පාවිච්චි කළේ?

Scorpius :- 1 වන කාර්යයේදි "Expelliamus", 2වන කාර්යයේදි " Engorgio" ඒක.

Ron :- ඒවා නිකන් සරල වලක්වා ගන්න මන්තරනේ? එහෙමනේ?

Snape :- ඊට පස්සෙ ඔබ යන්න ගියා එහෙමද?

Scorpius :- ඔව් , කාලයන්ත්‍රය අපි ආපහු ගෙනිච්චා.ඒක තමයි කාරණාව මේ කාල යන්ත්‍රය ඔයාව අතීතයට ගියාම ලබාදෙන්නේ විනාඩි පහක් පමණයි

Hermione :- ඔයාලට කාලය හරහා විතරයි ගමන් කරන්න පුළුවන්.තැනකින් තැනකට යන්න බැහැ

Scorpius :- ඔව් ඔව් ඒක නිකං...අම්...ඔයා කලින් හිටගෙන හිටපු තැනටම තමයි ආපසු ඔයා ඉන්නේ

Hermione :- සිත් ඇදගන්නා සුළුයි.

හර්මයිනී එසේ පැවසීමට හේතුව ස්නේප් සහ රොන් හොඳින්ම දැන සිටියහ

Snape :- එතකොට ඒක මමයි අනිත් කොල්ලයි සම්බන්ධ දෙයක්

Hermione :- නැහැ..ඒක හරියන්නේ නැහැ.ස්නේප් , නමුත් මම මේකට වෙන කාටවත් විශ්වාස කරන්නෙ නෑ මේක ගොඩක් වැදගත් දෙයක්

Ron :- හර්මයිනී , ඔයා තමා වඩාත්ම ඕන කරල තියෙන පුද්ගලයා මායා ලෝකයේ. ඔයා මේක කරන්න කරන්න නම් එළියට යන්න වෙනවා ඔයා අන්තිම පාර එළියට ගියාම ...

Hermione :- ලොකු වෙලාවකට නෙමෙයිනේ...නමුත්...

Snape :- ඔයා එළියට ගියොත් භූතාරක්ශකයෝ ඔයාව අල්ල ගනී.එයාලා ඔයාගේ ආත්ම උරා ගනීවි.

Hermione :- සෙවරස් , මට මේ සුන්බුන් එක්ක ජීවත්වෙන්න දැනටමත් සිදුවෙලා ඉවරයි.ඒ වගේම රාජ්‍ය විරෝධී කැරලි ගහන්න උත්සාහ කරලා සමත් වෙලා ඉන්නේ.මේක තමයි ලෝකය නිවැරදි කරන්න තියෙන අවස්ථාව

ඇය රොන්ට හිසින් සංඥාවක් කරමින් සිතියම දිග හැරියාය.

Hermione :- තරගාවලියේ 1වන කාර්යය පැවැත්වුණේ අඳුරු වනාන්තරය අද්දරනේ. අපි නැවත කාලය හරහා ගිහිල්ලා ඔයාල කරන මන්ත්‍ර වලක්වලා නැවත ආරක්ෂිතව එනවා.ඒක හරියටම හරි ගියොත් අපිට අපේ ලෝකෙ දී තවදුරටත් මුණ හංගගෙන හැංගිලා ජීවත් වෙන්න ඕනෙ වෙන්නෙ නෑ. ඊට පස්සේ අපි නැවත 2වන කාර්යය කරන කාලයට ගිහිල්ලා ඒක නැවත හරිගස්සමු.

Snape :- ඔයා හැමදේම අවදානමේ දානවා.

Hermione :- අපි මේක හරියටම බලමු හැරී ජීවත්වෙනවා.voldemort මැරිලා.ඒ වගේම Augurey එක නැතිවෙලා ගිහිල්ලා.ඒ වගේ දෙයක් වෙනවනම් තවත් මොකටද අවදානමක් ගැන හිතන්නෙ. නමුත් මට සමාවෙන්න මේ දේට ඔයාගේ ජීවිතේ කැප කරන්න වෙනවට ස්නේප්..

Snape :- සමහර වෙලාවට ඒ වගේ දෙයක් දරාගන්න වෙනවා.

ඔවුන් දෙදෙනා එකිනෙකා දෙස බලා ස්නේප් ස්නේප් හර්මයිනීටද නැවත පෙරලා හර්මයිනී ස්නේප්ට ද ආචාර කර ගත්හ. ස්නේප් තම මුහුණ තරමක් අමුතු කර,

මම dumbledoreගෙ වචන නම් ඉස්සුවේ නම් නෑ...

Hermione :- (සිනහවකින්) නෑ.මට හොඳටම විශ්වාසයි ඒ කතා කළේ නියම severus snape කියලා.

ඇය ස්කෝර්පියස් දෙසට හැරී කාල යන්ත්‍රය පෙන්වමින්

මැල්ෆෝයි

ස්කෝර්පියස් ඇයට කාලයන්ත්‍රය ලබා දුනි. ඇය එදෙස බලා සිනාසී එය නැවත වරක් පාවිච්චි කිරීමට ලැබීමේ පුදුමයත් සමඟ...

අපි හිතමු මේක හරි යාවි කියලා...

ඇය කාල යන්ත්‍රය ක්‍රියාත්මක කළාය.එය කම්පනය වී පසුව කුණාටුවක් මෙන් චලනය වන්නට විය...

ඉන්පසු එක්වරම විශාල පිපිරීමක් සමඟ ආලෝකයක් ඇතිවිය.කාලය නැවතුනි. එය ආපසු හැරුණි.මුලින් සෙමින්.පසුව වේගයෙන්...කාලය ආපස්සට ගමන් කලේය

නැවත විශාල පිපිරෙන හඬක්ද අකුණු සැරයක් වැනි විදුලි ආලෝකයක් සමඟ මුළු කණ්ඩායමම අතුරුදහන් විය

🔵3වන ජවනිකාව , 8වන දර්ශනය

1994 , අඳුරු වනාන්තරය අද්දර

අපි නැවතත් පළමු කාර්යය නැවත විකාශයක් බලන්නාක් මෙන් පිටු පසට වී නරඹමින් සිටියෙමු.ස්කෝපියස් සහ ඇල්බස් නැවතත් ඩර්ම්ස්ට්‍රැන්ග් නිල ඇඳුම් වලින් දැක ගන්නට ලැබේ.මේ ඔක්කෝටම වඩා ඉහළින් ද ශබ්දයෙන් යුතුව

Ludo bagman :- "විශිෂ්ඨයි"

ස්කෝපියස් , හර්මයිනී , රොන් සහ ස්නේප් බොහෝ උනන්දුවෙන් බලා සිටියහ.

Ludo bagman :- සෙඩ්‍රික් ඩිගරි මේ මොහොතේ වේදිකාව ඇතුළු වෙනවා. පෙනෙන ආකාරයට ඔහු තරමක් බිය වී ඇති සැටි නමුත් ඔහු සූදානමින්.ඔහු මෙය ජය ගනීවි.ගැහැනු ළමුන් ඔහුට තරගය දිනීමට ජයසෝසා නැගූහ.ඔවුන් සමහරෙක් හඬමින් අපේ ඩිගරිට හානියක් කරන්න එපා මකරෝ යැයි පැවසූහ. තරග නරඹන්නට පෙනීමට එයාට මෙහාට වනමින් ඔහු තම යෂ්ටිය සූදානම් කර ගත්තේය.

Snape :- මේකට ගොඩක් වෙලා ගතවෙනවානේ. කාල යන්ත්‍රය ක්‍රියාත්මක වෙන්න වගේ යන්නේ..

Ludo bagman :- දැන් මේ තරුණ , නිර්භීත , කඩවසම් කොල්ලො තම දැතින් මොනවා කරාවිද..

ඇල්බස් ඔහුගේ යෂ්ටියෙන් සෙඩ්‍රික්ගේ යශ්ටිය විසි වී යාමට මන්ත්‍රය යැව්වේය. හර්මයිනී ඔහුගේ මන්ත්‍රය වැළැක්වූවාය. ඇල්බස් තම යශ්ටිය දෙස දුකින් අවිශ්වාසයෙන් යුතුව බැලුවේ මන්ද එය හරි හැටි ක්‍රියා නොකළේ කියාය...

මේ මොහොතේ කාල යන්ත්‍රය ක්‍රියාත්මක වී සියලු දෙනාම එය තුලට ඇද ගත්ත

Ludo bagman :- බල්ලෙක් , ඔහු ගලක් බල්ලෙක් බවට පත්කරලා..අති විශිෂ්ඨයි..සෙඩ්‍රික් ඩිගරි..ඔබනම් අති විශිෂ්ඨයි...

තුන්වැනි ජවනිකාව නමවන දර්ශනය

අඳුරු වනාන්තරය අතර

ඔවුන් නැවත වර්තමානයට පැමිණියහ. ඔවුන් නැවතත් අඳුරු වනාන්තරය මායිමේය.මේ අතර රොන් ඉතා වේදනාවෙන් කෙඳරි ගාන්නට විය.ස්නේප් වටපිට බලා ඔවුන් වැටී සිටින අවුලෙන් නිදහස් වීමට මගක් සෙව්ය

Ron :- ආහ්...ආහ්...ආහ්....

Hermione :- රොන් මොකක්ද ඒක ඔයාට මේ කළේ...

Snape :- අපොයි නැහැ... මම දැනගෙන හිටියා මෙහෙම වෙයි කියලා

Scorpius :- කාල යන්ත්‍රයෙන් අපි පලවෙනි පාරේ ගමන්කලාමත් ඇල්බස්ට මේ වගේ දෙයක් උනා..

Ron :- මේ වෙලාවේ ඒක වටිනවා..අපිට කියන්න ඒක ගැන...

Hermione :- ඔයාට තාම ඇවිදින්න පුළුවන් ද....

රොන් නැගිටීමට උත්සාහ කරමින් වේදනාවෙන් කෑ ගැසීය.ස්නේප් තම යශ්ටිය ඕනෑම මොහොතක ප්‍රහාරයකට සූදානමින් තබා ගත්තේය.

Scorpius :- ඒක වැඩ කරලද..

Hermione :- අපි මන්තරය වැලැක්වුවා. සෙඩ්රික් ළඟ ඔයාගේ එයාගේ යශ්ටිය තිබුණා.ඔව්.ඒක වැඩ කරලා

Snape :- නමුත් අපි වැරදි තැනට ඇවිත් තියෙන්නේ.අපි එලිමහනේ ඉන්නේ..ඔයා එලිමහනේ ඉන්නේ..

Ron :- අපි නැවත කාලයන්ත්‍රය පාවිච්චි කරමු මෙතනින් පැනගන්න.

Snape :- අපි යම් ආවරණයක් සොයාගන්න ඕන.මොකද අපි ගොඩක් නිරාවරණය වෙලා ඉන්නේ..

එක්වරම පරිසරය පුරා සීතල සුළඟක් හමා ගියේය.එසැනින් ඔවුන් වටා කළු රෙදි වැනි දේවල් පාවීමට පටන් ගත්හ.ඒව ලංවෙත්ම හැඩයක් ගත්හ.පසුව තවත් ළං වූ විට ඔවුන් භූතාරක්ශකයෝ ලෙස පෙනෙන්නට විය..

Hermione :- පරක්කු වැඩියි

Snape :- මේකනම් විනාශයක්

හර්මයිනී යමක් තේරුම්ගත්තා වැනිය.

Hermione :- එයාලා ඉන්නේ මගේ පස්සෙන් ඔයාලා කාගෙවත් පස්සෙන් නෙමේ.

රොන්...මම ඔයාට ආදරෙයි.

ඒ වගේම ඒක හැමදාම තියේවි.නමුත් ඔයාලා තුන්දෙනා දැන් දුවන්න ඕන යන්න දැන්ම...

Ron :- මොකක්...

scorpius :- මොකක්....

Ron :- ආදරය සම්බන්ධ දේ මුලින් කතා කරන්න පුළුවන්ද?

Hermione :- මේක තවමත් voldemort ගේ ලෝකය.ඒ වගේම දැන් මගේ වැඩේ ඉවරයි. ඊළඟ කාර්යයත් ආපස්සට යැව්වහම මේක වෙනස් වේවි.හැමදේම වෙනස් වේවි..

Scorpius :- නමුත් එයාල ඔයාව අල්ල ගනීවි. අල්ලගෙන ආත්ම උරාගනිමින්

Hermione :- ඒවගේම ඔයා අතීතය වෙනස් කරාවි.එතකොට එයාලට එහෙම කරන්න බැරිවේවි....දැන් යන්න

භූතාරක්ශකයන්ට ඔවුන්ව දැනෙන්නට විය.සියලුම පැති වලින් යම් කෑගසන ශබ්දයත් සමග පැමිණෙමින් තිබුණි.

Snape :- යමු...අපි යමු...

ඔහු ස්කෝපියස්ගේ අතින් ඇද්දේය.ස්කෝපියස් කිසිදු උත්සහයකින් තොරව ඔහු සමග ඇදී ගියේය...

හර්මයිනී රොන් දෙස බැලුවාය.

Hermione :- ඔයත් එයාලා එක්ක යන්න ඕනේ...

Ron :- හොඳයි මම එයාලට පස්සේ යන්න බලන්නම්.නමුත් මම ඉන්නේ ලොකු වේදනාවකින්. දැන් ඉතින්..ඔයා දන්නවද ගොඩක් දුරට මම මෙතන ඉදීවි..Expectro...

ඔහු මන්ත්‍රය කීමට සැරසෙනවාත් සමගම හර්මයිනී ඔහුගේ අතින් ඔහුව නැවත්වීය.

Hermione :- අපි එයාලට මෙතනට එන්න දීලා කොලුවට හොඳම අවස්ථාව , කාලය තව අරගෙන දෙමු.

රොන් ඇය දෙස බලා ඉන්පසු හිස සලා එය අනුමත කළේය

දුවෙක්

Ron :- ඒ වගේම පුතෙක්.මමත් ඒ අදහසට ගොඩක් කැමතියි...

ඔහු වටපිට බැලුවේය.ඔහුගේ ඉරණම ගැන දැනගෙන සිටියේය.

Ron :- මට බයයි

Hermione :- මාව සිපගන්න.. 💋 💋

කල්පනා කර ඔහු පසුව එය කළේය. ඉන්පසු ඔවුන් දෙදෙනා බිම වාඩිවී ගත්හ. ඔවුන්ගේ සිරුර රන්වන් සුදු පැහැ මීදුමක් වැනි යමක් එළියට එමින් තිබුණි.ඔවුන්ගේ ආත්ම භූතආරක්ෂකයන් විසින් උරා ගනිමින් තිබුණි.එය බලා සිටීමට අපහසු භයංකාර දර්ශනයක් විය

මේ අතර ස්කෝපියස් අසරණ වී බලා සිටියේය.

Snape :- අපි විලට යමු.අැවිදගෙන යමු. දුවන්න එපා.

ස්නේප් ස්කෝපියස් දෙස බැලුවේය.

Snape :- සන්සුන් වෙන්න ස්කෝපියස් එයාලා අන්ධ වෙන්න පුළුවන්.නමුත් ඔවුන්ට ඔයාගේ බිය දැනෙනවා.

ස්කෝපියස් ස්නේප් දෙස බැලුවේය

Scorpius :- එයාලා ඔවුන් දෙදෙනාගේ ආත්මයන් උරා ගත්තා...

---

3වන ජවනිකාව , 9වන දර්ශනය (part 2)

එක් භූතාරක්ශකයෙක් ඔවුන් අසලට පාවී අවුත් scorpius ඉදිරිපිටට පැමිණ සිටියේය

Snape :- වෙනදෙයක් ගැන හිතන්න ස්කෝපියස් ඔයාගෙ සිතිවිලි හොඳ දේකට යොමු කරන්න...

Scorpius :- මට සීතලයි.මට පේන්නෙ නෑ. මගේ ඇස්වල නිකන් මීදුමක් තියෙනවා වගේ

Snape :- ඔයා රජෙක්.ඒ වගේම මම මහාචාර්ය කෙනෙක් එයාලා ඔයාගේ හොඳ දේවල් එක්ක සටන් කරාවි.හිතන්න ඔයා ආදරේ කරන දේවල්.හිතන්න ඔයා මේ දේවල් කරන්නෙ ඇයි කියලා..

Scorpius :- මට මගේ අම්මගේ කටහඬ ඇහෙනවා.එයාට මාව ඕනේලු..මගේ උදව් ඕනෙලු...නමුත් ඇය දන්නවා මට උදව් කරන්න බැරි බව

Snape :- මට ඇහුම්කන් දෙන්න.ස්කෝපියස් ඇල්බස් ගැන හිතන්න.ඔයා ඔයාගේ රාජධානිය ඇල්බස් වෙනුවෙන් අතාරිනවා.. එහෙම නේද ?

භූතාරක්ශකයන්ගේ බලපෑම නිසා ස්කෝපියස් සසර වී සිටියේය..

එක් පුද්ගලයෙක් මේ ඔක්කොම දේවල් විනාශ කළේ...එක් පුද්ගලයෙක්..මට හැරී ලිලී වෙනුවෙන් බේරගන්න ලැබුණේ නෑ.දැන් මම මගේ පක්ෂපාතීකම ලබා දෙනවා.ඇය මාව විශ්වාස කරන්න තරම් හේතු වුණේ පක්ෂපාතකම ලබාදෙනවා..

ස්කෝපියස් ස්නේප් දෙස බලා සිනා සී භූතාරක්ශකයන්ගෙන් ඉවතට තීරණාත්මක ලෙස පියවර කිහිපයක් තැබුවේ ය..

Scorpius :- ලෝකය වෙනස් වෙනවා අපි එකත් එක්ක වෙනස් වෙන්න ඕනේ.මම මේ ලෝකෙ ගොඩක් ජනප්‍රිය , දක්ෂ , බලවත් කෙනෙක්.නමුත් මේ ලෝකය හොඳ තැනක් නොවෙයි

එක්වරම Dolores umbridge ඔවුන් ඉදිරිපිට ප්‍රාදුර්භූත විය..

Dolores Umbridge :- මහාචාර්ය ස්නේප්!!!

Snape :- මහාචාර්ය උම්බ්‍රිජ්...!!

Dolores umbridge :- ඔයාට දැනගන්න ලැබුණ ද අලුත්ම ප්‍රවෘත්තිය..අපි ද්‍රෝහීයෝ අල්ලගත්තා.. කුණු ලේ තියෙන හර්මයිනී ග්‍රේන්ජර්ව අල්ලගත්තා.ඇය මේ ළඟ පාත ඉන්නේ..

Snape :- ඒකනම්..අනර්සයි...

උම්බ්‍රිජ් ස්නේප් දෙස බලා සිටියාය.ඔහු ඉවත බලා ගත්තේය..

Dolores umbridge :- ඔබත් සමග...ග්‍රේන්ජර් ඔබත් සමග ඉඳලා තියෙන්නේ...

Snape :- මාත් සමග!!!!ඔබට වැරදීමක් වෙලා...

Dolores umbridge :- ඔබයි ස්කෝපියස් මැල්ෆෝයි සමඟ..මම ගොඩක් සැලකිලිමත් වෙන ශිෂ්‍යයෙක්...

Scorpius :- හොඳයි ...

Snape :- අපිට පන්ති වලට යන්න පරක්කු වෙනවා.ඉතින් ඔබ අපිට ඉඩ දෙනවා නම් ..

Dolores umbridge :- ඉතින් ඔබ පංතියට යන්න පරක්කු වෙනවා නම් ඇයි ඔබලා පාසල වෙත නොයන්නේ...ඇයි විල පැත්තට යන්නේ

එක්වරම ඉතා තද නිශ්ශබ්දතාවක් ඇති විය.එම මොහොතේ ස්නේප්ගෙන් කිසිදා බලාපොරොත්තු නොවියහැකි දෙයක් සිදුවිය..ඔහු උස් හඬින් සිනාවිය..

Snape :- ඔයා කොච්චර කල් ඉඳන් සැක කරනවා ද මාව..

එක් වරම උම්බ්‍රිජ් පොළොවෙන් ඉහළට ගොස් දෑත් විහිදා තමයි තම යශ්ටිය ගෙන එහි තුඩට අඳුරු මායාවක් එක්රැස් කරන්නාක් වැනි යමක් කළේය...

Dolores umbridge :- අවුරුදු ගානක්...ඒ වගේම මට මීට කලින් මේකට මැදිහත් වෙන්න තිබ්බෙ....

ඒ ඔහුගේ යෂ්ටිය සමග ඉක්මන් විය.

Snape :- Depulso...

උම්බ්‍රිජ් ව ඈතට විසිවී ගොස් වැටුණි...

ඇයට ඕහොම කරලා හොඳ වැඩි.දැන් අපිට ආපසු හැරීමක් නෑ..

අහස අඳුරු වෙමින් පරිසරය අන්ධකාර විය.

Expecto patronum

ස්නේප් පෙට්‍රෝනාස් වශියක් ඇති කළේය.එය ඉතා ලස්සන මුවදෙනකගේ හැඩයක් ගත්තේය.

Scorpius :- මුවදෙනක්..!!ලිලීගේ පෙට්‍රෝනාස් එක ...

Snape :- පුදුමයි නේද , ඒක කොහොම ආවද කියලා

ඔවුන් වට කරමින් භූතආරක්ෂකයෝ පැමිණියහ.ස්නේප් මෙහි තේරුම වටහා ගත්තේය.

Snape :- ඔයා දුවන්න ඕනේ.මම මට පුළුවන් කාලයක් ඔවුන් මෙහි රඳවා ගන්නම්

Scorpius :- ඔයාට ගොඩක් ස්තුතියි මගේ අඳුරේ ආලෝකය බවට පත් වුණාට...

ස්නේප් ඔහු දෙස බැලුවේ.ඔහුට සෑම කොටසක්ම වීරයෙකුගෙන් යුතු පිරිමි ළමයෙක් දිස්විය.ඔහු සිහින් සිනාවක් පෑවේය..

Snape :- ඇල්බස්ට කියන්න.කියන්න ඇල්බස් සෙවරස්ට.එයා මගේ නම පාවිච්චි කරන එකට මට ගොඩක් ආඩම්බරයි කියලා කියන්න...

දැන් යන්න...යන්න....

මුවදෙන ස්කෝපියස් දෙස බලාසිටිද්දී ස්කෝපියස් දුවන්න පටන් ගත්තේය.

ස්කෝපියස් මුවදෙන පිටුපසින් දුවගෙන ගියේය.ඔහුගේ වටපිටාව ඉතා බියකරු විය. එක්වරම ඔහුට ඇඟ කිළිපොලා යන ශබ්දයක් ඇසෙන්නට විය.ඔහුට දැන් විල පෙනෙමින් තිබේ..ඔහු ඒ දෙසට දිව ගියේය.

මේ අතර භූතාරක්ශකයන්ට මැදි වූ ස්නේප් තමා ගැනම කියවමින් සිටියි. ඔහුගේ මනස ඔහුම කියවයි.

ස්නේප්ව පොලවට තද කරමින් එක් වරම ඉහළ ආකාශයට පාවී ගොස් ඔහුගේ ආත්ම ආරක්ෂකයන් උරාගත්හ.එම වේදනා සහගත අදෝනා ඒ මොහොතේ ඔහුගෙන් නික්මුණ එකකි..

එක්වරම මුව දෙන ස්නේප් සිටි දිශාව දෙස බලා එක්වරම නොපෙනී ගියේය...

ස්කෝපියස් දැන් විල මතය.ඔහු කාල යන්ත්‍රය ක්‍රියාත්මක කළේය.විශාල ශබ්දයකි.ඒ සමග විදුලි ආලෝකයකි.සියල්ල නැවතුණි. නිශ්ශබ්දතාවයකි.ගැඹුරු නිශ්ශබ්දතාවයකි.

සියල්ල නිශ්චලය.සාමකාමීය.

ඉන්පසු ස්කෝපියස් නැවතත් විල තුලින් එක්වරම උඩට මතු විය.වේගයෙන් හුස්ම ගනියි.ඔහු වටපිට බැලුවේය.ගැඹුරින් හුස්ම ගනිමින් වටපිට බැලුවේය.ඔහු අහස දෙස බැලුවේය.අහස කලින් තිබුනාට වඩා ඇත්තටම නිල් පාටින් පෙනෙන්නට විය.

ඉන්පසු ඇල්බස් විල තුලින් මතුවිය. නිශ්ශබ්දතාවයකි.ස්කෝපියස් ඇල්බස් දෙස බලා සිටියේය.විශ්වාස කළ නොහැකි පුදුමයකින් බලාසිටියේය.දෙදෙනාම වේගයෙන් හුස්ම ඉහළ පහළ දැමුවේය.

Albus :- වාව්...

Scorpius :- ඇල්බස් ....

Albus :- අම්මෝ ඒකනම් අනූ නමයෙන් ගියේ...ඔයා දැක්කද අර දිය කිඳුරා..අර අතේ මොකක්ද තියන් හිටපු කෙනා ...වාව්

Scorpius :- ඒ ඔයා...

Albus :- මොකක්...ඒකනම් විකාරයි..මම හිතුවේ සෙඩ්‍රික් ව බැලූමක් වගේ පිම්බෙනවා කියලා.නමුත් ඊළඟ මොහොතේ එයාව නැවත හැකිලෙන්න පටන් ගත්තා.ඒ වෙලාවෙ මම ඔයා දිහා බැලුවම ඔයා ඔයාගේ යශ්ටිය එළියට අරගෙන හිටියේ...

Scorpius :- ඔයා දන්නෙ නෑ ඔයාව මට ආයිම දකින්න ලැබීම කොච්චර සතුටක් ද කියල..

Albus :- ඔයා දැන් මිනිත්තු දෙකකට කලිනුත් මාව දැක්කනේ..

අමාරු වැඩක් වුනත් වතුර දීම ස්කෝපියස් ඇල්බස්ව වැලද ගත්තේය.

Scorpius :- ඊට කලින් ඔයා දන්නැති උනාට ගොඩක් දේවල් උනා...

Albus :- පරිස්සමින් ඔයා මාව ගිල්ලවන්න හදන්නෙ..මොකක්ද යාමේ ඇඳගෙන ඉන්නේ...

Scorpius :- මම මොකක්ද ඇඳගෙන ඉන්නේ, (ඔහු කබායේ ගැලෙව්වේය) ඔයා මොකක්ද ඇඳගෙන ඉන්නෙ කියලනෙ ඇහුවෙ.. ඔව්...ඒක ස්ලිදරින් එකක්..

Albus :- ඒක වැඩ කලාද..අපි මොකක් හරි කලාද ....

Scorpius :- නැහැ , නමුත් ඒක අනර්සයි

ඇල්බස් ඔහු දෙස අවිශ්වාසයෙන් බලාසිටියේය

Albus :- මොකක්ද !!!අසාර්ථකයි

Scorpius :- ඔව් ..ඔව්.. ඒ වගේම ඒක පුදුමාකාරයි..

ඔහු වේගයෙන් වතුර කලතමින් දැගලුවේය..ඇල්බස් ඒ රැලිවලින් ඉවුර දෙසට තල්ලුවී ගියේය.

Albus :- ස්කෝපියස් ඔයා පැණි රස ජාති ගොඩක් කෑවද...

Scorpius :- අන්න ඒ කතා කලේ නම් ඔයා. දැක්කද..කෙලින්ම විහිළු කරන ඇල්බස්... මම ඒකට පට්ට කැමතියි

Albus :- දැන් මට නම් අවුල් වගේ..

ඔවුන් සිටි දෙසට හැරී ද ඔහු පසුපසින් ඉක්මන් ගමනින් පැමිණියේ ඩ්‍රැකෝ ,ජිනී සහ මහාචාර්ය මැගෝනිගල් විය.

Harry :- ඇල්බස් ...ඇල්බස් ...ඔයා හොදින්ද..

Scorpius :- (උද්දාමයට පත්වී) හැරී!!
ඒ හැරී පොටර්!!!ඒ වගේම මහාචාර්ය මැගෝනිගලුත් ඉන්නවා.මගේ තාත්තත් ඉන්නවා..හෙලෝ තාත්තේ

Draco :- හලෝ..ස්කෝපියස්

Albus :- ඔයාලා හැමෝම මෙතන

Ginny :- ඒ වගේම මාටල් අපිට හැමදේම කිව්වා..

Albus :- මොකද වෙන්නේ..

Prof macgonigal :- ඔයාලනේ කාලය හරහා ගිහිල්ලා ආපසු ආව අය.ඔයාල අපිට කියන්න මොකද වුණේ කියලා...

ස්කෝපියස් ඔවුන් දැනගෙන සිටි දේ ගැන පිරික්සා බැලූවේය.

Scorpius :- ඕහ්...නෑ...නෑ...අපොයි දෙවියනේ කොහෙද ඒක!!!

Albus :- ආපසු එද්දී කොහෙද තිබුනේ

Scorpius :- ඒක නැතිවෙලා.මගේ අතින් ඒක නැතිවෙලා.කාල යන්ත්‍රය නැතිවෙලා...

(ඉතාමත් හිත් වේදනාවෙන් ස්කෝපියස් දෙස බලමින්) ඔයා මොකක් ඇතිකරගෙන කියලද කිව්වෙ !!!

Harry :- දැන් ඔය කතාවට තිත තියන්න..ඇල්බස් ...

Prof macgonigal :- මම හිතන්නේ ඔයාලට මේ ගැන විස්තර කිරීමක් කරන්න තියෙනවා

🟁 තුන්වන ජවනිකාව 10වන දර්ශනය

හොග්වෝර්ට්ස්වල විදුහල්පතිනියගේ කාර්යාලය

ඩ්‍රැකෝ ,හැරී ,ජිනී ස්කෝපියස් සහ ඇල්බස් දෙදෙනා පිටුපසට වී බලා සිටියහ. මහාචාර්ය මැගෝනිගල් ප්‍රශ්න කිරීමට ඔවුන් දෙදෙනා ඉදිරිපිට එහාට මෙහාට යමින් සිටියාය.

Prof macgonigal :- පැහැදිලිවම කිව්වොත් ඔයාලා නීති විරෝධී ලෙස හොග්වෝර්ට්ස් එක්ස්ප්‍රස් එකෙන් පැනලා තියෙනවා. ඔයාලා මායා අමාත්‍යාංශයට බලෙන් ඇතුළු වෙලා එහි තිබූ දේවල් සොරකම් කරලා තියෙනවා.ඉන්පසුවයි ඔයාලා දෙන්නා ඒකත් අරගෙන කාලය වෙනස් කරන්න කියලා හිතාගෙන අතුරුදන් වුණේ ...

Albus :- මම එකඟ වෙනවා ඒක එච්චර හොඳ වැඩක් නෙවෙයි කියලා ...

Prof macgonigal :- එතකොට ඔයාල ආපහු කාලයෙන් ආපස්සට ගියාම හියුගෝ සහ රෝස් අතුරුදහන් වීමට ඔබේ ප්‍රතිචාරය කොහොමද...පස්සේ දෙන්නෙක්ගේ ජීවිතය බේරගන්න ඕන නිසා තවත් ගොඩක් මිනිසුන්ගේ ජීවිතත් නැති කරලා , ඔයාගේ තාත්තගේ ජීවිතයත් නැති කරලා දාපු එක අඳුරු භයානක මායාකරු රජ කර නව අඳුරු යුගයක් ඇති කාලයක් ඇති කරපු එක ගැන??
(රළු හඬින්)ඔව් ඔයා හරි පොටර් මහත්තයා...මේ කිසිදෙයක් හොද වැඩ නෙමෙයි..එහෙම නේ...ඔයා කොච්චර ඔලමොට්ටල ද කියලා දැන් ඔයාට තේරෙනවද...

Albus :- ඔව් , මහාචාර්යතුමියනි.

ඇල්බස් මොහොතකට පසු හැරී දෙස බැලුවේය...

Harry :- මහාචාර්යතුමනි, මම මේ... පොඩ්ඩක්...

Prof macgonigal :- නෑ ඔයාට අවසර නෑ.. ඔයා දෙමාපියෙක් විදියට මොනවා කරන්න හැදුවත්..මේ මගේ පාසල ඒ වගේම මේ මගේ ළමයි..මමයි තීරණය කරන්නෙ එයාලට දෙන දඬුවම ගැන

Draco :- ඒකනම් සාධාරණයි වගේ...

හිස සොලවමින් එය අනුමත කරමින් සිටි ජිනී දෙස හැරී බැලුවේය.

Prof macgonigal :- මට පුළුවන් හරිනම් ඔයාලව පිටුවහල් කරන්න..(හැරී දෙසට බැල්මක් හෙළමින්) සියලුම දේවල් සලකා බලලා මම හිතුව මේ දෙන්න මගේ බාරේ හිටියොත් මීට වඩා පරිස්සම් වේවි කියලා. ඔයාලට මගේ නිවාස අඩස්සියේ ඉන්න වෙනවා.හොඳයි ඔයාලට සලකලා බලන්න පුළුවන් මුළු අවුරුද්දම නිවාස අඩස්සියේ ඉන්න එක ගැන.නත්තල් නිවාඩුව ඔයාලට අවලංගු කරනවා.මායිම කවදාවත් හොග්ස්මීඩ් යන එක ගැන අමතක කරන්න.ඒ වගේම මේවා ආරම්භයක් විතරයි...

එක්වරම විමිනියෙන් හර්මයිනී කාමරයට ඇතුළු විය...

Hermione :- මට මොනවද මහහැරුණේ ...

Prof macgonigal :- (තරහින්) මම කාමරයකට ඇතුළු වෙන කොට දොරට තට්ටු කරලා ඇතුළු වෙන එක ගැන ගොඩක් සදාචාරාත්මක දෙයක් විදියට සලකනවා හර්මයිනී ග්‍රේන්ජර්. මම හිතන්නේ ඔයාට ඒක මග හැරුණා..

හර්මයිනී එක්වරම කඩා වැදීම වැරදි බව තේරුම් ගත්තාය...

Hermione :- ආහ්...

Prof macgonigal :- ඔයාට දඬුවමක් දෙන්න පුළුවන් වුණානම් අමාත්‍යතුමියනි මම ඔබට අනිවාර්යයෙන් කරනවා මේ කල දේට විතරක් නෙමේ කාල යන්ත්‍රයක් තියා ගැනීමත් එක්ක ඔක්කොම මෝඩ වැඩ වලට...

Hermione :- මගේ ආරක්ෂාව යටතේ...

Prof macgonigal :- ඒක පොත් රාක්කෙක තියලා තිබ්බ.පොත් රාක්කෙක... කොච්චර විහිළුසහගත වැඩක්ද ඒක...

Hermione :- මිනර්වා (එක්වරම කීමට දෙයක් ගිල ගනිමින්) මහාචාර්ය මැගෝනිගල්...

Prof macgonigal :- ඔයාගේ ලමයි නැති වෙලා නැනේ!!!!

හර්මයිනීට එයට දීමට පිළිතුරක් නොවීය.

ඒක වුණේ මගේ පාසලේ මගේ භාරයෙහි තියෙද්දි ඩම්බ්ල්ඩෝර් මහාචාර්යතුමා එච්චර වටින දෙයක් කරලත් මට මගේ පාඩුවේ නිවිහැනහිල්ලේ ඉන්න නැති හැටි..

Hermione :- මම දන්නවා...

Prof macgonigal :- (කතා කිරීමට වචන අමුණමින්) සෙඩ්‍රික්ව බේරගන්න ඔබට තිබුන අරමුණ අගය කරන්න ඕන.නමුත් ඒක වැරදුණා නම් , ඒ වගේම ඒක ඔය ළමයි දෙන්නට වීරකමක් වගේ වෙන්න ඇති නමුත් ඇල්බස් , ස්කෝපියස් පාඩම තමයි ඔයාගේ තාත්තා පවා සමහර වෙලාවට සැලකිල්ලට ගත්තේ නෑ කරන මෝඩ වැඩ වලින් නිර්භීත කමට සමාව ලැබෙන්නේ නෑ කියල.හැම තිස්සෙම ටිකක් හිතලා බලන්න.වොල්ඩමෝර්ට් පාලනය කරන ලෝකයක් ගැන හිතලා බලන්න ...

Scorpius :- බය හිතෙන ලෝකයක්

Prof macgonigal :- ඔයාලා තාම තරුණයි (ඇය හැරී ,ජිනී , ඩ්‍රැකෝ සහ හර්මයිනී දෙස බලමින්)

ඔයාල හැමෝම තරුණයි ඔයාලට කිසිම අදහසක් නෑ අඳුර කොහොමද මායා කරුවන්ගේ යුද්ධයක් ඇති කරන්නේ කියලා.ඔයාලා ලෝකෙ සමහරක් මිනිස්සු ගැන හිතල ඔළමොට්ටලකම් කරාවි එකෙන් සමහර මගේ වගේම ඔයාලගෙත් ආදරණීය පුද්ගලයන්ට ගොඩක් දේවල් පූජාකරන්න වේවි..අත්හරින්න වේවි...

Albus :- ඔව් , මහාචාර්යතුමියනි ....

Scorpius :- ඔව් , මහාචාර්යතුමියනි

Prof macgonigal :- යනවා..නැගිටිනවලා මෙතනින්..ඔය ඔක්කෝටම කිව්වේ..ගිහින් කාල යන්ත්‍රය සොයා ගන්නවලා..

🟤 තුන්වැනි ජවනිකාව 11වන දර්ශනය

ස්ලිදරින් නිවාසයේ නිදන කාමරය , හොග්වෝර්ට්ස්

ඇල්බස් ඔහුගේ කාමරයේ වාඩිවී සිටියේය. හැරී එයට ඇතුළු වී තම පුතු දෙස බලා සිටියේය.ඔහු තරහින් පිපිරෙමින් ඇල්බස් දෙස බලා සිටි නමුත් එය පිටතට නොපෙන්වා සිත තුළ රඳවා ගැනීමට කටයුතු කලේය.

Harry :- ස්තූතියි මට ඇතුලට එන්න ඉඩ දුන්නට.

ඇල්බස් එයට හිසින් ආචාර කළේය.ඔහුද පියා ඉදිරිපිට තම ඉරියව් හැඟීම් පාවිච්චියේදී පරිස්සම්කාරි විය.

තවම කිසිම වාසනාවක් නෑ.තවම කාල යන්ත්‍රය සොයා ගන්න බැරිවුණා.එයාලා කිඳුරු මිනිස්සු එක්ක සාකච්ඡා කරනවා විල හිඳලා බලන්න.

ඔහු අපහසුවෙන් මෙන් ඉදගත්තේය...

මේක ලස්සන කාමරයක්..

Albus :- කොළ පාට ලස්සන පාටක්..එහෙම නේද ..මම කියන්නේ ග්‍රිෆින්ඩෝර් කාමරේ හොදයි ලස්සනයි.නමුත් ප්‍රශ්නෙ තියෙන්නෙ රතු පාට නිකම් මෝඩකම වගේනේ පෙන්වන්නේ.මම මේ නින්දාවක් එහෙම කරනවා නෙමේ...

Harry :- මට කියනවද ඇයි ඔයා මේ දේ පෙලඹුනේ කියලා..

Albus :- මම හිතුවා..මම හිතුවා...දේවල් වෙනස් කරන්න පුළුවන් වෙයි කියලා.මම හිතුව සෙඩ්‍රික්ව...ඒක වැරදියි තමයි..

Harry :- ඇත්තෙන්ම ඒක වැරදි ඇල්බස්. ඔයාට හිතුනෙ නැද්ද මම ඒක දන්නවා කියලා.මම එතන හිටියා.මම එයා මැරෙනවා දැක්කා.නමුත් මේ දේ කරන්න... මේ හැමදේම අනතුරේ දාන්න...

Albus :- මම දන්නවා ...

Harry :- (ඔහුගේ තරහ පාලනය කර ගැනීමට නොහැකිව)

මම කළා වගේ ඔයාලා මේක කරන්න හැදුවනම් එහෙනම් ඔයාලා ගිහිල්ලා තියෙන්නේ වැරදි පාරක.මම ඒ ත්‍රාසජනක සිද්ධියේ සාක්ෂිකාරයෙක් නෙමෙයි මම ඒකට මුහුණ දීපු කෙනෙක්.ඔයා ඇත්තටම ඔලමොට්ටල වැඩ කරල නම් නැත්නම් මොකක් හරි භයානක එහෙමත් නැත්නම් මේ හැමදේම විනාශ කරන්න පුළුවන් දෙයක් කරල නම්...

Albus :- මම දන්නවා හරිද...මම දන්නවා...

නිශ්ශබ්දතාවයකි..ඇල්බස් ඇස් වලින් වැටුණු කඳුලු බිඳුවක් පිසදා දැමුවේය.මෙය හැරී දුටුවේය.ඔහු හොඳ හුස්මක් ගෙන ඇල්බස් තමා අසලට ඇදගත්තේය.

Harry :- හොඳයි...මම වැරදි තමයි...ස්කෝපියස් වොල්ඩමෝර්ට්ගේ පුතා කියල හිතන්න තරම.ඔහු ඇත්තටම අඳුරු වලා කුලක් උනේ නෑ

Albus :- නෑ...

Harry :- මම සිතියම අරන් තිබ්බා.ඔයාට ආයි එක දකින්න ලැබෙන එකක් නෑ.ඔයාගෙ අම්මා ඔයාගේ කාමරේ ඔයා පැනලා ගිය දවසෙ තිබ්බ විදිහටම තියෙන්න ඇරියා ඔයා එක දන්නවද..
මටවත් ඇතුලට යන්න දුන්නේ නෑ..වෙන කාටවත් ඇතුලට යන්න දුන්නෙත් නෑ... ඔයා එයාව හොඳටම බය කලා..ඇයව විතරක් නෙමේ මාවත්...

Albus :-ඇත්තටම ඔයාව බය කලාද...

මම හිතුවේ හැරී පොටර් කිසිදේකට බය නැහැ කියලා...

Harry :- මම ඔයාට දැනෙන්න ඇරලා තිබ්බේ එහෙමද...

ඇල්බස් පියා දෙස බලමින් ඔහුව වටහා ගැනීමට උත්සාහ කළේ ය.

Albus :- අපිට කාලයෙන් ආපස්සට ගිහිල්ලා සෙඩ්‍රික්ගේ 1වන කාර්යය හරිගස්සන්න වැඩේ වැරදුනාම මාව , ආපහු එනකොට ග්‍රිෆින්ඩෝර් නිවාසයට තේරිලා තිබුනේ.මං හිතන්නේ

ඒක ස්කෝපියස් කියන්නේ නැතුව ඇති.ඒ උනාට එහෙම වුණා කියලා අපි දෙන්නගේ යාලුකමේ වෙනසක් තිබුනේ නෑ.ඉතින් ඒකෙන් පේන්නේ අපේ ප්‍රශ්න වලට මම ස්ලිදරින් නිවාසයේ ඉන්න එක නෙමෙයි හේතුව...ඒක ඇත්තටම නිවාස ගැන දෙයක් නෙමේ ...

Harry :- නැහැ මම දන්නවා ඒක නිවාස සම්බන්ධ දෙයක් නෙමෙයි කියලා...

හැරී ඇල්බස් දෙස බැලුවේය..

ඔයා හොඳින්ද...

Albus :- නෑ...

Harry :- නෑ !! මමත් නෑ

---

3වන ජවනිකාව , 12වන දර්ශනය

සිහිනයක් Godric's Hollow,Grave yard

තරුණ හැරී මල් වලින් වටවුනු සොහොන් කොතක් දෙස බලාගෙන සිටියේය. ඔහු අතේ කුඩා මල් පොකුරක් විය.

Aunty petunia:- යන්න ඉතින්, ඔයාගේ මල් පොකුර එතනින් තියලා යමු යන්න.මම කොහොමත් මේ ජරා පොඩි ගමට කැමති නැහැ.මම දන්නේ නැහැ අඩුමතරමේ මගේ ඔලුවට ගොඩ්‍රික් හෙලෝම්, ගෝඩ්ලස් හොලෝම් වගේ දේවල් එන්නේ ඇයි කියලවත් දන්නේ නැහැ. මේ තැන සම්පූර්ණයෙන්ම අසික්කිත දේවල් වලින් පිරුණු තැනක්. ඉතින් ...ඉක්මන් කරන්න ...හා..හා..යන්න ...යන්න.

ඔහු සොහොන් කොත වෙතට ගියේය. මොහොතක් එතන සිටගෙන සිටියේය.

දැන් හැරී මට ඕවට වෙලාව නැහැ. අද රෑට ඩඩ්ලිට කණිෂ්ඨ බාලදක්ෂ සංගමයට යන්න තියෙනවා.ඔයා දන්නවනේ එයා පරක්කු වෙනවට කැමති නැහැ කියලා.

Young Harry :- පෙටුනියා පුංචි අම්මේ, අපි නේද එයාලගේ ජීවත් වෙලා ඉන්න එකම නෑදෑයන් හරිනේ?

Aunty petunia :- ඔව් ඔයයි මමයි...ඔව්

Young Harry :- ඒවගේම එයාලා ප්‍රසිද්ධ නැහැ ? ඒ වගේම ඔයා කිව්වා එයාලාට යාලුවෝ හිටියේ නැහැ කියලා ?

Aunty petunia :- ලිලි උත්සාහ කලා, එයා බැගෑපත් වුණා, ඒක එයාගේ වරදක් නොවේ. නමුත් ඇය මිනිස්සුන්ව ප්‍රතික්ෂේප කලා.එයාගේ ස්වාභාවය නිසා එයා එහෙම කලා.ඒ ඇයගේ විදිහ, ඇයගේ විලාසය. ඒවගේම ඔයාගේ තාත්තා අප්‍රිය සහගත මිනිහෙක්, අමුතු අප්‍රිය දනවන මිනිහෙක්, කිසිම යාලුවෙක් නැහැ.

Young harry:-ඉතින් මගේ ප්‍රශ්නය තමයි,ඇයි එහෙනම් මෙච්චර මල් පොකුරු එයාලගේ සොහොන ලඟ තියෙන්නේ ?

පෙටුනියා පුංචි අම්මා වටපිට බැලුවාය.සොහොන ලඟ විශාල මල් පොකුරු තිබෙනවා ඇය දුටුවාය.ඇය එය අසලට ගොස් දණගසාගෙන ඇය ඇයගේ සිතට නැගෙමින් තිබුණ හැඟීම් සමග සටන් කරමින් සිටියාය.නමුත් ඇය ඒවා මැඩපවත්වා ගනිමින් කතා කරන්න පටන් ගත්තා.

Aunty petunia : ඔහ් හොඳයි මට තේරෙනවා..මෙතන ටිකක් තියෙනවා, අනිවාර්යයෙන්ම වෙන ඒවා වලට තිබ්බ ඒවා සුළගට ගහගෙන ඇවිත් නැත්නම් කවුරුහරි විහිලුවක් කරලා. ඔව් අනිවාර්යයෙන්ම ඒක තමයි. කවුරුහරි කාලකණ්ණියෙක් මෙතන තියෙන අනික් සොහොන් වලට තිබ්බ මල් පොකුරු එකතු කරලා මෙතනට ගෙනත් දාලා...

Young harry :- නමුත් ඒ ඔක්කොම ඒවා වල එයාලගේ නම් ගහලා "ලිලී සහ ජේම්ස්" ඔයාලා කල දේවල්, අපිට කවදාවත් අමතක නොවෙමු." ලිලී සහ ජේම්ස් ඔයාලා පුද කලා.......

Voldermort:- මට යම් වැරැද්දක සේයාවක් හැගෙනවා, මට මොකක්හරි වරැද්දක දුර්ගන්ධයක් මගේ නාස් පුඩු හරහා දැනෙනවා.

Aunty petunia :- ( තරුණ හැරීට) ඔතනින් යන්න...ඔතනින් අයින් වෙන්න...

ඇය ඔහුව ඇද පසෙකට ගත්තාය. වෝල්ඩමෝට් පොටර්ලාගේ සොහොන මතට අත එසෙව්වේය. අපට ඔහුගේ මුහුණ නොපෙනුණි නමුත් ඔහුගේ සිරුර විරූපී වී බියානක හැඩයක් ගන්නට විය.

මම දැනගෙන හිටියා ..මේ තැන හයානකයි කියලා. අපි ඉක්මන්ට මෙතනින් පිටවෙලා යන එක තමයි හොඳ.

තරුණ හැරීව ඇය ඇදගෙන ගියාය,ඔහු වෝල්ඩමෝට් දෙස බැලුවේය.

Voldermort :- ඔයාට මගේ ඇස්වලින් තාමත් පේනවාද හැරී පොටර්?

ඉන්පසු වෝල්ඩමෝට්ගේ කබාය ඉරාගෙන එය තුලින් ඇල්බස් මතුවිය, ඔහු තම පියා දෙස දෑත් දිගුකරමින් සිටියි..

Albus:- තාත්තේ...තාත්තේ....

පාස්ල්ටංග් භාෂාවෙන් පවසන වදන් කිහිපයක්.

ඔහු එනවා...ඔහු එනවා ....ඔහු එනවා ...

ඉන්පසු හයානක කෑගැසීමකි....

ඊටත් පසුව කාමරයේ කෙලවරක කටහඬවල් ගණනාවකි,ඔවුන් කොඳුරති.
නොවරදින පැහැදිලි කටහඬකි, එය වෝල්ඩමෝට්ගේ කටහඬයි.

හැ..රී...පෝ...ට...ර්

3වන ජවනිකාව , 13වන දර්ශනය

🏠හැරී සහ ජීනි පොටර්ගේ නිවස,
මුලුතැන්ගෙය🏠

හැරී ඉතා භයානක තත්වයක සිටියේය. ඔහුට තම සිහින වලින් පවසන දේ ගැන සිතීමෙන් ගල්ගැසී සිටින්නාක් මෙන් සිටියේය.

Ginny:- හැරී? හැරී? මොකක් කිය කියාද ඔයා කෑගසමින් හිටියේ ?

Harry :- ඒවා නවතින්නේ නැහැ. මට පේන හීන.

Ginny :- ඒවා ඉක්මනට නවතීවි,මේ ඔයා ගොඩක් පීඩනයක හිටපු කාලයක්....

Harry :- නමුත් මම පෙටූනියා පුංචි අම්මා එක්ක කවදාවත් Godric's Hollow වල ඉඳලා නෑනේ, මේක වෙන්න බැහැ.

Ginny :- හැරී ,ඔයා ඇත්තටම මාව බයකරනවා....

Harry :- එයා තාම මෙහෙ ඉන්නවා ජිනි...

Ginny :- කවුද ඉන්නේ ?

Harry :- වෝල්ඩමෝට්...මම වෝල්ඩමෝට්වයි ඇල්බස්වයි දුටුවා.

Ginny:-ඇල්බස්ව ?

Harry :-එයා කිව්වා... වෝල්ඩමෝට් කිව්වා "මට වරදක ගඳක් දැනෙනවා,මට වරදක මහත් දුර්ගන්ධයක් දැනෙනවා" ඔහු මට කතාකරමින් හිටියේ..

ජිනි ඔහු දෙස බැලුවේය. ඔහු ඔහුගේ කැලල අතගාමින් සිටියේය. ඔහුගේ මුහුණේ බලාපොරොත්තු සුන්වූ ස්වරූපයක් විය.

Ginny :-හැරී , ඇල්බස් තවම ඉන්නේ අනතුරකද?

ඔහුගේ මුහුණ සුදු මැලි විය.

Harry :-මම හිතන්නේ එයා විතරක් නෙවෙයි, අපි හැමෝම අනතුරක ඉන්නේ ...

🌘3වන ජවනිකාව , 14වන දර්ශනය

🏰හොග්වට්සවල ස්ලිදරින් නිදන කාමරය

ස්කෝපියස් ඇල්බස්ගේ ඇඳ විට්ටමේ ඇලවී සිටියේය.

Scorpius :-ඇල්බස් ...ස්...ස්..ස්....ඇල්බස්

ඇල්බස් ඇහැරුනේ නැත.)
ඇල්බස් (උස් හඬින් )

ඇල්බස් ගැස්සී ඇහැරුනේය, ස්කොපියස් සිනාසෙමින් සිටියේය.

Albus :-නියමයි කෙනෙක්ව භය කරන්නේ නැතුව නැගිට්ටවන්න කියාපු විදිහ..

Scorpius :- ඔයා දන්නවද පුදුම හිතෙන දේ මොකක්ද දන්නවාද ? මම හිතින් මවාගත්ත භයානකම තැනක කොයිම වෙලාවක හිටියත් මම භය කියනදේ එක්ක හොඳින් ගණුදෙනු කරනවා. ඇත්තටම මට ලොකු බයක් කියන එක දැනෙන්නේ නෑනේ, මම තමයි මරන්න බැරි ස්කොපියස්, මම තමයි කිසි උනන්දුවක් නැති මැල්ෆෝයි.

Albus:-හොඳයි!

Scorpius :-මම කියන්නේ සාමාන්‍ය නිවාස අඩස්සියේ ඉන්න එක මාව බිඳවට්ටනවා, නමුත් දැන් එයාලට කරන්න පුළුවන් නරකම වැඩේ මොනවද? මොල්ඩි වෝල්ඩිව ගෙනල්ල මට වද දෙන එකද? නෑ....

Albus :- හී හී..ඔයා ඔහොම විනෝදයෙන් ඉන්නකොට මට ඔයා ගැන බය හිතෙනවා ...ඔයා දන්නවාද ?

Scorpius :-අද මායා බෙහෙත් පන්තියට රෝස් ආවම එයා මට "පාන් ඔලුවා" කියලා කිව්වා. ඉතින් මන් එයාව සම්පූර්ණයෙන්ම වැලඳගත්තා..නෑ නෑ මම කියන්නේ

සම්පූර්ණයෙන් නෙවෙයි.,මම ඇත්තටම එයාව වැලඳගන්න උත්සාහ කලා,ඊටපස්සේ එයා මට කකුලෙන් හොඳ පාරක් දුන්නනේ.

Albus :-මමනම් හිතන්නෙ නෑ නිර්භීතකම් කරන එක ඔයාගේ ශරීර සෞඛ්‍යයට හොඳයි කියලා

ස්කොපියස් ඇල්බස් දෙස බැලුවේය. ඔහුගේ මුහුණ යම් දෙයක් කල්පනා කරන ආකාරයට වෙනස් වෙමින් තිබුණි.

Scorpius :-ඔයා දන්නවාද ඇල්බස් ? මම ආයි මෙහෙට ආවම කොච්චර සතුටක්ද දැනෙන්නේ කියලා ...මම එහෙට වෛර කරනවා.

Albus :- අහ්...පොලි වැප්මන්ගේ චාටු පුරමෝසම් සිද්ධි ටික හැරෙන්න......නේ? හී...හී...

Scorpius :-සෙඩ්රික් සම්පූර්ණයෙන්ම වෙනස් කෙනෙක්, අඳුරු ,භයානක කෙනෙක්, මගේ තාත්තා කියන ඕන වැඩක් කරන කෙනෙක්.එතකොට මම...මම තවත් විදිහක ස්කොපියස් කෙනෙක් සොයාගත්තා..ඔයා දන්නවාද ? හැම තිස්සේම තරහින් ඉන්න, මටම කියලා නමක් හදාගත්ත, මිනිස්සු බයකරගෙන හිටපු කෙනෙක්. ඒකෙන් පේන්නෙ නිකන් අපි හැම කෙනාව පරික්ෂාවට ලක් කරලා අපි ඒ දේවල් වලින් ...................

Albus :-නමුත් ඔයා ඒ දේවල් වෙනස් කලා, ඔයාට අවස්ථාවක් තිබුණා...ඔයා කාලය නැවත වෙනස් කලා.. ඔයා ඔයාවම වෙනස්
කරගත්තා.

Scorpius :- මොකද මම හේතුව දැනගෙන හිටියා ,මම මොනවද කරන්න ඕනේ කියලා.

ඇල්බස් එය වටහාගත්තේය.

Albus :- ඔයා හිතන්නේ මාවත් පරික්ෂා කරලද? නැත්නම් නැද්ද ?

Scorpius :- නෑ....තවම ...නෑ

Albus :-ඔයා වැරැදි ..ඕනම කෙනෙක් අතීතයට ගියොත් මේ වැරද්ද වෙන්න පුළුවන්, මෝඩ වැඩේ තමයි ආඩම්බර වෙලා ආයෙම පාරක් කාලයෙන් ආපස්සට යන එක.

Scorpius :-අපි දෙන්නම ගියා ඇල්බස්

Albus :-ඉතින් මම ඇයි ඒ දේ කරන්න පෙලඹුනේ? සෙඩ්රික් නිසාද? නැහැ .මට ඕනේ වුණා යම් දෙයක් ඔප්පු කරන්න, මගේ තාත්තා හරි, ඔහු ත්‍රාසජනක දේවල් වලට නිකන්ම තම කැමැත්තෙන් ඉදිරිපත් වුණ කෙනෙක් නෙවෙයි. මම වැරදි, මේ ඔක්කොම මගේ වැරදි ..මම ඔයා වෙනුවෙන් හිටියේ නැත්නම් මේ හැමදේම අඳුරු වෙන්න තිබ්බා.

Scorpius :-නමුත් එහෙම වුනේ නෑනේ ?මට වගේම ඔයාටත් ස්තුතිවන්ත වෙන්න ඕනේ, මගේ ඔලුවට භූතාරක්ෂකයෝ රිංගලා ආත්මය උරාගන්න හැදුවම සෙවරස් ස්නේප් කිව්වා මට ඔයා ගැන හිතන්න කියලා, ඔයා එතන ඉන්නේ නැතුව ඇති ඇල්බස් ,නමුත් ඔයා එතන සටන් කලා, ඔයා මාත් සමග මගේ ළඟින් ඉදන් සටන් කලා, ඒ වගේම සෙඩ්රික්ව බේරගත්ත එක, ඒක හිතපු තරම් නරක අදහසක් නෙවෙයි. ඔයා දන්නවනේ...නේද ...අපි නැවතත් උත්සාහ කරන්න එකනම් කරන්න බෑ කොහොමත්ම.

Albus :-ඔව් ,මම ඒක හොදටම දන්නවා ...

Scorpius :-හොඳයි..එහෙනම් ඔයා මට මේක විනාශ කරන්න උදව් කරන්න ඕනේ.

ස්කොපියස් සඟවාගෙන සිටි කාලයන්ත්‍රය ඇල්බස්ට පෙන්වීය.

Albus :-මටනම් හොදට මතකයි..ඔයා හැමෝටම කිව්වේ ඒක විලමැද්දේ නැතිවුණා කියලා

Scorpius :-මේ වැඩකට නැති මැල්ෆෝයිගෙනුත් හොඳ බොරුකාරයෙක් හදාගන්න පුළුවන් කියලා මම හොයාගත්තා.

Albus :-ස්කොපියස් අපි කාටහරි මේ ගැන කියන්න ඕනේ

Scorpius :-ඒක මුළු දවසේම වැඩ කළා...

▨3වන ජවනිකාව , 15වන දර්ශනය

🏰හොග්වට්ස් ස්ලිදරින් නිදන කාමර🏰

හැරී සහ ජිනී නිදන කාමරය දිගේ ඉක්මනින් ඇවිදගෙන ගියහ.Graig BowkerJR ඔවුන් පසුපස යමින් සිටියේය.

Graig bowker:- මම ආයිම කියන්න ඕනිද? මේක පාසලේ නීතියට පටහැනියි, අනික මේ මහ රෑ මැද්දේ....

Harry:-මට මගේ පුතාව හොයාගන්න ඕනි..

Graig bowker :-මම ඔයා කවුද කියලා දන්නවා පොටර් මහත්තයා, නමුත් ඔයා වුනත් දැනගන්න ඕනි පාසලේ නීතී පද්ධතියක් තිබෙනවා. කිසිම දෙමව්පියෙක්ට, මහචාර්යවරකුට නිවාස වලට අදාල නිදනකාමර වලට හදිසි අවසරයක් නොමැතිව.......

මහාචාර්ය මැගෝනිගල් එකවරම ඔවුන් පසුපසින් මතුවී ආහ.

Pro mc:- කරුණාකරලා හිරිහැරයක් වෙන්න එපා ක්‍රේග්

Graig bowker :-(තරමක් පුදුම වී) විදුහල්පති තුමියනි මම.....මම... මේ....

හැරී නිදන කුටියේ තිරරෙදි ඇද මැත් කලේය.

Pro macgonigal :-ඔහු ගිහිල්ලාද?

Harry:-ඔව්..

Pro macgonigal :-එතකොට තරුණ මැල්ෆෝයි ළමයා?

ජිනී තවත් නිදන කුටියක තිරරෙදි මැත් කලාය.

Ginny :-හපොයි....මේක වෙන්න බැහැ ...

Harry:-එහෙනම් අපි මේ පාසල කනපිට හරවලා හරි එයාලවා හොයාගමු.....ක්‍රේග් අපිට කරන්න වැඩක් තියෙනවා.

ජිනි සහ හැරී නැවතී ඇඳ දෙස බලාසිටිහ.

Ginny :-අපිට මීට කලින් එන්න බැරිවුණානේ?

Harry:-මොකක් නමුත් මට මේ පාර දරුණු හැඟීමක් තියෙනවා මේ ගැන.

ජිනි තම ස්වාමිපුරුෂයා දෙස බියෙන් පිරුණු බැල්මක් හෙලුවාය.

Ginny:-ඔයා කලින් එයාට කතාකලාද?

Harry:-ඔව්

Ginny :-ඔයා එයාගේ නිදන කුටියට ඇවිත් එයත් එක්ක කතාකලාද ?

Harry:-ඔයා දන්නවනේ මම එහෙමකලා...

Ginny:-ඔයා මොනවද අපේ පුතාට කිව්වේ හැරී ?

හැරීට ඇයගේ වදන් වලින් චෝදනා ස්වරූපයක් අසන්නට ලැබුණි.

Harry :-මම ඔයා කිව්ව විදිහට එයා එක්ක අවංක වෙන්න හැදුවේ, මම වෙන මොකුත් කිව්වේ නැහැ ...

Ginny :-ඔයා ඔයාව පාලනය කරන් කතා කලාද? ඒක කොච්චර උණුසුම් කතාබහක් උනාද?

Harry :-මම හිතන්නේ නැහැ ....මම.....ඔයා හිතන්නේ මම ආයිම එයාව බයකලා කියලද?

Ginny :-මට ඔයාට එක වැරැද්දකට සමාව දෙන්න පුළුවන්, දෙකකට වුනත් ඒත් ඔයා තවත් වැරදි කරනවානම් සමාව දෙන්න අමාරුවෙයි.



🟣3වන ජවනිකාව , 16වන දර්ශනය

🏰හොග්වෝර්ට්ස්වලබස්සන් සිටින කුළුණ🏰

ස්කොපියස් සහ ඇල්බස් රිදී පාට එලියකින් මතුවිය.ඔවුන්ගේ අසලින් හ්ම්...හ්ම්...ශබ්ද නාද ගණනාවක් ඇසෙන්නට විය.

Scorpius :- ඉතින් මම හිතන්නේ සරල confringo එකක් ( මේ මන්ත්‍රය යම් දෙයක් පුපුරවන්න වගේ යොදාගන්නවා, වෝල්ඩමෝට්ගේ හැරීගේ අන්තිම සටනේදී එහෙම වෝල්ඩමෝට් එහෙම මේක පාවිච්චි කරනවා)

Albus :- ඇත්තෙන්ම නැහැ ඊට වඩා මම හිතන්නේ හොදයි Expulso වගේ මන්ත්‍රයක්

Scorpius :- පිස්සුද අනේ Expulso එකෙන් ඕනේ නම් කාල යන්ත්‍ර වීදුරුව විතරක් ගැලවිලා යයි.

Albus :- Bombarda?

Scorpius :- ඔයාට ඕනෙ මුලු හොග්වෝර්ට්ස් එකම ඇහැරවන්නද.. සමහරවිට stupify හරියයි. කලින් ඕකෙන් සම්පූර්ණයෙන්ම විනාශ කරලා තියෙනවනේ දේවල්...

Albus :- හරියටම හරි ඒව කලින් කරල තියෙනවා නේ.අපි අලුත් දෙයක් කරමු විනෝදජනක දෙයක් කරමු ...

Scorpius :- විනෝදයක්??? විකාරද... මේ බලන්න ගොඩක් මායාකාරයෝ කීප වරක් ම තමන් යොදාගන්න ඕන මන්ත්‍රය ගැන සලකා බලනවා.නමුත් මේ අවස්ථාව ඊටත් වඩා වැදගත් මම හිතන්නේ ඒක නවීන මායාකර්ම ගැන අඩුවෙන් තක්සේරු කිරීමක්..එහෙම නේද ?

Delphi :- "නූතන මායාකර්ම ගැන අඩුවෙන් තක්සේරු කිරීමක්".. ඔයාල දෙන්න තමා නියම වැඩකාරයෝ දෙන්න.. ඔයාල දන්නවද ඒ ගැන

Scorpius කට හඩ පැමිණි දෙස බැලුවේය. ඩෙල්ෆි ඔවුන්ට පිටුපසින් මතුවී පැමිණ ඇත ...

Albus :- වාව්.. ඔයා මොකද මෙතන කරන්නේ

Albus :- අපි කරන්න යන දේ ගැන එයාට කියන්න ඕන කියල මට හිතුනා.ඒ නිසා මම එයාට බස්සෙක් යැව්වා...

scorpius චෝදනා මුඛයෙන් ඇල්බස් දෙස බැලුවේය...

මේක ඇයටත් වැදගත් දෙයක් නේ ...

ස්කෝපියස් කල්පනා කර බලා එය පිළිගන්නා බව හඟවමින් හිස සැළුවේය..

Delphi :- මට වැදගත් වෙන්නේ මොකක්ද? මේ මොකක් ගැනද ඔයාලා කතාවෙන්නෙ

ඇල්බස් කාල යන්ත්‍රය එළියට ගත්තේය

Albus :- අපි මේ කාලය විනාශ කරන්න ඕන මොකද දෙවන කාර්යයෙන් පස්සේ scorpius දැක්ක දේවල් නිසා.මට බොහොම කණගාටුයි අපිට නැවත අතීතයට ගිහින් අවදානමක් ගන්න බෑ.අපිට ඔයාගේ ඥාති සහෝදරයා බේර ගන්න විදිහක් නෑ .

ඩෙල්ෆි කාල යන්ත්‍රය දෙස බලා නැවත ඔවුන් දෙස බැලුවාය.

Delphi :- ඔයාගේ බකමූණා ගෙනාපු ලියුමේ තිබ්බෙ බොහොම පොඩි කාරණයක් කියලනේ

Albus :- හිතලා බලන්නකෝ එපාකරපු දරුණු ලෝකයක් ගැන ඒ වගේ දෙගුණයක් භයානක ලෝකයක් තමා ඒක.මිනිස්සුන්ට වද දෙනවා භූතආරක්ෂකයෝ හැමතැනම. voldemort මුළු ලෝකයම ඒකාධිපතියෙක් වෙලා.මගේ තාත්තා මැරිලා.මම කවදාවත් ඉපදෙන්නේ නෑ.මුළු ලෝකයම අඳුරු මායාවන්ගෙන් පිරිලා.අපිට ඒක වෙන්න ඉඩ දෙන්න බෑනේ

ඩෙල්ෆිගේ මුහුණ මලානික විය.

Delphi :- ඔය මෝටර් පාලන ලෝකයක්??එයා ජීවතුන් අතර හිටියද ...

Scorpius :- එයා හැමදේම පාලනය කළා. ඒක හරිම භයානකයි

Delphi :- ඒ අපි කළ දේ නිසාද...

Scorpius :- සෙඩ්‍රික්ට අපි කරපු අපහාස නිසා එයා පුදුම විදිහට දරුණු පුද්ගලයෙකු වෙලා.ඊට පස්සෙ එයා ඩෙත් ඊටර් කෙනෙක් වෙලා...ඊට පස්සේ... ඊට පස්සෙ මේ හැමදේම නරක පැත්තට වෙලා තිබුනේ ගොඩක් ම නරක විදිහට

delphi හිස් බැල්මෙන් යුතුව scorpious ගේ මුහුණ දෙස බලා සිටියේය

Delphi :- ඩෙත් ඊටර් කෙනෙක් වෙලා !!!

scorpius :- ඒ වගේම මිනීමරුවෙක්..එයා මහාචාර්ය longbottomව මරලා...

Delphi :- එහෙනම් අනිවාර්යෙන්ම අපි ඒක විනාශ කරන්න ඕන

Albus :- ඔයාට තේරෙනවා ඇතිනේ මේකෙ බරපතලකම ගැන

Delphi :- මට තේරෙනවා මට හිතෙනවා සෙඩ්‍රික් වුණත් මේ තත්ත්වය ගැන තේරුම් ගනීවි කියලා.අපි එකතු වෙලා මේක විනාශ කරමු.පස්සෙ ගිහිල්ලා මගේ මට මේ ගැන පැහැදිලි කරමු

Albus :- ස්තුතියි

ඩෙල්ෆි දුක්මුසු ලෙස ඔවුන් දෙස බලමින් කාලයන්ත්‍රය ඇය අතට ගත්තාය.ඇය ඒ දෙස බලමින් එක්වරම මුහුණේ ස්වරූපය වෙනස් කර ගත්තාය

ලස්සන සලකුණක්

Delphi :- මොකක්ද

ඩෙල්ෆි ගේ කබාය බුරුල් වී බිම වැටී තිබුණි.මේ නිසා ඇයගේ ගෙල පිටුපස වූ පච්චය නිරාවරණය වී ඇත

Albus :- ඔයාගේ බෙල්ලෙ තියෙන පියාපත් වගේ සලකුණ.මම කලින් ඒක දැකලා තිබුනෙ නෑ.ඔය වගේ ඒවට ද සාමාන්‍ය ලෝකෙ මිනිස්සු පච්ච කියලා කියන්නේ

Delphi :- ඔව්..හොඳයි ඒක.. Augurey කෙනෙක්

Scorpius :- "Augurey"?

Delphi :- ඔයාලට එයා ගැන මායා සත්තු ගැන උගන්නකොට කියල දීල නැද්ද කළුපාට ,විරූපී ,වැස්ස වහින්න කලින් නාද කරන කුරුල්ලෝ ජාතියක්.මායාකාරයෝ උන්ව

මරණය ගැන අනාවැකි කියන්න පාවිච්චි කරනවා.මාව හදාවඩා ගත්ත භාරකාර ගෙදර කූඩු කරල හිටිය එකෙක්..

Scorpius :- ඔයාගේ භාරකාරයා

ඩෙල්ෆි scorpious දෙස බැලුවේය.දැන් ඇය සතුව කාල යන්ත්‍රය ඇති බැවින් ඇයට මෙය ක්‍රීඩාවක් බඳුවිය..

Delphi :- ඇය මට ඛේදාන්තයක් සහිත අවසානයක් හිමි වනවා දැකීමට අකමැත්තෙන් මෙන් ඉතා දුක්මුසු විදිහට තමයි මාව බාර ගත්තේ.ඒ වුණාට ඇය මට වැඩිය කැමති නෑ Euphemia Rowle මාව බාර ගෙන තියෙන්නෙ රත්තරන් වලට කෑදරකමට විතරයි....

Albus :- ඉතින් ඇයි ඔයාට එයාගේ කුරුල්ලව පච්චයක් විදිහට කොටා ගන්න ඕන වුණේ

Delphi :- ඒකෙන් මම අනාගතයේ කරන්න ඕන දේ මතක් කරලා දෙනවා

Albus :- නියමයිනෙ මම හිතන්නේ මටත් ඔය වගේ එකක් ඕනේ

Scorpius :- Rowleලා ඇත්තටම දරුණු ඩෙත් ඊටර්ස්ලා නේ..

scorpious ගේ හිස තුළ විවිධ අදහස් රාශියක් කැරකෙමින් තිබුණි

Albus :- අයියෝ , කමෝන් අපි මේක විනාශ කරලදාමු.Confringo ? Stupify? Bonbarda? මොකක්ද අපි පාවිච්චි කරන්නෙ...

Scorpius :- ඒක මෙහාට දෙන්න.කාල යන්ත්‍රය අපිට දෙන්න

Delphi :- මොකක්

Albus :- scorpious මොකද මේ තරහින් පිපිරෙන්නේ. මොකද වෙලා තියෙන්නෙ ඔයාට

Scorpius :- මට නම් ඔයා ගැන පොඩ්ඩක් වත් විශ්වාසයක් තිබුණෙ නෑ.ඇයි ඔයා හොග්වෝර්ට්ස් වලට ඉගෙන ගන්න ආවෙ නැත්තෙ.ඇයි දැන් ඔයා මෙහෙ ඉන්නේ

Delphi :- මම උත්සාහ කරන්නේ මගේ ඥාති සහෝදරයා ආපසු ගෙන්වන්න විතරයි..

Scorpius :- එයාල ඔයාට Augurey කියල කතා කලේ.අනිත් ලෝකෙදි එයාලා කතා කලේ Augurey කියලා

මද සිනාවක් ඩෙල්ෆි මූනෙන් මතු වෙමින් තිබුණි.

Delphi :- Augurey ...ම්ම්ම්...එක් අතකින් ඒ නමත් නරකම නෑ...

Albus :- ඩෙල්ෆි ...

ඇය ක්ෂණිකව ක්‍රියාත්මක විය.ඇය ඇගේ යෂ්ටිය එළියට ගෙන scorpius දෙසට එල්ල කරමින් බන්ධනයක් එල්ල කළාය.ස්කෝපියස් එය වළකා ලීමට උත්සාහ කළ මුත් එය කරගත නොහැකි විය.ඩෙල්ෆිගේ බලය ඔහුට වඩා ඉක්මන් මෙන්ම බලවත් විය

Delphi :- Fulgari...

ස්කෝපියස්ගේ අත් හා පා දීප්තිමත් රැහැන් වර්ගයකින් තදින් බැඳී ගියේය...

Scorpius :- ඇල්බස් දුවන්න

ඇල්බස් වටපිට බැලුවේ.පසුව ඔහු දිවීමට පටන් ගත්තේය

Delphi :- Fulgari...

ඇල්බස් ස්කෝපියස් මෙන්ම බැඳී ගිය අතර දුවමින් සිටි ඔහුව එක්වරම ගැට වලට හසු වෙමින් පොළොවට පතබෑවුනේය.

එතකොට ඒක තමා පළවෙනි මන්තරය මට ඔයාට කරන්න සිද්ධ වෙච්ච.මම හිතුවේ මීට වඩා ඒවා පාවිච්චි කරන්න වේවි කියලා.නමුත් ඔයාලා ආමෝස් ට වඩා ගොඩක් ලේසියෙන් මට පාලනය කරන්න පුළුවන් උනානේ.සාමාන්‍යයෙන් පිරිමි ළමයි ස්වාභාවිකවම කීකරුයි.එහෙම නේද...දැන් අපි මේ අවුල වෙන්නේ පළවෙනි සහ අවසාන වතාවට කියලා හිතාගමු

Albus :- නමුත් ඇයි??මොකක්ද ???කව්ද ඔයා???

Delphi :- ඇල්බස් , මම තමයි අලුත් අතීතය.

ඇය ස්කෝර්පියස්ගේ යෂ්ටිය ගෙන එය එක්වරම දෙකට කඩා දැමුවාය...

මම තමයි මේ ලෝකය මේ ලෝකෙ ගොඩක් අය බලාපොරොත්තුවෙන් හිටපු පිළිතුර

◍ තුන්වැනි ජවනිකාව 17වන දර්ශණය

🏛 මායා අමාත්‍යාංශය ,හර්මයිනිගේ කාර්යාලය 🏛

Ron හර්මයිනීගෙ මේසේ ඉදිරිපිට පොරි වගයක් කමින් බලාසිටියේය...

Ron :- මටනම් ඒක කොහෙත්ම හිතාගන්න බෑ..ඔයා දන්නවනේ සමහර ලෝක වලදී විවාහ වෙලත් නෑ...

Hermione :- රොන්.. ඒක මොකක් උනත් දැන් මට විනාඩි දහයයි තියෙන්නෙ ග්‍රින්ගොට්ස් වල ආරක්ෂාව භාර ගොබ්ලින්ව මුණගැහෙන්න..

Ron :-;මම කියන්නේ අපි දැන් ගොඩක් කල් ඉඳලා එකට ඉන්නේ..බැඳලා ගොඩක් කල් වෙනවනේ..මම කියන්නේ ගොඩක් කල්...

Hermione :- ඔයාට දිග නිවාඩුවක් ඕනෙ කියල නම් මේ කියන්න හදන්න... මම මේ පිහාටු පෑනෙන් ඔයාට හිල් වෙන්න එකක් අනිනවා..

Ron :- අනේ ඔයා ටිකක් කට වහගන්නකෝ .මේ අපේ විවාහය පොඩ්ඩක් අලුත් කරලා ගන්න විතරයි ඕනේ... මම ඒ ගැන කියවලා තියෙනවා.. අපේ කසාදේ අලුත් කරන එක ගැන... මොකද ඔයා ඒ ගැන හිතන්නෙ

Hermione :-;(ලැජ්ජාවෙන් ඇඹරෙමින්) ඔයාට ඕනේ ආයේ මාව විවාහ කරගන්නද...

Ron :- හොඳයි මේකයි..ඇත්තටම අපි ඉතින් ගොඩක් තරුණයිනේ විවාහ වෙනකොට.ඉතින් අපි මුලින්ම බඳින දවසේ මම හොඳටම බීල හිටියෙ.ඒ නිසා ඇත්තටම මට ඒ දවසේ ගොඩක් දේවල් මතක නෑ.ඇත්ත කතාව තමයි මම ඔයාට මගේ පනටත් වඩා ආදරෙයි හර්මයිනී ග්‍රේන්ජර් කාලය කොච්චර ගත වුනත් මට ඕනෙ ඒක ගොඩක් මිනිස්සු ඉස්සරහා ඔයාට කියන්නේ...

ඇය ඔහු දෙස බලා සිටියාය.ඇය මද සිනාවක් පා රොන්ව ඇය දෙසට ඇද ගෙන ආදරෙන් හාදුවක් පිරි නැමුවාය...

Hermione :- ඔයා හරිම මිහිරියි...

Ron :- ඔයත් හරිම රසවත්..ඔයා ටොෆී රසයි..

හර්මයිනී සිනාවිය.හර්මයිනී නැවතත් රොන්ව සිප ගැනීමට යන විටම හැරී , ජිනී සහ ඩ්‍රැකෝ එතැනට පැමිණියෙන් ඔවුන් ඈත්විය.

Hermione :- හැරී , ජිනී ...ආහ් ඩ්‍රැකෝ කොච්චර දෙයක්ද ඔයාව දකින්න ලැබුන එක...

Harry :- හීන... මට පේන හීන..ඒවා ආයිම පේන්න පටන් අරන්.ඒවල ඉවරයක් නෑ

Ginny :- ඒ වගේම albus ආයිමත් පැනලා ගිහින්...

Draco :- ස්කෝපියසුත් නෑ.මැගෝනිගල් එක්ක එකතු වෙලා මුලු ඉස්කෝලෙම හෙව්වා.එයාල යන්න ගිහින්

Hermione :- එහෙනම් මම අවුරෝරා එක ඉක්මනින් කැඳවන්නම්...

Ron :- නෑ..එපා...කැඳවන්න ඕනෙ නෑ... ඔක්කොම හරි ඇල්බස් මම ඊයෙ රෑ දැක්කා. ඔක්කොම හොඳින් සිද්ධවෙනව...

Draco :- කොහේදිද

ඔවුන් සියළුදෙනාම රොන් දෙස බැලූහ. එක්වරම කලබලයට පත්වූ නමුත් ක්ෂණික ව ඔහු පිළිතුරු දෙන්නට විය

Ron :- මම ඊයේ නෙවිල් එක්ක ෆයර්විස්කි ටිකක් තොල ගගා හිටියේ හොග්ස්මීඩ්වල. ඔයාලත් ඉතින් එහෙම කරනවා.අපිත් එහෙම ඉතින් පොඩ්ඩක් අරගෙන ආපහු එනකොටගොඩක් පරක්කු උනා.ඉතින් ඒ නිසා අපි Floo කුඩු ටිකකින් ගෙදරට එන්න වැඩේ කරගන්න බැලුවේ.ඔයාලා දන්නවනේ ඉතින් පොඩ්ඩක් බීපු වෙලාවට ලොකු ලොකු මන්තර කියනවට වඩා පොඩි මන්තරයක් ...

Ginny :- රොන් කෙලින්ම කාරණාවට බහිනවද.. අපි ඔක්කොම එකතුවෙලා ඔයාගේ බෙල්ල මිරිකන්න කලින්

Ron :- එයාලා පැනලා ගියේ නෑ.එයා සොඳුරු මොහොතක් ගතකරමින් හිටියේ..එයාට වඩා වැඩිමල් එයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් එක්ක හිටියේ ...

Harry :- මොකක්...එයාට වඩා වැඩිමල් කෙල්ලෙක් එක්ක

Ron :- ඒ වගේම එයා හරිම පෙනුමයි... මනබඳින රිදී පාට කොණ්ඩෙ...
එයාලව මම දැක්කේ බකමූණො ඉන්න කුළුණේ වහලය මත හිටියේ.ස්කෝපියසුත් හිටියා ගූස්බෙරි එක්ක සෙල්ලම් කර කර. මම හිතන්නේ මම දුන්න ආදර වශිය වැඩ කරනවා වගේ..

හැරී කල්පනාවක නිග්මිය.

Harry :- ඇයගේ කොණ්ඩය රිදී සහ නිල් පාටයි ද

Ron :- අන්න හරි රිදී සහ නිල්පාට ඔව් ...

Harry :- එයා කතා කර කර හිටියෙ ආමෝස් ඩිගරිගේ මිනිපිරි එක්කද

Ginny :- මේ ආයිම සෙඩ්‍රික් ගැන අවුලක්ද

හැරී කිසිවක් පැවසුවේ නැත.හර්මයිනී කාමරය සිසාරා ඔවුන් දෙස බලා දොරෙන් එබී කෑගැසුවාය

Hermione :- Ethel...ගොබ්ලින් එක්ක හමුව අවලංගු කරන්න...

🟢 3වන ජවනිකාව , 18වන දර්ශනය

🏘St.ඔස්වල්ඩ්ගේ මහලු මායාකරුවන් මායාකාරියන්ට වෙන්වූ නිවාසය,ආමෝස් ගේ කාමරය 🏘

හැරී සමග ඩ්‍රැකෝ තම යෂ්ටි අමෝරාගෙන කාමරයට ඇතුළු විය.

Harry :- කෝ එයාලා ?

Amos Diggory :- හැරී පොටර්.මම ඔබ වෙනුවෙන් මොනවද කරන්න පුළුවන් සර් ? ඒ වගේම ඩ්‍රැකෝ මැල්ෆෝයි මහත්තයා.මම සතුටින් ඒක ඉටු කරන්නම්.

Harry :- මම දන්නවා තමුසේ කොහොමද මගේ පුතාව පාවිච්චි කළේ කියලා

Amos Diggory :- මම ඔයාගේ පුතාව නැටෙව්වෙ නෑ සර් .ඔයයි මගේ කඩවසම් කොලුවා පාවිච්චි කලේ..

Draco :- අපිට දැන්ම කියනවා ඇල්බසුයි , ස්කෝපියසුයි කොහෙද කියලා..නැත්නම් දරුණු ප්‍රතිවිපාක වලට මුහුණ දෙන්න වෙයි.

Amos Diggory :-නමුත් මම කොහොමද දන්නෙ එයාල කොහෙද ඉන්නේ කියලා.

Draco :- අපිට කොලේ වහන්න හදන්න එපා මනුස්සයෝ.

Amos :- මම ඒ වගේ කිසි දෙයක් කරලා නෑ.

Harry :- ආමෝස් ඔයා ඇස්කබාන් වලට නොදා ඉන්න තරම් වයස වැඩි නෑ හොඳේ.එයාල අන්තිමට අතුරුදහන් වෙද්දි ඔයාගෙ ම්ණිබිරිය එක්ක ඉන්නවා තමයි දැකලා තියෙන්නෙ.

Amos Diggory :- මට කිසිම අදහසක් නෑ ඔයා මොකක් ගැන....(ඔහු කතාව නතර කරන ගමන් ශක්තියක් නගා , දුක්මුසු මුහුණක් මවා ගන්නට විය) මගේ ම්ණිබිරිය ???

තුන්වන ජවනිකාව , 19වන දර්ශනය

🏫හොග්වර්ට්ස් මායා පාසලේ ක්‍රීඩා පිටිය🏫

තත්පරයෙන් තත්පරය වෙනස් වන ඩෙල්ෆිගේ හැසිරීම දෙස අපි ඇස් අයාගෙන බලා සිටියා. ඇයගේ කලින් හැසිරීමේ තිබුණේ නොවිසිලිමත්, අනාරක්ෂිත බවක් වූ නමුත් දැන් ඇයගේ හැසිරීම් වල ශක්ති සම්පන්න බවක් පමණක් පිරී තිබුණි.

Albus :- ක්විඩිච් පිට්ටනයේ අපි මොකද මේ කරන්නේ???

ඩෙල්ෆි කිසිවක් නොපැවසුවාය.

Scorpius :- ට්‍රයිවිසාඩ් තරගාවලියේ තුන්වන වටයේ වංකගිරියෙ තරගය.මෙතන තමයි වංකගිරියට යන්න ආරම්භයේ තිබුන තැන.අපි සෙඩ්‍රික්ව බේරගන්න යන්නේ ඉන්නේ.

Delphi :- දැන් තමයි වෙලාව.නොවිය යුතු දෙයක් නොවෙන්න වගබලාගන්න තිබෙන අවසන් අවස්ථාව.අපි සෙඩ්‍රික්ව බේරගන්න යනවා scorpios අපි ඔයා දැකපු සෙඩ්‍රික් ජීවත්වන ලෝකය නැවත පණ උපද්දනවා.

Scorpius :- ඒ අපාය???ඔයාට ඕනේ අපායට පණ දෙන්නද?

Delphi :- නෑ..මට ඕනේ පාරිශුද්ධ බලවත් මායාවක්.මට ඕනේ අඳුර නැවත රජ කරනවා දකින්න.

Scorpius :- ඔයාට ඕනෙ වොල්ඩමෝට්ට නැවත පණ දෙන්නද?

Delphi :- මායා ලෝකයේ එකම පරිපූර්ණ,සැබෑ පාලකයා නැවත එනවා.දැන් ඔයාලට විශ්වාසයිනේ මායා කර්මවල පොඩි අවුල් වගයක් වුණා කියලා.මොකද දැන් අවම වශයෙන් දෙපාරක්වත් අනාගතයේ ඉඳලා ඒ කාලෙට ගිහින් තියෙනවා.ඒ නිසා මට ඕනේ නෑ ඒ අයට මාව අහු වෙනවට.දැන් තුන්වන කාර්ය තියෙන්නේ...අවුලක් නෑනේ..අපි ඒකෙන් පටන් ගමු.අපි එහෙනම් පටන් ගමු ද ??

Albus :- අපි එයාව නවත්වන්න යන්නෙ නෑ.ඔයා අපිට මොන බලපෑමක් කළත්.මොකද අපි දන්නවා එයාට ඕන වුණේ මගේ තාත්තා එක්ක එකතුවෙලා තරගාවලිය දිනන්න.

Delphi :- මටත් ඕනේ නෑ එයාව නවත්වන්න.මට ඕනේ ඔයාලව ලවා එයාව සමච්චලයට පත් කරවන්න.එයාව කොහොමහරි නිරුවත් කරලා දම්පාට පිහාටු පිස්නාවක් තියෙන කොස්සක නග්ගවලා වංකගිරියෙන් එළියට පියාබාවලා යවන්න ඕන.අන්න ඒ නින්දාව කලින් ඔයාලට එතනට අරන් ගියා වගේ ම වගේම අපිව නැවතත් එතනට අරන් යාවි?ඒ වගේම අනාවැකිය සඵල වේවි.

Scorpius :- අනාවැකියක් තිබුන කියල අපි පරීක්ෂාකාරී වුනේ නැනෙ??මොකක්ද අනාවැකිය??

Delphi :- ඔයා දැකපු ලෝකය ඒ විදියට තියෙන්න ඕන නේද ??එහෙම නේද??ඉතිං අද අපි ඒ ලෝකය නැවත පැමිණෙනවා කියලා තහවුරු කරගමු...

Albus :-අපි ඉඩ දෙන්නේ නෑ.අපි ඔයාට අවනත වෙන්නේ නෑ.ඔයා කවුරු වුණත් ඔයාට අපි ලවා මොනවා කරගන්න ඕනි වුණත්...

Delphi :- ඇත්තෙන්ම ඔයාලා කරාවි.

Albus :- ඔයාල imperio මන්ත්‍රය යොදාගන්න වෙනවා.ඔයාට මාව පාලනය කරන්න වෙනවා.

Delphi :- නෑ අනාවැකිය සඵල වෙන්න නම්.ඒ ඔයා වෙන්නම ඕනේ.නැතුව ඔයාගේ අතකොලුව නෙමේ.ඔයා තමයි සෙඩ්‍රික්ව සමච්චලයට ලක් කරන්න ඕන කෙනා.ඒ නිසා imperio මන්ත්‍රය හරියන එකක් නෑ.ඒ නිසා මට ඔයාට වෙන විදිහකට මේක කියලා දෙන්න වෙයි වගේ

එක්වරම ඩෙල්ෆි ඇගේ යෂ්ටිය ඉවතට ගෙන ඇල්බස් දෙසට දිගු කරමින් යෂ්ටිය ඇල්බස්ගේ කම්මුලකට තබා තද කළාය.

Albus :- ඔයාට පිස්සු හැදිලද? ඔල්මාද ?

ඩෙල්පි ඔහු දෙස බැලුවාය.පසුව ඇය scorpios දෙසට යෂ්ටිය දිගු කළාය.

Delphi :-ඔව් එහෙම වෙව්

Albus :- නෑ

Delphi :- නෑ නෙමේ...ඔව්.මම හිතපු විදියට මේක ඔයාව ගොඩක් බය කරාවි.

Scorpius :- ඇල්බස් ඈය මොනව කලත්,අපි ඇයට යන්න දෙන්න හොඳ නෑ.

Delphi :- Crucio!!!

Scorpius වේදනාවෙන් කෑ ගැසීය.

Albus :- මම කරන්නම්........

Delphi :- (සිනාසෙමින්) මොකක්ද ? ඔයාට මේ ලෝකෙ මොනවා කරන්න පුළුවන් කියලද හිතන් ඉන්නෙ?ලොකු පසුතැවිල්ලක් ද?ඔයාගේ පවුලට කැළලක් එක් කරන එකද?ඔයාට ඕනේ මම ඔයාගේ එකම යාලුවට හිරිහැර කරන එක නතර කරන්නද? එහෙම නම් මම කියපු දේ කරනවා..

ඇය albus දෙස බැලුවාය.ඔහු දැඩි ස්වරයකින් මුව අයාගෙන බලා සිටියේය

ආහ්...එහෙම නැද්ද??එහෙමනම්.. Crucio ....

Albus :- නෑ...කරුණාකරලා නතර කරන්න.

ප්‍රබෝධමත් පෙනුමකින් යුතුව Craig දුව එයි.

Craig Bowker :- ස්කොපියස්?ඇල්බස්?ඔක්කොම ඔයාලව හොයනවා.

Albus :- Craig ..අහකට යන්න.ගිහිල්ලා උදව් ඉල්ලන් එන්න.

Craig Bowker :- මොකක්ද වෙන්නෙ මෙතන.

Delphi :- Avada Kadavra!!!!

ඩෙල්ෆි එක්වරම කොළපාට ගිනි පුලිඟුවක් මායා යෂ්ටිය අගින් නිකුත් කළාය.Craig පිටුපසට විසි වී ගොස් ක්ෂණික ම මරණයට පත් විය.

එක්වරම නිශ්ශබ්දතාවකි.

ඔයාට තේරුනේ නැද්ද?අපි මෙතන පොඩි එවුන්ගේ සෙල්ලමක් නෙමෙයි කරන්න යන්නේ. මට ඔයාව ප්‍රයෝජනවත් උනාට ඔයාගේ යාළුවො මට වැදගත් නැහැ.

ඇල්බස් සහ ස්කොපියස් ඇගේ නිසල දේහය දෙස බලා සිටියහ.ඔවුන් මනසින් තරහින් පුපුරමින් සිටියහ.

මට ගොඩක් කල් ගියා ඔයාගේ දුර්වලකම හඳුනාගන්න.ඇල්බස් පොටර් ,මම හිතුවේ ඒක ඔයාගේ උඩගුකම කියලා.මම හිතුවේ ඔයාගේ තාත්තාව සතුටුකරන්න තියෙන ඕනෑකම කියලා. නමුත් පස්සේ මම තේරුම් ගත්ත ඔයාගේ දුර්වලතාවය ඔයාගේ තාත්තගේ වගේම යාලුවන්ට තිබ්බ ලැදියාව කියලා.ඔයා කිව්ව විදිහටම ඔයා ඔයාගේ දේ කරාවි.නැත්නම් Scorpius මැරිලා යාවි.හරියටම සෙඩ්‍රික්ට උනා වගේ.

ඇය ඔවුන් දෙදෙනාම දෙස බලා සිටියාය.

වොල්ඩමෝට් නැවත පැමිණේවි. Augurey එක ඔහුගේ පසුපසින් පක්ෂපාතී ව සිටීවි. හැමදේම අනාවැකියට අනුව සිදුවෙයි."වැඩ නැති උන් වැඩකට නැති වෙලා යාවි.කාලය නැවත ආවහම, නූපන් දරුවන් ඔවුන්ගේ පියවරුන් ඝාතනය කරද්දී ,අඳුරු මායාකරු නැවත පැමිණේවි.

එය සිනාසී scorpiosව එකවර වැරෙන් ඇය අසලට ඇද ගත්තාය.

සෙඩ්‍රික් තමා වැඩකට නැති එකා..ඒ වගේම ඇල්බස්...

ඇය ඇල්බස්වත් ඇය අසලට වරෙන් ඇද ගත්තාය .

කාල යන්ත්‍රය කැරකැවීමට පටන් ගනී.ඇය ඔවුන්ගේ අත් එයට ඇද ගත්තාය.

හරි...දැන් !!!!

එක් වරම විශාල රශ්මි කදම්භයක් සහ විශාල ශබ්දයක් ඇතිවිය.

කාලය නතර විය.එය නැවත ආපස්සට..සෙමින් සෙමින් යාමට පටන් ගනී.මුලින්ම සෙමින්..පසුව වේගයෙන්...පසුව ඉතා වේගයෙන්

පසුව එක්වරම එපාකරපු ශබ්දයක් සමග පිපිරීමකි...

🚫 අද ඉතිරි කොටස මුල්ම කමෙන්ට් එකේ 🚫
Oct 18, 2019 · Public · in Timeline Photos
View Full Size · Send as Message · Find Support or Report Photo
LikeLoveWow192
Write a comment...

.
Shashitha Vinod
Scorpius :- Albus මේකට මොකක් හරි කරන්න ඕනේ....

Albus :- මම දන්නවා. නමුත් මොකක්ද කරන්නේ. ඇය අපේ මායා යෂ්ටි උදුරාගත්තා.අපිව බැඳලා දැම්මා.ඒ මදිවට ඔයාව මරනවා කියලා තර්ජනය කරනවා...

Scorpius :- මම මැරෙන්න වුණත් සූදානම් ඒකෙන් voldermort නැවත පැමිණෙන එක නැති වෙනවා නම්

Albus :- ඇත්තටම!!!ඔයා!!!

Scorpius :- ඔයාට මං වෙනුවෙන් ලොකු කාලයක් වැළපෙන්න ඕනෙ වෙන එකක් නෑ.මොකද මාව මරලා ඉක්මනටම ඔයාවත් මරා දාවි...

Albus :- (බලාපොරොත්තු කඩවූ ස්වරයෙන්) කාල යන්ත්‍රයේ තියෙන දෝෂය..විනාඩි පහේ නීතිය..අපි අපිට පුලුවන් හැමදේම කරන්න ඕනේ මේ කාලය ගත වෙන්න...

Scorpius :- ඒක හරියන වැඩක් නෙමේ.

වංකගිරියෙ තාප්පයක් චලනය වී දිශාව වෙනස් විය.ඩෙල්ෆි ඇල්බස්ව සහ ස්කෝපියස්ව ඇය දෙසට ඇද ගත්තාය.බලාපොරොත්තු වලින් තොරවූ වංකගිරිය තුළින් ඔවුන් තවදුරටත් ඉදිරියට ගමන් කළහ..

Ludo bagman :- දැන් තියෙන ලකුණු තත්වය ගැන මතක් කරන්න මට ඉඩ ඉඩදෙන්න.දැනට පළමු ස්ථානයේ රැකගෙන ඉන්නේ සෙඩ්‍රික් මහතා සහ හැරි පොටර් මහතා.දෙවැනි ස්ථානය වික්ටර් ක්‍රම් මහතා සහ තුන්වන ස්ථානයේ Sare blue; ෆ්ලෙයාර් ඩෙලකූර් මෙනෙවියයි.

එක්වරම ඇල්බස් සහ ස්කෝපියස් තාප්පයක් පිටුපසින් මතුවිය.ඔවුන් දුවමින් සිටියහ.

Albus :- ඇය කොහෙටද ගියේ???

Scorpius :- ඒක වැදගත්ද?ඔයා හිතන්නෙ මොන පැත්තට කියලද???

එක්වරම ඩෙල්ෆි ඔවුන්ට පසුපසින් අහසේ ඉහලින් පාවෙමින් සිටියාය.ඇය මායා කොස්සක් නොමැතිව පියාඹමින් සිටියාය.

Delphi :- මෙලෝ රහකට නැති අසරණයෝ...

ඇය කොලුවන් දෙදෙනාව පොළොවට තල්ලුකර දැමුවාය.

හිතුවේ මගින් බේරිලා යන්නද??

Albus :- (පුදුම වී) ඔයා කොහොම.....අඩුම තරමේ කොස්සක්වත් නැතුව....

Delphi :- කොසු....ඒවා ලොකු..වැඩකට නැති... දෙයක්නේ.මිනිත්තු තුනක් ගිහිල්ලා...අපිට මිනිත්තු දෙකයි ඉතුරු වෙලා තියෙන්නෙ.ඒ නිසා ඔයාට කියපු දේ ඔයා කරන්න ඕන දැන්..

Scorpius :- නෑ අපි කරන්නෙ නෑ...

Delphi :- ඔයා හිතන්නෙ ඔයාට මාත් එක්ක සටන් කරන්න පුළුවන් කියලද??

Scorpius :- නෑ.නමුත් අපිට ඔයාව වළක්වන්න පුළුවන්.අපි අපේ ජීවිත පූජා කළොත් එහෙමනෙ වෙන්නෙ.

Delphi :- අනාවැකිය කොහොමහරි සඵල වෙන්න ඕනේ.අපි ඒක ඒ විදිහට ඉටුකරාවි..

Scorpius :- අනාවැකි බොරු කරන්න පුළුවන්.

Delphi :- ඔයාට වැරදිලා දරුවෝ...අනාවැකි කියලා කියන්නේ ඉදිරි අනාගතය..

Scorpius :- අනාවැකිය නියතවශයෙන් සඵල වෙනවා නම් මොන එහෙකටද එහෙනම් අපි ඒකට ආයිම බලපෑම් කරන්නේ.ඒ උනාට ඔයාගේ සිතුවිලි ඔයා කරන වැඩත් එක්ක විරුද්ධයිනේ.. ඔයා මේ වංකගිරියෙ අපිව ඇදගෙන යන්නේ මොකද..අපි අනාවැකිය සඵල කරවන්න වැඩ කරන්න ඕනෙ කියල හිතෙන නිසානේ.මේ තර්කය අනුව කියන්න තියෙන්නේ අනාවැකි බොරු කරන්න පුළුවන් කියලා...

Delphi :- ඔයා කියවනවා වැඩියි ළමයො...Crucio..

scorpios වේදනාවෙන් ඇඹරෙන්නට විය.

Albus :- scorpius....

Scorpius :- ඔයාට පරීක්ෂණයක් ඕනෙ උනා නේද ඇල්බස්??මෙන්න ඒක.ඒ වගේම අපි ඒක සමත් වෙන්න යන්න..

ඇල්බස් ස්කෝපියස් දෙස බලා සිටියේය. අවසානයේ ඔහුට කිරීමට ඇති දෙය ගැන පරීක්ෂාකාරී විය.ඔහු ඔලුව පහත් කර ගත්තේය.

Delphi :- එහෙනම්..ඔයා මරණයට පත්වේවි..

Albus :- (මුළු වෙර වීරියම යොදා) ඔව් අපි එහෙම කරාවි.ඒ වගේම අපි එක සතුටින්ම කරනවා.මේ වැඩේ නතර වෙනවනම්...

ඩෙල්ෆි ක්‍රෝධයෙන් නැගී සිටියාය.

Delphi :- අපිට මේ මෝඩ වැඩ වලට වෙලාව නෑ...Crucio....

Mysterious voice :- Exoelliarmus...

පිපිරීමකි.ඩෙල්ෆිගේ යෂ්ටිය ඈගෙන් එකවර ගිලිහී ගියාය.ස්කෝපියස් එදෙස පුදුමයෙන් බැලුවේය..

Brachiabindo!!!!

4 වන ජවනිකාව,1 වන දර්ශනය

මායා අමාත්‍යාංශය, මහා රැස්වීම් ශාලාව.

මායාකරුවන් හා මායාකාරියන් එක පොදියට මහා රැස්වීම් ශාලාවට එක් රොක් වන්නට විය. ළමයින් ඉක්මන් ගමනින් එහි වේදිකාවට ගොඩවන්නට විය.ඇය සියලු දෙනාගේ නිශ්ශබ්දතාවය රකින ලෙස ඉල්ලමින් අත ඉහළට ඔසවන්නට විය.නමුත් නිශ්ශබ්දතාවයක් නොවිණි.ඇය පුදුමයෙන් බලා සිටියාය.ඇය වටපිට බලන්නට විය.

Hermione :- ස්තුතියි මම ගොඩක් ස්තූති පූර්වක වෙනවා.ඔයාලගෙන් ගොඩදෙනෙක්ට මගේ දෙවෙනි විශේෂ ප්‍රධාන රැස්වීමට සහභාගි වීමට ලැබීම ගැන.මට දේවල් ටිකක් කියන්න තියෙනවා.අපි දැන් අහන ප්‍රශ්න එක්ක ගත්තාම මම මේ කියන්න යන දේවල් වලට පස්සෙ තව ප්‍රශ්න වැඩිවේවි...

ඔයාලා ගොඩදෙනෙක් දන්නවා වගේ හොග්වර්ට්ස් මිනියක් හමුවෙලා තියෙනවා කියලා දන්නවනේ.ඔහුගේ නම Craig Bowker.ඔහු හොඳ ළමයෙක්.අපිට දැනට පැහැදිලි තොරතුරක් ලැබිලා නෑ මේ මරණයට කවුරු වගකියන්න ඕනේ කියලා.නමුත් අපි ඊයේ St.ඔස්වල්ඩ්ගේ නිවහන පරීක්ෂාවට ලක්කළා.එහි කාමරයක් අපිට දේවල් දෙකක් හෙළි කළා.පලවෙනි දේ අඳුරේ නැවත පුනරාගමනය ගැන කියැවෙන අනාවැකිය, දෙවෙනි එක ලියල තිබුන එකක්..ප්‍රකාශනයක් අඳුරේ අධිපතියා නැත්නම් voldemortට ළමයෙක් හිටියා කියන එක...

එම පුවත මුළු කාමරය පුරාම කසුකුසුවක් කසුකුසුවක් නංවන්නට විය.

අපි සම්පූර්ණ විස්තරයම තවම දන්නේ නෑ.අපි තාම පරීක්ෂණය කරගෙන යන ගමන්.අපි ප්‍රශ්න කරගෙන යනවා මෙයාලා ඩෙත් ඊටර්ලා එක්ක තියෙන සම්බන්ධකම් ගැන.ඒ වගේම දැනට අපිට අනාවැකිය සහ ළමයා ගැන කිසිම හෝඩුවාවක් හොයාගන්න ලැබිලා නෑ.නමුත් එහි යම් සත්‍යතාවක් තියෙනවා කියලා අපිට හැගෙනවා...මේ ළමයව මායා ලෝකයෙන් සඟවා තබාගෙන ඉඳල,දැන් ඇය...හොඳයි දැන් ඇය ....

Prof. McGonagall :- ඇය??ඒ දුවෙක්ද?එයාට දුවෙක් ඉදලා ද?

Harry :- මහාචාර්යතුමියනි, ඇය කිසිම ප්‍රශ්නයක් නැගුවේ නෑ..

Hermione :- ඒකට කමක් නෑ හැරී.නැහැ මහාචාර්යතුමියනි,එතැනදි තමයි මේක ගොඩක් බරපතළ වෙන්නේ.මට බය අපිට ඇයව අත්අඩංගුවට ගන්න පුළුවන් වෙයිද කියලා. නැත්නම් ඇත්තටම ඇය මොනවහරි කරන එක නවත්තන්න.ඇය අපේ සීමාවෙන් පිට ඉන්නේ...

Prof. McGonagall :- අපිට බැරිද එයාව සොයා ගන්න

Hermione :- අපිට විශ්වාස කරන්න තියෙන හොඳම හේතුව තමා ඇය ඇයව කාලය සගවලා ඉන්නවා කියන එක...

Prof. McGonagall :- මේ හැම මගුලක්ම සිද්ධ වුනේ ඔයා කාල යන්ත්‍රයක් තියාගත්ත නිසා නේ

Hermione :- මහාචාර්ය තුමිය මම ඔයාට සහතික වෙනවා...

Prof. Mcgonagall :- මට ඔයා ගැන ලැජ්ජයි හර්මයිනි ග්‍රේන්ජර්...

හර්මයිනි තරහෙන් මුහුණ ඇඹුල් කර ගත්තාය.

Harry :- නැහැ...ඇයට එහෙම කියන එක වැරදියි ඔයාට තරහ ගන්න අයිතියක් තියෙනවා.ඔව්..ඔයාල හැමෝටම පුළුවන්.නමුත් මේ හැමදේම හර්මයිනිගේ වැරදි නොවේ.අපි දන්නෑ ඒ මායාකාරී කොහොම කාල යන්ත්‍රය අතට ගත්තද කියල.සමහරවිට මගේ මගේ පුතා ඒක ඇයට දෙන්න ඇති.

Ginny :- සමහරවිට අපේ පුතා ඒක ඇයට දෙන්න ඇති.නැත්නම් සමහරවිට ඒක ඔහුගෙන් සොරකම් කරන්න ඇති.

ජිනීත් හැරීට සහාය වෙමින් වේදිකාවට නැග්ගාය.

Prof McGonagall :- ඔයාලගේ එකමුතුකම මම අගය කරනවා.නමුත් ඔයාලගේ නොසැලකිල්ල ගණන් නොගෙන ඉන්න බැහැනේ.

Draco :- ඒක එහෙනම් නොසැලකිල්ල නිසා කියලා කියනවනම් මමත් ඒකට මුහුණ දෙන්න ඕනේ.

ඩ්‍රැකෝ ද වේදිකාවට නැඟ ජිමීට පසෙකව සිට ගත්තේය.එයට ඔහුගේ පැමිණීම ද දැඩි සේ උවමනා වූ බවක් පෙනෙන්නට විය.සෙනග අතර අමාරුවෙන් වචන පටලවගෙන කතා කරන හඬවල් ඇසෙන්නට විය.

හර්මයිනි සහ හැරී මුකුත් වැරදි දෙයක් කරලා නෑ. අපිව ආරක්ෂා කළා විතරයි.හැබැයි එයාල වැරදි නම් මමත් එහෙනම් වැරදියි.

හර්මයිනි එතැන සිටි ඇයගේ පිරිස හරහා බලන්නට විය.එවෙලේ රොන් ද වේදිකාවට ඔවුන් සමග එකතු විය.

Ron :- නිකමට කියන්නේ.මම නම් ඔය ගැන මුකුත්ම හොඳට දන්නේ දන්නෙ නෑ. ඉතිං මට වගකීමක් ගන්න බෑ.ඒ වගේම මට හොඳටම විශ්වාසයි මගේ ළමයිනුත් මේකට පැටලිලා නැති වග.නමුත් ගොඩදෙනෙක් මෙතැන නැගී සිටිනවා නම් මමත් ඒ අයත් එක්කම ඉන්නවා.

Ginny :- කාටවත් කියන්න බෑ එයාල කොහෙද කියලා.එයාලා එකට ද ඉන්නේ වෙන් වෙලාද ඉන්නේ කියලවත්.මම විශ්වාස කරනවා අපේ පුතාලා ඇයව නවත්වන්න පුලුවන් හැම දෙයක්ම කරනවා කියලා.නමුත්...

Hermione :- අපි උත්සාහය අත්හැරලා නැහැ.අපි යෝදයෝ ගාවට ගියා.අඟුටුමිට්ටන් ගාවටත්.අපිට හොයාගන්න පුළුවන් හැම කෙනා ගාවටම.Auror නියෝජිතවරුනුත් ඔවුන්ව සොයන්න ගිහින් තියෙන්නේ.එයාල රහස් දන්න අයට කතා කරමින් රහස් හෙළි නොකරන අයව ලුහුබඳිමින් ඉන්නවා.

Harry :- නමුත් එක සත්‍යතාවක් තියෙනවා අපිට ගැලවිලා යන්න බැරි.ඒක තමයි කවුරුහරි මායාකාරයෙක් අපි දැනගෙන හිටපු අතීතය නැවත ලියන්න උත්සහ කරනව කියන එක.ඉතින් අපිට කරන්න පුලුවන් එකම දේ බලාගෙන ඉන්න එක.සාර්ථක වෙනවද පරාජය වෙනවද කියලා බලන් ඉන්න එක.

Prof. McGonagall :- ඉතින් ඇය සාර්ථක වුණොත් එහෙම???

Harry :- එහෙනම්.එහෙම වුනානම් මේ කාමරේ ඉන්න හුග දෙනෙක් නැතිවෙලා ගිහිල්ලා. තවදුරටත් පවතින්න විදිහක් නෑ.ඒ වගේම voldemort නැවත පාලනය කරාවි.

4 වන ජවනිකාව, 2 වන දර්ශනය

ස්කොටිෂ් උස්බිම් , එච්මෝ දුම්රියපොළ ,1981

ඇල්බස් සහ ස්කෝපියස් දුම්රිය ස්ථානාධිපති දෙස සැක මුසු බැල්මෙන් බලා සිටියහ.

Albus :- අපි දෙන්නගෙන් කවුරු හරි ඕහුට කතා කරන්න ඕනේ.ඔයා එහෙම හිතන්නේ නැද්ද ??

Scorpius :- හෙලෝ,දුම්රිය ස්ථානාධිපති මහත්තයා.මගල් මහත්මයා.ප්‍රශ්නයක් තියෙනවා. ඔයා දැක්කද පියාඹන මායාකාරියක් මෙතන පහුකරන් යනවා.ඒ වගේම මේ මොන අවුරුද්දද?අපි මේ හොග්වර්ට්ස් ඉදන් පැනලා යන ගමන්.මොකද අපි අවුල් කළ දේවල් නිසා බය වෙලා ඉන්නේ,නමුත් මේක හරි නේද ??එහෙම අහන්නද කියන්නේ....

Albus :- ඔයා දන්නවද මට මේ මුළු කාලෙම හිතට වදදෙන්නේ මොකක්ද කියලා.තාත්තා අපි ඒක හිතාමතාම කළා කියලා හිතන එක.

Scorpius :- ඇල්බස් ඇත්තටම?මම කියන්නේ ඇත්තටම?අපි කාලය තුළ හිරවෙලා ඉන්නේ සමහරවිට සදහටම..ඒ මදිවට ඔයා හිතන්නෙ තාත්තා මේක ගැන මොනවා හිතාවි කියලද? මට නං ඔය දෙන්නව කවදාවත් තේරුම් ගන්න බැරි වේවි...

Albus :- ගොඩක් දේවල් තේරුම් ගන්න තියෙනවා. තාත්තා ටිකක් සංකීර්ණ පුද්ගලයෙක්.

Scorpius :- ඉතින් ඔයා එහෙම නැද්ද? මම ඉතිං අහන්නේ නැහැ ඔයාට ගැහැණු පාර්ශවය ගැන තියෙන කැමැත්ත කොහොමද කියලා.නමුත් ඔයා ඇන්දුනා....හොදටම...

ඔවුන් දෙදෙනාම කා ගැනද මේ කතා කරන්නේ කියා දැන සිටියහ.

Albus :- මම එහෙම කළා තමා.නැද්ද?මම කියන්නේ බලන්නකෝ එයා Craigට කල දේ..

Scorpius :- අපි ඒ ගැන හිතන්නේ නැතුව ඉමු.අපි දැන් හිත යොමු කරමු අපිට යෂ්ටි නැති එක ගැන,කොසු නැති එක ගැන ,නැවත අපේ කාලයට යාගන්න බැරි එක වගේ කාරණා ගැන.අපිට දැනට තියෙන්නේ අපේ බුද්ධිය සහ නෑ...එච්චරයි. අපේ මොලේ පාවිච්චි කරන එක විතරයි.ඒ වගේම අපිට ඇයව නවත්තන්නත් ඕන.

දුම්රිය ස්ථානාධිපති :- (රළු ස්කොෂ් වචන වලින් අමතමින්)යේ කෙනත් ඕල්ඩ් රිකී (auld reekie - edinburgh)

Scorpius :-සමාවෙන්න ?

දුම්රිය ස්ථානාධිපති :- ඔයාලා එඩින්බර්ග් දුම්රියට යන්න බලාගෙන ඉන්නවනම්, ඔයාලා දැනගන්න ඕන ඒක පරක්කු වෙනවා කියලා.එක කෝච්චි පාරක විතරයි කෝච්චි යන්නේ...

ඔහු ඔවුන් දෙස බලා සිටියහ.ඔවුනුත් ඔහු දෙස වික්ෂිප්තව බලා සිටියහ.ඔහු ඔවුන් දෙස රවා බලමින් සංශෝධනය කළ දුම්රිය කාලසටහන දිගු කළේය..එහි දකුණු පසට වන්නට තැනක් ඇගිල්ලෙන් පෙන්නුම් කළේය...

පරක්කුයි...

ඇල්බස් එය අතට ගෙන අධ්‍යනය කරන්නට විය. ඔහු තොරතුරු රාශියක් සොයාගත් පරිද්දෙන් මුහුණේ විලාසය වෙනස් වන්නට විය.ස්කෝපියස් දුම්රිය ස්ථානාධිපති දෙස බලා සිටියේය.

Albus :- මම දන්නවා එය කොහෙද කියලා...

Scorpius :- ඔයා තේරුම් ගත්තද ඒක???

Albus :- කාල සටහනේ තියෙන දින දිහා බලන්න.

ස්කෝපියස් එයට එබී බලමින් කියවන්නට විය.

Scorpius :- 1981 ඔක්තෝබර් 30.හැලොවීන් දිනයට කලින් හව.අවුරුදු 39 ක ට කලින්.නමුත් ඒ ඇයි ඇය?ඔහ්...

ස්කෝපියස් එය තේරුම් ගත්තාක් මෙන් මුහුණ මැලවෙන්නට විය.

Albus :- මගේ සීයාගෙයි ආච්චිගෙයි මරණ.මගේ තාත්තා ළදරුවෙක් කාලෙදි උන පහරදීම.වොල්ඩමෝට්ගේ ශාපය නැවත එයාටම පොලා පැනපු මොහොත.ඇය උත්සහ කරන්නේ ඇගේ අනාවැකිය සඵල කරගන්න නෙමේ,ඇය උත්සාහ කරන්නේ ලොකුම එකෙන් බේරෙන්න.

Scorpius :- ලොකු එක ??

Albus :- "අඳුරේ අධිපතිගේ ආගමනය නවත්වන්න පුළුවන් බලයක් තියන කෙනා.."
ස්කෝපියස් ද එයට එකතු විය..

Scorpius and Albus :- "තුන් වතාවක් ඔහුට විරුද්ධ වූ අයට උපත,හත්වන මාසය මිය යන විට උපත..."

ඔහුගේ මුහුණ වචනයක් වචනයක් පාසා සුදු මැලි වන්නට විය.

Scorpius :- ඒක මගේ වැරැද්ද.මම එයාට කිව්වේ ඒ අනාවැකි නිශ්ඵල කරන්න පුළුවන් කියලා.මම ඇයට අනාවැකි ප්‍රශ්නාර්ත්මකයි කියලා සම්පූර්ණ තර්කයක්ම කියලා දුන්නා.

Albus :- තව පැය 24කින් වොල්ඩමෝට් ළදරු හැරී පොටර් මරන්න ගිහින් ඔහුටම සාපයක් කරගන්නවා.ඩෙල්ෆි හදන්නේ ඒකෙන් එයාව වළක්වන්න.අපි දැන්ම ගොඩ්‍රික්ස් හොලෝ වෙත යන්න ඕන.

4 වන ජවනිකාවේ 3 වන දර්ශනය

🏘 ගොඩ්‍රික්ස් හොලෝ , 1981 🏘

ඇල්බස් සහ ස්කෝර්පියස් ලස්සන පුංචි ගොඩ්‍රික්ස් හොලෝ ගම්මානය මැදින් ගමන් කරමින් සිටියි.එය කලබල ගතියක් උසුලමින් තිබුණි.

Scorpius :- හොඳයි මට පේන විදිහට නම් කිසිම පහරදීමක ලකුණු නම් පේන්න නැහැනේ.

Albus :- මේ ගොඩ්‍රික්ස් හොලෝ ද?

Scorpius :- ඔයාගේ තාත්තා ඔයාව කවදාවත් එක්කං ඇවිත් නැද්ද ???

Albus :- නෑ..එයා කීප වරක් උත්සාහ කළත් මම බැහැ කිවුවා.

Scorpius :- හොඳයි දැන් මේ ගම වටේ ඇවිදින්න වෙලාවක් නෑ.අපිට මිනීමරු මායාකාරියකගෙන් ලෝකය බේරගන්න තියෙනවා ශාන්ත ජෙරමියස් ගේ පල්ලිය.

ඔහුගේ හැගවීමත් සමග පල්ලිය දිස්වන්නට විය.

Albus :- ඒක මනහරයි...

Scorpius :- ඒ වගේම ශාන්ත ජෙරමියස්ගේ සිතූ පරිදිම ඉතාමත් බියකරු එකක් විය.(ඔහු තවත් පැත්තක් පෙන්වමින්)එතකොට අර පැත්තේ තමයි හැරී පොටර් සහ ඔහුගේ දෙමාපියන්ගේ පිළිරූ තියෙන්න ඕනේ.

Albus :- මගේ තාත්තගේ ප්‍රතිමාවක් තියෙනවද ?

Scorpius :- තවම නෑ නමුත් ඔහුගේ එකක් තියේවි කියලා විශ්වාස කරනවා.ඒ වගේම මේ තියෙන්නෙ...මේ තියෙන්නේ බැතිල්ඩා බැග්ශොට් ජීවත් වුන.. නෑ නෑ...ජීවත්වෙන...

Albus :- බැතිල්ඩා බැග්ශොට් ?මැජික් ඉතිහාසය ලියපු බැතිල්ඩා බැග්ශොට???

Scorpius :- ඒ වගේමයිනේ... ඔහ්.. මගේ...ඒ එයා තමා.වාව්.(ඔහු හීන් විසින් විසිල් හඩක් නංවන්නට විය.)මගේ ඇඟත් එක්ක කිලිපොලා යනවා...

Albus :- ස්කෝර්පියස්..!

Scorpius :- ඒ වගේම මෙන්න....

Albus :- ජේම්ස් , ලිලී සහ හැරී පොටර්ගේ නිවහන

තරුණ දැකුම්කළු ජෝඩුවත් තල්ලු කරන් යන ළදරු කරත්තයක හුරුබුහුටි සිඟිත්තෙක් හොවාගෙන එම නිවසෙන් පිටව ගියහ.ඇල්බස් ඔවුන් දෙසට ගමන් කරන්නට විය.ස්කෝර්පියස් ඔහුව නැවත ඇදගත්තේය.

Scorpius :- එයාලට ඔයාව පේන්නේ නෑ.ඇල්බස් එක කාලයට කරන නරක හානියක් වෙන්න පුළුවන්.ඒ වගේම අපි ඒක කරන්නේ නෑ...මේ සැරේනම් නෑ....

Albus :- නමුත් මේකෙන් කියන්නේ,ඇයට නැහැ.... අපි ඒක කළා...නමුත් ඇයට නැහැ...

Scorpius :- ඉතින් අපි මොකද කරන්නේ??ඇයට එරෙහිව සටන් කරන්න සූදානම් වෙනවාද??මොකද ඇය හරිම...කෲරයි....

Albus :- ඔව්..අපිත් හිතුවේ නැහැනේ මේක හරියයි කියල.හිතුවද අපි?අපි දැන් මොකද කරන්නේ?කොහොමද අපි තාත්තාව ආරක්ෂා කරන්නේ???

---

4වන ජවනිකාව, 4වන දර්ශනය

මායා අමාත්‍යාංශය,හැරීගේ කාර්යාලය

හැරී කඩිමුඩිය ඔහුගේ ලිපිගොනු වල වැඩ කරමින් සිටියේය.

Dumbledore :- සුභ උදැසනක් හැරී.

(ශබ්දයක්) හැරී ඩම්බල්ඩෝගේ උඩුකය දිස්වන රූපය දෙස බැලුවේය.ඔහුගේ මුහුණ මලානික වී තිබේ.

Harry :- මහාචාර්ය ඩම්බල්ඩෝ, මගේ කාර්යාලයෙ ,මට ගෞරවයක්.

Prof.Dumbledore :- ඔයා මොකද කරන්නේ

Harry :- මම මේ ලියකියවිලි වල වැඩ වගයක් කරන ගමන.මට මග හැරෙන්න හොඳ නෑ කියලා හිතෙන මොනවාහරි මට මගහැරිලා තියෙනවා ද කියලා බලන ගමන්.අපේ හමුදාවල බලයෙන් සටන් කරන්න පුළුවන් සීමාවක් තියෙනවානේ.දැනගන්න ඕන සටන අපෙන් ගොඩක් ඈත් වෙලාද තියෙන්නෙ කියලා.තව වෙන මොනවද මට කරන්න පුළුවන්?

(විරාමයක්) ඩම්බල්ඩෝ කිසිවක් නොපවසයි.

ඔයා කොහෙද හිටියේ මහාචාර්ය ඩම්බල්ඩෝ ...

Prof.Dumbledore :- දැන් මම මෙතන ඉන්නේ.

Harry :- මේ බලන්නකෝ.සටන පරාජය වුණා වගේ.නැත්නම් වොල්ඩමෝට්ගේ පැමිණීම ගැන කියන දේ ගැන ප්‍රතික්ෂේප කරනවා ද...???

Prof.Dumbledore :- ඒක....වෙන්න පුළුවන්.

Harry :- යන්න.මෙතනින් යන්න.මට ඔයාව මෙතනට ඕන නෑ.මට ඔයා අවශ්‍ය නෑ.මට ඔයාව අවශ්‍ය වුණු හැම මොහොතෙම ඔයා මං ළඟ හිටියේ නෑ.මම ඔහු සමග තුන් පාරක් සටන් කලා ඔයා නැතුව.මම ආයෙමත් ඒවාට මුහුණ දෙනවා.ඕන වුණොත් තනියම හරි.

Prof.Dumbledore :- හැරී .. ඔයා හිතන්නෙ නැද්ද මට ඔයත් එක්ක ඒවට විරුද්ධව සටන් කරන්න ඕන වුණා කියලා.මට ඔයාගේ උදව්වට එන්න තිබ්බ,එහෙම පුළුවන්කමක් තිබ්බනම්.

Harry :- "ආදරය අපි අන්ධ කරනවා?." ඔයා අඩුතරමේ දන්නවාද ඒ මොකක්ද කියන්නේ කියලා.අඩු තරමේ ඔයා දන්නවද ඒ අවවාදය කොච්චර බරපතළ ද කියලා.මගේ

පුතා...මගේ පුතා අපි වෙනුවෙන් සටන් කරමින් ඉන්නවා.හරියට මට ඔයා වෙනුවෙන් සටන් කරන්න වුණා වගේ.මම ඔප්පු කරලා තියෙන්නේ නරක තාත්තා කෙනෙක් වෙලා තියෙන්නෙ කියලා මගේ පුතාට..හරියට ඔයා මට උනා වගේ.එයාට කිසිම ආදරයක් නැති තැන්වල මම එයාව අත හැරලා දැම්මා.එයාගේ හිත ඇතුලේ ඇතිවුන අමනාපය තේරුම් ගන්න අවුරුදු ගාණක් යාවි.

Prof.Dumbledore :- ඔයා ප්‍රිවෙට් ඩ්‍රයිව් එහෙම යනවනම් ,එහෙනම්....

Harry :- අවුරුදු ගාණක් මම එහේ හිටියේ තනියම,මම කවුද කියලවත් දන්නේ නැතුව. නැත්නම් මම මොකද ඒ හිටියේ කියලවත් දන්නෙ නැතිව.. කිසිම කෙනෙක්ගේ රැකවරණයක් නැතිව හිටියේ...

Prof Dumbledore :- මම ඔයත් එක්ක එකතු වෙන්න ප්‍රාර්ථනා කළේ නෑ...

Harry :- ඔයාව ආරක්ෂා කරගෙන... අඩු තරමේ ඒ කාලෙත්.

Prof Dumbledore :- නෑ.මම ඔයාව ආරක්ෂා කරමින් හිටියේ.මට ඔයාට හිරිහැර කරන්න ඕනෙ වුනේ නෑ....

ඩම්බල්ඩෝර් රූපයෙන් ඉවතට එන්න උත්සාහ කළද එය සාර්ථක නොවිණි.ඔහු හැඬීමට පටන් ගත් අතර එය සැඟවීමට උත්සාහ ගත්තේය.

නමුත් මට ඔයාව හම්බුනේ අන්තිමේදී.අවුරුදු 11දී.ඒ කාලේ ඔයා ගොඩක් නිර්භීතයි. ගොඩක් හොඳයි.ඔයා ඔයාගේ දෙපතුල ළඟ තිබුණ මාවතේ පැහැදිලිව ඇවිදගෙන යමින් තිබුණා.ඇත්තටම මම ඔබට ආදරය කලා..මම දැනගෙන හිටියා ඒක නැවත නැවත ඒවි කියලත් මට පිරිමහගන්න බැරි තරමේ හානියකට වගකියන්න වෙනවා කියලත් මම දැනගෙන හිටිය.මම ආදරය කරන්න හොඳ පුද්ගලයෙක් නෙමේ.මම හානියක් නොකර කවදාවත් ආදරේ කරලා නෑ...

(ශබ්දයක් )

Harry :- එදා ඔයා මට මේක කිව්වා නම් ඔක මට අඩුවෙන් හිත රිදවන්නේ.

Prof Dumbledore :- (හඬාවැටෙමින්) මම අන්ධ වෙලා හිටියෙ.ඒක තමා ආදරය කරන්නේ.මේ දේවල් සගවන් ඉන්න ,උපායශීලී ,භයානක මහල්ලා... ඔබට ආදරය කළ බව ඔයාට අහන්න ඕන කියලා මට පෙනුනේ නෑ..

(විරාමයකි) මිනිසුන් දෙදෙනාම හැඟීම්වලින් පිරී ගොස් තිබුණි.

Harry :- මම කවදාවත් ඒ ගැන දොස් කිව්වේ නැහැනේ.

Prof Dumbledore :-හැරී මේ විකාර හැඟීම් පිරුණු ලෝකයේ නියමාකාර උත්තරයක් කවදාවත් හොයාගන්න නෑ.පරිපූර්ණ බවයි , මිනිසත්කමයි මැජික් වලට ගිය දෙයක්. සන්තෝෂයේ සෑම දිදුලන මොහොතක්ම නිකන් වස බිඳුවක් වගේ.ඒ සතුට වේදනාව නැවත පැමිණෙනවා කියලා අපිට දැනුමක් දෙනවා වගේ.ඔයා ආදරය දක්වන අයට අවංක වෙන්න නම් ඔයාගේ වේදනාව පෙන්වන්න.මිනිහෙක් හුස්ම ගන්නවා වගේම දුක් විඳින්නත් ඕනේ.

Harry :- ඔයා ඒක මට කලින් කියල තියෙනව.

Prof Dumbledore :-ඒක තමයි මට ඔයා වෙනුවෙන් මේ රෑ ඔයාට දෙන්න පුළුවන් එකම දේ.

ඔහු ඉවතට ඇවිද යන්නට විය.

Harry :- යන්න එපා.

Prof Dumbledore :-අපි ආදරේ කරන අය අතහැරලා යන්නේ නැහැ. සමහර දේවල් තියෙනවා මරණයට අල්ලන්න බැරි.සිතුවම් ,මතකයන් සහ ආදරය .....

Harry :- මම ඔයාට ආදරේ කරා, ඩම්බල්ඩෝ.

Prof Dumbledore :-මම දන්නවා

ඔහු යන්න ගියේය.හැරී තනිවිය.ඒ මොහොතේ ඩ්‍රැකෝ එතැනට පැමිණියේය.

Draco :- ඔයා දැනන් හිටියද අනික් ලෝකෙ, මම කියන්නේ ස්කෝපියස් දැකපු කාලයේ මම තමයි මායා නීති බලගැන්වීමේ ප්‍රධානියා සමහරවිට මේ කාමරය මගේ වෙන්න පුළුවන් ලඟදිම ඔයා හොඳින්ද

හැරී ඔහුගේ රෝගීන් ගිලී යයි

Harry :- ඇතුලට එන්න මම ඔයාට තැන දෙන්නම්

ඩ්‍රැකෝ දෙගිඩියාවෙන් කාමර තුලට ඇවිද යයි.ඔහු අකමැත්තෙන් වටපිට බලයි.

Draco :-කාරණය නම් කිසිම වෙලාවක අමාත්‍යාංශයේ වැඩ කරන කෙනෙක් කියල නිකන් හිතන්න නරකයි.කුඩා ළමයෙක් වගේ වුණත් මගේ තාත්තා,ඔහුට මාව ඕන වුණේ ඒකට විතරයි.

Harry :- ඔයාට මොනවා කරන්නද ඕන වුනේ ?

Draco :- ක්විඩිච්.නමුත් මම එච්චර දක්ෂ වුණේ නෑ.මූලිකව මට සතුටු වෙන්නයි ඕනේ වුනේ.

හැරී තට්ටු කරයි.ඩ්‍රැකෝ ඔහු දෙස දෙපාරක් බලයි.

සමාවෙන්න මම සුහද කතා වලට වැඩිය දක්ෂ නෑ,ඔයාට කමක් නැද්ද අපි අපේ බරපතළ කාරණාවට බැස්සොත්.

Harry :- ඇත්තෙන්ම මොකක්ද බරපතළ කාරණාව

ශබ්දයක්

Draco :- ඔයා හිතන්නෙ තියඩෝර් නොට් ගාව විතරක් කාල යන්ත්‍රයක් තිබුණා කියලද??

Harry :- මොකක්?

Draco :- අමාත්‍යාංශයෙන් ගත්ත කාල යන්ත්‍රය මූලාකෘතියක් විතරයි.බාල ලෝහයකින් හදපු එකක් විතරයි.ඒක වැඩ නම් කරනවා සත්තයි.නමුත් විනාඩි 5කට විතරයි කාලෙන්

ආපස්සට ගිහින් ඉන්න පුළුවන්.ඒක බරපතල අඩුපාඩුවක්.ඒක හරිනම් සැබෑ අඳුර මායාවන් එකතු කරන්නන්ට විකුණන දෙයක් නෙමේ.

ඩ්‍රැකෝ කියන දේ හැරී තේරුම් ගත්තේය.

Harry :- ඔහු ඔයා වෙනුවෙන් වැඩ කරනවද ?

Draco :- නෑ මගේ පියා.එයා කැමති අනිත් කාගාවවත් නැති දේවල් එකතු කරගන්න. අමාත්‍යාංශයේ තිබුණු කාල යන්ත්‍ර ගැන එයාගෙ වැඩ සැලකිල්ලක් තිබ්බේ නෑ.එයාට අවශ්‍ය වුණේ පැයකට වඩා කාලයේ ආපස්සට ගිහින් ඉන්න හැකියාව තියෙන, අවුරුදු ගණන් ආපස්සට ගිහින් ඉන්න හැකියාව තියෙන එකකට.මම හිතන්නේ එයත් රහසින් කැමති වොල්ඩමෝට් නැති ලෝකෙකට.නමුත් ඇත්ත කාල යන්ත්‍රය එයාට තමයි හැදුවේ.

Harry :- ඉතින් ඔයා ඒක තියාගත්තා.

ඩ්‍රැකෝ කාල යන්ත්‍රය පෙන්විය.

Draco :- විනාඩි 5හේ ප්‍රශ්න නෑ.ඒ වගේම ඒක රත්තරන් වගේ දිලිසෙනවා.මැල්ෆෝයි කැමැත්තෙන් හිටපු විදියට.ඔයා හිනාවෙනවා.

Harry :- හර්මයිනි ග්‍රේන්ජර්.ඒක තමයි ලොකුම හේතුව එයා ඒක තියාගන්න.බය තියෙන්නෙ තව එකක් තියෙයිද කියලා.මේක තියාගත්තට ඔයාව ඇස්කබාන් වලට යවන්න ඉඩකඩ තිබ්බා.

Draco :- වෙන විදියකට හිතන්නකෝ, හිතන්නකෝ මට කාලය හරහා යන්න පුළුවන් කියලා මිනිස්සු දැනගෙන හිටිය නම් ,එහෙනම් අර කටකතාව ගැන තියෙන විශ්වාසය වැඩි වෙන්න හොඳ රුකුලක් වෙනවා ඒක.

හැරී බැලුවේ ඔහුව හොඳින් තේරුම්ගත් පරිද්දෙනි.

Harry :- ස්කෝපියස් ....

Draco :- අපිට ළමයි ලබාගන්න හැකියාවක් තිබ්බට ඇස්ටෝරියා බෙලහීන වෙලා හිටියේ. ඇයට ලේ ශාපයක් තිබ්බා.ගොඩක් බරපතල එකක්.එයාගේ මුතුන් මිත්තන්ට ශාප

කරලා....ඒක ඇගෙන් පෙන්නුම් කරන්න ගත්තා.ඔයා දන්නවනේ ඔයා දන්නවනේ පරම්පරාවකට පස්සේ ඒක නැවත මතු උනාම....

Harry:- මට සමාවෙන්න ඩ්‍රැකෝ.

Draco :- මට ඇගේ සෞඛ්‍ය තත්ත්වය අවදානමේ දාන්න ඕන උනේ නෑ.මම කිව්වා මගේ තාත්තා මොනවා කිව්වත් මැල්ෆෝයි පරම්පරාව මගෙන් නතර වුණත් ඒකට කමක් නෑ කියල.නමුත් ඇස්ටෝරියාට ළමයෙක් ඕන වුණේ මැල්ෆෝයි පවුලටවත් පිරිසුදු ලේකමටවත් නෙමේ.අපි දෙන්නටයි ඕන උනේ.අපේ පුතා ස්කෝපියස් ඉපදුන දවස තමයි අපිට හොඳම දවස වුණේ.ඒ වගේම මේක ඇස්ටෝරියාව සැලකිය යුතු මට්ටමින් දුර්වල කලා. අපි තුන්දෙනා අපි තුන්දෙනාගෙන්ම හැංගිලා ජීවත් වෙලා හිටියේ.මට ඇගේ ශක්තිය රඳවාගෙන තියාගන්න ඕනෙ වුණා.... ඉතින් කටකතා පැතිරුණා.

Harry :- මට හිතාගන්නවත් බැහැ ඒක මොනවගේද කියලා.

Draco :- ඇස්ටෝරියා හැම වෙලාවෙම දැනගෙන හිටියා එයාට මහලු වියක් ඇත්තෙ නෑ කියල.ඇයට මාව ඕනෙ වුණා, එයා අපිව දාලා යනකොට ඩ්‍රැකෝ මැල්ෆෝයිගේ තනිකම නැති කරන්න.මම හැමවෙලාවෙම සැක කරන්න තිබ්බා.අතීතයෙන් කිසිම ගැලවීමක් නෑ.කොහොම වුණත් මේ ඕපදූප විනිශ්චකාර ලෝකයෙන් ඔහුව සඟවා තැබීමෙන් මගේ පුතා මා විඳ දරාගත් තත්වයට වඩා දරුණු සැකයකින් වැසී යනවා කියලා මම සහතික කළා.

Harry :- ආදරේ අන්ධ කරනවා.අපි දෙන්නම අපේ පුතාට ඕන දේවල් වලට නෙමේ ,අපිට ඕන දේවල් වලට තමයි යොමු කරලා තියෙන්නේ. අපි අපේ අතීතය නැවත ලියවගන්න උත්සාහ කළේ.අපි එයාලගේ වර්තමානය විනාශ කරලා තියෙන්නේ.

Draco :- මේක තමයි ඔයාට ඕනේ.ඇස්ටෝරියා එක්ක තවත් මිනිත්තුවක් සඳහා මගේ ආත්මය විකුණා දැම්මත් ,මම ඒක තදින් අල්ලගෙන ඉන්නවා.

Harry :- ඔහ් ඩ්‍රැකෝ...අපිට බැහැ...අපිට බැහැ....ඒක භාවිත කරන්න

ඩ්‍රැකෝ හැරී දෙස බලයි.පලවෙනි වතාවට ඔවුන් දෙදෙනා ,දෙදෙනාගේ හදපත්ලෙන්ම මිත්‍රත්වයෙන් යුතුව එකිනෙකා දෙස බලා සිටියහ.

Draco :- සියවස් ගණනක් ගියත් අපි එයාලව හොයාගන්න ඕන.අපි අපේ පුතාලා සොයාගන්නම ඕන.

Harry :- මට කිසිම අදහසක් නැහැ එයාල කොහෙද කොහෙද ,කවදාද කියලා ඉන්නේ. එයාලා කොහේ මොන කාලයේ ද ඉන්නේ නොදැන සොයා බලන එක මෝඩ වැඩක්.නෑ ආදරය එහෙම කරන එකක් නෑ.ඒ වගේම කාලයන්ත්‍රය කරන එකකුත් නෑ කියලයි මට බය.ඒක අපේ පුතාලා මත තමයි තියෙන්නේ.එයාලා තමයි අපිව බේරගන්න ඉන්න එකම පිරිස.

◍4වන ජවනිකාව,5වන දර්ශනය

🏘 ගොඩ්‍රික්ස් හොලෝ ,ලිලී සහ ජේම්ස් පොටර්ගේ නිවස අසල,1981🏘

Albus :- අපි කියනවද සීයටයි ?ආච්චිටයි ?

Scorpius :- ඔවුන්ගේ පුතා ලොකු වෙන එක එයාලට බලන්න බැරි බව.

Albus :- ඇය ඇති තරම් ශක්තිමත්.මම ඇය ගැන දන්නවා.ඔයා ඇයව දැකලා තියෙනවනේ.

Scorpius :- ඇය පුදුමාකාරයි ඇල්බස.මම ඔයා වුනානම් එයාට කතා කරන එක මට අමාරු වේවි.නමුත් ඇයට හැරීගේ ජීවිතය වෙනුවෙන් අයදින්න වෙනවානේ. බාගවෙලාවට හිතන්න ඇති ඔහු මැරෙන්න ඇති කියලා.එතකොට ඔයා තමයි එපාම කරපු රහස් එළි කරන්නා ඇත්ත නොවුණු දෙයක් හෙළි කරන.

Albus :- ඩම්බල්ඩෝ ,ඩම්බල්ඩෝ තවමත් ජීවතුන් අතරනේ.අපි ඩම්බල්ඩෝව මේකට මැදිහත් කරගමු. ඔයා ස්නේප් එක්ක කල දේ අපි කරමු .

Scorpius :- ඇල්බස් ඩම්බල්ඩෝ දන්නා දේ ,ඔහු එය දැන සිටියේ කෙසේ ද යන්න හෝ ඔහු කළ දේ කළේ ඇයිද යන්න පොත් 100 ගණනක් ලියල තියෙනවා. නමුත් නිසැකවම සත්‍යය නම් එයා කළේ එයා කළ යුතු දේ.ඉතිං මම ඒක අවදානමේ දාන්නේ නෑ ,ඒක අවුල් කරන්න ගිහින්.

මට උදව් ඉල්ලන්න සිද්ධ වුණා.මොකද වෙනස් කාලයක යථාර්ථයක සිටිය නිසා. නමුත් අපි එහෙම නැහැ.අපි ඉන්නේ අතීතයේ.අපිට බෑ අතීතය වෙනස් කරන්න ගිහින් තව ප්‍රශ්න

මතු කරන්න.අපිට අපේ වික්‍රමාන්විත ක්‍රියා වලින් යම් දෙයක් කියල දුන්න නම් ,ඒකයි අපිට කියලා දුන්නේ.කාට හරි කතා කරන එක, කාලයට බලපෑම් කිරීම ගොඩක්ම ගොඩක් භයානක දේවල් .

Albus :- ඉතින් අපි අනාගතයට කතා කරන්න ඕනේ.අපි තාත්තට පණිවිඩයක් යවන්න ඕනෙ.

Scorpius :- නමුත් අපි ගාව කාලය හරහා පියාඹන්න පුළුවන් බකමූණෙක් නැනෙ,ඒ වගේම අපිට කාල යන්ත්‍රයක් ඇත්තෙත් නෑ.

Albus :- අපි තාත්තට පණිවිඩයක් යවමු.එයා නැවත මෙහෙට එන්න විදියක් හොයා ගනී, ඔහුට කාල යන්ත්‍රයක් හදන් එන්න වුණත්...

Scorpius :- අපි මතකයක් යවමු.හරියට පෙන්සිව් වගේ.ඔහුට ඉදිරිපිට පෙනී ඉන්නවා වගේ.පණිවිඩයක් යවමු..අපි විශ්වාස කරමු එයා නියම වෙලාවට මතකයට ළඟාවේවි කියලා.මම කියන්නේ ඒක අසාමාන්‍යයි වගේනෙ.නැත්නම්...අපි බබාගේ ඉස්සරහ ඉඳන් එක දිගට කෑ ගහමු..උදව් කරන්න.. උදව් කරන්න...උදව් කරන්න කියලා.ඒක සමහර විට යන්තම් බබාව කම්පනයට පත් කරන්න පුළුවන්.

Albus :- යන්තම් විතරයිනේ.

Scorpius :- සිදුවෙන්න තියෙන දේත් එක්ක පුංචි කම්පනයක් මොකක්ද...ඒ වගේම සමහර විට එයා ඒක මතක් කරනකොට අපි කෑගහන අපේ මුහුණු පෙනේවි.

Albus :- උදව් ....

ස්කෝපියස් ඇල්බස් දෙස බලයි.

Scorpius :- ඔයා හරි.. ඒක හරිම භයානක අදහසක්.

Albus :- ඒක ඔයාගේ අදහස් වලින් එපාම කරපු එකක්.

Scorpius :- හරි.හොයා ගත්තා. අපිම ඒක ගිහින් දෙමු.අපි අවුරුදු හතළිහක් බලන් හිටියා..අපිම ඒක ගිහින් දෙමු.

Albus :- ඒක කරන්න බැහැ.ඩෙල්ෆි ඇයට ඕන විදියට කාලය හදාගත්තට පස්සේ අපිව මරන්න හමුදාවක් එවාවි.

Scorpius :- ඉතින් අපි ගුලක් අස්සේ ගිහින් හැංගෙන්නද ?

Albus :- ඉදිරි අවුරුදු හතළිහක්ම ඔයා එක්ක ගුලක හැංගිලා ඉන්න උනත් මට සතුටුයි.. නමුත් ඔවුන් අපිව සොයා ගනීවි.අපි මරණයට පත්වේවි.ඒ වගේම කාලය වැරදි තැනක නතර වේවි.නෑ.අපිට පාලනය කරන්න පුළුවන් යමක් අපිට ඕනේ. අපි දන්න දේ තමයි එයා හරිම වෙලාවට එතැනට පැමිණෙන බව.අපිට ඕනේ....

Scorpius :- මුකුත් නෑ... තවම ,මට දිගු කාලයකට පවතින අඳුර නැවත එනවිට යහළුවෙක් ඕනි වුනොත් මම ඔයාව තෝරගන්නවා .

Albus :- කිසි විරෝධයක් නෑ.හැබැයි මම නම් සද්දන්ත මැජික් හොඳට දන්න කෙනෙක්ව තෝරගන්නවා.

ලිලී ළදරු හැරී කරත්තයක හොවාගෙන නිවසින් පිටතට පැමිණෙයි.ඇය පරිස්සමින් ඔහු වටා බ්ලැන්කට්ටුවක් දවටයි.

එයාගේ බ්ලැන්කට්ටුව. එයාව ඇය දවටන්නේ එයගෙ බ්ලැන්කට්ටුවේ.

Scorpius :- හොඳයි එක තරමක් සීතල දවසක්.

Albus :- එයා හැම වෙලාවෙම කිව්වා.ඒ තමයි එයාගේ අම්මගෙන් එයාට ලැබුණු එකම දේ කියලා බලන්නකෝ එයාගේ ඇඟට දාන ආදරේ තරම මට හිතෙන්නෙ ඔහු ඒක දැනගන්න කැමතිවේවි මම ප්‍රාර්ථනා කරනවා මට කියන්න පුළුවන් පුලුවන් උනානම් කියලා පුළුවන් වුණානම් කියලා

Scorpius :- ඒ වගේම මම ප්‍රාර්ථනා කරනවා මගේ තාත්තට කියන්න පුළුවන් වුණානම් කියලා.හොඳයි මට විශ්වාස නෑ මොනවා කියන්නද කියලා මම හිතනවා මට කියන්න පුළුවන් වුණානම් කියලා එයා හිතන තරම් මම බය නැති බවත් මම ගොඩක් නිර්භීතයි කියලත්.

ඇල්බස්ට අදහසක් පහල විය.

Albus :- ස්කෝපියස් මගේ තාත්තා ගාව තාම අර බ්ලැන්කට්ටුව තියෙනවා

Scorpius :- ඒක වැඩ කරන එකක් නෑ අපි ඒක පණිවිඩයක් පොඩියට හරි ලිව්වොත් එයා ඒක ඉක්මනට කියවාවි.කාලය අවුල් වේවි.

Albus :- මොනවද ඔයා දන්නේ ආදර වශිය ගැන, මොනවද ඒකෙ අන්තර්ගත දේවල් ?

Scorpius :- ඔක්කොමත් එක්ක ගත්තහම , මුතු කුඩු.

Albus :- මුතු කුඩු සාමාන්‍යයෙන් දුර්ලභ ද්‍රව්‍යයක් ,එහෙම නේද ?

Scorpius :- ප්‍රධාන වශයෙන් ඒකට හේතුව ඒවා තරමක් මිල අධිකයි.මේ මොකක් ගැනද ඇල්බස් ?

Albus :- මමයි තාත්තයි අතර රණ්ඩුවක් ඇති වුණා. මම ඉස්කෝලෙට යන්න හිටිය දවසට කලින් දවසේ.

Scorpius :- මම මේකනම් දන්නවා. මම විශ්වාස කරනවා ඒක අපිව මේ අවුලට ඇදල දැම්මා කියලා.

Albus :- මම දැන් බ්ලැන්කට්ටුව කාමරයේදී විසි කරා.ඒක රොන් මාමා විහිළුවට වගේ මට දුන්න ආදර වශියේ වැදිලා වැටුණා.

Scorpius :- එයා හරිම ජොලි එක්කෙනෙක් නේද ...?

Albus :- බෝතලේ තිබ්බ ඒවා බ්ලැන්කට්ටුව පුරාම ඉහිරිලා ගියා.ඒ වගේම මට දැනගන්න ලැබුණා මම ගියාට පස්සේ අම්ම තාත්තට කාමරේට අතවත් තියන්නේ ඉඩ දීලා නෑ කියලා.

Scorpius :- ඉතින් ?

Albus :- ඉතින් අපිට හැලොවින් සැන්දෑව එනවා වගේම එයාලටත් අපේ වෙලාවට හැලෝවින් සැන්දෑව එනවා.ඉතින් එයා මට කියලා තියෙනවා හැමතිස්සෙම එයාට හැලොවින් සැදෑව එයාගෙ බ්ලැන්කට්ටුවත් එක්ක ගත කරන්න ඕන කියල.ඒ තමයි එයාගෙ අම්මගෙන් එයාට ලැබුණු අන්තිම දේ.ඉතින් එයා ඒක ගැන බලයි වගේම එයා ඒක හොයාගත්තම...

Scorpius :- නෑ..තාම ඔයාට තේරුනේ නැද්ද?

Albus :- මොකක්ද මුතු කුඩු වලින් ඇතිවන ප්‍රතිඵලය ?

Scorpius :- හොඳයි කියලා තියෙන හැටියට ඩෙමිගෝස් බෙහෙත් වතුර මිශ්‍රණයයි මුතු එකට එකතු වුණාම ඒවා ගිනි ගන්නවා.

Albus :- එතකොට බෙහෙත් වතුර (ඔහුට එම නම කියන අයුරු තේරුම් ගත නොහැකිව) ඩෙමිගෝස් අපේ ඇස් වලට පේනවද ?

Scorpius :- නෑ.

Albus :- ඉතින් අපි අර බ්ලැන්කට්ටුව අරගෙන ඒකෙ ඩෙමිගෝස් බෙහෙත් වතුර මිශ්‍රණයෙන් එකේ උඩ ලියනවා... එතකොට

Scorpius :- (සොයාගත්තා) ඒක කිසිම ප්‍රතිචාරයක් දක්වන්නෙ නෑ වර්තමානයේදි ඔයාගේ කාමරයේදි ඒක ආදර වශියෙ ගැටෙනකම්...ඩම්බල්ඩෝ පල්ල...ඒකනම් නියම අදහසක්..

Albus :- අපිට ඩෙමිගෝස් සොයාගන්න පුළුවන් තැනක් ගැන සොයලා බලන වැඩේට බහින්න ඕනේ.

Scorpius :- ඔයා දන්නවද කට කතා වලට අනුව බැතිල්ඩා බැග්ශොට් දැකලා කිසිම අවස්ථාවක මායාකාරියෝ සහ මායාකාරයෝ එයාලගේ ගෙවල් වල දොරවල් ලොක් කරලා තියෙනවා කියලා.

දොර පැද්දෙමින් ඇරෙන්නට විය.

කටකතානම් ඇත්ත.මායා යෂ්ටි ටිකකුයි, මායා වතුර ටිකකුයි සොරාගන්න දැන් තමා වෙලාව.

4වන ජවනිකාව ,6වන දර්ශනය

හැරී සහ ජිනීගේ නිවහන, ඇල්බස්ගේ කාමරය

හැරී ඇල්බස්ගේ ඇඳ උඩ නිදාගෙන සිටියි.ජිනී කාමරයට ඇතුළු වෙයි.ඇය ඔහු දෙස බැලුවා ය.

Ginny :- පුදුමයි ඔයාව මෙතන හම්බවෙච්ච එක.

Harry :- බයවෙන්න එපා මම මොකකටවත් අතවත් තියන්නේ නෑ.ඔයාගේ පූජනීය වස්තුව ආරක්ෂිතයි.(බියෙන් හැකිලෙමින් පවසයි.) සමාවෙන්න.වැරදි වචන වලින් වගේ කිව්වේ ඒක....

ජිනි කිසිවක් නොපැවසූවාය. හැරී ඇය දෙස බලා සිටියේය ...

ඔයා දන්නවද මට එපාම කරපු හැලොවින් සැන්දෑවල් තිබිල තියෙනවා..නමුත් නිතැතින්ම අඩුම තරමේ දෙවනියට හරි ජරාම දවස අද තමයි.

Ginny :- ඔයාට බැනපු එක වැරදියි.මම හැමවෙලාවෙම ඔයාගේ දේවල් වලට කඩා පැනලා ඔයාට චෝදනා කරනවා.ඒ වගේම මම හිතුවේ ඇල්බස් අතුරුදහන්වීම ඔයාගේ වරදක් කියලා.මට සමාවෙන්න මම කළ දේ ගැන.

Harry :- ඔයා හිතන්නෙ නැද්ද මේක මගේ වරදක් කියල.

Ginny :- හැරී,එයාව බලසම්පන්න අඳුරු මායාකාරියක් පැහැරගත්තා.ඉතින් ඒක කොහොමද ඔයාගේ වරදක් වෙන්නේ.

Harry :- මම එයාට යන්න ඉඩ හැරියා.මම එයාව ඇය වෙත යන්න ඉඩ හැරියා.

Ginny :- අපි නිකන් දැනටමත් පරාද උන යුද්ධයක් වගේ කියල මේක නොසලකා ඉමු.

ජිනී හිස වැනුවාය.හැරී හඬන්න පටන් ගනී.

Harry :- මට සමාවෙන්න ජිනි...

Ginny :- ඔයා මම කියන එකට ඇහුම්කන් දෙන්නේ නැද්ද?මටත් සමාවෙන්න...

Harry :- මට බේරෙන්නේ නැතුව ඉන්න තිබ්බේ. මගේ දෛවයට අනුව මම මැරෙන්න තිබ්බේ කියලා ඩම්බල්ඩෝ හිතන් ඉදලා තියනවා මම ජීවත් වෙලා ඉන්නකන්. මම වොල්ඩමෝට්ව පරාද කළා.මේ ඔක්කොම මිනිස්සු...මේ ඔක්කොම මිනිස්සු... මගේ දෙමවුපියෝ , ෆ්‍රෙඩ්, මැරුණ පනස් දෙනා... මේ මාව ජීවත් කරවන්න ?කොහොමද ඒක? මේ ඔක්කොම හානි.....ඒක මගේ වැරැද්ද....

Ginny :- එයාලා මැරුනේ වොල්ඩමෝට් අතින්නේ....

Harry :- නමුත් මම ඔහුව ඉක්මනින් නතර කළා නම්?ඒ ලේ ඔක්කොම මගේ අතේ ගෑවිලා තියෙන්නෙ.දැන් ඒ වගේම මගේ පුතාවත් අරගෙන ගිහිල්ලා...

Ginny :- එයා මැරිලා නෑ..ඔයාට මාව ඇහෙනවද හැරී ?එයා මැරිලා නෑ ...

ඇය හැරීව ඇගේ දෙඅත් තුරුලට ගත්තාය.ඔවුන් දෙදෙනා අතර දුකින් පිරුණු ලොකු නිහැඬියාවක් විය.

Harry :- ජීවත් වූ දරුවා වෙනුවෙන් කොච්චර මිනිස්සු මැරෙන්න ඕනෙද....ජීවත් වුණු දරුවා වෙනුවෙන්....

හැරී මද වේලාවක් අවිශ්වාසයෙන් දෙපසට වැනෙමින් සිට පසුව ඔහුගේ දෑසට බ්ලැන්කට්ටුව හසුවිය.ඔහු එය වෙතට පිය නැගීය.

ඔයා දන්නවනේ මේ බ්ලැන්කට්ටුව විතරයි එදා හැලොවින් සැදෑවෙන් මට ඉතුරු උනේ. මේක විතරයි මට එයාලව මතක් වෙන්න මං ළඟ තියෙන එකම දේ.ඒත්...

ඔහු බ්ලැන්කට්ටුවඅතට ගත්තේය.එය පළුදු වී හිල් සෑදී ඇති බව ඔහු සොයා ගත්තේය.ඔහු එය දෙස බියෙන් ත්‍රස්තව බලා සිටියේය.

මේකෙ හිල් හැදිලා...රොන්ගේ මෝඩ ආදර වශයෙන් ඒක පුච්චගෙන ගිහිල්ලා. හරියටම ඒක හරහා ගිහිල්ලා.මේ බලන්නකෝ ඒක විනාශ කරලා....

ඔහු බ්ලැන්කට්ටුව දිග හැරියේය.ඔහු පිලිස්සුණු තැන්වලින් යම් ලියූ දෙයක් දුටුවේය. ඔහු පුදුම විය.

මොකක්ද !

Ginny :- හැරී මේ මොනවහරි ලියපු දෙයක් තියෙනවා

වේදිකාවේ තවත් පසෙකින් ඇල්බස් සහ ස්කෝපියස් මැවී පෙනෙන්නට විය.(මේක වේදිකා නාට්‍ය පිටපතක්නේ.ඒකයි මේ වේදිකාවක් ගැන කියන්නෙ හොඳේ.නිකන් හැරීට මැවිලා පේනවා කියලා හිතාගන්න.)

Albus :- තාත්තෙ..

Scorpius :- අපි පටන් ගන්නෙ තාත්තේ කියලද?

Albus :- ඉතින් එතකොට එයා දන්නවා ඒක මගෙන් කියලා

Scorpius :- එයාගේ නම හැරී අපි හැරී කියලා පටන් ගන්න ඕනේ .

Albus :- (දැඩි ලෙස) අපි පටන් ගන්න ඕන තාත්තේ කියලා

Harry :- තාත්තෙ...ඒකෙන් කියන්නේ තාත්තෙ කියලද ?

Scorpius :- තාත්තෙ...උදව්...

Ginny :- "හෙලෝ... "ඒකෙන් කියවෙන්නේ හෙලෝ.ඊට පස්සේ හොඳයි.

Harry :- "හලෝ තාත්තෙ..හලෝ හොඳයි...හලෝ හොඳයි..."නෑ ඕක අමුතු විහිලුවක්...

Albus :- "තාත්තෙ...උදව්...ගොඩ්‍රික්ස් හොලෝ..."

Ginny :- ඔයා මට ඒක දෙන්න.මගේ ඇස් පෙනීම ඔයාට වඩා හොඳයි.ඔව්" තාත්තෙ හෙලෝ හොඳයි..."ඒක හෙලෝ නෙමේ..ඒක හැලෝ හරි හොලෝ හරි. ඊට පස්සේ අංක ටිකක් " 3..1...1..9...8..1.."මේක මගල් ටෙලිෆෝන් අංකයක් ද ?නැත්නම් ජාල යොමුවක් හරි දෙයක් ද ?

හැරී උඩ බැලුවේය.එක්වරම අකුණු ගසන්නාක් මෙන් අදහස් ගණනාවක් ඔහුගේ ඔලුවට එන්නට විය.

Harry :- නෑ ඒක දිනයක් ඔක්තෝම්බර් 31 / 1981.මගේ දෙමව්පියන්ව මරපු දවස.

ජිනී හැරී දෙස බලයි.නැවත බ්ලැන්කට්ටුව දෙස බලයි.

Ginny :- ඒකෙන් 'හෙලෝ' කියලා කියන්නේ නෑ.ඒකෙන් කියන්නේ උදව් කියලා...

Harry :- "තාත්තේ උදව් කරන්න.ගොඩ්‍රික්ස් හොලෝ 31/1981"ඒක පණිවිඩයක්.දක්ෂ ළමයා පණිවිඩයක් තියලා ගිහිල්ලා.

හැරී ජිනීව තදින් සිප ගත්තේය.

Ginny :- ඇල්බස් ද මේක ලියලා තියෙන්නේ ?

Harry :- එයා මට කියලා එයාලා කවදා , කොහේද ඉන්නේ කියලා.

ඔහු නැවතත් ඇයව තදින් සිප ගත්තේය .

Ginny :- අපිට තවම එයාලව හම්බෙලා නෑනෙ..

Harry :- මම බකමූණෙක් යවනවා හර්මයිනිට.ඔයා යවන්න තව එකෙක් ඩ්‍රැකෝට.එයාලට කියන්න අපිව ගොඩ්‍රික්ස් වලදි හමුවෙන්න කියලා.කාල යන්ත්‍රයත් එක්ක.

Ginny :- ඒ වගේම "අපි" හරිද? හැරී,මම නැතුව අතීතයට යන්න හිතන්නවත් එපා...

Harry :- ඔව් ඇත්තෙන්ම.ඔයත් එනවා.අපිට අවස්ථාවක් තියෙනවා ජිනි.ඩම්බල්ඩෝට පින් සිද්ද වෙන්න.අපිට ඕන වුණේ එකම එක අවස්ථාවක්.

🟤4වන ජවනිකාව , 7වන දර්ශනය

🏘️ගොඩ්‍රික්ස් හොලෝ🏘️

වර්තමානයේ රොන් , හර්මයිනි ,ඩ්‍රැකෝ ,හැරී සහ ජිනී ගොඩ්‍රික්ස් හොලෝ හරහා ඇවිද යන්නට විය.එය කාර්යබහුල වෙළඳ නගරයක් විය.(අවුරුදු ගාණක් පුරා එය පැතිරී විශාල වී ඇත..)

Hermione :- ගොඩ්‍රික්ස් හොලෝ... අවුරුදු විස්සක් විතර මයෙ හිතේ...

Ginny :- මේ මම විතරද?නැත්නම් මගල්ස්ලා ගැන තවත්...

Hermione :- ඒක නිකන් සතිඅන්ත නිවාඩුවක් වගේ ප්‍රසිද්ධයි.

Draco :- මට පේනවා ඇයි ?..පිදුරු හෙවිල්ලපු වහලවල් දිහා බලන්න.ඒ ගොවි වෙළෙඳ පොළක්ද ?

හැරීම හොයමින් වටපිට බල බල සිටි හර්මයිනි ඔහුට ළං විය.ඔහු දැක තිබූ දේවල් සියල්ල වියැකී ගොස් ඇත.

Hermione :- ඔයාට මතකද අන්තිමට අපි මෙහේ හිටපු කාලේ??මේක හරියට ඒ පරණ කාලේ වගේ.

Ron :- පරණ අනාරාධිත පෝනිටේල් කිහිප දෙනෙකුත් එකතු වෙච්ච පරණ කාලයක්..

Draco :- මට කියන්න පුළුවන්ද...?

Ron :- මැල්ෆෝයි ,ඔයා හැරී එක්ක චූන් දානවා ඇති,ඔයා ලස්සන ලමයෙක් බිහි කරන්න ඇති ,නමුත් ඔයා මගේ බිරිඳටයි අනිත් දේවල් වලටයි ඉතා සාධාරණ දේවල් කිව්වා.

Hermione :- ඒ වගේම ඔයාගේ බිරිඳට ඇය වෙනුවෙන් යුද්ධයේදි සටන් කරන්න ඕනේකමක් තිබ්බෙත් නෑ.

හර්මයිනි මැලවුණු මුහුණින් රොන් දෙස බැලීය.ඇයගේ බැල්ම රොන් වහා හැදුනා ගත්තේය.

Ron :- හොඳයි හැබැයි ඔය මම ගැන හරි ඇය ගැන හරි එක දෙයක් කිව්වොත්..

Draco :- ඔයා මොනව කරන්නද වීස්ලි?

Hermione :- එයා ඔයාව බදාගනී.මොකද අපි ඔක්කොම දැන් එකම කණ්ඩායමේ.? එහෙම නේද රොන් ?

Ron :- (ඇගේ නොසැලෙන බැල්ම හමුවේ හැකිලෙමින් )හොඳයි මම හිතන්නේ ඔයාට ලස්සන කොණ්ඩයක් තියෙනවා ඩ්‍රැකෝ...

Hermione :- ස්තූතියි මගේ ස්වාමියාණෙනි.දැන් ජේන විදියට හොඳ වෙලාවක් වගේ.අපි මේක කරමු

ඩ්‍රැකෝ කාල යන්ත්‍රය එළියට ගත්තේය. එය කැරකැවෙන්න පටන් ගත්තා.සියලු දෙනා එය වටා සිටගත්හ.

එවෙලේ විශාල ආලෝක ධාරාවක් සමග විශාල ශබ්දයක් ඇතිවිය.

කාලය නැවතුණි.ඒ වගේම පසුව එය හැරෙන්නට විය.සෙමින්...පසුපසට...සෙමින්... යාමට පටන්ගනී.පළමුව සෙමින්...පසුව වේගවත් විය.

ඔවුන් සියලුදෙනා ඔවුනොවුන් දෙස බලයි.

Ron :- ඉතින්? ඒක වැඩ කලාද ?

4වන ජවනිකාව , 8වන දර්ශනය

ගොඩ්‍රික්ස් හොලෝ , ගෙපැල , 9181

මුලින්ම ජිනී පසුව හැරීව දුටු පුදුම වූ දෑසින් යුතුව ඇල්බස් බලා සිටියි.පසුව ඔහුට කණ්ඩායමේ ඉතිරි පිරිස පෙනෙන්නට.(රොන් , ඩ්‍රැකෝ සහ හර්මයිනි )

Albus :- අම්මේ ?

Harry :- ඇල්බස් සෙවරස් පොටර් ,අපිට අවසරයිද ඔයාව දකින්න ?

ඇල්බස් ජිනීගේ දෙඅත් තුරුලට දිව ගියේය.ජිනී ඉතා සතුටින් ඔහුව පිළිගත්තේ ය.

Albus :- ඔයාට අපේ පණිවිඩය ලැබුණද?

Ginny :- අපිට ඔයාලගේ පණිවිඩය ලැබුණා.

ස්කෝපියස් පියා වෙත දිව ගියේය.

Draco :- අපිටත් බදාගන්න පුලුවන් ඔයා කැමතිනම්....

ස්කෝපියස් ඔහුගේ පියා දෙස අවිශ්වාසයෙන් යුතුව බැලුවේය.පසුව ඔවුන් තිදෙනා අමුතු ආකාරයට තරමක් අකමැත්තෙන් මෙන් කෙටි වැලද ගැනීමක් කළේය.ඩ්‍රැකෝ සිනාසෙයි.

Ron :- දැන් කොහෙද ඩෙල්ෆි ?

Scorpius :- ඔයා ඩෙල්ෆි ගැන දන්නවද ?

Albus :- ඇය මෙහෙ.අපි හිතන්නේ ඇය ඔයාව මරන්න හදන්නේ.වොල්ඩමෝට්ට ශාපය වදින්න කලින් එයා ගිහින් ඔයාව මරලා අනාවැකිය බොරු කරලා....

Hermione :- ඔව් අපිත් හිතුවා එහෙම වෙන්න ඇති කියලා..ඔයා දන්නවද හරියටම එයා කොහෙද ඉන්නේ කියලා දැන් ?

Scorpius :- ඇය අතුරුදහන් වෙලා.ඔයාලා කොහොමද...ඔයාලා කොහොමද කාල යන්ත්‍රයක් නැතුව ?

Harry :- (බාධා කරමින්) ඒක ගොඩක් දිග සංකීර්ණ කතාවක් ස්කෝපියස් .ඒ වගේම අපිට ඒකට කාලයක් නෑ ...

ඩ්‍රැකෝ සතුටින් සිනාවෙමින් හැරී දෙස බැලුවේය.

Hermione :- හැරී නිවැරදියි. කාලය ගොඩක් වටිනවා.අපි කට්ටියව නියමිත තැන්වල තියන්න ඕනේ.දැන් ගොඩ්‍රික්ස් හොලෝ එච්චර ලොකු ප්‍රදේශයක් නෙමෙයි.නමුත් ඈ කොහේ හරි පැත්තකින් එන්න පුළුවන්. ඉතින් අපිට නගරය හොඳට පේන තැනක් ඕන වෙනවා.හොඳට දේවල් පේන තැනක් වගේම වැදගත්ම දේ අපිව හොඳින් සගවලා තියන්න ඕන.මොකද අපිව දැකලා මේක අනතුරේ දාගන්න බෑ.

සියලු දෙනාම සිතමින් බැම අකුලයි.

මම කැමැතියි කියන්න ශාන්ත ජෙරමියස්ගේ පල්ලිය කිව්ව ඔක්කොටම හොඳයි වගේ, එහෙම නැද්ද ?

4වන ජවනිකාව , 9වන දර්ශනය

ගොඩ්‍රික්ස් හොලෝ , ශාන්ත ජෙරමියස්ගේ පල්ලිය , සිද්ධස්ථානය , 1981

ඇල්බස් ආසන පෙළක් ඇති බංකුවක නිදාසිටියි.ජිනි ඔහුව පරිස්සමින් බලාගනියි.හැරී එය අසල වූ කවුළුවෙන් පිටත බලා සිටියි.

Harry :- නෑ.....මුකුත් නෑ....ඇයි ඈය මෙතැන නැත්තෙ ?

Ginny :- අපි එකට , ඔයාගේ අම්මයි තාත්තයි ජීවතුන් අතර. අපිට කාලය වෙනස් කරන්න පුළුවන්.හැරී අපිට ඒක ඉක්මන් කරන්න බැහැ..ඇය සූදානම් උනාම ඇය ඒවි. ඒ වගේම අපි අය වෙනුවෙන් සූදානම් වෙලා ඉමු.

ඇය ඇල්බස් නිදන අයුරු බලා සිටියි.

නැත්නම් අපෙන් සමහර අය..

Harry :- අසරණ දරුවා හිතන්න ඇති එයා ලෝකය බේරගන්න ඕන කියලා.

Ginny :- අසරණ දරුවා ලෝකය බේරගත්තා.අර බ්ලැන්කට්ටුවේ අදහස නම් නියමයි. මම කියන්නේ එයා දැනටමත් ලෝකයේ විනාශකරලා.නමුත් හොඳම දේ තමා අපි ඒ ගැන නොහිතා ඉන්නේ.

Harry :- ඔයා හිතන්නේ එයා හොඳින් කියලද?

Ginny :- එයා එතනට ඒවි.ඒකට ටික කාලයක් යාවි.ඒ වගේම ඔයාටත් ටික කාලයක් යාව.

හැරී සිනාසෙයි. ඇය නැවත ඇල්බස් දෙස බලය.හැරී ද ඔහු දෙස බලයි.

ඔයා දන්නවද , මම රහස් කුටිය ඇරියාම , වොල්ඩමෝට් අර භයානක දිනපොතෙන් මාව මෝහනය කළාට පස්සේ මම සෑම දෙයක්ම විනාශ කරලා දාන්න තිබ්බා.

Harry :- මට මතකයි.

Ginny :- මම රෝහලෙන් ආවට පස්සේ සියලු දෙනාම මාව ප්‍රතික්ෂේප කළා.මට කතා කරන්න දුන්නේ නෑ.ඒ විතරක් නෙමේ හැම දෙයක්ම තිබ්බ ළමයා ග්‍රිෆින්ඩෝර් කාමරය මැද්දෙන් ඇවිත් ස්නැප් පුපුරවන සෙල්ලම කරන්න එන්න කියලා අභියෝග කලා. මිනිස්සු හිතන්නේ එයාලා ඔයාගේ හැම දෙයක් ගැනම දන්නවා කියලා නමුත් ඔයාගේ හොඳම දේවල් ටික තියෙන්නේ සැඟවිච්ච පාරක.මගේ කාරණාව තමා මේක ඉවර වුණාට පස්සෙවත් මතක තියාගන්න ස්නැප් පුපුරවන සෙල්ලම කරන්න තව කෙනෙක්ව ඕනේ කියලා.

Harry :- ඔයා හිතන්නෙ දැන් මෙතනට අඩු වෙලා තියෙන දේ ස්නැප් පුපුරවන එක කියලද ?

Ginny :- මට එදා ඔයා ගැන ආදරේ හිතුනා වගේ ඇල්බස්ට එහෙම හිතුනා කියලා මට විශ්වාස නෑ.

Harry :- මම එයා වෙනුවෙන් ඕනෙම ඕනෑම දෙයක් කරනවා.

Ginny :- හැරී ඔයා ඕනම කෙනෙක් වෙනුවෙන් ඕනෙම දෙයක් කරාවි.ඔයා ගොඩක් කැමති ලෝකය වෙනුවෙන් ඔයාගේ ජීවිතය පරිත්‍යාග කරන්න.එයාට ඕන විශේෂ ආදරයක හැඟීමක්.ඒකෙන් එයාව වඩාත් ශක්තිමත් කරනවා වගේම ඔයාවත් වඩාත් ශක්තිමත් කරාවි.

Harry :- ඔයා දන්නවනේ , ඇල්බස් ගිහින් කියලා අපි හිතනකම්ම තමයි මට තේරුණේ මගේ අම්මා මම වෙනුවෙන් මොනවද කරන්න තිබ්බෙ කියලා.ගොඩක් බලපත් ප්‍රති මායාකර්මයක්.ඒකෙන් මරණීය ශාපය නැවත හැරවීමක් කරන්න පුළුවන්කම තියෙන එකක්.

Ginny :- ඒ වගේම වොල්ඩමෝට්ට තේරුම්ගන්න බැරිවුන එකම මන්තරය , ආදරය.

Harry :- මමත් එයාට විශේෂයෙන් ආදරෙයි ජිනී.

Ginny :- මම දන්නවා නමුත් ඒක එයාට දැනගන්න ඕන.

Harry :- මම හරි වාසනාවන්තයි ඔයාව ලැබෙන තරම් ,මම එහෙම නැද්ද ?

Ginny :- ඇත්තෙන්ම.ඒ වගේම මම කැමැතියි ඉස්සර කාලෙක කොහොම වාසනාවන්ත වුණා ද කියලා.කතාබහ කරන්න.නමුත් දැනට ඩෙල්ෆිව නවත්තන විදිය ගැන අවධානයෙන් ඉමු.

Harry :- අපේ වෙලාව ඉවර වේගෙන යන්නේ

ජිනීට සිතිවිල්ලක් පහලවිය.

Ginny :- හැරී කාටවත් හිතුනද ඇයි ඇය දැන් ,අද දවසම...තෝරාගත්තේ කියලා?

Harry :-මොකද අද දවස තමා හැමදේම වෙනස් වෙච්ච දවස...

Ginny :- දැන් ඔයා අවුරුද්දක් පිරුණු කෙනෙක්... මම හරි නේද ?

Harry :- අවුරුද්දයි මාස 3යි.

Ginny :- ඒ අවුරුද්දයි මාස 3දී ඔයාව මරන්න පුළුවන්කම තිබ්බනේ එයාට.දැනට වුණත් ඇය පැය විසි හතරක් විතර ගොඩ්‍රික්ස් හොලෝ වල ඉඳලා තියෙනවා.එයා මොකටද බලන් ඉන්නෙ?

Harry :- මට තවමත් සම්පූර්ණයෙන් ..?

Ginny :- මොකද හිතන්නේ එයා බලාගෙන ඉන්නේ ඔයා වෙනුවෙන් නෙමේ නම් ,එයා බලන් ඉන්නේ ඔහු වෙනුවෙන් නම්...එයාව නවත්වන්න නම්...

Harry :- මොකක්?

Ginny ::- ඩෙල්ෆි අද රාත්‍රියම තෝරගත්තෙ මොකද එයා මෙතනට එන නිසා.මොකද එයාගේ තාත්තා එන නිසා.එයට ඔහුව හමුවෙන්නයි ඕන.ඇය ආදරය කරන තාත්තා එක්ක ඉන්න.වොල්ඩමෝට්ගෙ ප්‍රශ්න පටන් ගත්තේ ඔයාට පහර දුන්නට පස්සේ.එයා ඒක නොකලොත්...

Harry :- එයා තවත් බලසම්පන්න විය.අඳුර තවත් අඳුරු බවට පත්වේවි.

Ginny :- අනාවැකිය නිෂ්ඵල කරන්නහොඳම විදිය හැරී පොටර්ව මරණ එක නෙමේ. හොඳම දේ තමයි කිසිම වොල්ඩමෝට්ට කිසිම කරදරයක් නොකර ඉන්න ඉඩ දෙන එක.

---

4වන ජවනිකාව ,10වන දර්ශනය

ගොඩ්‍රික්ස් හොලෝ,ශාන්ත ජෙරමියස් පල්ලිය ,1981

කණ්ඩායම දෙගිඩියාවෙන් නැවත එකතු විය.

Ron :- මට එක හරියට කියන්න.දැන් අපි සටන් කරන්නෙ වොල්ඩමෝට්ව ආරක්ෂා කරන්නද?

Albus :- වොල්ඩමෝට් මගේ ආච්චි සීයා මරලා දානවා.වොල්ඩමෝට් මගේ තාත්තව මරන්න උත්සහ කරනවා.?

Hermione :- ඇත්තෙන්ම ජිනී .ඩෙල්ෆි හදන්නේ හැරීව මරන්න නෙමේ.එයා හදන්නේ වොල්ඩමෝට් හැරීව මරන්න උත්සාහ කරන එකෙන් එයාව වළක්වන්න.විශිෂ්ටයි.

Draco :- ඉතින්...අපි බලන් ඉන්නවද?වොල්ඩමෝට් පේන්න එනකන්?

Albus :- ඇය දන්නවද එයා කොයි වෙලාවටද එන්නෙ කියලා?එයා එන්නේ මොන වෙලාවටද? මොන පාරෙන්ද කියලා දන්නවනම් ඇය පැය විසි හතරකට කලින් ඇවිත් ඉන්නෙ නැනෙ?මම වැරදිනම් අතීත ග්‍රන්ථ මාව නිවැරදි කරයි.ස්කෝපියස් එයා ගොඩ්‍රික්ස් හොලෝ වලට කොයි වෙලාවෙ කොහෙන් ආවද කියලා මොකුත් නැනෙ.

Scorpius and Hermione :- ඔයා වැරදි නැහැ.

Ron :- පුදුමයි ! දැන් ඒක වගේ දෙන්නෙක්ම ඉන්නවා.

Draco :- ඉතින් ඒක කොහොමද අපි ප්‍රයෝජනයට ගන්නේ ?

Albus :- ඔයා දන්නවද මම මොනවටද ඇත්තටම දක්ෂ කියලා ?

Harry :- ඔයා ගොඩක් දේවල් වලට දක්ෂයිනෙ ඇල්බස් .

Albus :- පොලි ජූස් හදන්.මම හිතනවා ඇති බැතිල්ඩා බැග්ශොට්ගේ පහත මාලයේ පොලි ජූස් හදන්න ඕන හැම දෙයක්ම තියේවි කියල.අපිට පුළුවන් පොලි ජූස් වලින් වොල්ඩමෝට්ව හදලා ඩෙල්ෆි ඉස්සරහට එයාව ගේන්න.

Ron :- පොලි ජූස් හදන්න ඔයාට අදාල කෙනාගෙන් පොඩි හරි දෙයක් ඕනේ.අපිට වොල්ඩමෝට්ගෙන් පොඩි හරි කෑල්ලක් නැනෙ...

Hermione :- නමුත් මම අදහසට කැමතියි.බළලා අල්ලගන්න මීයෙක්ව දාන එක.

Harry :- අපි කොහොමද වෙස් මාරුව හොඳට කරන්නේ.?

Hermione :- අපි දන්නවා එයා කොයි වගේද කියලා.අපි ළඟ මෙතන ඉන්නවා අතිදක්ෂ මායාකාරයෝ , මායාකාරියෝයි.

Ginny :- ඔයාට ඕනෙද වොල්ඩමෝට් වගේ වෙස් මාරු කරගන්න.

Albus :- එක තමයි එකම විදිහ.

Hermione :- ඒක තමයි.එහෙම නේද ?

රොන් නිර්භීතව ඉදිරියට පැමිණියේය.

Ron:- එහෙනම් මම කැමතියි. මම හිතනවා එයා වෙන්න ඕන මම කියලා මම කියන්නේ මට වොල්ඩමෝට් වගේ හරියටම වෙන්න බැහ.නමුත් මගේ දස්කම් ගැන නොහිතා ඉන්න බැහැනේ..ජේන විදිහට මම තමයි මෙතනින් වැඩියෙන්ම කූල් එකේ ඉන්න කෙනා.. ඉතින් වොල්ඩමෝට් බවට හැරෙන එක....අඳුර අධිපතියා බවට පත්වෙන එක ඔයාලට බලපෑමක් කරනවට වඩා අඩුවෙන් මට බලපාවි.

හැරී හිත හිත අඩි තබමින් ඉවතට ඇවිද යයි.

Hermione :- ඔයා කාවද ඉතින් හොදටම හඳුන්වන්නේ?

DrAco :- මමත් කැමතියි ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වෙන්න.මම හිතන්නේ වොල්ඩමෝට් වීම අපරාධයක් නෙමෙයි යථාර්තයක.රොනුයි අඳුරු මායා දැනුමයි..තව...

Hermione :- ඒ වගේම මමත් කැමති ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන්න.මායා අමාත්‍යවරයා විදිහට මම හිතන්නෙ ඒක මගේ වගකීමක් ,වගේම අයිතියක් .

Scorpius :- මම හිතන්නේ අපි ටිකක් හිතලා බලන්න ඕන.

Draco :- ඔයා එහෙම ඉදිරිපත් වෙන්නේ නෑ ,ස්කෝපියස් .

Albus :- ඇත්තටම...

Ginny :- නෑ කොහෙත්ම නෑ...මම හිතන්නේ ඔයාල ඔක්කොටම පිස්සු.මම දන්නවා ඔයාගේ ඔලුවෙන් වගේ එන කටහඬ තේරුම.මගේ නම් ඒක ආයි වෙන්නෙ නෑ.

Harry :- ඒ වගේම...ඒ මම වෙන්න ඕන.

සැවොම හැරී දෙසට හැරුනි ?

Draco :- මොකක්ද ?

Harry :- උපාය වැඩ කරන්න නම් ඇය මේ ඉන්නේ වොල්ඩමෝට් කියලා විශ්වාස කරන්න ඕන.එයා පාසල්ටන්ග් භාෂාව පාවිච්චි කරාවි.මම දැනගෙන හිටියා මට ඒ හැකියාව ඇයි තාමත් තියෙන්නෙ කියලා.ඔක්කොටම වඩා මම දන්නවා එයා වගේ හඟවන්නේ කොහොමද කියලා.ඒ නිසා ඒ මම වෙන්න ඕන.

Ron :- මගුල තමා...ලස්සනට තියේවි... මොන වැඩක් ද ,, කොහෙත්ම විදිහක් නෑ ඔයාට .

Hermione :- මට බය ඔයා හරි කියලා මගේ පරණ යාළුවා.

Ron :- හර්මයිනි ඔයා වැරදි.වොල්ඩමෝට් කියන්න හැරී නොවිය යුතු දෙයක්.

Ginny :- ඒ වගේම මට බය මගේ සහෝදරයා එක්ක එකඟ නොවෙන්න වෙන එක. නමුත් ,

Ron :- එයා සදහටම වොල්ඩමෝට් වෙලා හිර වෙලා ඉඳීවි.

Hermione :- ඉතින් අපේ වෙන කෙනෙක්ට පුළුවන්ද? ඔයාගේ කාරණා ඇත්ත තමයි. නමුත් ,

Harry :- ඉන්න හර්මයිනි , ජිනී...

ජිනී සහ හැරීගෙ නෙත් එකිනෙක ගැටුණි.

ඔයාට ඕනෙ නැත්නම් මම ඒක කරන්නේ නැහැ.නමුත් මට හැගෙන විදියට ඒක තමයි එකම මාර්ගය.මම වැරදිද ?

ජිනී මද වේලාවක් කල්පනාකර සෙමින් හිස සැලුවා.හැරීගේ මුහුන පිරිපුන් විය.

Ginny :- ඔයා හරි

Harry :- එහෙනම් අපි මේක කරමු

Draco :- ඔයා එන්න ඕන පාර ගැන අපි සාකච්ඡා කරන්න ඕනේ නැද්ද ?

Harry :- ඇය ඔහු එනකන්නේ බලාගෙන ඉන්නෙ.ඇය මා ගාවට ඒවි.

Draco :- ඉතිං ඊට පස්සේ එයා ඔයත් එක්ක ඉන්නකොට,මම ඔයාට මතක් කරන්න ඕනෙද නෑ එයා ගොඩක් බලවත් මායාකාරියක් කියලා.

Ron:- සරලයි.මෙයා ඇයව මෙතනට ගේනවා.අපි වටකරලා පහර දෙනවා.

Draco :- පහර දෙනවා ?

හර්මයිනි කාමරේ පුරා බලයි.

Hermione :- අපි මේ දොරවල් පිටිපස්සේ හැංගෙමු.ඔයාට පුලුවන්නං ඒයාව මෙතනට ගේන්න හැරී (බිත්තියේ වූ රෝස පාට ජනේලයක් හරහා ආලෝක ධාරාවක් බිමට පතිත වූ ස්ථානයක් පෙන්වමින්) පස්සේ අපි එකපාරම එලියට පනිමු එයාට පැනගන්න ඉඩක් තියන්නේ නැතිව.

Ron :- (ඩ්‍රැකෝ දෙසට බැල්මක් හෙලමින්) පස්සේ අපි එයාට පහර දෙමු.

Hermione :- හැරී අන්තිම පාරට අහන්නේ..ඔයාට මේක කරන්න පුලුවන්ද

Harry :- ඔව් මට පුලුවන්.

Draco :- නෑ මොකද මෙතන ගොඩක් අවුල් යන්න පුළුවන් දේවල් තියනවා.වෙස්මාරුවෙන් නවත්තන්න බැරි දේවල් තියෙනවා.ඇයට ඒක හරහා පවා

දකින්න පුළුවන් දේවල් තියෙනවා.බැරිවෙලාවත් ඇය අපෙන් පැනලා ගියොත්.. ආයි කතා දෙකක් නෑනේ එයාගෙන් වෙන හානිය ගැන.අපි ටක්කෙටම උපාය හරිගස්සන්න ඕනේ...

Albus :- ඩ්‍රැකෝ මගේ තාත්තාව විශ්වාස කරන්න.එයා අපිව කනස්සල්ලට පත් කරන්නැහැ.හැරී ඇල්බස් දෙස බලා ඉවතට යයි.

Hermione :- මායා යෂ්ටි...

සියලුදෙනාම තමන්ගේ යෂ්ටි දිගු කළහ. හැරී ඔහුගේ එකද එකතු කළේය.යෂ්ටි කොන්වලින් ආලෝකයක් විහිදුණි.

වෙස් මාරුව සෙමින් වන භයානක එකක් විය.

ඒ වගේම වොල්ඩමෝට්ව හැරීගෙන් මැවී පෙනෙන්නට විය.

ඒ බිහිසුණු විය.

ඔහුගේ වෙස් මාරු විය.

ඔහු ඔහුගේ පවුල සහ යහළුවන් දෙස බැලීය.

ඔවුන් පෙරලා ඔහු දෙස බැලීය.

Ron :- හෙන ගහපන්.

Harry / Voldemort :- ඒක වැඩ කරලා ද එතකොට?

Ginny :- ඔව් වැඩ කරලා.

---

4වන ජවනිකාව ,11වනදර්ශනය

🏠 ගොඩ්‍රික්ස් හොලෝ , ශාන්ත ජෙරමියස්ගේ පල්ලියේ 1981 🏠

රොන් , හර්මයිනි , ඩ්‍රැකෝ ,ස්කෝපියස් සහ ඇල්බස් ජනේලය අසලට වී පිටත බලාගෙන සිටියහ.ජිනීට එලිය නොපෙනුණි.ඇය පසුපසින් හිඳගෙන සිටියි.

ඇල්බස්ට ඔහුගේ මව ඔහු අසලින් හිඳ ගෙන සිටින බවක් දැනුනි..ඔහු ඇය අසලට ඇවිද ගියේය.

Albus :- ඒක හරියාවි ,ඔයා දන්නවද ඒක අම්මේ ?

Ginny :- මම දන්නවා ඒක.නැත්නම් මම හිතනවා මම දන්නවා කියලා.මට එයාව ඒ විදියට දකින්න උවමනාවක් නැමම ආදරේ කළ මනුස්සයා මම වෛර කරන මනුස්සයාගෙන් වැහිල ගිහිල්ලා.

ඇල්බස් ඔහුගේ මවට පසෙකව හිඳගත්තේය.

Albus :- මම එයාට කැමතියි අම්මේ.ඔයා ඒක දන්නවද..?මම ඇයට ඇත්තටම කැමතියි. ඩෙල්ෆිට. ඒ වගේම ඇය වොල්ඩමෝට්ගෙ දුව?

Ginny :- ඒකට තමයි එයාලා දක්ෂ.අහිංසකයන්ව එයාලගේ දැලට අහු කරගන්න.

Albus :- මේ ඔක්කොම මගේ වැරදි.

ජිනී ඇල්බස්ගේ අත ඇය වෙතට ගත්තාය.

Ginny :- කොච්චර විහිලු කතාවක් ද ඒක.ඔයාගේ තාත්තා හිතන්නේ මේ ඔක්කොම එයාගේ වැරදි කියලා.ඔයාලා දෙන්නනම පුදුම ජෝඩුවක් තමයි.

Scorpius :- ඒ ඇය....ඒ ඇය..ඇය ඔහුව දුටුවා.

Hermione :- හැමකෙනාම තමන්ගේ තැන්වලට.ඒ වගේම මතක තියාගන්න.හැරී එයාව ආලෝකය තියෙන තැනට අල්ලගන්නකම් කවුරුවත් එළියට එන්න එපා.අපිට තියෙන්නෙ එකම පහරයි. ඒක අවුල් කරගන්න ඕනෙ නෑ.

සියල්ලෝම වේගයෙන් තමන්ගේ ස්ථාන කරා යන්නට විය.

Draco :- හර්මයිනි ග්‍රේන්ජර් ,මම හර්මයිනි ග්‍රේන්ජර්ගේ අණ යටතේ වැඩ කරනවා.(ඇය ඔහු දෙසට හැරුණි.ඔහු සිනාසෙයි.)ඒ වගේම මම කිසි කරදරයක් නැතිව ඒක රසවිඳිනවා.

Scorpius :- තාත්තෙ...

ඔවුන් විසිර ගියහ.ඔවුන් ප්‍රධාන දොරවල් දෙක පසුපස හැංගුණි.

හැරී / වොල්ඩමෝට් පල්ලිය තුළට ඇතුල්විය.ඔහු අඩි කිහිපයක් ඇවිදගොස් නැවත හැරුණි.

Harry / voldemort :- මාව ලුහුබඳින මොන මායාකාරියක් හරි මායාකාරයෙක් හරි කමක් නෑ.මම පොරොන්දු වෙනවා ,ඔබ ඒකට පසුතැවේවි.

ඩෙල්ෆි ඔහු පසුපසින් පෙනෙන්නට විය.ඇය ඔහුට බල කරන්නට මෙන් විය.මේ ඇයගේ පියාය.ඒ වගේම මේ ඇය මුළු ජීවිත කාලයම බලා සිටි මොහොත විය.

Delphi :- වොල්ඩමෝට් උතුමාණෙනි,මේ මම.මමයි ඔබව ලුහුබැන්දේ.

Harry / voldemort :-මම ඔබව හඳුනන්නේ නෑ.යනවා යන්න

ඇය ගැඹුරින් හුස්මක් ගත්තාය.

Delphi :- මම ඔබගේ දියණියය.

Harry / voldemort :-ඔයා මගේ දුව නම් මම දැනගෙන ඉන්න ඕන.

ඩෙල්ෆි ඔහු දෙස ආයාචනාත්මක ලෙස බලා සිටියාය.

Delphi :- මම ආවේ අනාගතයේ ඉඳල. ඔබගෙයි බෙලට්‍රික්ස් ලෙස්ට්‍රැන්ගෙයි දරුවා.මම ඉපදුනේ මැල්ෆෝයි බංගලාවේ හොග්වර්ට්ස් සටනට කලින.ඔබ පරදින්න ඉන්න සටන. මම ආවෙ ඔබව බේරගන්න.

හැරී/වොල්ඩමෝට් හැරුණි.ඇයට ඔහුගේ දෙනෙත් හසුවිණි.

ඒ රුඩෝල්ෆ් ලෙස්ට්‍රැන්ග්,බෙලාට්‍රික්ස්ගේ පක්ශපාති ස්වාමියා,ඔහු ඇස්කබාන් වලින් නිදහස් වෙලා ඇවිත් මම කවුද කියලා හෙළි කළා. ඒ වගේම මම සැබෑ කලයුතු අනාවැකිය ගැනත් හෙළිකලා. ඔබගේ දියණියයි, ස්වාමීනි.

Harry / voldemort :-මට බෙලට්‍රික්ස්ගේ හැඩහුරුකම් ගැන දන්නවා වගේම ඔබගේ මුහුණේ ඒ ඇතැම් හැඩහුරුකමුත් තියෙනවා. නමුත් ඇයගේ හොඳම දේවල් ඔබට උරුම වෙලා නෑ.නමුත් කරන්න පුළුවන් දෙයක් නැතිව ,

ඩෙල්ෆි ඕනැකමින් පාර්ස්ටංග් භාෂාවෙන් කතාකරන්නට විය.

හැරි/ වොල්ඩමෝට් ලෙස සිනාසෙයි.

එකද ඔයාගේ ඔප්පු කිරීම?

ඩෙල්ෆි කිසිදු ආධාරයක් නොමැතිව අහසට නැගුණි.හැරී / වොල්ඩමෝට් විමතියෙන් මඳක් පසුපසට ගියේය.

Delphi :- මම තමයි ඔබගේ Augurey අඳුරේ අධිපතියාණෙනි.ඒ වගේම මම කැමැතියි මා සතු සියලු දේ ඔබ වෙනුවෙන් වැඩ කරන්න පුදකරන්න

Harry / voldemort :- (හැරී ඔහුගේ විමතිය නොපෙන්වීමට උත්සාහ දරමින්) ඔයා මගෙන් පියාඹන්න ඉගෙනගත්තද ?

Delphi :- මම ඔබ නිර්මාණය කළ අඩිපාර අනුගමනය කරන්න උත්සාහ කළා.

Harry / voldemort :-මගේ තැනට සමාන වෙන කිසිම මායාකාරියක් මායාකාරයෙක් කවදාවත් හමුවෙලා නෑ.

Delphi :- වැරැද්දක් නොකරන්න.මම ඔබට සුදුසු යැයි කියලා නෙමේ කියන්නේ.නමුත් මම මගේ ජීවිතයේ ඔබට ආඩම්බර විය හැකි දරුවෙක් විදියට ඉන්න කැප කරලා තියෙන්නේ.

Harry / voldemort :- (බාධා කරමින්) මට පේනවා ඔබ කවුද කියලා.ඒ වගේම මට පේනවා ඔබට කළහැකි දේ දියණියනි.

ඇය ඔහු දෙස බලයි, (බලාපොරොත්තු සහගතව)

Delphi :- තාත්තේ...

Harry / voldemort :- අපි දෙන්නටම පාවිච්චි කරන්න පුළුවන් බලය.

Delphi :- තාත්තෙ

Harry / voldemort :-මෙහෙට එන්න මේ එළිය යටට එන්න..එතකොට මගේ ලේ වලින් උපන් දේ හොඳට බලාගන්න පුළුවන් වේවි.

Delphi :- ඔයාගේ මෙහෙයුම වැරැද්දක්.හැරී හැරීමට පහර දෙන්න යන එක.ඒක ඔබව විනාශ කරාවි.

හැරී/වොල්ඩමෝට්ගේ අත් හැරීගේ ස්වරූපයට හැරෙන්නට විය.පුදුමයෙන් සහ ත්‍රාසයෙන් ඔහු දෙස බලයි.ක්ෂණිකව ඔහු එය කබා අත්වල සඟවා ගත්තේය.

Harry / voldemort :-ඔහු ළදරුවෙක් විතරයි.

Delphi :- ඔහුට ඔහුගේ මවගේ ආදරේ තියෙනවා.ඔබගේ මන්ත්‍රය නැවත ඔබටම වදීවි. ඔබව විනාශ වෙලා යාවි.ඒ වගේම ඒකෙන් ඔහුව තවත් බල සම්පන්න කරාවි.ඔබව තවත් දුර්වල කරාවි.ඊළඟ අවුරුදු 17 ඔබ පරදින සටන ඔහුට විරුද්ධව කරගෙන යාවි.

හැරී/වොල්ඩමෝට්ගේ හිසකෙස් පැහැ වීමට පටන්ගනී.එය ඔහුට දැනෙන්නට විය.ඔහු එය ආවරණය කිරීමට උත්සාහ දැරුවේය.ඔහු තම කබායේ හිස්වැසුම ඔලුව වැසෙන පරිදි සැකසුවේය.

Harry / voldemort :-එහෙනම් මම පහර නොදිය යුතුයි.ඔබ නිවැරදියි.

Delphi :- තාත්තේ?

හැරී /වොල්ඩමෝට් ලෙස හැකිලෙන්නට විය.ඔහු දැන්වොල්ඩමෝට්ට වඩා හැරි ලෙස ලෙස පෙනෙන්නට විය.ඔහු ඩෙල්ෆිට නොපෙනෙන්නට අනෙක් පසට හැරුණි.

Delphi :- තාත්තේ ?

Harry :- (තවමත් වොල්ඩමෝට් මෙන් කථා කිරීමට උත්සාහ කරමින්) ඔයාගේ අදහස ඉතා කදිම එකක්.සටන නවත්තලා දාමු.ඔබ මට හොඳින් සේවය කළා. මේ එළිය යටට එන්න ඔබව හොඳින් මට බලාගන්න.

ඩෙල්ෆි දොරක් මදක් විවර වී වසා දමන ආකාරය ඩෙල්ෆි දුටුවාය.ඇය වේගයෙන් සිතන්නට විය.ඇයගේ සැකයක් වර්ධනය වන්නට විය.ඇයට කෝපයක් ඇතිවිය.

Delphi :- තාත්තේ..

ඇය නැවත ඔහුගේ මුහුණ දෙස බැලීමට උත්සාහ කරයි.මෙතන මොකක් හරි අවුලක් සිදුවෙමින් තියෙනවා.ඔබ වොල්ඩමෝට් උතුමාණෙන් නෙමේ.

ඩෙල්ෆි ඇගේ අතින් අකුණක් මුදා හැරියාය.හැරී ද එයම කළේය.

Incendio...!

Harry :- Incendio ....!

අකුණු දෙක එකට සට්ටනය වී කාමරය මැද අලංකාර පිපිරුමක් ඇතිවිය.

ඇය අනිත් අතින් ද පුළිඟු කීපයක් දොරවල් දෙකටම එල්ල කලාය.

Delphi :- පොටර්...colloportus...!

කොල්ලෝ දොරවල් දෙස කැළඹුණු සිතින් යුතුව බැලිය.

මොකද? ඔයාගේ යාළුවො ඔයා එක්ක එකතු වෙයි කියලා හිතුවද?

Hermione :- (පසුබිමින්) හැරි... හැරී .....

Ginny :- (පසුබිමින්) ඇය ඔයාගේ පැත්තෙන් දොරවල් සීල් කරලා.

Harry :- ඔයා හිතන්නෙ ඔයා මගේ දුර්වලතා ඉගෙනගෙන කියලද ?

Delphi :- මම එයාට වටින කෙනෙක් වෙන්න ඕන නිසා ඉගෙන ගත්තා.ඕව් මොකද ඔහු තමයි සර්වකාලයටම සුපිරිම මායාකාරයා..ඔහු මං ගැන ආඩම්බර වේවි.Expulso..!

හැරී බිම දිගේ පෙරලී ගොස් පසුපසට වැටුණි.ඔහු උමතුවෙන් පල්ලිය වූ බංකුවක් යටින් දණගාමින් ඇය හා සටන් වදින්නේ කෙසේදැයි බලන්නට විය.

ඔයා මගෙන් ඈතට දණගාන්න යනවද හැරී පොටර්? හැරි පොටර් ,,මායා ලොවේ වීරයා මීයෙක් වගේ රිංගනවා.Wingardium Leviosa...!

බංකුව ඉහල අහසට යන්නට විය.

ප්‍රශ්නය තියෙන්නෙ ඔයාව මරන්න තරම් මගේ වටිනා කාලය නාස්ති කරනවද කියන එක..මොකද පුළුවන් ඉක්මනින් මට මගේ තාත්තව බේරගන්න ඕනේ.ඔයා කරන්න යන විනාශයෙන්..කොහොමද තීරණය කරන්නේ?ඔහ්..මට කම්මැලියි.මම ඔයාව මරනවා.

ඇය බංකුව එකවර තදින් ඔහු වෙත යොමු කලාය.හැරී එතනින් පෙරලී යනවාත් සමඟ බංකුව බිම වැදී සුනුවිසුනු විය.

කිසිදු දැනුම් දීමකින් තොරව එක්වරම පල්ලියේ ගරාදියෙන් ඇල්බස් පෙනී සිටින්නට විය.

Avada....

Albus :- තාත්තෙ...

Harry :- ඇල්බස් එපා..ම්

Delphi :- ආ දෙන්නම නේ?තේරීම්...තේරීම්....මම හිතන්නේ මම මුලින් කොලුවව මැරුවනම් හොඳයි වගේ..Avada Kedavra.!

ඇය මරණීය ශාපයක් එල්ල කලාය.නමුත් හැරී ඇල්බස්ව වෙනතකට තල්ලු කළේය. ශාපය පොළොවේ වැදි නැතිවී ගියේය.

ඇය නැවතත් පුලිගුවක් නිකුත් කලාය.

ඔබ සිතන්නේ ඔබ මට වඩා බලවත් කියලද?

Harry :- නෑ මම එහෙම නෑ...

ඔවුන් අනුකම්පා විරහිතව එකිනෙකාට පුලිඟු යවන විට ඇල්බස් ඉක්මනින් ඉවතට පෙරළී එක් දොරකට සහ තවත් දොරකට මන්ත්‍ර මතුරා යවන ලදි.

නමුත් අපි එහෙමයි.

දොරවල් දෙකම තම යෂ්ඨියෙන් විවර කරන ලදී.

Albus :- Alohomora...!Alohomora...!

Harry :- මම කවදාවත් තනියෙන් සටන් කළේ නෑ , ඔයාට පේනවනේ.ඉස්සරහටත් ඒ වගේමයි.

හර්මයිනි ,රොන් , ජිනී සහ ඩ්‍රැකෝ දොරවල්වලින් ඇතුළට එන්නට විය.බලවත් කෝපයෙන් කෑගසමින් සිටි ඩෙල්ෆි වෙත ඔවුන් මන්ත්‍ර යොමු කරන්නට විය.මේක ගොඩක් අමාරුයි.නමුත් ඇයට සියලු දෙනා සමග සටන් කරන්න බෑ...

ඉතා බිහිසුණු පිපිරීම් සමග ඩෙල්ෆි බිම වැටී පෙරළී ගියාය.

Delphi :- නෑ.....නෑ.....

Hermione :- Brachiabindo...!

ඇය රැහැනකින් බැඳී ගියාක් මෙන් විය.

හැරී ඩෙල්ෆි වෙත පියවර මැන්නේය.ඔහු ඇය වෙතින් ඇස් ඉවතට ගත්තේය.අනෙක් අය පසු පසට වී ඔවුන් දෙස බලා සිටියහ.

Harry :- ඇල්බස් ඔයා හොඳින්ද ?

Albus :- ඔව් තාත්තෙ මම හොඳින්.

හැරී තවමත් ඩෙල්ෆි වෙතින් ඇස් ඉවතට නොගත්තේය.ඔහු තවමත් ඇය කෙරෙහි බියෙන් පසුවිය.

Harry :- ජිනී,එයාට තුවාල වෙලාද?මට දැනගන්න ඕන ඔහු ආරක්ෂිතද කියලා?

Ginny :- එයාට ප්‍රශ්නයක් නෑ.එයා විතරයි ගරාදියෙන් රිංගලා බඩගාලා යන්න තරම් පුංචි ඇඟක් තිබ්බ එකම කෙනා.මම එයාව නවත්තන්න හැදුවා...ඒත්...

Harry :- මට කියන්න ඔහු හොඳින් කියලා.

Albus :- මම පොරොන්දු වෙනවා තාත්තෙ මම හොඳින්.

හැරී බැරෑරුම් ලෙස ඉදිරියට ඇවිද ගියේය.

Harry :- ගොඩක් මිනිස්සු මට රිද්දන්න උත්සාහ කළා.නමුත් මගේ පුතා...!..ඔයා මගේ පුතාට රිද්දනවා කියලා තර්ජනය කළා.

Delphi :- මට ඕන වුණේ මගේ තාත්තව දැනගන්න විතරයි.

එම වදන් හැරීට පුදුමයක් ගෙන දෙන්නට විය.

Harry :- ඔයාට ඔයාගෙ ජීවිතේ නැවත හදන්න බැනේ.ඔයා දිගටම අනාථයෙක් වෙලා ඉදීවි.ඒක ඔයාව අතෑරලා යන්නේ නැනේ..

Delphi :- මට ඔහුව බලන්න ඉඩ දෙන්න.

Harry :- මට බැහැ...මම ඉඩ දෙන්නේ නෑ..

Delphi :- (වේදනාවෙන්) එහෙනම් මාව මරලා දානවා ..

හැරී මොහොතක් කල්පනා කර ..

Harry :- මට ඒක කරන්නත් බැහැ.

Albus :- මොකක්? තාත්තෙ ඇය භයානකයි

Harry :- නැහැ ඇල්බස්

Albus :- නමුත් ඇය මිනීමරුවෙක්.මම ඇය මිනී මරනවා දැක්කා.

හැරී තම පුතු වෙත හැරී බලා නැවත ජිනී දෙස බැලුවාය.

Harry :- ඔව් ඇල්බස් ඇය මිනීමරුවෙක් තමා තමා...නමුත් අපි එහෙම නෑ.

Hermione :- අපි ඔවුන්ට වඩා යහපත් වෙන්න ඕනේ.

Ron :- ඇත්තෙන්ම ඒක වදයක් නම් තමා.. නමුත් අපි ඒක තමයි ඉගෙන ගත්තේ...

Delphi :- මගේ මනස ගන්න...මගේ මතකය ගන්න....මම කවුද කියලා මට අමතක කරවන්න...

Ron :- අපි ඔයාව අපේ කාලයට අරගෙන යනවා.

Hermione :- ඒ වගේම ඔයා ඇස්කබාන් යාවි.හරියට ඔයාගේ අම්මා වගේ.

Draco :- එහිදී තමා ඔයා කුණු වෙන්නේ...

හැරීට යම් ශබ්දයක් ඇසුණි.යම් පිඹින ශබ්දයක්.

පසුව මරණයේ හඬක් වැනි හඬක් ,වෙන කිසිම දාක නොඇසුනු ආකාරය හඬක් ඇසුණි.

හැරී පොටර්....හැරි පොටර්....

Scorpius :- මොකක්ද ඒ ?

Harry :- නෑ....නෑ...දැන්ම නොවේ.

Albus :- මොකක්ද ?

Ron :- වොල්ඩමෝට්

Delphi :- තාත්තා?

Hermione :- දැන් මෙතන ?

Delphi :- තාත්තා !!!

Draco :- Silencio..!(ඩෙල්ෆි ගොළු විය.)wingardium leviosa (ඇය ඉහලට එසවී යන්නට විය.)

Harry :- ඔහු එනවා...ඔහු දැන් එනවා..

voldemortවොල්ඩමෝට් වේදිකාවේ අනෙක් පසින් මතුවන්නට විය.(මේක වේදිකා නාට්‍යයක් හොඳේ.මතකයිනෙ.)ඔහු එය හරහා ගමන් කර ශාලාව හරහා ගමන් කරන්නට විය.ඔහු සමඟ මරණය රැගෙන යන බව එහි සිටි කවුරුත් දැන සිටියහ....

4වන ජවනිකාව, 12වන දර්ශනය

🏘 ගොඩ්‍රික්ස් හොලෝ , 1981 🏘

හැරී අසරණ කමින් යුතුව වොල්ඩමෝට් දෙස බලයි.

Harry :- වොල්ඩමෝට් මගේ අම්මවයි තාත්තවයි මරන්න යනවා.මට කරන්න පුළුවන් කිසිම දෙයක් නෑ.

Draco :- ඒක ඇත්ත නෙමේ.

Scorpius :- තාත්තෙ දැන් ඒකට වෙලාව නෙමෙයි.

Albus :- ඔයාට කරන්න පුළුවන් දෙයක් තියෙව් එයාව නවත්තන්න.නමුත් ඔබ ඒක නොකරාවි.

Draco :- ඒකනම් වීරකමක්.

ජිනී හැරීගේ අත අල්ලා ගත්තාය.

Ginny :- ඔයා එක බලන්න ඕනෙ නැහැ හැරී අපි ගෙදර යමු.

Harry :- මම ඒක වෙන්න ඉඩ දෙනවනම් ඇත්තෙන්ම මම මේක බලන්න ඕනේ.

Hermione :- එතකොට අපි ඔක්කොම ඒකට සාක්ෂිකාරයෝ වෙනවා.

Ron :- එහෙනම් අපි ඔක්කොම බලමු.

නන්නාදුනන කටහඬක් ඇසෙන්නට විය.

James :- (පසුබිමින්) ලිලී , හැරීව අරන් යන්න..! ඒ එයා..යන්න ..දුවන්න ...මම එයාව නවත්තන් ඉන්නනම්

එක්වරම පිපිරීමකි , පසුව වියරු ලෙස සිනාසීමකි.

Voldemort :- උඹ පැත්තකට වෙලා ඉදපන්..උඹට තේරුණාද...පැත්තකට වෙලා ඉදපන්.

(පසුබිමින්) Avada Kadavra...!

ශාලාව පුරා කොලපාට ආලෝක ධාරාවක් විහිදී යද්දි හැරී වකුටු වී ගියේය.

ඇල්බස් හැරීගේ අත අල්ලා ගත්තේය.හැරී එය තදින් අල්ලන් සිටියේය.ඔහුට එය අවශ්‍ය විය.

Albus :- එයා එයාට පුළුවන් හැමදේම කළා

ජිනී හැරීට පිටුපසින් සිට ගනිමින් හැරීගේ අනෙක් අත අල්ලා ගත්තාය.ඔහු ඔවුන්ට හේත්තු විය.ඔවුන් ඔහුව අල්ලන් සිටියි.

Harry :- ජනේලෙ ගාව ඉන්නෙ මගෙ අම්මා.මට මගේ අම්මව පේනවා.ඇය හරිම ලස්සනයි.

එක්වරම දොරකට ප්‍රහාරයක් එල්ල වූ ශබ්දයක් සමඟ දොර ගැලවී යන හඬක් ඇසුණි.

Lily :- (පසුබිමින්) හැරීව නොවේ...හැරීව නොවේ...කරුණාකරලා...කරුණාකරලා...

Voldemort :- (පසුබිමින්) පැත්තකට වෙනවා....පැත්තකට වෙනවා...අමන තකතීරු කෙල්ලේ...

Lily :- (පසුබිමින්) හැරීව නෙමෙයි...කරුණාකරලා එපා..මාව ගන්න...මාව මරන්න.

Voldemort :- (පසුබිමින්) මගේ අන්තිම අනතුරු ඇඟවීම මේ.....

Lily :- (පසුබිමින්) හැරීව නෙමේ..කරුණාකරලා... අනුකම්පා කරන්න...අනුකම්පා කරන්න... මගේ පුතාව නෙමේ.කරුණාකරලා මම ඕනම දෙයක් කරන්නම්.

Voldemort :- (පසුබිමින්) Avada Kedavra..!

හැරීගේ සිරුර හරහා අකුණක් ගියා හා සමාන විය.

අසරණකමක මහත.පොඩි දරුවා ක්ෂණිකවම පොළොවට වැටුණි.

පසු හැකිලුණු කෑගැසීමක් අඩුවෙමින් වැඩි වෙමින් ඔවුන් වටා ඇසෙන්නට විය.

ඒ වගේම ඔවුන් බලා සිටියි.

සෙමින් ...සෙමින් ....දැන් එතැන තිබූ කිසිවක් දැන් එතැන නොවීය.

වේදිකාව කැරකී යන්නට විය.

හැරී , ඔහුගේ පවුල සහ ඔහුගේ යහළුවන් කැරකී ඉවතට ගොස් ඇත.

---

◍ 4වන ජවනිකාව , 13 වන දර්ශනය

🏘 ගොඩ්‍රික්ස් හොලෝ , ජේම්ස් සහ ලිලී පොටර්ගේ නිවහන තුළ 1981 🏘

සියල්ලෝම නිවසක සුන්බුන් අතර විය.එය කුරිරු ප්‍රහාරයකට ලක්වූ නිවසක් විය.

හැග්‍රිඩ් සුන්බුන් අතරින් ඇවිද එයි.

Hagrid :- ජේම්ස්

ඔහු ඔහුව සොයයි.

ලිලී ?

ඔහු සෙමින් ඇවිද යයි.ඔහු අකමැත්තෙන් ඔබ මොබ බලමින් සෙමින් ඇවිද යයි.ඔහු හදවතින් සම්පූර්ණයෙන්ම කඩා වැටුණු ස්වරූපයක් දිස්වේ.

ඔහු ඔවුන්ව දුටුවේය.ඔහු නැවතී කිසිවක් නොපවසා බලා සිටියේය.

ඔහ්..ඔහ්.ඒක වෙන්න බෑ...ඒක වෙන්න බෑ...මම් නොවෙයි නම,එයාලා කිව්වා.මට ඊට වඩා හොඳට බලාපොරොත්තු වෙන්න තිබ්බා...

ඔහු ඔවුන් දෙස බලා හිස නමා ආචාර කළේය.ඔහු වචන කිහිපයක්ද තෙපළුවේය. පසුව තම කබායේ වූ ලොකු සාක්කුවකින් මදක් පර වූ මල් පොකුරක් ගෙන පොළොව මත තැබුවේය.

මට සමාවෙන්න.එයාලා මට කිව්වා.ඔහු මට කිව්වා,ඩම්බල්ඩෝ මට කිව්වා.මට ඒකත් එක්ක ඉන්න බැරි වුණා.මගල්ස්ලා එනවා.ජේනවනේ එයාලගේ නිල් පාට එලි පත්තු කරගෙන එනවා.එයාලා මං වගේ මෝඩ තකතීරුවෙක් අල්ලන් යන එකක් නෑ නේද?

ඔහු ඉකි ගැසීමට පටන් ගත්තේය.

මට දාලා යන්න දුකයි.

ඔයා දැනගන්න ඕනේ මට කවදාවත් අමතක වෙන්නෙ නෑ.මට විතරක් නෙමෙයි කිසිම කෙනෙක්ට...

එක්වරම ඔහුට යම් ශබ්දයක් ඇසෙන්නට විය.යම් අයෙක් තදින් හුස්ම ගන්නා හඬක්. හැග්‍රිඩ් ඒ දෙසට හැරී ඉක්මන් ගමනින් යන්නට විය.

ඔහු බිම බලන විට යම් ආලෝක ධාරාවක් නිකුත් වෙමින් තිබූ තොටිල්ලක් විය.

හොඳයි ඔයා සමහරවිට හැරී වෙන්න ඕන.

හෙලෝ.හැරී.

මම රුබියස් හැග්‍රිඩ්.ඒ වගේම මම ඔයාගේ යාලුවෙක් වෙන්නයි යන්නේ ඔයා කැමති වුණත් වුනත්...නැති උනත්.

මොකද ඔයාට ඒක තදින්ම ඕන වේවි.මොකද දැනට ඔයා ඒක දන්නේ නැති නිසා. ඒ වගේම ඔයාට යාළුවොත් ඕන වේවි.

ඔයා දැන් මාත් එක්ක එන එක හොඳයි කියල ඔයා හිතන්නෙ නැද්ද?

එක්වරම නිල් ආලෝක ධාරා රැසකින් කාමරය පිරී යන්නට විය.ඔහු ඉතාම මෘදුව ළදරු හැරීව දෝතට ගත්තේය.

ඔහු පසු නොබලා ඇතින් ඇතින් අඩි තබමින් නිවසින් පිට වන්නට විය.

▨ 4වන ජවනිකාව , 14වන දර්ශනය

🏰 ඔහුව පන්ති කාමරය 🏰

ස්කෝපියස් සහ ඇල්බස් කාමරයක් තුළට උද්යෝගයෙන් යුතුව දිවයය.කාමරය තුළට පිවිසි ඔවුන් එහි දොර තදින් වසා දැමුවේය.

Albus :- මට විශ්වාස කරන්නත් බෑ මම ඒක කළා කියලා.

Scorpius :- මට විශ්වාස කරන්න බෑ ඔයා ඒක කළා කියලා.

Scorpius :- රෝස් ග්‍රේන්ජර් වීස්ලි.මම රෝස් ග්‍රේන්ජර් වීස්ලිගෙන් කැමැත්ත ඇහුවා.

Albus :- ඒ වගේම ඇ කිව්වා කැමති නැහැ කියලා.

Scorpius :- නමුත් මම ඇගෙන් ඇහුවා.මම වැඩේට මුල පිරුවනේ.ඒක කාලයක් යද්දි දළු දාලා වැඩිලා අන්තිමේ කසාදයක් වෙනකන් යාවි.

Albus :- ඔයා ඔය විකාර දොඩවන එකෙන් අයින් වෙලා හිටියොත් තමා හොඳ.

Scorpius :- මම ඔයා එක්ක එකඟ වෙනවා.පොලි චැප්මන් විතරයි පාසලේ නැටුමට යන්න මගෙන් ඇහුවෙ.

Albus :- ඒ වෙනත් සමාන්තර තලයක.ඒ කියන්නේ ඔයා සැලකිය යුතු තරම් ඇත්තටම සුවිශේෂී විදිහට ඔයා ජනප්‍රියයිනේ ඒ කාලේ.ඉතින් වෙන ගෑනු ළමයෙක් ඔයාගෙන් කැමැත්ත ඇහුව...ඉතින් ඒකෙන් කියන්නේ..

Scorpius :- ඔව් ඉතින් තර්කෙ හැටියට මම පොලී පස්සෙන් යන්න ඕනේ තමයි.නැත්නම් ඇයට මගේ පස්සෙන් එන්න සලස්වන්න ඕන.ඒ වුනාට ඇය කාගෙත් අප්‍රසාදයට පත් වෙලා ඉන්න රූප සුන්දරියක්නේ.ඒ ඔක්කොමත් එක්ක ගත්තහම රෝස් ඇවිල්ලා රෝස මලක්නේ.

Albus :- ඔයා දන්නවනේ තර්කෙට අනුව ඔයා විකාරකාරයෙක් බව.රෝස් ඔයාට වෛර කරයි.

Scorpius :- නිවැරදි කිරීමක්.ඇය මට වෛර කළා තමා.නමුත් ඔයා දැක්කද මම ඇයගෙන් කැමැත්ත අහද්දී ඇගේ ඇස්වල තිබුණ බැල්ම ? ඒ වල වෛරයක් නෙමෙයි තිබුණේ දයාවක් තිබුණේ...

Albus :- ඉතින් කරුණාව පෙන්වන එක හොඳද ?

Scorpius :- කරුණාව පෙන්වන එක ආරම්භයක් විතරයි මගේ මිත්‍රයා.ඒක තමයි මාලිගාව හදන්න අඩිතාලම වෙන්නේ, ආදර මාළිගාවේ අඩිතාලම වෙන්නේ .

Albus :- මම අවංකව හිතුවා අපි දෙන්නගෙන් මුලින්ම ගෑනු ළමයෙක් සොයාගන්නේ මම කියලා.

Scorpius :- ඔහ් , ඔයා හොයාගනීවි.අනිවාර්යයෙන්ම. සමහරවිට අර මලානික ඇස් තියෙන අලුත් මායා බෙහෙත් හදන්න උගන්වන මහාචාර්යවරිය , එයා ඔයාගේ වයසට ගැලපෙනවනේ , මම හරිනෙ ?

Albus :- මට නාකි ගෑනු කෙනා අදහසක් නෑ.

Scorpius :- ඒ වගේම ඔයාට වෙලාව තියෙයි.ගොඩක් වෙලාව තියෙයි ඇයව රවට්ටන්න.මොකද ඔයාට රෝස්ට ඒත්තු ගන්වන්න අවුරුදු ගාණක් ගත වෙන නිසා.

Albus :- ඔයාගේ නිර්භීතකම මම අගය කරනවා.

රොස් පඩිපෙල පසු කරමින් ඔවුන් අසලට පැමිණෙයි.ඇය ඔවුන් දෙදෙනා දෙස බැලුවාය.

Rose :- හායි !

දෙදෙනාම කෙසේ පිළිතුරු දිය යුතු දැයි නොදැන සිටියහ.ස්කෝර්පියස් දෙස බලා

මේක විකාරයක්ම විතරක් වෙන්න යන්නේ ඔයා ඒක විකාරයක් වෙන්න ඉඩ හැරියොත්.

Scorpius :- හරි හොඳටම තේරුණා.

Rose :- හොඳයි , ස්කෝපියන් රජුනි.

මුවගට සිනාවක් නගා ගනිමින් ඇය එතැනින් නික්ම ගියාය.ඇල්බස් සහ ස්කෝපියස් එකිනෙකාගේ මුහුණු දෙස බලා සිටියහ.ඇල්බස් විරිත්තන්නත් අතින් ස්කෝපියස්ට අනින්නත් විය.

Albus :- සමහරවිට ඔයා හරි වෙන්නැති.කරුණාව පෙන්වන එක සමහරවිට ආරම්භයක් වෙන්න ඇති.

Scorpius :- ඔයා ක්විඩිච් තරග බලන්න යන්නද ඉන්නෙ?ස්ලිදරින් හපල්පෆ් එක්ක එක්ක තරඟ වදින්නේ.ඒක ලොකු තරගයක්.

Albus :- මම හිතුවේ අපි ක්විඩිච් වලට වෛර කරනවා කියලා.

Scorpius :- මිනිස්සුන්ට වෙනස් වෙන්න පුළුවන්නේ.ඇරත් මම පුහුණුවෙමින් හිටියේ. මම හිතන්නේ කාලයක් යද්දි මට ටීම් එකට යන්න පුළුවන් වේවි...එන්නකො යන්න...

Albus :- මට බැහැ.තාත්ත හම්බෙන්න ඉන්නේ.....

Scorpius :- එයා අමාත්‍යාංශයේ එළියට එන්න වෙලාව හදාගෙනද?

Albus :- එයාට ඇවිදින්න ඕන වෙලා.මට මොනවද පෙන්නන්න
මාත් එක්ක මොනවද බෙදාගන්න.

Scorpius :- ඇවිදින්න යන්න ?

Albus :- මම දන්නවා මම හිතන්නේ ඒක බැඳීමක් ඇති කරන යම් දෙයක් හරි.නැත්නම් වමනේ එනවා වගේ එපා කරපු වැඩක් වෙන්න පුළුවන් කියලා.නමුත් ඔයා දන්නවනේ තවමත් මම හිතනවා මම ගියොත් හොඳයි කියලා.

ස්කෝපියස් ඇල්බස්ට ලංවී ඔහුව වැළඳගත්තේය.

මේ මොකද කරන්නෙ?මම හිතුවේ අපි වැලඳ ගන්නෙ නෑ කියල පොරොන්දු වුණා කියලා.

Scorpius :- මට විශ්වාසය නෑ.සමහරවිට අපි කරන්න ඕනේ.අපේ මේ අලුත් විදිහ මගේ ඔළුවේ තිබ්බා.

Albus :- ගොඩක් හොඳයි.රෝස්ගෙන් අහන්න කරන්න හොඳම වැඩේ ඒකනම්.

Scorpius :- හරි හරි...

දෙදෙනා විරිත්තමින් එකාගෙන් සමුගත්හ.

Albus :- ඔයාව මම රෑ කෑමෙදි හම්බවෙන්නම්කෝ.

▨ 4වන ජවනිකාව , 15වන දර්ශනය

🏔 මනස්කාන්ත කඳු මුදුන 🏔

හැරී සහ ඇල්බස් ගිම්හානයේ සුන්දර දවසක කඳු මුදුනක් වෙත ඇවිද යයි.මූණට වැටෙන හිරු රශ්මිය විඳිමින් කිසිවක් කතා නොකර ඔවුන් කන්ද තරණය කරමින් සිටියි.

Harry :- ඉතින් ඔයා ලෑස්තිද ?

Albus :- මොකටද ?

Harry :- හොඳයි 4 වන අවුරුද්දෙ විභාග තියෙනවා.තව පස්වෙනි අවුරුද්ද.ලොකුම අවුරුද්ද.මගේ පස්වෙනි අවුරුද්දෙදි මම....

ඔහු දෙස බලායි. ඔහු සිනාසෙයි.ඔහු ඉක්මනින් කතා කරන් යන්නට විය.

මම ගොඩක් දේවල් කලා.සමහර ඒව හොඳයි.සමහර ඒවා ගොඩක් නරකයි.

Albus :- දැනගත්ත එක හොඳයි.

හැරී සිනාසෙයි.

මට මොහොතකට දකින්න ලැබුණා, ඒකෙන් ඔයාගේ අම්මයි තාත්තවයි.ඔයා එයාලා විනෝදෙන් ඉඳලා.ඔයාගේ තාත්තා ඔයාට දුම් රවුමක් හදන්න මොකක්හරි කරන්න පුරුදු වෙලා ඉඳලා තියෙනවා.ඉතින් ඔයාත් මුකුළුව නවත්තගන්න බැරුව ඉන්නවා ඒකටආසාවෙන්.

Harry :- ඔව් ?

Albus :- මම හිතන්නේ ඔයා එයාට ආසාවෙන් ඉඳලා ඇත්තේ.ඒ වගේම මමයි , ලිලීයි ,ජේම්සුත් එයාලට කැමති වෙන්න තිබ්බා.

හැරී හිස වැනුවේය
මොහොතකට දෙදෙනාම අපහසු බවට පත්කරන නිශ්ශබ්දතාවක් විය.දෙදෙනාම එකිනෙකාට සමීප වෙන්න උත්සාහ කළත් එය සාර්ථක නොවිණි.

Harry :- ඔයා දන්නවද මම හිතුවේ මම එයාව පරාද කළා කියලා.පස්සේ මගේ කැලළ රිදෙන්න ගත්තම, මට එයා ගැන සිහින පේන්න ගත්තාම ,මට පාස්ල්ටන්ග් භාෂාව පවා කතා කරන්න පුළුවන් උනාම මට දැනෙන්න ගත්තා මම කොහෙත්ම වෙනස් වෙන්නෙ නෑ කියලා.ඔහු කවදාවත් මට යන්න දෙන්නෙ නෑ කියලා.

Albus :- ඔහු සිටියද ?

Harry :- මගේ ඇඟේ තිබුන වොල්ඩමෝට්ගේකොටස බොහෝ කාලෙකට ඉස්සෙල්ලා මැරිලා ගිහිල්ලා තිබුණත ඔහුගෙන් ශාරීරිකව ගැලවෙන එක අමාරු වැඩක් වුණා.මට ඔහුව මානසිකවත් ඉවත් කරන්න තිබුණා.අවුරුදු 40ක මනුස්සයෙක්ට ඒකෙන් ඉගෙන ගන්න ගොඩක් දේවල් තියෙනවා.

ඔහු ඇල්බස් දෙස බලයි.

මම ඔයාට කිව්වේ ඒ දේ සමාව දෙන්න බැරි දෙයක්.ඒ වගේම මට කියන්න බැහැ ඔයාට ඒක අමතක කරල දාන්න කියලා.නමුත් මට හිතන්න පුළුවන් එක අතීතයට එකතු කරන්න පුළුවන් වේවි කියලා.මම ඔයාට වඩා හොඳ තාත්තා කෙනෙක් වෙන්න මම උත්සාහ කරන්නේ.ඔයත් එක්ක අවංක වෙන්න වගේම....

Albus :- තාත්තේ එහෙම උවමනාවක් නෑ....

Harry :- ඔයා කිව්වා මම කිසිම දෙයකට බය නෑ කියලා හිතනවා කියලා.ඉතින් ඒක, මම කියන්නේ, මම හැමදේකටම බයයි.මම කියන්නේ මම අඳුරට බයයි ඔයා දැනගෙන හිටියද ඒක ?

Albus :- හැරි පොටර් අඳුරට බයයි කියලා ???

Harry :- මම පොඩි ඉඩක් තියෙන තැන් වලට බයයි වගේම ,මම ඒක කාටවත්ම කියලා නෑ.නමුත් මම ගොඩක් කැමති නෑ (ඔහු ඒ පැවසීමට පෙර අදිමදි කිරීමක් පෙන්වීය.) පරෙවියන්ට......

Albus :- ඔයාට පරවියන්ට කැමති නෑ???

Harry :- (ඔහු මුහුණ කසන්නට විය.) නපුරු , අශෝභන , අපිරිසිදු දේවල්.ඔවුන් මට පිළිකුලක් ඇති කරවනවා.

Albus :- නමුත් පරවියන්ගෙන් කිසි හිරිහැරයක් නැනෙ.

Harry :- මම දන්නවා.නමුත් ගොඩක්ම බය හිතෙන දේ තමා , ඇල්බස් සෙවරස් පොටර්, ඔයාට තාත්තා වීම එක ගැන.මොකද මම වැඩ කරන්නේ කිසිම ආධාරයක් නැතිව. ගොඩක් පුද්ගලයින්ට අඩුම තරමේ තාත්තා කෙනෙක් හරි ඉන්නවා එයාලගේ මුල් අඩිතාලම හදන්න හරි නැත්නම් එහෙම වෙන්න හරි උත්සාහ කරනවා නැත්නම් එහෙම නැතුව ඉන්න උත්සාහ කරනව.මට එහෙම මුකුත්ම තිබ්බෙ නෑ..නැත්නම් පොඩ්ඩක් හරි..මම ඉගෙන ගනිමින් ඉන්නවා හරිද.ඒ වගේම මම මං ළඟ තිබෙන හැමදේම උත්සාහ කරන්න ඉන්නේ ඔයාට හොඳ තාත්තා කෙනෙක් වෙන්න.

Albus :- ඒ වගේම මමත් උත්සාහ කරන්නම් හොඳ පුතෙක් වෙන්න.මම දන්නවා මම ජේම්ස් වගේ නෙමෙයි කියලා.තාත්තේ මම ඔයාලා දෙන්නා වගේ වෙන්නෙත් නෑ.

Harry :- ජේම්ස් පොඩ්ඩක්වත් මං වගේ නෑ.

Albus :- එයා එහෙමද?

Harry :-- ජේම්ස්ට හැමදේම ලේසියෙන්ම ලැබෙනවා.මගේ ළමා කාලය කරදර එකපිට එක ආපු එකක්.

Albus :- මගෙත් එහෙමනේ ඉතිං. ඔයා මේ කියන්නේ මම ඔයා වගේ කියලද ?

හැරී ඇල්බස් දෙස බලා සිනාසෙයි.

Harry :- ඇත්තටම ඔයා ගොඩක්ම ඔයාගෙ අම්මා වගෙයි.නිර්භීතයි , දරුණුයි , විහිළුයි.හරියට මම කැමති විදිහට.මම හිතන විදියට ඒවා ඔයාව හොඳ ශ්‍රේෂ්ඨ පුතෙක් කරාවි.

Albus :- ඒ උනාට මම දැනටමත් ලෝකය විනාශ කරලනේ.

Harry :- ඩෙල්ෆි කොහේවත් ගියේ නැනේ.ඇල්බස් ඔයා එයාව ආලෝකය වෙත රැගෙන ආවා වගේම ඔයා අපිට විරුද්ධව සටන් කරන්න මගක් පාදලා දුන්නා.සමහරවිට ඔයාට ඒක පේන්නේ නැතුව ඇති දැන් , නමුත් ඔයා අපිව බේරගත්තා.

Albus :- නමුත් මට ඊට වඩා හොදට කරන්න තිබ්බ නේද?

Harry :- ඔයා හිතන්නෙ නැතුව ඇති.මමත් ඒ ප්‍රශ්නේ මගෙන්ම අහලා තියෙනවා.

Albus :- (තව තවත් බඩ හකුලවමින්.මේ ඔහුගේ පියා විසින් කරනු ලබන දෙයක් නොවන බව දැන.) ඊට පස්සේ අපි එයාව අල්ල ගත්තට පස්සේ මට එයාව මරන්න ඕන වුණා.

Harry :- ඇය ක්‍රෑග්ව මරනවා ඔයා දැක්කා.ඔයා තරහින් හිටියේ.ඇල්බස් ඒකට ප්‍රශ්නයක් නෑ.ඒ වගේම ඔයා එහෙම කරන්න උවමනාවක් නෑ.

Albus :- ඔයා කොහොමද ඒක දන්නේ?සමහරවිට ඒ මගේ ස්ලිදරින් පැතිකඩ වෙන්න ඇති.සමහර විට තේරීම් තොප්පිය මාව දකින්න ඇත්තේ ඒ පැතිකඩෙන් වෙන්න ඇති.

Harry :- මට ඔයාගේ ඔලුවේ තියෙන දේවල් තේරෙන්නෙ නෑ.ඇල්බස් ඇත්තටම ඔයා දන්නවද දෙයක් , ඔයා ගැටවරයෙක් මට ඔයාගේ ඔලුවේ තියෙන දේවල් ගන්න බැරුව ඇති.නමුත් මට ඔයාගේ හදවතේ තියෙන දේවල් තේරුම් ගන්න පුළුවන්. ගොඩකාලෙකට

මම කලේ නෑ ඒක මේකට පිත්සිද්ද වෙන්න.."Escapade..!".මම දන්නවා ඔයා ඒකෙන් මොනවද කියල.

ස්ලිදරින් ,ග්‍රිෆින්ඩෝර් මොකකට ඔයා අයිති වුණත් මම දන්නවා...හොඳටම දන්නවා.. ඔයාගේ හදවත හොඳ එකක් කියලා.ඔව් ඔයා කැමති උනා හෝ නැතා ඔයා දැන් යම් මායාකාරයෙක් වෙන ඔයාගෙම මගකට වැටිලා ඉන්නේ.

Albus :- ඔහ් මම මායා කාරයෙක් වෙන්න නෙමේ යන්නේ.මම පරවි තරග වලට යන්න ඉන්න..මම ගොඩක් ඒ ගැන උද්යෝගයෙන් ඉන්නේ.

හැරී දත් විලිස්සමින් සිනාසෙයි.

Harry :- ඔයාට දාල තියෙන ඒ නම් ,ඒවා ඔයාට බරක් වෙන්න ඕනෙ නෑ.ඇල්බස් ඩම්බල්ඩෝට එයාගෙම අත්හදාබැලීම් තිබුනා.ඔයා දන්නවද සෙවරස් ස්නේප්ටත් එහෙමයි.ඔයා එයා ගැන හැමදේම දන්නවනේ.

Albus :- එයාලා හොඳ මිනිස්සු...

Harry :- එයාල ශ්‍රේෂ්ඨ මිනිස්සු.ජීවිතයේ ගොඩක් ලොකු කැලැල් තිබ්බ.ඒ වගේම ඔයා දන්නවද දෙයක්.ඒ කැලැල් එයාලව තවත් ශ්‍රේෂ්ටත්වයට පත් කළා .

ඇල්බස් ඔහු දෙස බලා සිටියි.

Albus :- තාත්තේ, ඇයි අපි මෙතන ?

Harry :- මේ මම නිතරම එන තැනක්.

Albus :- නමුත් මේක කනත්තක්නේ.

Harry :- ඒ වගේම මෙන්න තියනවා සෙඩ්‍රික්ගේ සොහොන.

Albus :- තාත්තෙ ?

Harry :- Craig Bowker කියන ළමයාව මරලා දාපු පිරිමි ළමයා.ඔයා කොච්චර මෙයා ගැන දන්නවද ?

Albus :- වැඩි දෙයක් නම් නෑ..

Harry :- මමත් ගොඩක් සෙඩ්‍රික් ගැන වැඩි දෙයක් දැනගෙන හිටියේ නැහැ.එයා එංගලන්තේ වෙනුවෙන් ක්විඩිච් සෙල්ලම් කරන්න තිබුණා නැත්නම් දීප්තිමත් අරුර් කෙනෙක් වෙන්න තිබ්බා.එයාට ඕනම කෙනෙක් වෙන්න පුළුවන්.ඒ වගේම ආමෝස් හරි,මම එයාව සොරකම් කළා.ඉතින් මම මෙහෙට එනවා.සමාවෙන්න කියන්න.මට පුළුවන් වෙලාවට.

Albus :- ඒක කරන්න හොඳ වැඩක් තාත්තේ...

ඇල්බස් ද තම පියාට එකතු වෙමින් සොහොන ඉදිරියේ සිට ගත්තේය.හැරී තම පුතු දෙස මොහොතක් බලා සිනාසී ඉහල අහස දෙස බලා සිටියේය.

Harry :- මම හිතන්නේ අද දවස හොඳ දවසක් වේවි.

ඔහු තම පුතුගේ උරහිස මත අතක් තබා හෙමින් සීරුවට එකිනෙකාට ළං විය.

Albus :- (සිනාසෙමින්) මමත් එහෙම හිතනවා.


~ නිමි.~

---

සියළුම හිමිකම් මුල් කර්තෘ සතුය..

ලියන්නේ:- Shashitha Vinod
අදින්නේ :- Naveen ishara

-----------------------------------------------


HARRY POTTER
AND THE CURSED CHILD
PARTS ONE AND TWO
NOMINATED FOR
BEST WEST END SHOW
WA
WHATSONSTAGE AWARDS